විමුත්තිමග්ගො.

විමුත්තිමග්ගො

මේ පොතෙහි එන සමහර අදහස් විශුද්ධි මාර්ගය පොතේ විඛණ්ඩනය කර ඇති බැවින් පොත් දෙකම එකට පරිශීලනය කිරීම සුදුසුය

විමුත්තිමග්ගො

භදන්තාරහන්ත-

මහාරිට්ඨඋපතිස්සත්ථෙර-

වරප්පණීතො

සිරිසඞ්ඛණ්ඩ සෙල සිරිවඩ්ඪන නගරෙ අච්ඡගිරි විහාරවාසීහි

ගල්කැටියාගම සිරි රතනජොති කරල්ලියද්දෙ සිරි රතනපාල-

නාමිකෙහි වීහි ථෙරෙහි අභිසඞ්ඛතො

1963

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද
කඩදසිවල ආණ්ඩුවේ නියමයෙන් ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිත යි

පටුන

පිටු

1. පඨමො නිදානකච්ඡො 1

2. දුතියො සීලකච්ඡො—සීලවිභාගො 2

3. තතියො කච්ඡො, ධුතානි 5

I පංසුකූලිකඞ්ගං
II තෙචීවරිකඞ්ගං
III පිණ්ඩපාතිකඞ්ගං
IV සපදානචාරිකඞ්ගං
V එකාසනිකඞ්ගං
VI පත්තපිණ්ඩිකඞ්ගං
VII ඛලුපච්ඡාභත්තිකඞ්ගං
VIII ආරඤ්ඤිකඞ්ගං
IX රුක්ඛමූලිකඞ්ගං
X අබ්භොකාසිකඞ්ගං
XI සොසානිකඞ්ගං
XII යථාසන්ථතිකඞ්ගං
XIII නෙසජ්ජිකඞ්ගං
XIV පකිණ්ණකකථා

4. චතුත්ථො සමාධිකච්ඡො 8

5. පඤ්චමො කච්ඡො—කල්‍යාණමිත්තපරියෙසනා 10

6. ඡට්ඨො කච්ඡො—චරියාවිභාගො 11

(i) රාගචරියා (iv) බුද්ධිචරියා
(ii) දොසචරියා (v) විතක්කචරියා
(iii) මොහචරියා (vi) මිස්සකචරියා
(vii) සද්ධාචරියා

7. සත්තමො කම්මට්ඨානකච්ඡො 12

I අට්ඨතිංස—ආරම්මණකම්මට්ඨානානි
II ද්වෙ විඤ්ඤාණානි

8. අට්ඨමො කච්ඡො—කසිණවිභාගො 13

I පඨවිකසිණං
II රූපාරූපජ්ඣානවිභාගො

පිටු

අට්ඨමො කච්ඡො—දුතියොභාගො 15

I කම්මට්ඨාණ
II ආපො, තෙජො, වායො කසිණ
III නීල, පීත, ලොහිත, ඔදාත කසිණ
IV විඤ්ඤාණ කසිණ
V දස අසුභානි
VI උද්ධුමාතකං
VII විනීලකං
VIII විපුබ්බකං
IX විච්ඡිද්දකං
X වික්ඛායිතකං
XI වික්ඛිත්තකං
XII හතවික්ඛිත්තකං
XIII ලොහිතකං
XIV පුළුවකං
XV අට්ඨිකං

අනුස්සති විභාගො 17

I බුද්ධානුස්සති
II ධම්මානුස්සති
III සඞ්ඝානුස්සති
IV සීල, චාග, දෙවතානුස්සති
V ආනාපාන සති
VI මරණසති
VII කායගතාසති
VIII උපසමානුස්සති

තතියො භාගො—අප්පමඤ්ඤායො 21

I මෙත්තා
II කරුණා
III මුදිතා
IV උපෙක්ඛා
V පකිණ්ණක කථා

ධාතු-වවත්ථානං 23

ආහාරෙ පටික්කූල-සඤ්ඤා

ආරුප්පා 25

I ආකාසානඤ්චායතන
II විඤ්ඤාණඤ්චායතන
III ආකිඤ්චඤ්ඤායතන
IV නෙවසඤ්ඤානාසඤ්ඤායතන

		පිටු
9.	නවමො කණ්ඩො—පඤ්ච අභිඤ්ඤායො	27
	I ඉද්ධිවිධං	
	II දිබ්බසොතං	
	III පරචිත්තවිජානනං	
	IV පුබ්බෙනිවාසානුස්සති	
	V දිබ්බචක්ඛු	
10.	දසමො කණ්ඩො—පඤ්ඤාභාවනා	29
11.	එකාදසමො කණ්ඩො—පඤ්ච උපායා	30
	I ඛන්ධ, ධාතු, ආයතන, හෙතු, නිදාන	
	II රූප	
	III වෙදනා	
	IV සඤ්ඤා	
	V සඞ්ඛාරා	
	VI විඤ්ඤාණ	
	VII ආයතන	
	VIII ධාතු	
	IX හෙතු	
	X නිදාන	
	දුතියො භාගො—සච්ච-විභාගො	34
	I දුක්ඛ-සච්චං	
	II දුක්ඛ-සමුදය-සච්චං	
	III දුක්ඛ-නිරොධ-සච්චං	
	IV දුක්ඛ-නිරොධ-ගාමිණි-පටිපද අරිය-සච්චං	
12.	ද්වාදසමො කණ්ඩො—විසුද්ධි-විභාගො	36
	I සීලචිත්තවිසුද්ධි	
	II දිට්ඨිවිසුද්ධි	
	III කඞ්ඛාවිතරණවිසුද්ධි	
	IV උදයබ්බයඤාණං	
	V භඞ්ගානුපස්සනාඤාණං	
13.	තෙරසමො කණ්ඩො	38
	I භයතුපට්ඨානඤාණං	
	II මුඤ්චිතුකාම්‍යතාඤාණං	
	III අනුලොමඤාණං	
	IV ගොත්‍රභූඤාණං	
	V පකිණ්ණකධම්මා	
	පරිවර්තනය	42
	විමුත්තිමග්ගො උද්දානං	109
	බඹරගලේ පොත	189

පෙරවදන

කලකට පෙර නංජියෝ නම් ජපන් පඬිවරයා විසින් සැකැසුණු චීන බෞඩ ග්‍රන්‍ථ නාමාවලියෙක් පළ විය. එහි උපතිස්ස නම් රහතකු විසින් රචිත **විමෝක්‍ෂමාර්ගශාස්ත්‍ර** නම් පොතෙක තතු සඳහන් විණ. එය ක්‍රි. ව. 505 පමණේ දී සංඝභද්‍ර නම් තෙර කෙනකුන් විසින් ලක්දිවින් චීන භාෂාවට නඟා ගෙනයන ලද්දෙකි. මෙ පොත පිළිබඳ වඩාත් සවිස්තර නිබන්‍ධයෙක් ජපන් රටැ ටෝකියෝ නුවර ඉම්පියරියල් විශ්වවිද්‍යාලයයෙහි මහාචාර්ය ඇම්. නගයි මහතා විසින් එංගලන්තයේ පාළිපොත් සමාගමෙ සඟරායෙහි මෙයින් සුසාළිස් වසකට උඩ දී පළ කැරැවිණ. එහි යටකී පොතේ නම විමුත්තිමග්ග යැ යි සඳහන් විය. පාළිවිසුඩිමග්ගයත් විමුත්තිමග්ග චීන පරිවර්තනයත් දෙකෙහි සැසැඳී මෙක් එහි ඇතුළත් විය. විසුඩිමග්ගයේ ගුරුපොත විමුත්තිමග්ගය වී යැ යනු නගයි මහතා ගේ මතය ය. මෙයින් ටික කලකට පසු ආචාර්ය **බපත්** මහතා විසින් විසුඩිමග්ග විමුත්තිමග්ග දෙකේ සම විසම තැන් පිළිබඳ දීර්‍ඝ වාර්තාවෙක් පළ කැරැවිණ.

විසුඩිමග්ගටීකායෙහි ද විසුඩිමග්ගයට පැරැකුම්බා රජු ලියූ සන්නයෙහි ද මෙ විමුත්ති මග්ගය ගැන සඳහන් වේ. එබැවින් බුදුගොස් තෙරුනටත් පෙරැ ම ලක්දිවැ නිපැයුණු මෙ පැරැණි ධර්‍මසංග්‍රහය පිළිබඳ තතු සෙවීමෙ බොහෝ දෙනෙක් උනන්දු වූහ. ලක්දිවැ තුබුණු මුල් පොත අභාවයට ගියේ වනැ යි ඒ කාගෙත් පිළිගැන්ම විය. මෙ අතරැ වර්‍ෂ කිහිපයකට පෙරැ කොළඹ බම්බලපිටියේ වජිරාරාම වාසි සෝම ඛේමින්ද යන දෙ තෙරණුවෝ (පැවිදි වන්නට පෙර) ජපන් රට ගොස් 1936 වස තුළ දී ගෙ දත්සු දෙ රෝං (විමුත්තිමග්ග) නම් පොත ජපන් ඇදුරක්හු ගේ සහායත්වය ද ලැබ ඉංලිසියට නැඟූහ. මෙය නොබෝද (1961 වන්නෙහි) ලක්දිව මුද්‍රිත විය.

මෙය මුලදී හෙළ අටුවා සෙයින් හෙළ බසින් ම රැසැසුණෙකැ යි අප අදහස විය. මේ බව බලපිටියේ පණ්ඩිත විශුඩාලොක මහානායක ස්ථවිරයන් වහන්සේ විසින් සිංහලයට නගා පළ කැරැවුණු විසුඩිමග්ගයේ තෙවෙනි කාණ්ඩයේ මූලට යොදන ලද අපේ ප්‍රස්තාව-නායෙහි දක්වා ඇත. එහෙත් ඒ අදහස මදක් වෙනස් කරන්නට අපට සිදු විය. එයට කරුණු වූයේ පාලි විමුත්තිමග්ගය දක්නට ලැබීම ය. මේ දුර්ලභ ග්‍රන්‍ථය ලක්දිවැ මැ කොහේ හෝ ඇතැ යි සැලකූ අස්ගිරි වෙහෙරැවැසි ගල්කැටියාගම සිරි රතනජොති, කරල්ලියැද්දේ සිරි රතනපාල යන දෙ මහතෙරණුවෝ මහදුත්සාහයෙන් මෙය සොයාගත්හ. සිය වස් ගණනක් ම ගුප්ත වැ රැඳුණු මෙ පැරැණි මහඟු පොත දූන් එළි දකී. මෙය සම්බන්‍ධ සියලු තොරතුරු උන් වහන්සේ ගේ පූර්විකායෙහි දක්වෙයි.

මෙ පාලි විමුත්තිමග්ගය හා චීන බසින් ඉංලිසියට නගා පළ කොට ඇති විමුත්තිමග්ගය සසඳ බැලීමෙ දී, චීන පරිවර්තනය මේ පාළි විමුත්තිමග්ගයේ ම ද ? නැත හොත් මෙයට ලියන ලද සවිස්තර සිංහල ව්‍යාඛ්‍යානයෙක ද ? යි විමතියෙක් උපදී. පහත පළ වන සංසන්‍දනය මැදහත් වැ සලකා බලන්නකුට මේ පිළිබඳ නිගමනයකට බසිනු අසීරු නොවේ යැ යි සිතමු. පහත දක්වෙනුයේ ලේශමාත්‍ර සැසැඳීමෙකි.

පාළිපොතෙහි පරිච්ඡෙද තෙළෙසෙකි. **පඨමො නිදාන කථෙථා දුතියො සීලකථෙථා** යන ආදි විසින් හැම පරිච්ඡෙදයෙක් ම **කථා** නාමයෙන් හැඳින්වේ. චීන පොතෙහිත් **කථා** තෙළෙසෙකි. එහෙත් පාළි පොතේ එන දෙළොස්වන තෙළෙස්වන කථා දෙක ම

චීනපොතෙහි දෙළොස්වන පරිච්ඡේදය සේ ගෙන ප්‍රථම භාග ද්විතීය භාග විසින් දෙකකට බෙදු ඇත. තව ද පාළි පොතේ අගට උද්දුන ගාථා තුන්දහස් අටසිය අටොළොසෙකැ යි

> " අට්ඨාදසහි ගාථාහි තිසහස්සට්ඨසතෙහි ච
> දසෙසත්‍වා නිට්ඨිතං එතං විමුත්තිමග්ගදස්සනං "

යන්නෙන් හැඟැවේ. එහෙත් චීන පොතේ ඉංලිසි පරිවර්තනයෙහි අගැ ඒ කිසිත් නො දක්වේ. එහි දෙළොස්වන පරිච්ඡේදයේ දෙවෙනි කොටස අගට ගාථා කිහිපයෙක් සඳහන්වේ. චීන භාෂාවට නැඟුණු පොතට ඒ ගාථා නොගෙන හැර දමන ලද්දේ කවර හෙයින්ද ?

සංසන්දනය

පඨමකවග්ග

පාළි පොත	චීන පොත*
' සීලං සමාධි පඤ්ඤා ච ' යන ගයින් ඇරැඹෙයි සීල සමාධි පඤ්ඤා විමුත්ති යන සතර සැකෙවින් දක්විණ. මුද්‍රිත පාළිපොත් පේළි එක හමාරෙකි.	' සීලං සමාධි පඤ්ඤා ච ' යන ආදී ගයේ අදහස ම මුලට ඇත. චීන පොතේ මේ කොටස ලොකු පිටු සතරකට ද මඳක් වැඩි වේ.

දුතිය සීලකවග්ග

පාළි පොත	චීන පොත*
' කිං සීලං ? කිං සීලස්ස ලක්ඛණං ? ආදි ප්‍රශ්න තුදුසක් ඉදිරිපත් කොට ඒ විසැඳෙයි. පේළි 89 කින් පමණ පරිමිත ය.	මේ පරිච්ඡේදය සිල් නම් කවරැ ? යන ආදී ප්‍රශ්න විසැඳීම් විසින් ලොකු පිටු පස් විස්සෙකින් පරිමිත ය.

තතිය ධුතඞ්ගකවග්ග

පාළි පොත	චීන පොත*
චීවරපටිසංයුත්ත ධුතංග දෙකෙක, පිණ්ඩපාත පටිසංයුත්ත ධුතංග පසෙක, සෙනාසනපටිසං-යුත්ත ධුතංග පසෙක, විරිය පටිසංයුත්ත ධුතංග එකෙකැ යි සැකෙවින් දක්වා ඉක්බිති පංසුකූලිකඞ්ගය පටන් කොට සියලු ධුතඞ්ග විස්තර කැරෙයි. පේළි එක් සැත්තෑවක් පමණ ය.	ධුතඞ්ග විස්තරය පාළිපොතේ එන පමණට වඩා මහති. ලොකු පිටු දෙළොසෙකින් පරිමිත ය.

චතුත්ථ සමාධිකවග්ග

පාළි පොත	චීන පොත*
කො සමාධි ආදි ප්‍රශ්න වැලෙකින් සමාධි කථාව ඇරැඹෙයි. සියල්ල පේළි එක් පණසක් පමණි.	පාළිපොතට බෙහෙවින් සමාන ය. එහෙත් කිසි තැනෙක පාළි පොතට වඩා සවිස්තර ය. ලොකු පිටු අටෙකුත් සවල්පයෙකි.

පඤ්චම කවග්ග (කල්‍යාණමිත්‍ර සම්පාදනය)

පාළි පොත	චීන පොත*
කලණමිතුරාගේ සැටි පේළි සයෙකින් දක්වේ.	මෙහි කල්‍යාණමිත්‍ර ලක්ෂණ විභාගය ලොකු පිටු සයෙකින් පරිමිත ය. පාළිපොතේ නැති ගාථා කිහිපයෙක පරිවර්තන ද අඩංගු ය.

* මෙහි චීනපොත යනු චීන පොතෙන් ඉංලිසියට නගා පළ කැරුණු සොම ඔෙමිඳ දෙ තෙරුන්ගේ ඉංලිසි පරිවර්තනය ය.

ෂට්ඨ කණ්ඩය (චරියා විභාගය)

චර්යා තුදුසෙක් තරමක් දුරට වැණෙයි. පේලි එකුන් විස්සෙකි.

පාළිපොතේ එන පිළිවෙළ ම ය. එහෙත් එයට වඩා සවිස්තර ය. පුරා ලොකු පිටු අටෙකි.

සත්තම කණ්ඩය (කම්මට්ඨාන විභාගය)

අටතිස් කමටහන් සැකෙවින් එයි. පේලි සතොළොසෙකි.

පාළිපොතේ එන පිළිවෙළ ම වුව ද එයට වඩා විස්තර සහිත ය. ලොකු පිටු හතහමාරෙකි.

අට්ඨම කණ්ඩය (පඨම භාගය)

පඨවිකසිණයේ ලක්ඛණ රසාදිය ද, පඨවි කසිණයේ ප්‍රභෙද සතර ද, එය වඩන සැටි ද යන ආදි විසින් දහන් වැඩීම දක්වේ. පේලි 26කි.

ලොකු පිටු 15කි. පාළි පොතට වඩා බොහෝ විස්තර එයි.

අට්ඨම කණ්ඩය (දුතිය භාගය)

වීතියධ්‍යානය පටන් කොට නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය තෙක් ධ්‍යාන කථාව දක්වෙයි. අගට එහි ම ප්‍රකීණ්ක කථාව ද වෙයි. ලොකු පිටු එකහමාරෙකි.

පාළිපොතේ එන ද්‍ ම විස්තරයෙන් එයි. ලොකු පිටු 30ක් පමණි.

අට්ඨම කණ්ඩය (තතිය භාගය)

ආපෝ තේජෝ වායු කසිණ ද. දස අසුභ ද, දස අනුස්සති ද පිටු එකහමාරෙකින් පමණ විස්තර වෙයි.

පාළි පොතේ එන ද්‍ ම ලොකු පිටු 26කින් පමණ විස්තර කැරේ.

අට්ඨම කණ්ඩය (චතුත්ථ භාගය)

ආනාපානසති මරණසති කායගතාසති උප- සමානුස්සති අප්පමඤ්ඤ ධාතුමනසිකාර ආහාරෙ පටික්කූල සඤ්ඤ ආරුප්පසමාපත්ති යන මොහු විස්තෘත හ. ලොකු පිටු සතෙකි.

ලොකු පිටු 24කි.

අට්ඨම කණ්ඩයේ පස්වන කොටසෙක් ද වේ. එහි අප්පමඤ්ඤ විභාගය එයි.

නවම කණ්ඩය

පංචාභිඥ වැඩීම විස්තර වෙයි. ලොකු පිටු දෙකෙකි.

පිටු 18ක් තරම් වේ. අභිඥ වැඩීම විස්තර වෙයි.

දසම කණ්ඩය

ප්‍රඥභාවනා විභාගය වේ. පිටකට මදක් අඩු ය.

පිටු 26කි.

එකාදසම කණ්ඩය (පඨමභාගය)

බන්ධාදි උපාය පස පිළිබඳ විස්තරය පිටු පසක් පමණවේ.

පිටු 12ක් පමණ ය. පාළිපොතට බොහෝ සමාන ය.

එකාදසම කච්ඡය (දුතිය භාගය)	
සත්‍ය විභාගය වේ. පිටු දෙකෙකි.	සත්‍ය විභාගය පිටු එකොළොසක් පමණ ය. පාළි පොතට වඩා සවිස්තර ය.
බාරසමකච්ඡය	**බාරසමකච්ඡය (පඨම භාගය)**
විශුද්ධි විභාගය දෙපිටෙකි.	විශුද්ධි විභාගය වේ. පිටු 15කි.
තෙරසම නිබ්බාණකච්ඡය	**බාරසම කච්ඡය (දුතිය භාගය)**
පිටු සතරෙකි.	මෙහි අගට ගාථා පෙළෙකි. පිටු 23ක් පමණ ය.

මෙසේ පොත් දෙක සසඳා බැලීමේදී පාළිපොත සංක්ෂිප්ත බවත් චීන පොත විස්තෘත බවත් පෙනේ. කෙළින් ම පාළිපොතෙන් චීන බසට නගන ලද නම් චීන පොත මෙ තරම් ලොකු විය නො හැක්ක. මේ දැනට සම්බ වී තිබෙන පාළි පොත මුල් ම විමුත්තිමග්ගය වී නම්, චීන භාෂාවට නගා ඇත්තේ ඒ මුල් පොතට ම කරන ලද විස්තරයෙකි. එය විමුත්තිමග්ගයට කරන ලද පැරැණි සිංහල ව්‍යාඛ්‍යානයක් වියැ යුතු ය. නො එසේ වැ පැරැණිතම විමුත්තිමග්ගය (චීනයට පෙරළීමට ගත් පොත) හෙළ බසින් තුබුණෙක් වී නම් දැන් ලැබී ඇති පාළි විමුත්තිමග්ගය ඒ පැරැණි සිංහල විමුත්තිමග්ගය සැකෙවින් පාළියට නගා සැකැසුණක් විය යුතු.

විසුද්ධිමග්ගයේ චරියාවිභාගයේ ඒකච්චවාදයෙක් දැක්වේ. 'ඇතැම්හු මෙසේ කියත්' යී දැක්වුණේ **උපතිස්ස** තෙරුන් පැ මතයක් ගැනැ යැ යි ටීකාකාරයෝ සඳහත්: **''එකච්චෙ'ති උපතිස්සත්ථෙරං සන්ධාය ආහ. තෙන හි විමුත්තිමග්ගෙ තථා වුත්තං''** යනුවෙනි.

පැරැණි සවිස්තර විමුත්තිමග්ගයේ සංක්ෂිප්ත පාළිපරිවර්තනය හැටියට හෝ පසු ව පහළ වූ සවිස්තර සිංහල විමුත්තිමග්ගයේ මුල් පොත හැටියට හෝ, මේ කවර සැටියෙන් වුව ද බොහෝ පෙරැ බුදුගොස් මහතෙරුන් මෙහි එන්නට ද පෙරැ වූ විමුත්තිමග්ගය දැන් ලැබී ඇත. විසුද්ධිමග්ගය හා සසඳ බැලිමේ දී කිසිසේත් විමුත්තිමග්ගය ගුරුපොත කොට ගෙන විසුද්ධිමග්ගය රැසැයුණැ යි කිව නොහැක්ක. එක ම ධර්මසම්ප්‍රදායයක් අනුගමනය කරන්නවුන් දෙදෙනකුන් එක ම අට්ඨකථා ඇසුරෙන් රැසැයූ දෙපොතෙක කරුණු සමාන ව එනු ආශ්චර්ය නො වේ. එය එකෙකින් අනෙක පිටපත් කිරීම නො වේ. දෙක ම එක් අටුවා ඇසිරෙන් කිරීම ය. නිබන්ධනය දික් වන බැවින් මෙ පමණින් නවතිමු. මේ පැරැණිතම දුර්ලභ ග්‍රන්ථය මහාදයාසයෙන් සොයා ඉදිරිපත් කළ අස්ගිරි වෙහෙරැ වැසි ගල්කැටියාගම සිරිරතනජොති මහතෙරණුවනටත් කරල්ලියැද්දේ සිරි රතනපාල මහතෙරණුවනටත් සියලු බෞඩ ලෝකයාගේ සාදර ගෞරව ස්තූතිය පිරි නැමෙති යි සිතමු.

තව ද මෙහි අගට තිබෙන **'විමුත්තිමග්ගො උද්දානං'** යන්න යටතේ ඇති ගාථා රාශිය පාලි විමුත්තිමග්ගයට අයත් නො වේ යැයි හැඟේ. බඹරගලේ පොත නමින් හැඳින්වෙන විදර්ශනා පොත අගට **'ජාලො මහාපාලො—පෙ—ධාරණී'ති** ධාරණී මන්ත්‍රයෙක් එයි. මෙයිනුත් මුල පටන් කොට ම පොතෙහි එන භාවනා-ක්‍රමයෙනුත් මෙය මන්ත්‍රයානය ද ඇසිරෙන් ලක්දිවැ ඇති වූ ක්‍රමයෙකැයි හැඟේ. විමැසියැ යුතු.

මෙයට,

විද්‍යොදය විශ්ව විද්‍යාලයය, බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්ථවිර
ගංගොඩවිල,
31.10.63.

විඥාපනය

විමුත්තිමග්ගො

සසර දුකින් මිදීම විමුත්ති යයි. පස් වැදෑරුම් විමුත්තිය ලැබ ගන්නා පිළිවෙත විමුත්ති මාර්ගය නම් වේ.—මෙකී මිදීමේ උපදෙශය දක්වන ග්‍රන්ථරත්නය ද විමුත්ති මග්ග නම් වේ.—ලක්දිව සම්බුදු සසුන පිහිටි ලහදීම නිපයුණු මේ අති ශ්‍රෙෂ්ඨ ග්‍රන්ථ රත්නය පිළිබඳව අස්ගිරි තල්පොත ආදී ඉපැරණි ලිපි අනුසාරයෙන් හා ආචාර්ය පරම්පරාගත කථානුසාරයෙන් ද, කර්තෘ කාලාදිය නිගමනය කට හැකිව තිබෙන්නේ මෙසේය :—

ශ්‍රී ලඞ්කාවීපයේ ශ්‍රී සම්බුඩ ශාසනය පිහිටීමෙන් පළමු වන සිංහල මහරහතුන් වහන්සේ වූ දෙවන පෑතිස් මහිපාලයාණන්ගේ භාගිණෙය්‍ය වූ මහාරිට්ඨ උපතිස්ස මහතෙර මාහිමියන් වහන්සේ සව්යාචාර්ය දීපප්පසාදක මහා මහින්ද මාහිමියන් වහන්සේගෙන් ලැබුනු උපදෙස් සටහන් කරගැණීම් වශයෙන් මේ උතුම් ගත් රුවන සපයා වදළ සේක. විසුඩි මාර්ගයට බොහෝ පැරණි වූ විමොක්ෂ මාර්ගය වන මේ පොත් වහන්සේ එකල පැවති හෙළ බසින් රචිත ව තිබී හෙළ අටුවා පාළි භාෂාවට පරිවර්තනය වණු සමඟ පාළියට නැඟුණේ විය. පාළි භාෂාවට නැඟුන පසු සිංහල අටුවා ග්‍රන්ථයන්ට පැමිණි දුර්දශාවම මේ විමුත්ති මග්ග නම් කමටහන් සංගහවටත් පැමිණි බව සිතිය හැක. එසේ හෙළ බසින් නිපයුණ ගත්රුවන අදර්ශනයට පැමිණිය ද පෙළ බසින් වූ විමුත්ති මග්ගය මහා විහාරවාසී මහ තෙරුන් වහන්සේලා කට පාඩමින් ගෝල පරපුරෙන් පරපුරට ආරක්‍ෂා කරගත් සේක. මහා විහාරස්ථානයාගේ ආරම්භයට ආසන්නයේ දී ම නිපයුණු මේ ග්‍රන්ථ රත්නය අවුරුදු දෙසිය අටළොස (218ක්) මුඛපාඨ වශයෙන් රැකගන්නා අතර මිහිඳු මාහිමියන් වහන්සේගේත් මේ ග්‍රන්ථ කර්තෘ භදන්තාරහන්තමහාරිට්ඨ උපතිස්ස මාහිමියන් වහන්සේගේත් ප්‍රශිෂ්‍යරත්නයක් වූ "කුන්තගත්ත තිස්ස" නම් රහත් මහතෙරුන් වහන්සේ අනුරාධපුර ථූපාරාම මහාවිහාරයේ ගණ දෙටුව වැඩ විසූ සේක.

විනයධරාග්‍ර උපාලි මහරහතන් වහන්සේගේ පටන් ශිෂ්‍යානුශිෂ්‍ය ථෙරවංශයේ මුන්වහන්සේ සත්තිස් (37) වැන්නා වූ සේක. බුඩ වර්ෂ හාරසිය පනස්හතර (454) පමණේදී මාතලේ අළුලෙන් විහාරස්ථානයේදී පැවැත්වුණු ග්‍රන්ථාරොපන සඞ්ගායනාවේ මූලසුන හොබවා වදළෝ මුන්වහන්සේ ම ය. සම්බුඩ ධරමාණ කාලයේ පටන් මුඛපාඨ වශයෙන් රැකගත් අටුවා සහිත ත්‍රිපිටක පාළිය එහිදී ග්‍රන්ථාරූඪකර සතර වැනි මහා සඞ්ගායනාව නිමවා මුන්වහන්සේ දිඹුලාගල කන්ද වෙත වැඩම වූසේක. ග්‍රන්ථාරූඪ වූ ත්‍රිපිටක ධර්මය සමග මේ පොත් වහන්සේගේ ද පිටපත් ථෙරවාද බුඩාගම පවත්නා අන් රටවලට ද ගෙණ යන ලද්දේ ඉන්පසුවය. මුන්වහන්සේ එසේ දිඹුලාගල පව්වට වැඩමවා ගල්ලෙනක වැඩසිටි බැවින් උදුම්බරගිරි ආරණ්‍ය සේනාසනය ඇති වූයේය. භස්තසාර වස්තුවක් වූ මේ විමුත්ති මග්ග නම් විමොක්ෂමාර්ගෝපදෙශය ද උන්වහන්සේ සමග දිඹුලාගල තපො වනයට පැමිණියේ, එහි වැසි තපොධනීන් වහන්සේලාගේ උද්ග්‍රහණධාරණය කරණ උතුම් රත්නයක් සේ අනිවාර්ය විෂයක්ව පැවතුනේය.

මහ විහාරයෙන් දිඹුලාගලට

දෙවන පැතිස් මනුජෙන්ද්‍රයන් විසින් මහාමහෙන්ද මහරහතුන් වහන්සේ සඳහා කරවා පිළිගන්වන ලද සෙනසුන මහාවිහාරය නමින් ම ප්‍රකට විය. එකී මහ විහාරය ආරම්භයේ පටන් අවුරුදු දෙසිය අටළොසක් ඉක්මුණු පසු මිහිඳු මාහිමියන්ගේ ශිෂ්‍ය පරපුරට අයත් කුන්ත ගත්ත තිස්ස මහරහතුන් වහන්සේ මහා විහාර ථූපාරාමයෙහි ගණ දෙටුව වැඩ සිටි බව පෙණේ.

විනයධරාග්‍ර උපාලි මහරහතුන් වහන්සේගේ පටන් ස්ථවිර පරම්පරා වශයෙන් සත්තිස් වැන්නා වූ මුන්වහන්සේගෙන් බු.ව. 454 ඉක්මුණු කල මේ දිඹුලාගල ආරණ්‍ය වාසය සැකසුනේ ය යි කල්පනා කටහැකි වේ. මෙතරම් කලක් ආයු විඳිනය කළ නිකෙලසී ආර්‍ය්‍යයන්ට වාසස්ථානය වූ මේ උතුම් සෙනසුන ගැණ යථාතත්වය "වූ" සැටි විදහා පෑම එතරම් පහසු නොවන බව නැණැතියෝ දනිති. එහෙත් අපට සපයා ගත හැකි තරමින් කරුණු ටිකක් පළකරණ අපි ඌණපූරණය උගතුන්ට පවරා තබමු.

දිඹුලාගල වනාහී පොළොන්නරුවේ සිට සැතපුම් පසළොසක් පමණ දුරින් මඩකලපුව දෙසින් සමතලා බිම් පෙදෙසක පිහිටි දර්ශනීය කඳු ගැටයකි. මුහුදුමට්ටමේ සිට අඩි 1,700 ක් පමණ උස කන්දකි. පොළොන්නරුවේ සිට මඩකලපුව දෙසට යන්නෙකුට මනම්පිටිය නම් කඩපලින් හැරී ගොඩ අතට සැතපුම් තුණ හතරක් යන විට මේ ඓතිහාසික කඳුවැටිය දක්ක හැකි වෙයි. රථවාහණයකින් යාමට තරම් එහි මාර්ගය තවම දියුණු නැතිකම පාඩුවකි.

අපරට ඉතිහාසයේ මුල් කාලයේ පටන්ම මේ පව්ව ගැණ සඳහන් වාර එමටය· මහාවංශයේ පණ්ඩුකාභය කුමරු පිළිබඳ කථා ප්‍රවෘත්තියෙහි සඳහන් වන "ධූමරක්ඛ පබ්බත"—දුම්රක් ගල—මෙයයි. එහිම සඳහන් තුමබරියඩ්ගණ විල ද මෙහි නැගෙණකෙණෙකුට පසකින් දකින්ට ලැබේ.

මේ පර්වතය අසල ගස්වැල් නැති තැනිතලා බිම් පෙදෙස දකුම් කළුය. මහාවංශයේ කී ධූමරක්ඛ පබ්බත ශබ්දය එහි ටීකාවෙහි ධූමරක්ඛාග යන පදය උදුම්බර පබ්බත කියා තේරුම් කිරීමෙන් හැඟෙන්නේ දුරාතීතයේ දුම්රක් ගල ය යි කිවූ නමුත් ටීකාව ලිවූ කාලයේ දී උදුම්බර ගිරි (දිඹුලාගල) නමින් තිබුන බවයි. දෙවන පැතිස් මහරජු දවස ලක්දිව සෙනසුනක් පාසාම වෙහෙර විහාර කරවූ බව බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන්ව ඇත්තේය. එසේ බු.ව. 236ටත් 276ටත් අතර කාලයෙහි මේ සෙනසුන ආරම්භ වී යයි කල්පනා කරණු ලැබේ. සාධකයක් නම්—මේ දෙවන පැතිස් මහරජු විසින් සිව් දිගින් වඩින මහ සඞ්ඝයා වහන්සේගේ ප්‍රයෝජනය සඳහා කරවා පූජා කළ ගල්ලෙන් විහාර අතුරෙන් දඹුළු ලෙන ද එකක් බව එහි ශිලා ලිපියක සඳහන් වේ. එහෙත් වළගම් අබා රජු දවස වන විට යථොක්ත දඹුළු ලෙණ වන සතුන් ගේ ලැගුම් ගෙය බවට පත්ව තිබුණේය· එලෙසින් දෙවන පැතිස් රජතුමන් විසින් ම කරවන ලද නමුත් දිඹුලාගලට ද සිදුවී ඇත්තේ එවැන්නක් ම බව මේ අනුව පිළිගත යුතුව තිබේ.

බුදු වසින් අවුරුදු 454ක් ඉක්මුණු කල මාතලේ අළුලෙන් විහාරයේ දී ත්‍රිපිටක ධර්මය සඞ්ගායනා කොට ග්‍රන්ථාරූඪ කිරීමට රැස්වූ පර්‍ය්‍යාප්තිධර පන්සියක් පමණ ක්ෂීණාශ්‍රවයන් වහන්සේ අතුරෙන් ප්‍රමුඛස්ථානය ගත් ශුබ නුවර මහ විහාරය බද ථූපාරාම වාසී යට කී කුන්ත ගත්ත තිස්ස මහරහතුන් වහන්සේ සඞ්ගායනා කටයුතු නිම වූ පසු එයින් නික්ම දිඹුලාගලට වැඩමවා එක් ගල් ගුහාවක සමවත් සුවයෙන් කල්යැවූ සේක.

එපවත් ඇසූ වළගම් අබා රජු සිව්රහ සෙන් පිරිවරා එහි පැමිණ තෙරණුවන් වැඳ සමු ගෙණ වන ගතව තිබුණු එම ස්ථානය එළිපහළි කරවා ඒ ගිරි ලෙණ ඇතුළු ගල්ගුහාවල කටාරම් කොටවා පිරිවෙන් (භාවනාඝර) සහිත ආරණ්‍ය සෙනසුනක් කරවා එහි වසන බුඩ පුත්‍රයන් වහන්සේගේ සිව්පසය පිණිස ගම් කෙත් ආදිය සහිත පරිවාර ජනයන් පූජා කළ බව අස්ගිරි තල් පොතෙහි සඳහන් ව ඇත්තේය.

ඉන්පසු උන්වහන්සේගේ ශාසන බෑඩු පරම්පරා යතත මලියදෙව මහරහතුන් වහන්සේ ද එකී වැදුමුතී නම් ගල්ලෙණෙහි වැඩ විසූ බව රසවාහිණියෙහි හා සඩර්ම ලඩකාරයෙහි මෙසවණී වසතු වෙහි දක්වේ. මෙසේ පුනරාරබඩව දියුණු තියුණු වෙමින් පැවති මේ දිඹුලාගල අරණ්‍යය ද, බු.ව. 1555 සිට 1593 දක්වා වූ අටතිස් වස තුළ පැවති සතුරු ආක්‍රමනවලින් ද, බු.ව. 1593 සිට 1609 දක්වා රට නිදහස් කරගැණීම සඳහා සිංහලයන් යෙදූ ඇතැම් යුඩොපක්‍රම වලින් ද සෙසු ලක් වැසි ගිහි පැවිදි ජනතාව මෙන්ම මෙද ඒ සියලු ආක්‍රමණයන්ට ලක්වී ය යි අසනු ලැබේ.

එබැවින් එවැනි අවසථාවල දිඹුලාගල විසූ භික්ෂුහුද වන ගිරිදුර්ගාදිය හා විදෙශයන්ගේ ද පිහිට සෙවූ බව සිතිය යුතුය. කෙසේ හෝ සතුරන් පරදවා ජය ගෙණ බු.ව. 1609 දී රජ සිරි පැමිණි I විජයබාහු රජතුමා රාමඤ්ඤ රටට ගොස් සිටි මහ සඩඝයා ගෙන්වා ගෙණ කලක් අතපසු වී තිබුණු භික්ෂු උපසම්පද කර්ය කරවූ තැන් පටන් ලක්දිව සෙසු සිඩස්ථාන මෙන්ම දිඹුලාගල අරණ්‍ය සෙනසුන ද දියුණු වෙන්ට පටන්ගත් බව පෙණේ. ඉන්පසු I විජයබාහු රජුගේ පුත්‍ර I වික්‍රමබාහු රාජ මහෙෂිකාව වූ ද ජයබාහු රාජ මාතෘ වූ ද සුන්දර මහදෙවින් විසින් සවකීය පුත්‍ර ජයබාහු රජු දවස පන් සියක් මහ සඩඝයාට නිවාස වූ මේ විහාරයෙහි සඳ මහ ලෙණේ සිට ගිරි ලෙණට යාම පිණිස ගල්පඩි කැපප වීම හා පිළිම දගැප් මහබෝ පිහිටුවා මේ සිඩ ස්ථානයෙහි කටයුතු රාශියක් කරවූ බවද අමුතුව කර වූ ලෙණට කලිඟු ලෙණ ය යි නම් තැබූ බවද එහි තිබෙන ශිලා ලිපියෙහි සඳහන් වේ.

ඒ ශිලා ලෙඛනය

ඔකාවස් රජකුලෙන් නිපන් සුදෙනා පරපුරෙනා හිරුගොත් කුලෙන් අභිනත වූ රුසිරින් සිරි දිනූ දෙඹටුණු මැද උපන් විකුම්බා නිරිඳුහට අග මෙහෙසුන් වැ ගජබා දේවයන් වැදූ සුන්දර මහදේවින් වහන්සේ පන් සියයක් මහ සඟනට ආවාස වූ අප මුනි රජහු සිරුරු ද පිහිටි දිඹුලගලැ සඳමහ ලෙණින් ගිරිමහ ලෙණ දෙ අතුරෙන් මහ දුණු එව් දම් එලි යන මිනිසුන්ගේ දුක බලා ගල් හස්වා මහ පවත්කොට ලෙණැ පිළිම දගබ් මහබෝ පිහිටි වා කලිඟු ලෙණ යැය් නම් තබා ජයබාහු වත් හිමියන් වහන්සේ සත් විසි වන හවුරුදු පොසොනැපුර පොහොයැ දෙමල පැය සිරි කුශලාන් කරවා තවත් පුදනු කොට ලොව පවත්නා තාක් කලට දුන් බවට සුන්දර දේවීමු. යනුයි.

බු.ව. 1703 දී රජ පැමිණි I පරාක්‍රමබාහු ලඩකාධිරාජයාණන් දවස මහා විහාරිය සුපෙසල ශික්ෂාකාමී මහා ප්‍රාඥයන් වහන්සේලා වැඩ සිටියේ ද මේ ස්ථාන යෙහි ය. එහෙයින් මහ පැරකුම්බා අධිරාජයා විසින් කරවූ ශාසන ශොධනයෙහි ප්‍රමුඛස්ථානය එකල එහි වැඩසිටි යටකි කුනත ගතත තිසස රහත් මහතෙර පරපුරෙන් පැවත ආ මහා කසසප මහා ස්ථවිරයන් වහන්සේට ලැබුණේය. ඒ ශාසන ශොධනයෙන් පසුව මහ රජු විසින් මුන්වහන්සේ මුල්ව කතිකා වතක් ද සම්මත කරවූ බව පැහැදිලිය.

මහ පැරකුම්බා අධිරාජයා විසින් එහි කරවූයේ ය යි කියන මණ්ඩපය අනුරාධපුරයෙහි ලෝවාමහපාය සේ දුන් ගල් කණු පමණක් ශෙෂව තිබෙන දකුම් කළු ස්ථානයකි. චාන්‍ද්‍රව්‍යාකරණයෙහි පරිවාර ග්‍රන්ථයක් වූ " බාල බොධිනී " නම් සකුවියරණ ග්‍රන්ථය නිපයූයේ මුන්වහන්සේ විසිනි. අභිධර්මාර්ථ සඩග්‍රහවට ටීකාවක් ලියන ලද්දේත්

මුන්වහන්සේ විසිනි. සාරත්‍ථදීපනී නම් විනය ටීකාව නිපදවූ පොළොන්නරු පුර දෙව්රම් වෙහෙර වැඩවිසූ ටීකාචාර්‍ය සාරිපුත්‍ර මහා ස්ථවිරයන් වහන්සේ ද දිඹුලාගල සභාවලියේ දීප්තිමත් පඩිරුවනකි. ටීකාචාර්‍ය සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ අතින් ම ලියවුණු අභිධම්මත්‍ථ සඞ්ගහසන්නයෙහි අවසනැ තම ඇදුරු ටීකාචාර්‍ය දිඹුලාගල මහා කාශ්‍යප ප්‍රථම සඞ්ඝරාජයන් වහන්සේ ගැණ වර්‍ණනාකර ඇත්තේ චාන්‍ද්‍ර ව්‍යාකරණයෙහි චන්‍ද්‍රාචාර්‍යයන් වැනි ය යි ද පාණිනීය ව්‍යාකරණයෙහි පාණිනි රුසිවරයා වැනි ය යි ද වෙනත් තර්‍ක තන්ත්‍රාදියෙහි ඒ නිර්‍මාතෘ වරයන් වැනි ය යි ද කවිත්‍වයෙන් කාලිදස වැනි ය යි ද කියාය. ථෙර වංශයෙහි ශාස්ත්‍රාගමධාරී විදර්‍ශනාධුරීන භික්ෂූන්ගේ ප්‍රධානතම ආවාසය වූ දිඹුලාගල ආයතනය බු.ව. 1760 දී ඇති වූ මාඝ විප්ලවයෙන් විනාස වූ බව කිය යුතුය.

මෙසේ බු.ව. 454 දී පමණ ඇරඹී මහත් දියුණුවකින් පැවති මේ උසස් සෙනසුන මාඝ වියවුල නිසා එකල එහි වැඩ විසූ දිඹුලාගල දීපඞ්කර මාහිමියන් ප්‍රමුඛ බුඬ පුත්‍රයන් වහන්සේලා යාපව් නුවරට ආරක්‍ෂාව සඳහා වැඩම කළහ.

යාපව් නුවර අස්ගිරි විහාරය

දඹදෙණි පුර විසූ II විජයබාහු මහ රජතුමන්ගේ ශුභ නම් වූ සෙනෙවියෙකු විසින් යාපව් පුරයේ දකුණු දිග අවඡ පබ්බත (වලස් ගල) නමින් ප්‍රසිද්ධ වූ කඳු පසෙක වන සෙනසුනක් කරවා උන්වහන්සේලාට පුදන ලදි. සුභ පබ්බත නම් මහ කඳු වැටියේ ම එක් අංශයක් වූ මේ වලස් ගල කරවූ අරම අස්ගල, අස්ගිරි නමින් ප්‍රසිඬ විය. බු.ව. 1760 පමණේ දී ඇරඹුණු යාපව් නුවර අග්‍ර රාජධානියව පැවති සමයෙහි උසස් දියුණුවකින් ද ඇතුගල්පුර IV පැරකුම්බා සමයේ දී මඳ දියුණුවකින් ද පැවතුණු අස්ගිරි ආරණ්‍ය සෙනසුන ඉන්පසු ක්‍රමයෙන් පාළුවී ගිය බව පෙණේ. අනුරාධපුර ථූපාරාම මහා විහාර යෙන් දිඹුලාගලට ද දිඹුලාගලින් යාපව්වේ අස්ගිරි විහාරයට ද මේ පොත් වහන්සේ ද වැඩම විය. එහිදි ද පාරම්පරික මහඟු රත්නයක් ලෙස ආරක්‍ෂා කරමින් අභ්‍යාශ කළහ.

මහනුවර අස්ගිරි විහාරය

ලක්දිව ග්‍රාම ජනපද ප්‍රදෙශා දී සීමා පිහිට වූ පණ්ඩුකාභය මහීපාලයා විසින් පිහිටුවන ලද ත්‍රි සිංහල මායිම් ලකුණ පිහිටි ගලක් නිසා හිංකඩ = සිංකඩ = සෙංකඩ වශයෙන් නම් පෙරළී කලින්කල ශාඛා නගරයක් ලෙසත් යුද කඳවුරක් ලෙසත් පැවති සෙංකඩගල් පුරය මහා නගරයක් සේ සකස් කළ සිරිවර්‍ධන සෙනෙවි රදුන් විසින් නගරයක අඞ්ග සම්පූර්‍ණ වීමට විහාරාරාම අවශ්‍ය සේ සලකා නගරයට උතුරු දිග මනරම් කඳුගැටයක රමණීය භූමි භාගයක් දැක එහි බුඬ පුත්‍රයන් වහන්සේගේ වාසයට සුදුසු රාත්‍රිස්ථාන, දිවාස්ථාන, චඞ්ක්‍රමන, වැසිකිළි, කෙසකිළි, පැන්හල් ආදී සියලු විහාරාඞ්ග නිමවා ඒබව මහ රජතුමාට දන්වා යැවිය.

මෙ නිවේදනයලත් මහ රජතුමා බෙහෙවින් සතුටුව ඉහත සඳහන් දිඹුලාගල දීපඞ්කර මාහිමියන් වහන්සේගේ ශිෂ්‍ය පලාබත්ගල ධර්‍මකීර්ත්ති මාහිමියන් වහන්සේට සෙංකඩ ගල්පුර අභිනව ආරාමයේ විසීමට සුදුසු භික්‍ෂූන් ලැබෙන ලෙස ආරාධනා යැවිය. රාජාරාධනය ලත් දම්කිත් පා මොක් මාහිමියෝ මහා සඞ්ඝ සභාව රැස්කරවා ඒ බව සැල කළ සේක. එවිට මහ සඞ්ඝ සම්මතයෙන් පලාබත්ගල වනරතන යතීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන සද්ධිවිහාරික මීගස්වැවේ මෙධඞ්කර හිරිපිටියේ කස්සප, කෝංගස් වැවේ ධම්ම කිත්ති, වලස්වැවේ උපතිස්ස යන තෙරුන් වහන්සේලා පස්නම ද වේරවෙල කොලිත සාමණේරයන් වහන්සේ ද තෝරා රාජදූත පිරිසට භාර කළහ. යාපව් නුවර සිට ඇතුගල් පුරය දක්වා ද ඇතුගල්පුර (කුරුණෑගල) සිට සෙංකඩගල දක්වා ද මහ මහ සරහා රාජකීය පූදපෙළහරින් සෙංකඩගල සභාවලියේ ආදි පුරුෂයන් වහන්සේලා වැඩමවා ගත්හ.

උන්වහන්සේලා යාපව්වේ සිට කුරුණෑගලට වඩමවා සෙංකඩගලට ගමන පිළියෙළ වන තුරු ඇත්ගිරි ලෙණ දැන් ඇත්කඳ විහාරයේ වැඩ සිටි බවත් අද තෙක් එකී ඇතුගල්පුර ඇත්කඳ විහාරය උන්වහන්සේලාගේ සඟවලියේම භික්ෂූන් වසන බව කිය යුතුය.

ඉන්පසු ඇතුගල්පුර විසූ ශ්‍රී ලඞ්කාධිපති IV පැරකුම්බා රජතුමා මහනුවර අස්ගිරි ආරණ්‍ය සේනාසනයට මායිම් පිරිසිඳින්නේ නැගෙණහිර දිගින් උඩවාහල වත්තේ මඩකඩ ද දකුණු දිගින් කිතුල්ගොල්ලේ ඇල්ල හා බහිරව කන්ද ද උතුරු දිගින් මහයායේ ඇළ ද බස්නාහිර දිගින් නියඳ ගල ද යන සතර මායිම් තුළ පිහිටි බිම්මාණය අස්ගිරි අරණ්‍ය සේනාසනය වශයෙන් සඞ්ඝභොගකොට පිදූහ. මෙසේ මේ බිම් පෙදෙස අස්ගල් අරණින් වැඩම වූ තෙරවරුන්ට පිදූ බැවිනුත් අස්ගල් අරණ වැසි මහ සඞ්ඝයාගේ වාසස්ථානය වූ බැවිනුත් අස්ගිරි විහාරය කියාම නම් කරණ ලද්දේ විය.

බු.ව. 1855 වෙසඟ මැදිපෝද සෙංකඩගල සිරිවඩන පුරයේ අස්ගිරි මහ විහාරය ආරම්භ වූ බවත් එද එහි වැඩම වූ සඟ දෙවු මහ තෙරුන් වහන්සේ විනයධරාග්‍ර උපාලි මහ රහතුන් වහන්සේගේ එක් සිය දෙසාළිස් වන ප්‍රශිෂ්‍යරත්නය හෙවත් ථෙර පරම්පරා වසයෙන් 142 වැනි පරම්පරාව බව අස්ගිරි තල්පොතෙහි සඳහන් ව ඇත්තේය. මෙලෙසින් මේ පොත් වහන්සේ ද හදන්තාරහන්ත අරිට්ඨාප තිස්ස මාහිමියන් වහන්සේ පටන් එකසිය හතළිස් දෙවෙනි පරපුරත් සමග මහනුවර අස්ගිරි මහ විහාරයට වැඩම වූ බව සැලකිය යුතුය.

බු.ව. 1855 වෙසඟ මැදි පෝද අස්ගිරි විහාරය ආරම්භ වූ තැන් සිට ස්‍යාමොපසම්පදව දක්වා ථෙර පරම්පරා අට විස්ස (28) කි. ස්‍යාමොපසම්පදවේ සිට අදතෙක් ථෙර පරම්පරා ගත වූයේ සතළොස (17) කි. මෙසේ මහනුවර අස්ගිරි විහාරයට වැඩම වූ ද සිට පන්සාළිස් පරපුරකින්ම මේ පොත් වහන්සේ ආරක්ෂා වූ බවත් අද අස්ගිරි විහාරයේ වැඩ සිටින්නේ මිහිඳු මා හිමියන් වහන්සේගේ 185 වෙනි ථෙර පරම්පරාවේ ගෝලයන් බවත් පැරණි ලියුම් අනුසාරයෙන් පැහැදිලිව පෙණේ.

මෙසේ අස්ගිරි විහාරවාසී යතිශ්වරයන් වහන්සේලා මහා විහාරවංශයේ ගුරු පරම්පරා නොසිඳ සිය පණ මෙන් රැකගණ එන අතර අපරට අන්හැම දේමෙන්ම අස්ගිරි සඟවලිය ද පිරිහීමට හැරුණේය. සමථ විදර්ශනා භාවනා වැඩීම තබා පොහෝ පවුරුණු ආදි විනය කර්ම්යනුදු නැති විය. උපසපන් භික්ෂූන් නැතිව සාමණේරවරු පමණක් ශෙෂව දෙවාරයක්ම පැවැත්තේය. ඒ හෙරණුන්දලා ශිල භාවනාදියෙහි නිරුත්සුක වුවත් බණ දහම් භාෂා ශාස්ත්‍ර දැනගත් පඬිවරු සහිත පිරිසක් වූ හ. විචක්ෂණ බුද්ධිමතුන් උන්වහන් සේලා අතර සිටි බව පෙණේ. එඑ පාළි සංස්කෘත භාෂාන් නැකැත් වෙදකම් යන්ත්‍ර මන්ත්‍රාදී බාගිර ශාස්ත්‍රත් පුහුණු කරමින් ගිහියන් මෙන් දිවි රැකගැණිමත් තමන් පැවදි ව සිටින්නේ ශිල භාවනා දි ගුණ දහම් වැඩීමට නොව ස්ථාන සතු දේපොල රැකීමට ය යි සිතා මෙන් හැසිරීමත් නිසා බුඩපුත්‍රයන්ට ඇමතිය යුතු ගරු නම් කියන්ට අකැමැති වූ එද බෞඩයා ඒ හෙරණුන්දලාට ගණයෝ හෝ ගණින්නාන්සේලා ය යි නම් කරගත් බව පෙණේ. අදත් සමහරු භික්ෂූන් වහන්සේලාට අවඥ මුඛයෙන් මේ නම කියති. ගණය නම් සංඝාරාමය හෝ සඟ පරපුර සමූහ ය යි. සඟ පරපුරෙන් පැවතෙන්නා හෝ ආරාමවාසියා යන තේරුම ලැබෙණ බැවින් ගණයා යනු අපභාස වචනයක් නම් නොවේ. මෙසේ පිළිවෙත් පිරිම හා ධර්මශාස්ත්‍රාදිය පිරිහී පැවති කාලවල මේ පොත් වහන්සේ පෙට්ටගමක පතුලටම වී නිසංසලව සිටි බව පෙණේ. එවැනි අවාසනාවන් කාලයක සෙංකඩගල සිරිවඩු පුරයෙහි සිංහාසනයට පැමිණි කිත්ති ශ්‍රී රාජසිංහ නරනාථයා බුඩ ශාසනයෙහි මහා සහායයෙකු වීම නිසා ස්‍යාම දේශයෙන් මහා මහින්ද වංශික තෙරවරුන් වැඩමවා පැවිදි උපසම්පද කර්ම් ඇති කරවා ශාසන ප්‍රතිපදවන් පුහුණු කරවමින් ලක් බුදු සසුන නැවතත් බැබල විය. භික්ෂූන්වහන්සේ දැන උගත් කමින් ද පිළිවෙත්

සරුකමින් ද යුක්ත කරණු සඳහා විදර්ශනා පිරිවෙන් ද ඇති කළේය. අස්ගිරියේ රාම විහාරය, මල්වතු ධම්මිකාරාමයේ නාග විමානය ද බඹරගල රජමහා විහාරය ආදී කිප පලක විදර්ශනා පිරිවෙන් ඇති කරවා දෙවෙහෙර භික්ෂු සාමණේරවරුන්ට හා සැදැහැති උවසුවන්ටත් සමථ විදර්ශනා භාවනා ක්‍රම උගන්වන්ට පටංගත් නිසා මේ පොත් වහන්සේට කළඑළි බසින්ට අවස්ථාව සැලසුනේය.

නමුත් පාළි භාෂාවෙන් කමටහන් පිළිබඳ විස්තර වාසගම්නුත් උද්දන හා විධාන ක්‍රම ගාථාවලිනුත් යුක්තව තිබුනු නිසා ගුරුවරයෙක් නැතිව උපචාර විධි පූර්වකරණ පූර්ව කෘත්‍යාදි භාවනාක්‍රම දත නොහැකිසේ දුස්කර තත්ත්වයක පැවැත්තේය. බු.ව. 1968 පමණේ දී සියම් රටට ගෙණ ගොස් කාම්බෝජිය අකුරෙන් ලියාගණ තිබී නැවත මෙහි ගෙණ ආවේත් මේ පොතේම කොටසකි. එහි කාම්බෝජ අකුරෙන් ලියා තිබීම හැර අන් වෙනසක් නොවිය. ඒ නිසාත් පැරණි පොත දිරාපත්ව භාවිතයට දුෂ්කරව පැවති නිසාත් අස්ගිරිය හා බඹරගල දෙව්දසුන් පිරිවෙන් හිමි රඹුක්වැල්ලේ ශ්‍රී රතනජෝති විදර්ශනාධුරයේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සියම් රටින් මෙහි වැඩම වූ තෙර වරුන්ගේත් උපදෙස් ඇතුව භාවනාරම්භයේ තුණුරුවන් වැඳීමාදි ආදිකර්මික විධි විස්තර ඇතුළත් කොට භාවිතයට පහසු අයුරින් විධාන ගාථා විස්තර කරමින් මෙහි තුංවෙනි කොටස සපයා මුල් පොතට එකතුකර වදළේය. පැරණි පොතෙහි (මුල දෙකොටසෙහි) හොඳටම දිරා ගොස් තිබුනු පත්ඉරු වෙනුවට පත්කට්ටු කිපයක් ලියා එකතු කළ සේක. එයින් මේ පොත භාවිතා කරන්නවුන්ගේ පහසුව මදක් සැලසුන නමුත් සම්පූර්ණ පහසුවක් නොවිය. පුහුණු ගුරුවරයෙකු නැතිව නියම උසස් භාවනාවක් දියුණු කරගන්ට තවම අපහසු තත්ත්වයේ පවතී.

මෙසේ ග්‍රන්ථ කර්තෘන් වහන්සේගේ පටන් දෙසිය පණස් තෙර පරපුරකින් ආරක්ෂිත වූ ග්‍රන්ථ රත්නය කිත්ති ශ්‍රී රාජසිංහ මහරජු දවස තුංවෙනි කොටස එකතුවීමෙන් මඳ සංස්කරණයකින් එළිබැස සිටි නමුත් එතුමාගේ අභාවයත් සමග ම නැවතත් පෙරදී වැඩවිසූ පෙට්ටගම් පතුල් කරාම වැඩමවන්ට සිදුවූ බව පෙණේ. සැදැහැවත් ඒ නරපතියාගේ මහදයාසයෙන් සකස්කර වූ සඟපරපුර එතුමා නැති වූ විගසින් ම ලාභ සත්කාරයෙන් හා පිරිස වැඩිවීමෙන් බලතල ඇතිවූ නිසා ඇතැම්හු ඒ පිළිවෙත අත්හැර දැමූහ. ධනයට ප්‍රධානකම්වලට අන්ධ සූත්‍ර පුහු නායක නම් වලට ගිජුවී දේපොල රැකීම මහණදම් පිරීමට වඩා උසස් කොට සලකන්ට වූහ. අලිගිලි ගිවුලු පල වැනියෝ ප්‍රධාන කම දරන්ට පටං ගති. මේවා දුටු මේ පොත් වහන්සේ බණවසුන් කිපයක් පෙරවාගණ අස්ගිරි විහාරේ මැද පන්සලෙහි පෙට්ටගමක පතුළට ම වී වැඩ සිටියේ නාමශෙෂ භාවයට පැමිණියේ ය යි සිතෙන තරම් අප්‍රකට විය.

අප දුටු විමුක්ති මාර්ගය

මහනුවර අස්ගිරි විහාරයට පළමුවර නේවාසිකත්වයට වැඩ වදළ තෙරුන් වහන්සේලා සමග වැඩම වී ය යි සිතෙන මේ පොත් වහන්සේ ආරක්ෂිතව තිබී කිත්ති ශ්‍රී රාජසිංහ රජු දවස භාවිතයට ගෙණ තුන්වෙනි සිංහල මිශ්‍ර විස්තර කොට සකුත් එකතු කර තිබී ඒ රජුගේ කාලචක්‍ර නැංවීමත් සමග නැවතත් සැඟවීමට පැමිණි බව ඉහත සඳහන්ව ඇත. ඒ සැඟවුණු ගමන් අපට හමුවනතුරු දිග හැරීමක් සෙලවීමක් නැතුව අවුරුදු දෙසියකට වැඩිකාලයක් නිසොල්මනේම සැඟවී තිබෙන අතර මැද පන්සලේ හා නිත්තවෙල විහාරාධිපති ගොහාගොඩ ශ්‍රී සුමනාභිධාන රන්ගිරි දඹුලු රජමහා විහාර ස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ අපවත් වූ පසු උන්වහන්සේගේ දෙවු කණිටු ශිෂ්‍ය දන්තුරේ ධම්මරතන කරල්ලියද්දේ ශ්‍රී සුමන රත්නපාල යන දෙනම මේ පෙට්ටගමේ තිබෙන වැදගත් දේ මොනවා ද යි ඇරබලන අතර මේ ග්‍රන්ථ රත්නය පළමුවරට දකින්ට ලැබුනේය.

එද මෙය දෙවියන්, පත්ඉරු තුන්සියක පමණ හපෙළ අටපෙළ ලියා සිතියම් කළ පොත් කම්බ දෙකක් යොද අතින් ගෙතූ පොත් හුයකින් වෙලා ලෙංසුවක ඔතා පොත් පසුම්බියක (පොත් උරයක) ලා නැවතත් හුයකින් වෙලා ඒ මත '' මහ විහාර අස්ගිරි වංශයේ කමටහන් පොත '' කියා උඩිටටුවක් පිටින් අලවා තිබුනේය. ලණුවක් හෝ ලෙංසුවක් වෙන් කරන්ට බැරිතරමට එකට ඇලී පුස්බැඳී දිරකඩයක්ව තිබෙනු දූක කරල්ලියද්දේ ශ්‍රී සුමන රතනපාල සථවිර තුමා දෙටුසෝවුරු දන්තුරේ ශ්‍රී ධම්මරතන මහතෙරුන් වහන්සේ ගේත් සතුට ලබාගෙණ මෙහි ගෙණවුත් මට ද පෙන්නුවේය. ඉන්පසු මේ ශ්‍රෙෂ්ඨ ග්‍රන්ථය රැකගැණිමට පිටපත් කිරීම හැර වෙන මඟක් නුදුටු අපි එය පිටපත් කිරීමට පටං ගතිමු. එකද පත්ඉරුවකුත් කැලි නොකැඩී පෙරලාගත නොහැකි විය. ඉතා ප්‍රවේසමෙන් පිටපත් කරණ අතර කියවාගත නොහැකි කැඩීගිය තැන් විසුඩි මාර්ගයේ ආධාරයෙන් සටහන් කළෙමු. සමහර වචන අඩු වැඩියෙන් වෙනස්ව සටහන් වීම වළක්වා ගන්ට වැයම් කළෙමු. එසේ මහදයාසයෙන් පිටපත් කර අහල් හතර පහේ කැලි හා ඊටත් කුඩා කැලි රාශියක් බවට පත්වූ මේ පොත ඉහත සඳහන් දන්තුරේ ශ්‍රී ධම්මරතන සවාමින් වහන්සේට ම භාර දුනිමු.

ඒ භාරගත් ඒ සවාමීන් වහන්සේ පසුගිය ලෝක මහා යුද්ධ කාලයේ යුදබිය නිසා පන්සලේ තිබුනු බොහෝ වටිනා පොත්පත් වටාපත් ආදී අගනා දේ ආරක්‍ෂා කරණු සඳහා පන්සලෙන් පිටත ගෙණ ගොස් සඟවා තැබීය. අවාසනාවට මෙන් ඒ දින කිපයකින් හදිසියේ උන්වහන්සේ අපවත් විය. ඒ සැඟවූ දේ සියල්ල සඳහටම සැඟ වුණේය. අද තෙක් ඒ ගෙණ ගිය දේ කොහේ ගෙණ ගියෙද කොහි කෙසේ තැබීද යන බවවත් දැනගත නොහැකි විය.

ඉන්පසු මේ අගනා පොත් වහන්සේ නොනැසී ආරක්‍ෂාකර ගැණිමේ පරමාථියෙන් මේ වගියේ පොත් තිබෙන තැන් ආරංචි දූන සොයා ගෙණ වුත් අප ලියාගත් පිටපත හා සසඳා බැලිමු. මෙහි අන්තැනක සඳහන් පරිදි පොත් හත අටක් සොයා ගතිමු. ඒ සියල්ලම මේ පොත් කාණ්ඩ තුණින් මුල් කතෘන් වහන්සේගේම ය යි සැලකිය හැකි පළමුවන දෙවන කොටස් හැර තුන්වන කොටසේ පිටපත් වූහ. නමුත් ඒවා වෙන වෙන නම් වලින් සුළු සුළු වෙනස්කම් වලින් ද යුක්තව තිබුනාහ. '' අමතාකර වණ්ණනා, කම්මට්ඨාන දීපනී, විමුත්ති දීපනී, විමුත්තිමග්ග දීපනං, කමටහං පොත, විදර්ශනා පොත යනාදී නම් තිබුනි. කරුණු පිළිවෙත් ද එකිනෙකට මඳ වෙනස්කම් දුටුවෙමු. මෙසේ වෙනස් වීමට කුමක් හේතු වී දැයි ඉඳුරා කිව නොහැක. කෙසේ හෝ මුල් පොතේ තුන්වෙනි කාණ්ඩයේම පිටපත් බව පෙණියාම සතුටකි.

එසේ පිටපත් කර සසඳා බලන අතර පළමු වෙනි කොටස හා දෙවෙනි කොටස පාළි භාෂාවෙන් ලුහුඩු ක්‍රමයෙන් තියෙන නිසා පාළි නූගත් උපාසක උපාසිකාවන්ගේ ප්‍රයෝජනය සඳහා ඒ ඒ තැන මුල් කොටසට සිංහල අනුවාදයක් යෙදීමු. දෙවෙනි කොටස වන උද්දන විධාන ගාථා කාණ්ඩය පැහැදිලිව තුංවෙනි කොටසේ ඇති බැවින් තිබුනු අන්දමින් ම ලියා තැබීමු. මෙසේ මේ ග්‍රන්ථ රත්නය කඩදසියක ලියවුණු පළමු වාරය මේ ය යි සිතමු.

සම්මා සම්බුඩ ශාසනයාගේ ජීවනාළය වන මෙකල වෙසෙසින් පසු බැස යන විදර්ශනා ධුරය පණ ගන්වා ලොකාර්ථයක් කරණු පිණිස ද, දූනුදු ලක්දිවින් අතුරුදන් වී ඇතැයි සලකණ මෙසේ තිබීමෙන් සැබවින් ම වන අතුරුදන්වීම වළකන පිණිස ද, දෙසිය සූපණස් ගුරු ශිෂ්‍ය පරපුරකින්ම ආරක්‍ෂිතව එන මේ ග්‍රන්ථ රත්නය ලක්වැසි ලෝවැසි බෞඩ මහජනයාට ප්‍රයෝජන ගන්ට නොදී සඟවා තබා විනාශ වෙන්ට හැරීම මහ අපරාධයකැයි හැඟී ගිය නිසාද, මේ ගැණ ඇසූ දුටු ගිහි පැවිදි බොහෝ උතුමෝ මෙය වහා මුද්‍රණ කරවන්නැ යි බල වශයෙන් කිවූ නිසාද මෙසේ සකස්කර රජයේ සංස්කෘතික අංශයේ උතුමන් වෙත ඔප්පු කළෙමු. 1938 පමණ පිටපත් කළ මෙය මෙතාක් පමාවූයේ

මුද්‍රණ වියදම් නැති නිසාත් වෙන පහසු ක්‍රමයක් හමුනුන නිසාත්ය. සැබවින් ම හැම අතින්ම ජනෝපකාරී රජයක් ඇති වී මෙවැනි ලෝකෝපකාර කිරීම වාසනාවකි. අපගේ අනල්ප සතුට හා හෘදයඞ්ගම පැසසුම චිරාත් කාලයක් වර්තමාන රජය නිරුපද්‍රැත වේවා යන ආශීර්වාදය සමග රජය වෙත ඔප්පු කරන්නෙමු.

මෙය මනහර අන්දමින් මුද්‍රණය කරවූ රජයේ මුද්‍රණාලයේ නියුක්ත සේවක මහතුන් ට ද ශෝධ්‍ය පත්‍ර බලාගැණීමට නොමැලිව උපකාරවූ ගොඩමුන්නේ සිද්ධාර්ථ අඹගස්වැවේ රතනපාල උඩුගම බුද්ධරක්ඛිත පොද්දල්ගොඩ චන්දජෝති යන ආයුෂ්මතුන් වහන්සේලාට ද පොත් සපයා දුන් පින්වතුන්ට ද, ඒ පොත් සසඳා බැලීමට නොමැලිව අපට ආධාර කළ සිරිමල්වත්තේ රතනජෝති, ගංහතේ සරණඞ්කර යන කුඩා දෙනමට ද මෙහි මුල යොද ඇති සුඛාසන භාවනා ආදර්ශ පිළිරූ ඇඳ දුන් ධර්මරාජ විද්‍යාලයේ කලා අංශයේ ආචාර්ය ඇස්. ඒ. වික්‍රමසිංහ මහතාට හා මීට නොයෙක් දෙයින් උපකාර වෙමින් අවවාද අනුශාසනා දියෙන් අප උනන්දුකරවූ හිතවත් ආර්. අබේසේකර මහතාට ද, මෙය පමා නොකර මේ මෙ අන්දමින් සකස් කරන්නැයි අපව උනන්දු කරවූ විද්‍යාලඞ්කාර සරසවියේ උප කුලපති ශ්‍රීමත් කිරිවත්තුඩුවේ නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ, මහාචාර්ය බඹරැන්දේ සිරි සීවලි මහාස්ථවිරයාණන් වහන්සේ, මහාචාර්ය පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය නායක ස්ථවිරපාදයන් වහන්සේ ආදී පැවිදි ගිහි උතුමන්ට ද අපගේ අවංක ප්‍රශංසා පූර්වක පුණ්‍යානුමෝදනාව හිමි වේවා. මෙසේ වචන මාත්‍රයකිනුදු අපට අනුබල දුන් පින්වතුන්ට ශුභාශිර්වාද ස්තුති පුදකරමින් දෙවියන් සහිත සියලු ලෝවැස්සාටම මේ ධර්ම දානමය කුශල බලයෙන් උතුම් සගමොක් සුව ලැබේවායි පතමු.

මීට,

ශාසනසපීකාමි,

ගල්කැටියාගම ශ්‍රී රතනජෝති ස්ථවිර,
කරලියද්දේ ශ්‍රී රතනපාල ස්ථවිර.

63.12.12 දින දී.

පොත් සපයා දුන් පින්වතුන්

1. මහනුවර අස්ගිරි විහාරාධිවාසී පූජ්‍ය අඹගස්වැවේ ශ්‍රී රතනපාල ස්ථවිරයෝ.

2. මල්වතු මහා විහාරයේ මැද පන්සලේ අමුණුගම ශ්‍රී රාජගුරු රතනපාල ස්ථවිරයන් වහන්සේ, මොරතොට ශ්‍රී ධම්මක්ඛන්ධ මහා නායක මාහිමියන් වහන්සේගේ අත්පොත.

3. තෙල්දෙණියේ බඹරගල රජමහා විහාරාධිපති වැවේගම ශ්‍රී චන්දජෝති නායක ස්ථවිර.

4. සතුරුවන්කෙත පොත්ගුල් විහාරාධිපති වැත්තැවේ නායක මාහිමියන් වහන්සේ.

5. දෙරණෑගොඩ සදනන්ද පරිවෙණාචාර්ය පණ්ඩිත රඹුක්වැල්ලේ පඤ්ඤාසාර ස්ථවිර.

6. මැණික් හින්නේ ශ්‍රී සිද්ධාර්ථ පිරිවෙන් හිමි ශ්‍රී සුමන මහා ස්ථවිර පාදයන් වහන්සේ

7. අස්ගිරි විජය සුන්දරාරාම පුරාණ විහාරාධිපති බමුණුපොළ ශ්‍රී සරණපාල මහා ස්ථවිර.

විමුත්තිමග්ගො

(I)

පඨමො නිදානකථා

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා
අනුබුද්ධා ඉමෙ ධම්මා ගොතමෙන යසස්සිනා

සීලං නාම සීලසංවරො, සමාධි නාම අවික්ඛෙපො, පඤ්ඤා නාම සම්බොධිඤාණං, විමුත්ති නාම බන්ධනාපගමො, අනුත්තරාති අනාසවා.

දුතියො සීලකථා

කිං සීලං ?

චෙතනා සීලං. 2 සංවරො සීලං. 3 අවීතික්කමො සීලං. පහාණට්ඨෙන සංවරො, සබ්බෙ කුසලාධම්මා. ඉදං සීලං නෙක්ඛම්මෙන කාමච්ඡන්දස්ස පහාණං—පෙ—අරහත්තමග්ගෙන සබ්බකිලෙසානං පහාණං සීලං. වෙරමණි, චෙතනා, සංවරො, අවිතික්කමො සීලං.

2. කිං සීලස්ස ලක්ඛණං ?

සංවරො පාතිමොක්ඛධම්මා පච්චයධම්මා ඉන්ද්‍රිය ධම්මා ලක්ඛණං.

3–5. කානි රස පච්චුපට්ඨානපදට්ඨානානි ?

අනවජ්ජ සුඛං රසො නාම. අනුපායාසො පච්චුපට්ඨානං, සුචරිතත්තයසමාචාරො පදට්ඨානං. අථ ච සොමනස්සං රසො, අවිප්පටිසාරො පච්චුපට්ඨානං, ඉන්ද්‍රියෙසු ගුත්ති පදට්ඨානං.

6. කො සීලස්ස ආනිසංසො ?

අවිප්පටිසාරො—පෙ—එවං අනන්තානිසංසං සීලං.

7. කිමත්ථං සීලං ?

සීතලත්ථං, සෙට්ඨත්ථං, සීලනත්ථං, සභාවත්ථං, සුඛදුක්ඛාභාවසම්පයුත්තත්ථං, සිරත්ථං, පතිට්ඨාත්ථං.

8. ආචාරස්ස ච සීලස්ස ච කිං නානාකරණං ?

ධුතඞ්ගසමා නං ආචාරො සංවරො සීලං.

9. කතිවිධං සීලං ?

තිවිධං—කුසලං සීලං, අකුසලං සීලං, අබ්‍යාකතං සීලන්ති, කායිකං වාචසිකං මාන—සිකන්ති පි.

10. කිංසමුට්ඨානං සීලං ?

කුසලචිත්තසමුට්ඨානං කුසලං සීලං, අකුසලචිත්තසමුට්ඨානං අකුසලං සීලං අබ්‍යාකතචිත්තසමුට්ඨානං අබ්‍යාකතං සීලං. කායද්වාරෙ පවත්තං කායිකං මිච්ඡාවාචා වෙරමණි වාචසිකං අභිජ්ඣාබ්‍යාපාද මිච්ඡාදිට්ඨි පටිලොමං සංවරො මානසිකංසීලං.

11. කානි සීලස්ස ආදිමජ්ඣපරියොසානානි ?

සමාදානං ආදි, අවිතික්කමො මජ්ඣං අභිරති පරියොසානං.

12. කතිධම්මා සීලස්ස අන්තරායිකා ? 13. කති සීලස්ස හෙතු ?

චතුත්තිංස ධම්මා මග්ගස්ස අන්තරායා: කොධො, පලාසො, මක්ඛො, සන්තාපො, මච්ඡරියං, ඉස්සා, සාඨෙය්‍යං, මායා, උපනාහො, මානො, අතිමානො, මදෙ, පමාදෙ, කොසජ්ජං, ලොභො, අරති, අනනවය ඤාණං, මිච්ඡාසති, පාපිකා වාචා, පාපකා මිත්තා, පාපකං ඤාණං, පාපිකා දිට්ඨි, අකබනති, අස්සද්ධා, අහිරිකං, අනොත්තප්පං, කායිකවාචසිකබ්‍යාපාරෙසු අස්සාදෙ, ඉත්ථිජනෙසු සංවාසො, සත්ථු සික්ඛාය අගාරවො, ඉන්ද්‍රියෙසු අසංවරො, භොජනෙ අමත්තඤ්ඤුතා, පඨමාය රත්තියා පච්ඡිමාය ච රත්තියා අජාගරියානුයොගො, ඨාන සජ්ඣායානං අභාවො, ඉමෙ චතුත්තිංස ධම්මා මග්ගස්ස අන්තරායා සීලස්සාපහාරකා ති.

14. කතිවිධං සීලං ?

දුවිධං, තිවිධං, චතුබ්බිධං. කථං දුවිධං ? චාරිත්තවාරිත්තවසෙන, හාණභාගියපත්තිභාගියවසෙන, ලොකියලොකුත්තරවසෙන ච දුවිධං, සප්පමාණඅප්පමාණ වසෙන ච, සපරියන්තඅපරියන්තවසෙන ච, නිස්සිත අනිස්සිත වසෙන ච, දුවිධං හොති. කථං තිවිධං? හීනමජ්ඣිමපණීතවසෙන, ආදිබ්‍රහ්මචරියකං සම්මාවාචා සම්මාකම්මන්ත ආජීවො—බුද්ධානුබුද්ධසික්ඛා සෙසං—චිත්ත සම්පයුත්තං ආදි සික්ඛා බ්‍රහ්මචරියං. චිත්තවිප්පයුත්තං. සෙසං බුද්ධකං—අවිතික්කමසීලං සාවකානං. විසුද්ධි සීලං බුද්ධානඤ්ච පච්චෙක බුද්ධානඤ්ච සීලං කාලපරියන්තං ආපාණකොටිකං.

කථං තිවිධං ?

පාපනිම්මූලනෙන අවිතික්කමො, සමාදනෙන අවිතික්කමො, සමුච්ඡෙදෙන අවිතික්කමො ති ච පරාමඨඅපරාමඨපටිප්පස්සද්ධිවසෙන ච, ලොකනිස්සිතං අත්තනිස්සිතං ධම්මනිස්සිතනති ච, විසමසමඅප්පණිහිතවසෙන ච, විසුද්ධඅවිසුද්ධවෙමතිකවසෙන ච, සෙඛඅසෙඛනෙවසෙඛාසෙඛංති ච, භයසීලං දුක්ඛසීලං මොහාසීලනති ච, හීනමජ්ඣිම පණීතනති ච තිවිධං සීලං.

කථං චතුබ්බිධං සීලං ?

හානභාගියං මග්ගස්ස අන්තරායෙන විනොදෙති, උට්ඨානවනෙතහි ජනෙහි අපක්කමති සඤ්චිච්ච ආපජ්ජති ආපත්තිං ආපන්නො පටිගුහති පටිච්ඡාදෙති. ඨිතිභාගියං සම්පාදිතෙ සීලෙ අප්පමත්තො හොති, උපසමදස්සනං පන න උප්පාදෙති. විසෙසභාගියං පරිපූරිතසීලසමාධිසු අප්පමත්තො හොති උපසමදස්සනම්පන න උප්පාදෙති නිබ්බෙධභාගියං පරිපූරිත සීලසමාධිසු අප්පමත්තො හොති උපසමදස්සනෙන ච නිබ්බෙධ භාගියො හොති.

භික්ඛුසීලං භික්ඛුණීසීලං අනුපසම්පන්නසීලං ඔදාතවසනසීලනති ච, පකතිසීලං ආචාරසීලං ධම්මතාසීලං පුබ්බහෙතු සීලනති ච, සීලසීලං (කුසලසීලං අකුසලසීලං) සමුදයසීලං කුසලචිත්තසමුට්ඨානං කුසලසීලං අකුසලචිත්තසමුට්ඨානං අකුසලසීලං. නිරොධසීලං කුසලසීලානුප්පත්තියා. අකුසලසීලස්ස වූපසමො, අරහත්තුප්පත්තියා කුසලසීලස්ස වූපසමො නිරොධමග්ගපටිපදාසීලං. චත්තාරො සම්මප්පධානා පාතිමොක්ඛ සංවරසීලං ; ඉධ භික්ඛු පාතිමොක්ඛසංවරසංවුතො විහරති, ආචාරගොචරසම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී, සමාදය සික්ඛති සික්ඛාපදෙසු. ඉධාති ඉමස්මිං සබ්බඤ්ඤුසාසනෙ ධම්මෙ. භික්ඛු ති, පුථුජ්ජනකල්‍යාණකො. අපි ච සෙඛො අසෙඛො ආනෙඤ්ජධම්මො පාතිමොක්ඛනති, සීලං, පතිට්ඨා, ආදි, චරණං සඤ්ඤමො සංවරො, මොක්ඛො, අනිබ්බෙධො, පමුඛං කුසලානංධම්මානං සමාපත්තියා. සංවරො ති කායිකවාචසික,

කම්මස්ස අවිතික්කමො. සංවුතො ති පාතිමොක්ඛසංවරෙන උපෙතො විහරති ති චතුසංවරෙණ සංවුතො, ආචාරගොචර සම්පන්නො, අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදය සික්ඛති සික්ඛාපදෙසු. කානි සික්ඛාපදනි ? වුච්චන්ති — සත්තප්පභෙදෙ සංවරො : ආජීවපාරිසුද්ධිසීලං මිච්ඡාජීවෙන, අවිතික්කමො. කතමො මිච්ඡාජීවො කුහනා (පච්චයපටිසෙවනවසෙන, ඉරියාපථවසෙන සාමන්තජප්පනවසෙන. ලපනා නෙමිත්තිකතා නිප්පෙසිකතා ලාභෙන ලාභං නිජිගිංසනතා. අපි ච මිච්ඡා ජීවො ති වෙළුදනං වා පත්තදනං වා, පුප්ඵඵලසිනානදන්තකට්ඨදනං. අඞ්ගං නිමිත්තං උප්පාදං එවමාදිකො නානාවිධො මිච්ඡාජීවො. මිච්ඡාජීවෙන පටිවිරති පරිසුද්ධසීලං.

චතුපච්චයසන්නිස්සිතසීලං අට්ඨහි ආකාරෙහි පටිසඞ්ඛා යොනිසො සෙවති—පිණ්ඩපාතං නෙවදවාය න මදය, න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය, ජිඝච්ඡා පිපාසානං වූපරතියා (විහිංසූපරතියා), බ්‍රහ්මචරියානුග්ගහාය, ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි, නවං ච වෙදනං නඋප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. චතුධා පච්චවෙක්ඛිතබ්බං. පහාතබ්බ පච්චවෙක්ඛණා, පච්චයපච්චවෙක්ඛණා, යාත්‍රා පච්චවෙක්ඛණා, පරිත්තානිසංස පච්චවෙක්ඛණා අන්තද්වය පරිවජ්ජනා. මජ්ඣිමාය ච පටිපදය සෙවනං

පටිසඞ්ඛා යොනිසො චීවරං පටිසෙවාමි යාවදෙව සීතස්ස පටිඝාතාය උණ්හස්ස පටිඝාතාය ඩංසමකසවාතාතපසරිංසපසම්ඵස්සානං පටිඝාතාය යාවදෙව හිරිකොපින-පටිච්ඡාදනත්ථං.

පටිසඞ්ඛා යොනිසො සෙනාසනං—පෙ—උතුපරිස්සයවිනොදනං පටිසල්ලානාරාමත්ථං. පටිසඞ්ඛා යොනිසො ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරං පටිසෙවාමි. යාවදෙව උප්පන්නානං වෙය්‍යාබාධිකානං වෙදනානං පටිඝාතාය අබ්‍යාපජ්ඣපරමතායාති.

චත්තාරො පච්චයපරිභොගා ථෙය්‍ය පරිභොගො ඉණ පරිභොගො දයජ්ජපරිභොගො සාමිපරිභොගො ති. අපරිසුද්ධපරිභොගපරිසුද්ධපරිභොගවසෙන ච.

විනයසංවරසීලංපාතිමොක්ඛසංවරසීලං අධිමත්තාය සද්ධාය පරිපූරිතං හොති, ආජීව-පාරිසුද්ධිසීලං අධිමත්තෙන විරියෙන පරිපූරිතං හොති. ඉන්ද්‍රියසංවරසීලං අධිමත්තාය සතියා පරිපූරිතං හොති චතුපච්චයසෙවනසීලං අධිමත්තාය පඤ්ඤාය පරිපූරිතං හොති. ආජීවපාරිසුද්ධිසීලංපාතිමොක්ඛසංවරෙණ සංගහීයති. ඉන්ද්‍රියසංවරසීලං පච්චයසන්නිස්සි-තෙන සංගහීයති. ඉන්ද්‍රියසංවරං ආජීවපාරිසුද්ධි ච සීලක්ඛන්ධෙන ගහිතො, ඉන්ද්‍රිසංවර පාතිමොක්ඛසංවරා සමාධික්ඛන්ධෙන, චතුපච්චයසන්නිස්සිතසීලං පඤ්ඤක්ඛන්ධෙන සංගහීයතෙ.

15. කථං සීලවිසුද්ධි සමාදින්නා හොති?

16. කති සීලස්ස පතිට්ඨා ?

වෙ සීලස්ස පතිට්ඨා දුස්සීලස්ස ආදීනවදස්සනෙන ච සීලස්ස ආනිසංසදස්සනෙන. කිකීව අණ්ඩං චමරිව වාළධිං පියංවපුත්තං නයනංව එකකං

තථෙව සීලං අනුරක්ඛමානකා සුපෙසලා හොථ සද සගාරවා.

තතියො කණ්ඩො

ධුතානි

අථ සීලානන්තරං සීලසම්පාදනත්ථමෙව ධුතානි සම්පාදෙතබ්බානි හොන්ති. තානි පන තෙරසෙව හොන්ති තෙසු වෙ ධම්මා චීවරපටිසංයුත්තානි—පංසුකූලිකං තෙචීවරිකන්ති. පඤ්ච ධම්මා පිණ්ඩ පාත පටි සංයුත්තා: පිණ්ඩපාතිකං, සපදානචාරිකං, එකාසනභොජනං, භොජනෙ මත්තඤ්ඤුතා (පත්ත පිණ්ඩිකඞ්ගං) ඛලුපච්ඡාභත්තිකං ච. පඤ්ච ධම්මා සෙනාසනපටිසංයුත්තා: ආරඤ්ඤකං රුක්ඛමූලිකං අබ්භොකාසිකං සොසානිකං යථාසන්ථිකඤ්ච. එකං විරියපටිසංයුත්තං නෙසජ්ජිකඞ්ගං.

1. පංසුකූලිකඞ්ගං

1. කිමත්ථං පංසුකූලං සමාදියති ?

ගහපතිදානචීවරං පටික්ඛිත්තත්තා පංසුකූලං සමාදියාමි. කො ආනිසංසො පංසුකූලසමාදානෙ ? චොරභයෙන අභයතා, පරිභොගතණ්හාය අභාවො, දිට්ඨධම්මසුඛවිහාරිතා ච. කතිවිධං පංසුකූලං ? දුවිධං සොසානිකං, සඞ්කාරචොලං, පාපණිකං, රථියා චොලකං, ගොඛායිතං, මූසිකච්ඡින්නං, අග්ගිදඩ්ඪං කථං සමාදියති ? සචෙ භික්ඛු ගහපතිදානං පටික්ඛිපති තෙන පංසුකූලිකො හොති. කථං භෙදෙ ? සචෙ භික්ඛු ගහපතිදානං සමාදියති, තෙන පංසුකූලිකං භින්නං හොති.

2. තෙචීවරිකඞ්ගං

2. කථං තෙචීවරිකං සමාදියති ? අජ්ජතග්ගෙ අතිරෙකචීවරස්ස පටික්ඛිත්තත්තා තෙචීවරිකං සමාදියාමි. කො ආනිසංසො තෙචීවරික සමාදානෙ ? අප්පසමාරම්භතා සන්තුට්ඨො කායපරිහාරිකෙන. කානි තීනි චීවරානි සඞ්ඝාටි උත්තරාසඞ්ගං අන්තර වාසකඤ්ච. කථං සමාදින්නං ? සචෙ භික්ඛු අතිරෙකචීවරං න ධාරෙති, කථං භෙදෙ ? සචෙ භික්ඛු චතුත්ථං චීවරං සමාදියති.

3. පිණ්ඩපාතිකඞ්ගං

කථං පිණ්ඩපාතිකං සමාදින්නං හොති ? අජ්ජතග්ගෙ නිමන්තනපටික්ඛෙපෙන පිණ්ඩ පාතිකං ධම්මං සමාදියාමීති සමාදින්නං හොති. කො පිණ්ඩපාතිකස්ස ආනිසංසො ? කොසජ්ජනිම්මථනතා. මානප්පහානං රසතණ්හානිවාරඤ්ච, චාතුද්දිසතා. කථංවිධා නිමන්තනා ? කථං සමාදානං ? තිවිධා නිමන්තනා. නිමන්තනපටික්ඛෙපෙන. කථං භෙදෙ ? නිමන්තනාසාදියනෙන භෙදෙ හොති ?

4. සපදානචාරිකඞ්ගං

4. කථං සපදානචාරිකං සමාදින්නං හොති ? අජ්ජතග්ගෙ අසපදානචාරිකං පටික්ඛිපාමි. සපදාන චාරිකං සමාදියාමි. කො ආනිසංසො සපදානචාරිකෙ ? අවභාණාභිනන්දනා චන්දූපමතා. කිං නාම සපදානචාරිකං ? කථං සමාදානං ? කථං භෙදෙ ති.

5. ඒකාසනිකඞ්ගං

5. කථං ඒකාසනිකං සමාදියති ? කො ආනිසංසො ඒකාසනිකෙ ? අප්පාබාධතා අප්පාතඞ්කතා ඵාසුවිහාරො ති. කථං ඒකාසනිකස්ස සමාදානං ? කෙ පරියන්තා ? කථං භෙදෙ ? තයො පරියන්තා ආසනපරියන්තො උදකපරියන්තො භොජනපරියන්තො. සචෙ මනුස්සා සප්පිමණ්ඩං ආහරති භෙසජ්ජමත්තමෙව වට්ටති.

6. පත්තපිණ්ඩිකඞ්ගං

6. කථං භොජනෙමත්තඤ්ඤුතා සමාදියති ? අජ්ජතග්ගෙ ලොලුප්පං පටික්ඛිපිත්වා භොජනමත්තඤ්ඤුතං සමාදියාමි. කො ආනිසංසො භොජනෙ මත්තඤ්ඤුතාය ? පිනමිද්ධපනූදනං සම්මාසම්බුද්ධානුමති ච කථං සමාදානං ? කථං භෙදෙ ?

7 ඛලුපච්ඡාභත්තිකඞ්ගං

7. කථං ඛලුපච්ඡාභත්තිකං සමාදියති ? අජ්ජතග්ගෙ අතිරිත්තභොජනං පටික්ඛිපාමි. ඛලුපච්ඡාභත්තිකං සමාදියාමි. කො ආනිසංසො ඛලුපච්ඡාභත්තිකෙ ? පරියෙසනාය අභාවො. කතිවිධං ඛලුපච්ඡාභත්තිකං ? දුවිධං පරිච්ඡින්නනන්තං අපරිච්ඡින්නානන්තං. පවාරෙත්වා පුන භොජනං. කප්පියං කාරෙත්වා න භුඤ්ජිතබ්බං. අධිට්ඨිතනන්තං එක විසති කබලෙ නිඩ්ඩිතෙ නාධිකං භුඤ්ජිතබ්බං.

8. ආරඤ්ඤිකඞ්ගං

කථං ආරඤ්ඤිකං සමාදියති ? අජ්ජතග්ගෙ ගාමන්තවිහාරං පටික්ඛිපාමි. ආරඤ්ඤිකං සමාදියාමි ති ? කො අරඤ්ඤස්ස පච්චන්තො ? පඤ්ච ධනුසතිකං පච්ඡිමං. කථං සමාදින්නං ? ගාමමජ්ඣවිහාරපටික්ඛෙපෙන. කථං භෙදෙ ? ගාමමජ්ඣෙ විහාර-වාසෙන.

9. රුක්ඛමූලිකඞ්ගං

කථං රුක්ඛමූලිකං සමාදියති ? අජ්ජතග්ගෙ ඡන්නං පටික්ඛිපාමි. රුක්ඛමූලවිහාරං සමාදියාමි. කො ආනිසංසො රුක්ඛමූලිකෙ ? සෙනාසනමච්ඡෙරකම්මාරාමතානං අභාවො. දෙවතාහි සහවාසතා. කෙ රුක්ඛා සෙවිතබ්බා ? සම්බාධදෙසවිරහිතා ඡායාසම්පන්නා රුක්ඛා සෙවිතබ්බා. කෙ රුක්ඛා න සෙවිතබ්බා ? චෙතියරුක්ඛා සදෙසා සාමන්තරායිකා රුක්ඛා. කථං සමාදානං ? ඡදනපටික්ඛෙපෙන. කථං භෙදෙ ? ඡනෙන අරුණුට්ඨාපනෙනාති.

10. අබ්භොකාසිකඞ්ගං

කථං අබ්භොකාසිකං සමාදියති ? අජ්ජතග්ගෙ නිවාසං න සාදියාමි. රුක්ඛමූලං ච පටික්ඛිපාමි අබ්භොකාසිකං සමාදියාමි. කො ආනිසංසො අබ්භොකාසිකස්ස ? ථීන-මිද්ධපනූදනං මිගා විය නිස්සඞ්ගතා ච කථං සමාදානං ? ඡන්නඤ්ච රුක්ඛමූලඤ්ච. පටික්ඛිපාමි, අබ්භොකාසිකං සමාදියාමිති කථං භෙදෙ ? ඡන්නං වා රුක්ඛමූලං වා පවිට්ඨෙ භෙදෙ හොති.

11. සොසානිකඞ්ගං

කථං සොසානිකං සමාදියති ?. අජ්ජතග්ගෙ න සුසානං පටික්ඛිපාමි සොසානිකං සමාදියාමි ති. කො ආනිසංසො සොසානිකස්ස සමාදානෙ ? මරණසතියා පටිලාභො

අප්පමාදවිහාරිතා. කාමරාගවිනොදනං. අමනුස්සානං ගරුභාවනියතා ති. කථං සොසානිකං සමාදින්නං හොති ?. කත්ථ වසිතබ්බං ?. කථං සමාචරිතබ්බං ?. කථං සමාදින්නං හොති ?. කථං හෙදෙ ?.

12. යථාසන්ථතිකඞ්ගං

කථං යථාසන්ථතිකං සමාදියති ?. අජ්ජතග්ගෙ සෙනාසනලොලුප්පං පටික්ඛිපාමි යථා සන්ථතිකං සමාදියාමී ති, කො ආනිසංසො යථාසන්ථතිකෙ ?. කථං සමාදනං ?. කථං හෙදෙ ?.

13. නෙසජ්ජිකඞ්ගං

කථං නෙසජ්ජිකං සමාදියති ?. අජ්ජතග්ගෙ සෙය්‍යං පටික්ඛිපාමි, නෙසජ්ජිකං සමාදියාමි ති. කො ආනිසංසො නෙසජ්ජිකෙ ?. ඣානවිසෙසො. කථං සමාදනං, කථං හෙදෙ ?

පකිණ්ණක කථා

කති ධුතානි කාලපරියන්තානි ? රුක්ඛමූලිකං අබ්භොකාසිකං සොසානිකන්ති ඉමානි තීනි අට්ඨමාසකාලපරියන්තානි,

කො ධුතො ච ධුතවාදෙ ච ? ධුතො ච ධුතවාදෙ ච අරහා ච ධුතසමන්නාගතො ච. ධුතො ච නධුතවාදෙ ච අරහා ධුතඞ්ගසමාදනෙන පන සමන්නාගතො න ධුතො ච ධුතවාදෙ ච සෙඛො ච පුථුජ්ජනො ච ධුතසමාදනෙන සමන්නාගතො නධුතො ච නධුතවාදෙ ච සෙඛො ච පුථුජ්ජනො ච, ධුතඞ්ගසමාදනෙන න සමන්නාගතො. ධුතානි කිං ලක්ඛණානි කිංරසානි කිංපච්චුපට්ඨානානි ? අප්පිච්ඡතාලක්ඛණානි, සන්තුට්ඨිරසානි. ඉදමත්ථිතාපච්චුපට්ඨානානි, අථ ච නිල්ලොලුප්පලක්ඛණං, අනාදීනවරසානි, අපරිහාණිපච්චුපට්ඨානානි. කානි ආදිමජ්ඣපරියොසානානි ? සමාදනං ආදි, පටිසෙවනා මජ්ඣා, සොමනස්සං අන්තො ති.

චතුත්ථො සමාධිකථා

සීලධුතසම්පන්නෙන යොගාවචරෙන පරිසුද්ධෙ සන්තානෙ සමාධිභාවනා ආරභිතබ්බා. කො සමාධි ? කථං සමාධි උප්පාදෙතබ්බො ? කානි තස්ස ලක්ඛණරසපච්චුපට්ඨාන පදට්ඨානානි ? කො පුග්ගලො සමාදහිස්සති ? ඣානවිමොක්ඛසමාධිසමාපත්තීනං කිං නානාකරණං ? ඣානන්ති පඨමජ්ඣානාදීනි චත්තාරි ඣානානි. විමොක්ඛො ති අජ්ඣත්තං රූපසඤ්ඤී බහිද්ධා රූපානි පස්සතීති ආදයො අට්ඨ විමොක්ඛා. සමාධී ති සවිතක්කසවිචාරාදයො තයො සමාධයො. සමාපත්ති ති නව අනුපුබ්බා සමාපත්තියො. කති ආනිසංසා ? චත්තාරො. දිට්ඨධම්මසුඛවිහාරිතා විපස්සනාය සුඛා කිරියා, අභිඤ්ඤ සච්ඡිකිරියා භවසම්පත්තීති. කති ධම්මා සමාධිස්ස අන්තරාය කරා ? අට්ඨ ධම්මා : කාමච්ඡන්දෙ බ්‍යාපාදෙ ථීනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡා අවිජ්ජා පීති, සුඛ විරහිතතා. සබ්බෙ ච පාපකා ධම්මා ති. කති ධම්මා සමාධිස්ස හෙතු ? අට්ඨ ධම්මා : සවුපනිස්සයතා, පබ්බජ්ජා, පහාණං නීවරණානං, අදෙසඅභිජ්ඣා, අවික්ඛෙපො. සබ්බෙ කුසලා ධම්මා. චිත්තාභිප්පමොදකා, සබ්බෙ කුසලා ධම්මා ධම්මඤ්ඤාණසමුප්පාදකා ච. කති සමාධිස්ස සම්භාරා ? සත්ත විධා. අනෙකවිහිතං සීලං, සන්තුට්ඨිතා, ඉන්ද්‍රියෙසු ගුත්තවාරතා, භොජනෙ මත්තඤ්ඤුතා, රත්තියා පඨමෙ මජ්ඣිමෙ පච්ඡිමෙ යාමෙ අමිද්ධතා, නිච්චං සතිසම්පජඤ්ඤං පවිවෙකවිහාරො ච, කතිවිධො සමාධි ? දුවිධො ලොකුත්තරො අරිය ඵලෙන සමධිගතො, ලොකියො සෙසො. අයං ලොකියො සමාධි සාසවො සංයොජනියො, ගන්ථනියො, සඞ්කිලෙසිකො. වුත්තවිපරියයෙන ලොකුත්තරො මිච්ඡා සමාධි අකුසල චිත්තෙකග්ගතා, භාවෙතබ්බො වා සම්මා සමාධි. කුසලචිත්තෙකග්ගතා, භාවෙතබ්බො වා සමාධි උපචාරසමාධි. තස්ස තස්ස ඣානස්ස පුබ්බභාගො පවත්තො අප්පණාසමාධි. ගොත්‍රභූඅනන්තරපරිකම්මානන්තරො. තිවිධං සවිතක්කසවිචාරො, පඨමංඣානං—අවිතක්ක පරිත්ත විචාරො—දුතියංඣානං අවිතක්ක අවිචාරො—සෙසඣානානි. පීතියා සහ උප්පන්නං පඨමජ්ඣානං ච දුතියජ්ඣානං ච සුඛෙන සහ උප්පන්නං තතියජ්ඣානං උපෙක්ඛාය සහ උප්පන්නං චතුත්ථජ්ඣානං. කුසලඅරියමග්ගා සෙඛෙහි ච පුථුජ්ජනෙහි ච භාවිතා. රූපාවචර අරූපාවචර සමාධි ච විපාකො අරිය ඵලං, සෙඛෙහිච පුථුජ්ජනෙහිච උප්පාදිතා රූපාරූපාවචරධාතු ච. කිරියා අසෙඛෙන සමාපන්නො රූපාරූපාවචර සමාධි. චතුබ්බිධො—කාමාවචරො තෙන තෙන ආචිණ්ණො සමාපත්ති ආචාරො රූපාවචරො. චත්තාරි ඣානානි අරූපාවචරො චත්තරො අරූපාවචර සමාධයො, කුසල කම්මවිපාකා ච. අපරියාපන්නො. චත්තාරො මග්ගා ච, චත්තාරි ඵලානි ච. දුක්ඛාපටිපදදන්ධාභිඤ්ඤ, දුක්ඛා පටිපද ඛිප්පාභිඤ්ඤ සුඛා පටිපද දන්ධාභිඤ්ඤ, සුඛා පටිපද ඛිප්පාභිඤ්ඤ ති. පරිත්තො සමාධි පරිත්තාරම්මණො, පරිත්තො සමාධි අප්පමාණාරම්මණො, අප්පමාණො සමාධි, පරිත්තාරම්මණො. අප්පමාණො සමාධි අප්පමාණාරම්මණො. ඡන්දසමාධි විරියසමාධි, චිත්තසමාධි වීමංසා සමාධිවසෙන ච.

අත්ථි සමාධි බුද්ධෙහි සමධිගතො නො සාවකෙහි. මහාකරුණා සමාධි, යමකපාටිහාරියසමාධි ච. අත්ථි සමාධි සාවකෙහි සමධිගතො නො බුද්ධෙහි සෙඛඵලසමාධි. අත්ථි සමාධි සාවකෙහි සමධිගතො බුද්ධෙහි ච නවානුපුබ්බා සමාධි, අසෙඛ ඵල සමාධිච. අත්ථි සමාධි නෙව බුද්ධෙහි සමධිගතො න සාවකෙහි ච අසඤ්ඤී සමාධි. අත්ථි සමාධි උප්පාදය, න නිරොධාය. කාමාවචරෙ කුසලො අකුසලො සමාධි. අත්ථි සමාධි නිරොධාය න උප්පාදය.—චතු අරියමග්ග සමාධි අත්ථි සමාධි උප්පාදය චෙව

නිරොධාය ච සෙඛපුථුජ්ජනානං රූපාරූපාවචරකුසලසමාධි. අත්ථි සමාධි නෙව උප්පාදාය න නිරොධායච සබ්බඵලසමාධියො කිරියසමාධි ච පඨමජ්ඣානං, දුතියජ්ඣානං, තතියජ්ඣානං, චතුත්ථජ්ඣානන්ති ච.

පඤ්චවිධො පඤ්චමජ්ඣානවසෙන. පඤ්චඞ්ගසමාධි — පඤ්චඞ්ගිකසම්මාසමාධි, පීති ඵරණතා පඨමෙ ඣානෙ දුතියෙ ඣානෙ ච. සුඛඵරණතා තීසු ඣානෙසු. චෙතොඵරණතා පරචිත්තවිඤ්ඤාණෙ, ආලොකඵරණතා දිබ්බචක්ඛුඅභිඤ්ඤාය. පච්චවෙක්ඛණසඤ්ඤා තම්හා තම්හා සමාධිම්හා වුට්ඨිතස්ස පච්චවෙක්ඛණඤාණා. පඤ්චඞ්ගිකසමාධි—අයං සමාධි පච්චුප්පන්නසුඛො චෙව ආයතිං ච සුඛවිපාකොති පච්චත්තං යෙව ඤාණං උප්පජ්ජති. අයං සමාධි අරියො නිරාමිසොති අයං සමාධි සප්පඤ්ඤෙහි මහාපුරිසෙහි සෙවිතො පටිසෙවිතො අයං සමාධි සන්තො පණීතො පටිප්පස්සද්ධි ලද්ධො එකොදිභාවාධිගතො ඉමං සමාධිං සතො'ව සමාපජ්ජති ඉමම්හා සමාධිම්හා සතො'ව වුට්ඨහතීති පච්චත්තං යෙව ඤාණං උප්පජ්ජති,

පඤ්චමො කච්ජො

කල්‍යාණමිත්තපරියෙසනා

සමාධිං භාවෙතුකාමෙන ආදිකම්මිකෙන තාදිසො කල්‍යාණමිත්තො පරියෙසිතබ්බො. කො පරමකල්‍යාණ මිත්තො ? ඡෙකො ධම්මවිනයෙ, කුසලො කම්මකුසලක්ඛානාභිඤ්ඤසු සචෙවසු, සත්තඞ්ග සමන්නාගතො :

පියො ච ගරු භාවනීයො — වත්තා ච වචනක්ඛමො
ගම්භීරඤ්ච කථං කත්තා — නො චට්ඨානෙ නිවෙසයෙ.

කථං පරියෙසිතබ්බො ? උට්ඨානුපට්ඨානසුස්සුසා පාරිචරියාදීහි වත්තෙහි ති.

ඡට්ඨො කණ්ඩො

චරියාවිභාගො

තථාවුත්තෙන කල්‍යාණමිත්තනාචරියෙන කම්මට්ඨානදායකෙන අන්තෙවාසිකානං චරියානුරූපං කම්මට්ඨානං උග්ගණ්හාපෙතබ්බන්ති වුත්තත්තා චරියාවිභාවනමත්‍ර කාතබ්බං. චුද්දසචරියා—රාගචරියා, දොසචරියා, මොහචරියා, සද්ධාචරියා, බුද්ධිචරියා, විතක්ක චරියා, රාගදොසචරියා, රාගමොහචරියා, දොසමොහචරියා, රාගදොසමොහසමභාගචරියා, සද්ධාබුද්ධිචරියා, සද්ධාවිතක්කචරියා, බුද්ධිවිතක්කචරියා, සද්ධාබුද්ධිවිතක්ක සමභාගචරියා ති. අථ ච තණ්හාදිට්ඨි මානාදයො අපරෙ පි තිස්සො චරියායො. රාගචරියා දොසචරියා මොහ චරියාති මූලකිලෙසවසෙන තිස්සො, එතා තිස්සො චරියා කින්නිදානා ? පුබ්බාචිණ්ණතානිදානා. පුබ්බෙ කිර ඉට්ඨප්පයොගසුභකම්මබහුලො ධාතුනිදානා දොසනිදානා සෙම්භාධිකො රාගචරිතො, පිත්තාධිකො දොසචරිතො වාතාධිකො මොහචරිතො අථවා සෙම්භාධිකො මොහචරිතො වාතාධිකො රාගචරිතොති කථං ජානිතබ්බො අයං පුග්ගලො රාගචරිතො අයං දොසචරිතො අයං මොහචරිතො ති සත්තධා වෙදිතබ්බං, ආරම්මණදස්සනාදිතො, කිලෙසතොධම්මප්පවත්තිතො, ගමනතො චීවරපාරුපණතො, භොජනතො, කිච්චතො, සෙය්‍යාදිතො ඉරියාපථතො. කථං චීවරං පාරුපති භොජනං භුඤ්ජති, කථං අස්ස සෙනාසනං ගොචරො ඉරියාපථො ච චීවර සමාදනං, නිවාසනපාරුපණං, ආරම්මණං, භොජනාහාරා, යාගුභත්තඛජ්ජකාදිනි. ගොචරොති භික්ඛාචාරමග්ගාභික්ඛාචාරගාමො, රාගචරිතො පුබ්බං දිසං දොසචරිතො පච්ඡිමං, මොහචරිතො. යථාදිසං ගාමං චරති. ඉරියාපථො ති රාගචරිතො දසො විය. දොසචරිතො අධිපති විය. මොහ චරිතො විසං විය.

සත්තමො කණ්ඩො

කම්මට්ඨානානි

අවිජ්ජා ති චතූසු අරියසච්චෙසු අඤ්ඤාණං. වීහූපමා සඞ්ඛාරා කායවචීචිත්ත කම්මානි බීජූපමානි. විඤ්ඤාණං පටිසන්ධික්ඛණෙ පවත්තං චිත්තං. අඞ්කුරොපමං නාමරූපං චිත්තචෙතසිකා ධම්මා කලලරූපඤ්ච. පත්තූපමං සළායතනං. ඡඅජ්ඣත්තිකායතනා සාඛූපමා. ඵස්සො ඡ ඵස්සකාය රුක්ඛූපමා වෙදනා ඡවෙදනා කායා පුප්ඵූපමා තණ්හා. ඡතණ්හාකායා රසූපමා. උපාදනං චත්තාරි උපාදනානි. සාලිතණ්ඩුලොපමො භවො. කාම රූප අරූප භවසමුට්ඨාපකං කම්මං. බීජූපමා ජාති. භවො ඛන්ධාභිනිබ්බත්ති. පුනඞ්කුරූපමා ජරා. ඛන්ධානං පරිපාකො පක්ක ඵලූපමං මරණං. ඛන්ධානං විධංසන පරිච්ඡෙදෙ පතනූපමො. එවමිදං පුබ්බාපරකොටිරහිතං හෙතුපච්චයචක්කං බීජඅඞ්කුරරුක්ඛඵල බීජඅඞ්කුරරුක්ඛවසෙන භමති. කිංපච්චයා අවිජ්ජා? අවිජ්ජායෙව අවිජ්ජාය පච්චයො. සබ්බෙව කිලෙසා අවිජ්ජාය පච්චයා. ආසව සමුදයා අවිජ්ජාසමුදයො. අවිජ්ජා තණ්හා උපාදනාති තයො කිලෙසා සඞ්ඛාරා. භවොති ච කම්මා ඉතරෙ සත්ත විපාකාව. අවිජ්ජා සඞ්ඛාරා අතීත හෙතු, ජාතිජරාමරණං අනාගතහෙතු. අඤ්ඤෙ පන පච්චුප්පන්නහෙතු හොන්ති. හෙතුපච්චයසමුප්පාද පටිච්චසමුප්පාදෙ. ද්වාදස හෙතු පච්චයඞ්ගානි චෙව සමුප්පන්නධම්මා. ද්වාදසිමෙ ධම්මා සඞ්ඛතා අසඞ්ඛතාති වත්තුං න සක්කා. තෙයෙව හෙතු පච්චයා ධම්මා පටිච්චසමුප්පාදධම්මා හොන්ති. පච්චය-උප්පන්නා තෙ සඞ්ඛතා හොන්ති. හෙතුපච්චයා ගම්භීරසභාවා. හෙතුපච්චයා පනිමෙ සත්තධා පරිජානිතබ්බා. පඨමං සන්ධිතො. සඞ්ඛාරවිඤ්ඤාණානං එකා සන්ධි. වෙදනාතණ්හානං දුතියා සන්ධි. භවජාතීනං තතියා සන්ධි. හෙතුඵලසන්ධි, ඵලහෙතුසන්ධි හෙතුඵලසන්ධිවසෙනෙව තිසන්ධි. පඨමතතියා හෙතුඵලසන්ධි භවසන්ධි. දුතියා ඵලහෙතුසන්ධි න භවසන්ධි. කම්ම-කම්මනිමිත්තගති ගතිනිමිත්තා චතුසඞ්ඛෙපතො. අතීතකම්මකිලෙසා පච්චුප්පන්නඵලවිපාකා පච්චුප්පන්නකම්මකිලෙසා අනාගතඵලවිපාකා වීසතියා ආකාරෙහි පුරිමකම්මභවස්මිං මොහො අවිජ්ජා ආයූහණං සඞ්ඛාරා නිකන්ති තණ්හා උපගමනං උපාදනං චෙතනා භවොති පඤ්ච පුරිම කම්මභව පච්චයා ඉධ පටිසන්ධි විඤ්ඤාණං. ඔක්කන්ති නාමරූපං, පසාදෙ ආයතනං, ඵුට්ඨො ඵස්සො වෙදයිතං වෙදනා ඉති පඤ්ච ධම්මා පුබ්බකම්මස්ස පච්චයා. ඉධ මොහො අවිජ්ජා ආයූහණං සඞ්ඛාරා නිකන්ති තණ්හා උපගමනඋපාදනං චෙතනා භවොති ආයතිං පච්චයා පඤ්ච. විඤ්ඤාණනාමරූපආයතනඵස්සවෙදනාති පඤ්ච ධම්මා අනාගතභවස්ස පච්චයාති එවං වීසතියා ආකාරෙහි පරිබ්භමණං සංසාර චක්කං හෙතුඵල ඵලහෙතු හෙතුඵල වසෙන භමති චක්කතො. අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, ජාතිපච්චයා ජරාමරණං, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. පරිච්ඡෙදතො—දුවිධා ලොකියලොකුත්තර වසෙන. අවිජ්ජා අවිජ්ජාය, දුක්ඛං දුක්ඛස්ස සඞ්ඛා සඞ්ඛාය හෙතුඵලභාවමාපජ්ජති. චතුබ්බිධා කම්මකිලෙසතො. හෙතු අවිජ්ජා පුරිමභවෙ. බීජතො හෙතු බීජඅඞ්කුරානං සම්බන්ධතා. භවනික්කන්ති ඔපපාතිකරූපසහජාත කම්ම හෙතු පඨවි පබ්බත හිම චන්ද සාගර සූරියාදයො ලක්ඛණා සංගහතො ඉමෙ ද්වාදස හෙතු පච්චයා පඤ්චක්ඛන්ධෙසු ආයතනෙසු ධාතූසු සච්චෙසු සංගය්හන්තීති.

එකාදසමො කණ්ඩො

දුතියභාගො

සච්චානි

චත්තාරි අරියසච්චානි, දුක්ඛං අරියසච්චං දුක්ඛසමුදයං අරියසච්චං දුක්ඛනිරොධං අරියසච්චං දුක්ඛනිරොධමග්ගං අරියසච්චන්ති. කුච්ඡිතං අනෙකොපද්දවාධිවාහං තුච්ඡං පරපරිකප්පිතධුවසුභසුඛඅත්තරහිතං පීළනසඞ්ඛරණවිපරිණාමසන්තාපකරතථඅනඤ්ඤථා-භාවරහිතං දුක්ඛසච්චං නාම. තස්ස දුක්ඛස්ස සංයොගඋප්පත්තිකාරණං ආයූහණං සංයොගනිදානපළිබොධකරතථඅනඤ්ඤථාභාවං සමුදයසච්චන්නාම. දුක්ඛපරොධස්ස අභාවං නිස්සරණ විවෙක අසඞ්ඛත අමත තථාවිතථ භාවං නිරොධ සච්ච ංනාම. දුක්ඛනිරොධප්පත්තිපටිපදසඞ්ඛාතං, නිය්‍යානහෙතු දස්සනාධිපතෙය්‍යං. තථාවිතථභාවං දුක්ඛනිරොධගාමිණීපටිපද අරියසච්චං නාම. අරියෙහි පටිවිද්ධං අරියභාවකරං සච්චන්ති අරියසච්චන්ති වුච්චති. ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං සඞ්ඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධාපි දුක්ඛා. ඛන්ධානං පාතුභාවො ජාති නාම. ධාතූනං පරිපාක භාවො බල රූපඉන්ද්‍රියසති-පඤ්ඤානං හානි ජරා නාම. එකභවපරියාපන්නජීවිතින්ද්‍රියප්පබන්ධවිච්ඡෙදෙ මරණං. බ්‍යසනාදිපරිපීළිතස්ස චිත්තසන්තාපො සොකො නාම. ව්‍යසනාදීහි පරිපීළිතස්ස වචීපලාපො පරිදෙවො නාම. කායිකා පීළා දුක්ඛං, මනසිජාතං චිත්තපීළනං දොමනස්සං, බ්‍යසනාදීහි පරිපීළිතස්ස අධිමත්තචෙතොදුක්ඛසම්භූතො චිත්තදහො උපායාසො. අමනුඤ්ඤසත්තසඞ්ඛාරසමොධානං චිත්තවිඝාතාකාරං අප්පියෙහි සම්පයොගො. ඉට්ඨපියසත්තසඞ්ඛාරෙහි විනාභාවො පියෙහි විප්පයොගො, අලබ්භනෙය්‍යෙසු අජාති-අජරාඅමරණාදිසු ඉච්ඡාවිඝාතො ඉච්ඡිතාලාභදුක්ඛං. සබ්බදුක්ඛසඞ්ගාහිකා පඤ්ච උපාදානක්ඛන්ධා දුක්ඛං.

වත්ථු දුක්ඛාජාති, මරණං, අප්පියානං සම්පයොගො, පියානං විප්පයොගො යම්පි ඉච්ඡං න ලභති තම්පි, සඞ්ඛිත්තෙන පඤ්ච උපාදානක්ඛන්ධා දුක්ඛාති. සභාවදුක්ඛාසොකපරිදෙව-දොමනස්සඋපායාසදුක්ඛාතිතිවිධං දුක්ඛදුක්ඛං කායිකංචෙතසිකං, විපරිණාමදුක්ඛං. සාසවා සුඛා වෙදනා විපරිණාමවත්ථු, සඞ්ඛාරදුක්ඛං පඤ්ච උපාදානක්ඛන්ධා. දුක්ඛසච්චං.

දුක්ඛසමුදයො

යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං කාම-තණ්හා භවතණ්හා විභවතණ්හා ඉදං වුච්චති දුක්ඛසමුදයං අරියසච්චන්ති. යා අයං තණ්හා පුනබ්භවකරණසීලා නන්දිසඞ්ඛාතෙන රාගෙන සහපවත්තා භවයොනිගතිසත්තාවාසෙසු අභිනන්දයමානාපඤ්චකාමගුණපටිබද්ධා සස්සතදිට්ඨිඋච්ඡෙදදිට්ඨිසහජාතා තණ්හා සමුදයන්ති වුත්තා.

දුක්ඛ නිරොධො

යො තස්සා යෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො අයං වුච්චති දුක්ඛනිරොධං අරිය සච්චන්ති. සමුදයසඞ්ඛාතාය තණ්හාය අනවසෙසවිරාගං අනවසෙසනිරොධං පහාණං නිබ්බාණං දුක්ඛනිරොධං අරියසච්චං නාම. දුක්ඛනිරොධමග්ගො අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සම්මාදිට්ඨි චතුසච්චෙසු ඤාණං නිබ්බාණෙ ඤාණ දස්සනං. සම්මාසඞ්කප්පො (තිවිධකුසලසංකප්ප නිබ්බාණෙ සංකප්පො සම්මා වාචා චතුබ්බිධපාපචරිතවිරති මිච්ඡාවාචාය පහාණං සම්මාකම්මන්තො තිවිධ පාපචරිතා විරති මිච්ඡා කම්මස්ස පහාණං සම්මාආජීවො. මිච්ඡාජීවා විරති මිච්ඡාජීවස්ස පහාණං. සම්මාවායාමො චත්තාරි සම්මප්පධානානි මිච්ඡාවිරියස්ස පහාණං. සම්මාසති චත්තාරො සතිපට්ඨානා, නිබ්බාණෙ සති සම්මාසමාධි චත්තාරි ඣානානි, නිබ්බාණෙ චිත්තෙකග්ගතා සත්තතිංස බොධපක්ඛියා ධම්මා අරියෙ යෙව අට්ඨඞ්ගිකෙමග්ගෙ අන්තොගධා. වචනත්ථතො ලක්ඛණතො කමතො සඞ්ඛෙපතො සච්ඡිකාතබ්බත්ථෙන. සඞ්ඛෙපතො දුක්ඛං සක්කායදිට්ඨිවාරපිදහනසමත්ථං සමුදයො උච්ඡෙදදිට්ඨිවාරපිදහන-සමත්ථො නිරොධො සස්සතදිට්ඨිවාරපිදහනසමත්ථො මග්ගො මිච්ඡාදිට්ඨිවාරපිදහනසමත්ථො උපමාතො විසරුක්ඛඔරිමතීරභාරා පරිච්ඡෙදතො චත්තාරි සච්චානි, සම්මුතිසච්චං, පච්චෙකසච්චං පරමත්ථසච්චං අරියසච්චං. තං ඉධාධිප්පෙතං. ගණනතො එකත්තතො සච්චතො, අවිතථතො, ධම්මත්ථතො සුඤ්ඤතත්ථතො. නානත්තතො ලොකියං සාසවං සංයොජනීයං සඞ්කිලෙසිකං. ලොකුත්තරං අනාසවං අසඞ්කිලෙසිකං. සඞ්ඛතං තිනි සච්චානි අසඞ්ඛතං නිරොධ සච්චං. අරූපං තිනී සච්චානි. සරූපං දුක්ඛසච්චං දුවිධං. අකුසලං සමුදයසච්චං, කුසලං මග්ගසච්චං. අබ්‍යාකතං නිරොධසච්චං, කුසල අකුසල අබ්‍යාකතං. දුක්ඛසච්චං පරිඤ්ඤෙය්‍යං. සමුදයසච්චං පහාතබ්බං. නිරොධසච්චං සච්ඡිකාතබ්බං. මග්ගසච්චං භාවෙතබ්බන්ති චතුබ්බිධං. කමවිත්ථාරතො ඒකවිධං දුක්ඛං සවිඤ්ඤාණකකායං සමුදයං. අභිමාන නිරොධං සමුදයප්පහාණං මග්ගං කායගතාසති. දුවිධං නාමරූපඅවිජ්ජාභවතණ්හා සමථවිපස්සනා තිවිධං දුක්ඛදුක්ඛං, තිවිධඅකුසල මූලානි සීලසමාධිපඤ්ඤ චතුබ්බිධං සක්කාය භාවවත්ථු. චත්තාරො විපල්ලාසා, චත්තාරො සතිපට්ඨානා, පඤ්චවිධා, පඤ්චගතියො, පඤ්ච නිවරණානි, පඤ්ච ඉන්ද්‍රියානි. ඡබ්බිධං—ඡඵස්සායතනානි ඡ තණ්හාකායා ඡ පටිනිස්සග්ගධම්මා. සත්තවිධං—සත්ත විඤ්ඤාණට්ඨිතියො, සත්තානුසයා, සත්තබොජ්ඣඞ්ගානි, අට්ඨවිධං—අට්ඨ ලොකධම්මා, අට්ඨමිච්ඡත්තා අට්ඨඞ්ගිකොමග්ගො, නව විධා—නවසත්තාවාසා නවතණ්හා මූලකාධම්මා නවසඤ්ඤාමනසිකාරමූලකා ධම්මා, දසවිධා–දසදිසාචරියා, දසසංයොජනානි, දසසඤ්ඤා. සඞ්ගහතො–ඛන්ධසංගහදුක්ඛං පචක්ඛන්ධෙසු. සමුදයමග්ගානි සඞ්ඛාරක්ඛන්ධෙ, නිරොධො ඛන්ධෙසු අසංගහිතො. ආයතනසඞ්ගහෙ–දුක්ඛං චාදසසු ධම්මායතනෙසු ඉතරෙ ධාතුසඞ්ගහෙ. දුක්ඛං අට්ඨාරසසු ධම්මධාතුසු. ඉතරෙ ඉති එකාදස අරිය-සච්චාභිගමූපායා ති.

12. ද්වාදසමො විසුද්ධි කථා

දිට්ඨිවිසුද්ධිසීලවිසුද්ධිචිත්තවිසුද්ධීහි සමන්නාගතො යොගාවචරො යද ඛන්ධධාතුආයතනාදීනි ආජානාති හෙතුපච්චයඅරියසච්චානි පටිබුජ්ඣති තද සො එතෙසු ධම්මෙසු ධම්මමත්තං විනා සත්තො ජීවො නත්ථීති විජානාති. එතෙසු ධම්මෙසු නාමරූපමත්තමෙව හොතීති අඤ්ඤමඤ්ඤං නිස්සායෙව පවත්තන්ති. යථානාම දුන්දුභිසද්දෙ ජච්චන්ධපඞ්ගුලො නාමං නිස්සාය රූපෙ රූපං නිස්සාය නාමඤ්ච පවත්තති, විනා එතෙහි දෙහො නත්ථි, අඤ්ඤෙ පන අහං ගච්ඡාමි, තිට්ඨාමි ති වා සො ගච්ඡති තිට්ඨතීති වදන්ති, තං නයුජ්ජති. නාමරූපමෙව ගච්ඡති තිට්ඨති සයති භුඤ්ජතීති නාමරූපමෙව වවත්ථපෙති. දුක්ඛෙඤාණං යථාභූතඤාණදස්සනං විසුද්ධිමග්ගො නාමරූපවවත්ථානං දිට්ඨිවිසුද්ධිනාම.

කඞ්ඛාවිතරණවිසුද්ධි හෙතුපච්චයපරිග්ගහෙ ඤාණං. සචෙ පටිලද්ධසීලවිසුද්ධිචිත්තවිසුද්ධිදිට්ඨිවිසුද්ධිසහිතස්ස යොගාවචරස්ස චිත්තෙ සත්තසඤ්ඤා අප්පහීණා හොති දුක්ඛ නිදානං තෙන පරියෙසිතබ්බං, අනුලොම පටිලොමං හෙතුපච්චයවිභාගො මනසිකාතබ්බො. වෙදනා පච්චයා තණ්හාති ආදිනා අනුලොමපරිඤ්ඤ හොති, එවං පරිජානන්තස්ස අවිජ්ජාපච්චයා සඞ්ඛාරා සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපපච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සො ඵස්සපච්චයා වෙදනා වෙදනාපච්චයා තණ්හා තණ්හාපච්චයා උපාදනං උපාදනපච්චයා භවො භවපච්චයා ජාති ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති එවං දුක්ඛසමුදයො හොතීති අනුලොමවසෙන හෙතුපච්චයපරිඤ්ඤ කාතබ්බා. එවං හෙතු පච්චයෙ පරිගණ්හන්තස්ස උප්පජ්ජනකඤාණං ධම්මට්ඨිතිඤාණං හෙතුපච්චය පරිග්ගහෙඤාණං කඞ්ඛාවිතරණවිසුද්ධීති වෙදිතබ්බං. යද යොගාවචරො එවං හෙතුපච්චයං පරිජානාති, අථ සො පටිලොමවසෙන හෙතුපච්චයෙ පරිගණ්හාති, අවිජ්ජා නිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො නාමරූපනිරොධා සළායතන නිරොධො සළායතනනිරොධා ඵස්සනිරොධො ඵස්සනිරොධා වෙදනානිරොධො වෙදනානිරොධා තණ්හානිරොධො තණ්හානිරොධා උපාදනනිරොධො උපාදනනිරොධා භවනිරොධො භවනිරොධා ජාතිනිරොධො ජාති නිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සා නිරුජ්ඣන්ති.

ඉමිනා පටිලොමහෙතුපච්චයපරිග්ගාහිකාය පඤ්ඤාය දුක්ඛස්ස මූලං පරිජානාති. එවං සො තණ්හාය පහානූපායං පරියෙසති. තද සො පඤ්චසු උපාදානක්ඛන්ධෙසු එකසතාසීතිකාකමෙහි තණ්හං පරිවජ්ජෙති. යථා රූපක්ඛන්ධෙ එවං මනසිකරොති අත්ථි රූපං අතීතං අනාගතං පච්චුප්පන්නං අජ්ඣත්තං බහිද්ධා මහන්තං පරිත්තං ඔළාරිකං සුඛුමං දූරෙ සන්තිකෙ සබ්බං රූපං අනිච්චන්ති පස්සති. එවමෙව ඉතරෙසු චතූසුපි තණ්හං පරිවජ්ජෙති. එකෙකක්ඛන්ධෙ ද්වාදසවසෙන සට්ඨිවිධං හොති තං දුක්ඛං වයෙන ගුණිතං සතාධිකාසීතිවිධාකාරා හොන්ති. අථ ච අනිච්චදුක්ඛඅනත්තසඤ්ඤාතණ්හා වසෙන ඡඅජ්ඣත්තායතනඡබාහිරායතනා. ඡවිඤ්ඤාණකායා ඡඵස්සකායා ඡවෙදනාකායා ඡසඤ්ඤාකායා ඡචෙතනා කායා ඡතණ්හා කායා ඡවිතක්කා ඡවිචාරාති සතාධිකාසීතිවිධ පරිජානනාහොති (3 × 6 × 10=180) යොගාවචරො සබ්බෙ සඞ්ඛාරා ඛණෙ ඛණෙ අඤ්ඤථාභාවං පාපුනන්තීති සල්ලක්ඛෙති, සඞ්ඛාරා සබ්බෙ නිච්චනවා යෙවාති සල්ලක්ඛෙති. දීපසිඛා විය නිච්චනවා අභිනවා යෙව. තථා සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා අනත්තා ති.

අනිච්චානුපස්සනාය අනිමිත්තධාතු. දුක්ඛානුපස්සනාය අප්පණිහිතධාතු. අනත්තානුපස්සනාය සුඤ්ඤතාධාතු. තයො භවා පඤ්ච ගතියො සත්ත විඤ්ඤාණට්ඨිතියො නව සත්තාවාසා අනිච්චා දුක්ඛා අනත්තාති විජානාති. පරිච්ඡෙදඤාණං නිට්ඨිතං.

උදයබ්බයඤාණං

එවං පඤ්චසු උපාදානක්ඛන්ධෙසු විඤ්ඤාතතිලක්ඛණසභාවො යොගාවචරො තෙ පජහිතුමෙව ඉච්ඡති. සො උපාදානප්පහාණාය තිහි නිමිත්තෙහි උදයබ්බයං පරිගණ්හාති. තිසු නිමිත්තග්ගහණෙසු කිලෙසනිමිත්තගහණං විපල්ලාසගාහප්පහාණං, අනිච්චඅද්ධුවඅසුභදුක්ඛෙසු වත්ථූසු පුථුජ්ජනානං නිච්චධුවසුභසුඛඅත්තසඤ්ඤප්පහාණං පදීපස්ස තෙලං ආකිරන්තො විය කිලෙසන්ධකාරං පජහති. ඉදං කිලෙස නිමිත්තග්ගහණං. දුතියං සමාධිනිමිත්තගහණං. අට්ඨතිංසආරම්මණභූතෙසු කම්මට්ඨානෙසු එකං භාවෙත්වා චිත්තං පරිසොධෙති පග්ගණ්හාති අඞ්කුසෙන හත්ථි විය ආරම්මණෙ චිත්තං සණ්ඨාපෙති. තතියං විපස්සනා නිමිත්තග්ගහණං. ඛන්ධෙසු යථාභූතවිසෙසදස්සනං උදයබ්බයං විපස්සනානිමිත්තගහණංනාම. ඝොරාසිවිසං ගහිතො පුරිසොවිය තං ඡඩ්ඩෙතුකාමො හොති. තිහි නිමිත්තගාහෙහි පරිඤ්ඤාතලක්ඛණෙ ආරම්මණතො චෙව මනසිකාරතො චාති වීහාකාරෙහි තෙ ධම්මෙ පජහති හෙතුතො පච්චයතො සරසතො ති තිහාකාරෙහි උදයබ්බයෙ පරිජානාති. එවං සබ්බසඞ්ඛාරානං උදයබ්බයං පරිගණ්හන්තො යොගාවචරො එකලක්ඛණා ධම්මා නානත්තධම්මා අකිරියා ධම්මා සම්මාධම්මාති එකත්තනයනානත්තනයඅබ්‍යාපාරනයඑවංධම්මතානයාති චතුහාකාරෙහි පජහති. එවං උදයවයවසෙන සඞ්ඛාරපරිච්ඡෙදඤාණං උප්පාදෙති.

භඞ්ගානුපස්සනාඤාණං

උදයබ්බයදස්සී යොගාවචරො සම්මසිතසඞ්ඛාරාදීනවො උප්පාදං පහාය වයස්සභාවමෙව අනුපස්සති. සො තිහෙවාකාරෙහි භඞ්ගස්සභාවං පස්සති. කලාපතො යමකතො පරිච්ඡෙදතො ච සබ්බසඞ්ඛාරෙ විපරිණාමධම්මෙ උප්පජ්ජමානෙ ජීයමානෙ මීයමානෙ පස්සති. ඔභාසො ඤාණං පීති පස්සද්ධි සුඛං අධිමොක්ඛො පග්ගහො උපට්ඨානං උපෙක්ඛාදයො උපක්කිලෙසා ච පහීයන්ති. නෙක්ඛම්මනිස්සරණපටිනිස්සග්ගො හොති, ලොකියධම්මා සඞ්ඛාරාරම්මණා ලොකුත්තරධම්මා නිබ්බාණාරම්මණා සබ්බමිදං යථාසභාවවසෙන පස්සමානො සඞ්ඛාරානං වයස්සභාවමෙව පස්සති. ඉදං භඞ්ගානුපස්සනාඤාණං නිට්ඨිතං.

13. තෙරසමො නිබ්බාණකච්ඡා

සච්ච විභාගො භයතුපට්ඨානඤාණං

භඞ්ගානුපස්සී යොගාවචරො වයස්සභාවං නිස්සාය ඛන්ධෙහි චෙව සඞ්ඛාරෙහි භායති, තයො භවෙ පඤ්ච ගතියො සත්ත විඤ්ඤාණට්ඨිතියො නව සත්තාවාසා දවානලපරිග්ගහිතවනගහණං විය අනුබන්ධන්තං උක්ඛිත්තාසිං බීභච්ඡපුරිසං විය, ඝොරාසිවිසං විය ච පස්සති, භීරුකජාතිකො පුරිසො විය අනිමිත්තානුපස්සනාය චිත්තං පතිට්ඨාති.

මුඤ්චිතුකම්‍යතාඤාණං

යද යොගාවචරො සබ්බ සඞ්ඛාරෙ භයතො පස්සති සො සබ්බසඞ්ඛාරෙහි පරිමුඤ්චිතුකාමො හොති අග්ගිනා පරිඩය්හමානො ගෙහෙ ජීවිතුකාමා ඝරමානුසකා විය චොරෙහි පරිවාරිතො විය සබ්බසඞ්ඛාරෙහි මුඤ්චිතුකාමො හොති. ආදීනවානුපස්සනා නිබ්බිදනුපස්සනා භයතුපට්ඨානාදයො එකට්ඨචනෙතාගධා'ව.

අනුලොමඤාණං

යස්මිං සමයෙ යොගාවචරො මුඤ්චිතුකම්‍යතා ඤාණං උප්පාදෙති සබ්බසඞ්ඛාරෙහි මුත්තිං පස්සති විමොක්ඛාධිප්පායො හොති. පටිසඞ්ඛානුපස්සනා සඞ්ඛාරුපෙක්ඛාඤාණානන්තරං අනුලොමඤාණං උප්පාදෙති, 'සබ්බෙ සඞ්ඛාරා අනිච්චා දුක්ඛා අනත්තා තෙසං නිච්චසුඛපරමත්ථතා නාම නත්ථී'ති සල්ලක්ඛෙති, සත්තතිංස බොධිපක්ඛියෙ ධම්මෙ මනසිකරොති සතිපට්ඨානාදිසු සත්තතිංසබොධිපක්ඛියෙසු ධම්මෙසු ඤාණං සච්චානුලොමිකං අනුලොමඤාණං නාම හොති.

ගොත්‍රභූඤාණං

පුථුජ්ජනගොත්තං අභිභවති අරියගොත්තං භාවයතීති ගොත්‍රභූඤාණං. තම්පන න විපස්සනාඤාණං නාපි මග්ගඤාණං භවති. නවන්නං මහාවිපස්සනානමනෙන මග්ගඤාණස්ස පුරෙතරං උප්පජ්ජති මග්ගස්ස ආවජ්ජනට්ඨානං හොති විපස්සනාසොතාවසානෙ පතිතත්තා විපස්සනාසඞ්ඛං ගච්ඡති මග්ගස්ස ආවජ්ජනීයං ඨානං නාම හොති.

ගොත්‍රභූඤාණස්ස සමනන්තරමෙව දුක්ඛෙ ඤාණං හොති දුක්ඛසමුදයං පජහති දුක්ඛනිරොධං සච්ඡිකරොති මග්ගං භාවෙති සොතාපත්ති මග්ගඤාණං උප්පජ්ජති. සබ්බෙ පි බොධිධම්මා පාතුභවන්ති. අපච්ඡාපුරිමං සච්චපරිච්ඡෙදං කරොති. ඉදං කිර සච්චපරිච්ඡෙදඤාණං නාවා විය සංසාරමහම්බුධිං තාරෙති පදීපං විය කිලෙසන්ධකාරං විධංසෙත්වා විජ්ජාලොකං උප්පාදෙන්තො සූරියුග්ගමනං විය ලොකුත්තරධම්මං පභාසෙන්තො උප්පජ්ජති. ගොත්‍රභූඤාණං කිර කිලෙසග්ගිනා ඩය්හමානං තිභවමහානගරම්පහාය ධාවමානො ඛෙමෙ නිබ්බාණපුරද්වාරෙ එකං පාදං ඨපෙත්වා ඨිතපුරිසො විය ච, මග්ගඤාණං පාදද්වයමෙව ඛෙමපුරද්වාරස්ස අන්තොඨපිතපුරිසො විය ච දට්ඨබ්බා. තතො ගොත්‍රභූඤාණං එකපාදෙන අභයපුරං අඤ්ඤෙන පාදෙන තිභවදුග්ගං අක්කමිත්වා ඨිතපුරිසො විය න සම්මා පරිමුත්තො හොති. මග්ගඤාණං උභයෙහිපි පාදෙහි ඛෙමපුරෙ ඨිතො සබ්බභවපරිත්තානං ගතො පුරිසො වියාති වෙදිතබ්බං.

සච්චපරිච්ඡෙදඤාණලාභී යොගාවචරො සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාසො ති තීනි සඤ්ඤොජනානි පහාය නිබ්බාණමග්ගසොතං ආපන්නො අරියො ති සඞ්ඛං ගච්ඡති. සක්කායදිට්ඨියා පහානෙන සබ්බෙව ද්වාසට්ඨිදිට්ඨියො ජහතෙව යථා සක්කායදිට්ඨි සබ්බෙසමෙව මිච්ඡාදිට්ඨීනං මූලං හොති. සො යාව අරහත්තං අනුක්කමෙන භාවෙති සොතාපත්ති ඵලමපත්තෙ පච්චවෙක්ඛණඤාණං උප්පජ්ජති. තයො සොතාපන්නා මුදින්ද්‍රියො සත්තක්ඛත්තුපරමොමජ්ඣිමින්ද්‍රියො කොලංකොලො තික්ඛින්ද්‍රියො එකබීජීති. තිණ්ණං සඤ්ඤොජනානං පහාණා කාමරාගව්‍යාපාදනං තනුත්තා සකදගාමී හොති සකිදෙව කාමධාතුභවමාගාමී හොති. පඤ්චන්නං ඕරම්භාගියානං සඤ්ඤොජනානං පහාණා අනාගාමී හොති අනාගන්ත්වා ඉමං ලොකං පඤ්චසු සුද්ධාවාසෙසු මූලභූතෙසු චතූසු එකෙකස්මිං අසඞ්ඛාරපරිනිබ්බායී සසඞ්ඛාරපරිනිබ්බායී උපහච්චපරිනිබ්බායී අන්තරාපරිනිබ්බායී උද්ධංසොතො අකනිට්ඨගාමී ති පඤ්චවසෙන වීසති, අකනිට්ඨභවනෙ උද්ධංසොතඅකනිට්ඨගාමිං පුග්ගලම්පහාය චත්තාරො ති චතුවීසති අනාගාමිනො හොන්ති. අවිහඅතප්පසුදස්සසුදස්සීඅකනිට්ඨකා ඉති පඤ්ච සුද්ධාවාසා. සුද්ධාවාසවාසිනො තත්ථපරිනිබ්බායිනො හොන්ති. තෙ සබ්බකිලෙසදරථෙ විනොදෙත්වා අරහත්තං පාපුණන්ති.

පකිණ්ණකධම්මා

එත්ථ පකිණ්ණකධම්මා වෙදිතබ්බා. විපස්සනා, විතක්කා, පීති, වෙදනා භූමි, ඉන්ද්‍රියානි, විමොක්ඛා, කිලෙසා, විසමාධිසමාපජ්ජනං, අරහත්තප්පත්තියා කිඞ්කාතබ්බන්ති විභාවෙතුං ඉමෙධම්මා විජානියා'ව.

විපස්සනා

ද්වෙ විපස්සනා, ඣානවිපස්සනා, සුක්ඛවිපස්සනා ති. සචෙයොගාවචරො සමාධිබලෙන පඤ්චනීවරණෙ පජහාති. සො සමාධිපුබ්බඞ්ගමං විපස්සනං වඩ්ඪෙති. සචෙ අත්තනො පඤ්ඤාබලෙන නීවරණෙ පජහති විපස්සනාපුබ්බඞ්ගමං සමථං සො භාවෙති.

විතක්කා: සුක්ඛවිපස්සනාවසෙන විත්ථාරිතං ඉමිනා යොගාවචරෙන ලද්ධං අලද්ධං කිඞ්කිං ති දීපෙති සවිතක්කභූමි. අවිතක්කභූමි සප්පීතිකභූමි නිප්පීතිකභූමි ති දස්සනභූමි සොතාපත්තිමග්ගො අථවා මිච්ඡාදිට්ඨි. සඞ්කප්පභූමි, සෙසා තයො මග්ගා චෙව ඵලා ච. අනිච්චදිට්ඨියා මනසිකාරො, අථ ච සෙඛභූමි චත්තාරො මග්ගා තීනි ච ඵලානි. අසෙඛභූමි අරහත්තඵලං.

ඉන්ද්‍රියානි: තීනි ලොකුත්තරඉන්ද්‍රියානි අනඤ්ඤාතංඤස්සාමීතින්ද්‍රියං අඤ්ඤින්ද්‍රියං අඤ්ඤාතාවින්ද්‍රියං සොතාපත්තිමග්ගඤාණං සෙසමග්ගත්තයෙ ඤාණං චෙව පඨම ඵලඤ්ච, සෙසඵලත්තයං අරහත්තඵලන්ති. විමොක්ඛා අනිමිත්තඅප්පනිහිතසුඤ්ඤතා, කිලෙසා: තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො. තිස්සො පරියෙසනා කාමපරියෙසනා භවපරියෙසනා බ්‍රහ්මචරියපරියෙසනා. චත්තාරො ආසවා කාමො, භවො, දිට්ඨි, අවිජ්ජා. චත්තාරො ගන්ථා: අභිජ්ඣා, ව්‍යාපාදෙ, සීලබ්බතපරාමාසො, ඉදංසච්චාභිනිවෙසො.

චත්තාරො ඔඝා, චත්තාරො යොගා: කාමො භවො දිට්ඨි අවිජ්ජා. චත්තාරි උපාදනානි: කාමො, දිඨි සීලබ්බතං අත්තවාදෙ'ති. චතස්සො අගතියො: ඡන්ද දොසො භයං මොහො. පඤ්ච මච්ඡරියානි: ආවාසමච්ඡරියං, කුලලාභවණ්ණධම්මමච්ඡරියං. පඤ්ච නීවරණානි: කාමච්ඡන්ද බ්‍යාපාදෙ ථීනමිද්ධං උද්ධච්චකුක්කුච්චං විචිකිච්ඡා. ඡ විවාදමූලානි: කොධො මක්ඛො ඉස්සා සාඨෙය්‍යං පාපිච්ඡතා සන්දිට්ඨිපරාමාසතා ති. සත්ත අනුසයා: කාමරාගො පටිඝො මානො දිඨි, විචිකිච්ඡා භවරාගො, අවිජ්ජා ති. අට්ඨලොකධම්මා: ලාභො අලාභො අයසො යසො නින්ද පසංසා සුඛං දුක්ඛං. නවමානා:

සෙය්‍යස්ස සෙය්‍යොහමස්මීති මානොත්‍යාදි සදිසො හීනො මජ්ඣිමස්ස සෙය්‍යො සදිසො හීනො හීනස්ස සෙය්‍යො සදිසො හීනො හමස්මීති. දස කිලෙසවත්ථූනි: ලොභො දොසො මොහො මානො දිට්ඨි විචිකිච්ඡා ථීනං උද්ධච්චං අහිරිකං අනොත්තප්පං. දසාඝාතවත්ථූ, දස අකුසලකම්මපථා: පාණාතිපාතො අදින්නාදානං කාමෙසු මිච්ඡාචාරො මුසාවාදො පිසුනාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපො අභිජ්ඣා බ්‍යාපාදො මිච්ඡාදිට්ඨීති. දස සඤ්ඤොජනානි: කාමරාගො පටිඝො මානො දිට්ඨි විචිකිච්ඡා භවරාගො අවිජ්ජා සීලබ්බතපරාමාසො ඉස්සා මච්ඡරියං. දස මිච්ඡත්තා ද්වාදස විපල්ලාසා ද්වාදස අකුසලචිත්තුප්පාද. එවං චතුත්තිංසාධිකසතං කිලෙසා වජ්ජනීයා හොන්ති මග්ගවජ්ඣා.

ද්වෙ සමාධියො: අපුථුජ්ජනසෙවිතා ඵලසමාපත්ති, සඤ්ඤාවෙදයිතා නිරොධසමාපත්තීති. කිං ඵලසමාපත්ති නාම ?. ඉදං සාමඤ්ඤඵලං චිත්තස්මිං නිබ්බාණං පතිට්ඨානෙන අරියඵලස්ස නිරොධෙ අප්පණා හොති, ඉදං ඵල සමාපත්ති නාම. කිමත්ථං තං ඵලසමාපත්තීති වුච්චති?. ඉදං නෙව කුසලං න අකුසලං න කිරියචිත්තං. ලොකුත්තරමග්ගඵලානං විපාකමත්තමෙව හොති. තස්මා ඵලසමාපත්තීති වුච්චති. කො ඵලසමාපත්තිං අප්පෙති, ? අරහන්තො ච අනාගාමිනො ඵලසමාපත්තිං අප්පෙන්ති තෙසං සමාධි ථාමගතො විසසත්ථා සබ්බෙපි අරියා සකං සකං ඵලසමාපත්තිං සමාපජ්ජන්තීති අභිධම්ම පරියායෙන වුච්චතෙ. සොතාපත්තිමග්ගපටිලාභත්ථාය උප්පාදං අභිභූයාතීති ගොත්‍රභූ සොතාපත්තිඵලසමාපත්තත්ථාය උප්පාදං අභිභූයාතීති ගොත්‍රභූ. එවං සබ්බත්ථ. කෙචි පන සොතාපන්නසකදාගාමිනොපි න සමාපජ්ජන්ති. උපරිමා ද්වෙ යෙව සමාපජ්ජන්තීති වදන්ති. ඉදඤ්ච තෙසං කාරණං එතෙහි සමාධිස්මිං පරිපූරකාරිණො ති. අපුථුජ්ජනා ලොකියසමාපත්තිං සමාපජ්ජිතුං සක්කොන්ති. සබ්බෙසම්පි අරියානං ඵලසමාපත්ති සමාපජ්ජිතුං සක්කා භවිතබ්බං තථාපි සමාධිලාභිනො ච සමාපජ්ජන්ති. යථා හි පුරිසො ඝම්මාභිතත්තො තසිතො පිපාසිතො උදකං පස්සෙය්‍ය ගම්භීරෙ කූපෙ අරජ්ජුකුඩවෙ, න සො පිපාසං පටිවිනොදෙතුං පටිබලො හොති. එවමෙව උදකාහාරකරජ්ජූපමසමාධිරහිතානං අරහන්තානම්පි ඵලසමාපත්තිසමාපජ්ජනං න හොතෙව.

කිමත්ථං අරියා ඵලසමාපත්තිං සමාජ්ජන්ති ? දිට්ඨධම්මසුඛවිහාරත්ථං. අනිමිත්තො චෙතොසමාධි හි ආනන්ද කායිකො ඵාසුවිහාරො හොති. කථං සමාපජ්ජති? සබ්බනිමිත්තානං අමනසිකාරා අනිමිත්තාය ධාතුයා මනසිකාරා සමාපජ්ජති. කථඤ්ච මනසිකරොති? අසඞ්ඛතං අමතධාතුං සන්තතො මනසිකරොති. කෙනාකාරෙන සමාපජ්ජති. කථං සමාපත්තියා නිසීදති, කථං උට්ඨාතීති වෙදිතබ්බං. ඵලසමාපත්ති ලොකියා උදාහු ලොකුත්තරා ති? අයං සමාපත්ති ලොකුත්තරා න ලොකියා.

කද කථංවා අනාගාමිනො ඵලසමාපත්තිං භාවෙන්ති?. කථං ගොත්‍රභූඤාණං ඵලසමාපත්තිං න උප්පාදෙති? ති. කථං සමනන්තරමෙව අරහත්තමග්ගො ගොත්‍රභූඤාණං විපස්සනාදස්සනං න හොති. තම්පන සමාපත්තිනින්නං ථාමවන්තඤ්ච න හොති. තස්මා න උප්පජ්ජති. යෙ පන වදන්ති සොතාපන්නො ඵලසමාපත්තිං සමාපජ්ජිස්සාමීති විපස්සනං පට්ඨපෙත්වා සකදාගාමී හොති සකදාගාමී ච අනාගාමී ති තෙ වත්තබ්බා එවං සති අනාගාමී අරහා භවිස්සති. අරහා පච්චෙකබුද්ධො පච්චෙක බුද්ධො ච සම්බුද්ධොති. තන්න. ද්විධා ඵලවිසෙසා. වීහි ආකාරෙහි රසානුභවනං හොති. සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්තිඉමාය සමාපත්තියා වාසනා හොති. කා සඤ්ඤාවෙදයිතනිරොධසමාපත්ති?. චිත්තචෙතසිකානං අප්පවත්ති. කො තං සමාපජ්ජති?. අනාගාමී චෙව අරහන්තො ච සමාපජ්ජන්ති. තෙසම්පන අරියානං සමාධි සුභාවිතො. සොතාපන්නසකදාගාමිනො අරූපාවචරවාසිනොපි සමාපජ්ජිතුං න සක්කොන්ති සඤ්ඤා වෙදයිතනිරොධසමාපත්තිං. කෙන බලෙන සමාපජ්ජති. සමථවිපස්සනාභාවනාබලෙන සමාපජ්ජති. කෙසං සඞ්ඛාරානං අත්ථඞ්ගමා තං සමාපජ්ජති

වෙ?. කායසඞ්ඛාරචිත්තසඞ්ඛාරානං අත්ථංගමෙන සමාපජ්ජති. කතමානි පුබ්බකිච්චානි.? සත්ථුපක්කොසනසඞ්ඝවහානපරිච්ඡෙදඅවිතික්කමඅධිට්ඨානානි. කිමත්ථං සමාපජ්ජන්ති?. දිට්ඨධම්මසුඛවිහාරත්ථං. අයං අරියානං සබ්බපච්ඡිමා ආනෙඤ්ජා සමාපත්ති අභිඤ්ඤාබල-විප්ඵාරසමාධි. ආයස්මා සඤ්ජීවො අත්තනො දෙහපරිරක්ඛනත්ථං විය. කථං උට්ඨානං? අහංසමාපත්තිතො වුට්ඨහිස්සාමීති ආභොගං නත්ථි. පුබ්බෙ කතසන්නිට්ඨානපරිච්ඡෙද-වසානෙ උට්ඨානං හොතෙව. කෙන චිත්තෙන උට්ඨාති? අනාගාමී අනාගාමිඵලචිත්තෙන අරහා අරහත්තඵලචිත්තෙන උට්ඨාති. කති ඵස්සා ඵුසන්ති? සුඤ්ඤතා අනිමිත්තා අප්පණිහිතා ති තයො ඵස්සා ඵුසන්ති. කෙ සඞ්ඛාරා පඨමං පාතුභවන්ති?. පඨමං කායසඞ්ඛාරා අනන්තරං වචීසඞ්ඛාරා. නිරොධංසමාපන්නස්ස ච මතස්ස ච කිං නානාකරණං?. කායස්ස අනඤ්ඤථාභාවො හදයරූපපටිබද්ධා අප්පාකටා අස්සාසපස්සාසා ති. අයං සමාධි සඞ්ඛතො උදාහු අසඞ්ඛතො? ති. නිරොධසමාපත්ති සඞ්ඛතා ති වා අසඞ්ඛතා ති වා න සක්කා වත්තුං. සඞ්ඛතධම්මා න විජ්ජන්ති. අසඞ්ඛතධම්මා පි නප්පවත්තන්ති. නිරොධජ්ඣානසමාපත්ති නිට්ඨිතා.

සමත්තො'යං ගන්ථො සහප්පයොජනඋද්දනදස්සකගාථාහීති වෙදිතබ්බො.

විමුත්තිමග්ගො නිට්ඨිතො.

විමුත්තිමග්ගො

1 පරිච්ඡේදය

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

(සීල, සමාධි, පඤ්ඤා, අනුත්තර විමුත්ති යන මෙ ධර්මයෝ යශස්වී වූ ගෞතම බුදුරජාණන් වහන්සේ මැනවින් අවබෝධ කරන ලදහ. සසර කතර ගෙවා නිවන් අමා පුර වදනා කැමැති සැදැහැවත් නුවණැති වියතී වඩන්නහු සූත්‍ර අභිධර්ම විනය යන ත්‍රිපිටකාගත බුදුදහම් දූන ගුණ දම් පිරීමෙහි උත්සුක විය යුතු)

මෙලෙසින් සීලය නම් සීලසංවරය යි, සමාධිය නම් කුසල චිත්තයාගේ නොවිසිරි එක අරමුණේ තහවුරු ව පිහිටීම ය, පඤ්ඤා නම් සත්‍යය අවබෝධ කරන ඤාණය යි, අනුත්තර විමුත්තිය නම් ආසවයන්ගෙන් මිදීම යැයි දක්වා විස්තර දක්වන සේක්, පස්වැදෑරුම් විමුත්ති දක්වූහ. එ නම් :

1. වික්ඛම්භන විමුත්ති, 2. තදඞ්ග විමුත්ති, 3. සමුච්ඡේද විමුත්ති, 4. පටිප්පස්සද්ධි විමුත්ති, 5. නිස්සරණ විමුත්ති යනු යි—එනම්: 1. ධ්‍යාන බලයෙන් නිවරණ යටපත් කිරීමය, 2. නිබ්බේධ භාගිය සමාධි භාවනාවෙන් මිථ්‍යා දෘෂ්ටියෙන් මිදීම, 3. සසර බැඳුම් (සංයෝජන) වලින් මිදීම, 4. ඵලයට පැමිණීමෙදී ඇති වන නිදහස, 5. අනුපාදි ශේෂ පිරිනිවණ යයි පස් ආකාරය. මේ පස්වැදෑරුම විමුක්තිය ලබන මාර්ගය (පටිපදව) විමුත්ති මග්ග නම්වේ. මෙ විමුත්ති මග්ග පටිපදව සීල සමාධි පඤ්ඤාවන්ගේ සමවායෙන් සිදුවේ.

අප්ප රජක්ඛ=හේතු සම්පන්න වුවද පුහුදුන් පුහුල් තෙමේ දුරගමනක් යනු කැමති අපරිනායක අන්ධයෙකු (මහපෙන්වන්නෙකු නැති දැස නැති අයෙකු) උවමනා තැනට යා නො හෙන්නේය. එමෙන් නිවන් දකිණු කැමති හේතුවන්තයන්ට නිවන් මහ පෙන්වනු සඳහා සැපයුණු මෙය එනිසාම විමුත්ති මග්ග නම් වේයයි වදළසේක.

1. වික්ඛම්භන විමුත්ති මග්ග=සීලක්ඛන්ධය, සමාධික්ඛන්ධ, පඤ්ඤාක්ඛන්ධ යන තුණින් සම්පූර්ණ වන්නේය—සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව යනු සීලස්කන්ධයට ඇතුළත් වේ.

2. සම්මා වායාම, සම්මාසති, සම්මා සමාධි යන තුණ සමාධි ස්කන්ධයට අයත් වෙති.

3. සම්මා දිට්ඨි, සම්මා සඞ්කප්ප, පඤ්ඤා ස්කන්ධයෙහි ඇතුළත් වේ.

මේ තුණ අධිසීල සික්ඛා, අධිචිත්ත සික්ඛා, අධිපඤ්ඤා සික්ඛා වශයෙන් ද විස්තර වන්නේ ය. ශීල විශුද්ධි, චිත්ත විශුද්ධි, දිට්ඨි විශුද්ධි වශයෙන් ද විස්තර වන්නේ ය. ආදි කල්‍යාණ, මජ්ඣ කල්‍යාණ, පරියොසාන කල්‍යාණ යනුද සීල, සමාධි, පඤ්ඤා දක්වේ.

ද්වෙ මෙ භික්ඛවෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදය, කතමෙ ද්වෙ ? පරතොච ඝොසො,. යොනිසොචමනසිකාරො යනාදි වශයෙන් විස්තරව ඇත.

සීල සමාධි දෙක වැඩිවශයෙන් හා පඤ්ඤා ස්වල්ප වශයෙන් සම්පූර්ණ කරගැණීමෙන් සොතා පන්න සකදගාමී විය හැකිය. සීල සමාධි දෙක අධිකවත් ප්‍රඥාව උසස් වශයෙනුත් උපදවා ගැණීමෙන් අනාගාමී වීමද, සීල සමාධි පඤ්ඤා තුණම සර්වප්‍රකාරයෙන් සම්පූර්ණ වීමෙන් රහත්ඵලය වන අනුත්තර විමුත්තිය සිදුවන බව දක්වේ.

2 පරිච්ඡේදය

සීලය නම් කවරේද ? සමාදන විරති සිතිවිලිද, සංවරයද, වැරදි නොකිරීම සීල නම් වේ. අකුසල සිත් දුරලන බැවින් සංවරයද සීලයවේ. මේ අර්ථ වශයෙන් අකුසල් සිත් දුරලන නිසා සියලු කුසල් සිත් සිතිවිලිම සීල නම්වේ. නෙක්ඛම්ම (ආලය හැර යාමෙන්) කාමච්ඡන්දයද පටිනිස්සග්ගානුපස්සනාවෙන් ආදානයද තණ්හා මාන දිට්ඨි වශයෙන් ගැණීමද අරහත්තමග්ග ඤාණයෙන් සියලු අකුසලයන්ගේ දුරුකිරීම, වැළකීම, වළකින සිත සීලයවේ—

සීලයාගේ ලක්ෂණය නම් ප්‍රාතිමොක්ෂ සීල ප්‍රත්‍යය පරිභොගය ඉන්ද්‍රිය දමනය ද ලක්ෂණය වේ—

අනවද්‍ය සැපය රසයයි, දුඩි ආයාස නැතිබව වැටහීමයි, තෙවැදෑරුම් සුසිරිත හැසිරීම ආසන්න කාරණයයි, තවද සොම්නස රසය හෝ ස්වභාවයයි, පසුතැවිලි නොවීම වැටහීමයි, ඉන්ද්‍රිය රැකගැණීම ආසන්න කාරණය වේ—

සීලය පසුතැවිලි නොවීම ආදී අපමණ අනුසස් ඇත්තේය—

සීතල අර්ථය, ශ්‍රෙෂ්ඨ අර්ථය, හීලැකිරීම් අර්ථය, ස්වභාව යන අර්ථය, සැපදුක් දෙදෙනා ගේ අභාවය සැලසීම් අර්ථය, ගුණධර්මයන්ගේ ශිර්ෂය යන අර්ථය, ප්‍රතිෂ්ඨා අර්ථය දැයි යන සප්තාර්ථය උපමා උදහරණ සහිතව දක්වා ඇත්තාහ—

පවිත්‍ර අදහසින් තෙළෙස් දුහඟ දහම්හි උත්සුක වේ නම් ඒ ආචාරයයි. සතර පාරිශුද්ධිය සීලයයි. මේ අකුසල් දුබල කිරීම හා පවසිත් වැදෑ නොදීම ආචාර සීල දෙදෙනාගේ එකිනෙකට ඇති වෙනසයි—

සීලය කිවැදෑරුම්ද ? කුශල, අකුශල, අව්‍යාකෘත වශයෙන් හෝ කායික, වාචසික, මානසික වශයෙන්ද තුංතුං ආකාරවේ—

සීලයාගේ සමුත්ථානය (හටගැණීම) කුමක්ද ? කුසල සීලය කුසල චිත්තයෙන්ද අකුසල සීලය අකුසල චිත්ත සමුත්ථානයි. අව්‍යාකත (කුසල් අකුසල් වශයෙන් ගත නොහැකි) සීලය අව්‍යාකෘත චිත්තයෙන්ද හටගන්නේවේ—

සීලයාගේ ආදි මධ්‍යය අවසානයෝ කවරහුද යත්—සමාදනය මූලය, කඩතොලු නොකර රැකීම මැදය, ලෝකෝත්තර ගුණයන්හි සිත ඇලවීම අවසානය නම් වේ—

සීලයට අන්තරායකර ධර්මයො කෙතෙක්ද ? සීල සම්පදවට හේතු ධර්ම කියක්ද ? සූතිස් ධර්ම කෙණෙක් මාර්ගාවබෝධයට අන්තරායකර වෙති. එනම්—කෝපය, එකට එක කිරීම, ගුණමකුකම, සිත්තැවුල, මසුරුකම, ඊර්ෂ්‍යාව, කපටිකම, මායාව, බද්ධවෛරය, මාන්නය, අතිමානය, මදය, පවෙහි ඇලීම, කුසීතකම, ලෝභකම, කුසලට ආලය නොවීම, අනුවණකම, මිත්‍යා සිහිය, පචිටු වචන, පාප මිත්‍ර සේවනය, දුෂ්ටබුද්ධිය, වැරදි ලබ්ධිය, නොයිවසීම, සැදෑහැනැතිකම, ලැජ්ජානැතිකම, පවට පිළිකුල් නොවීම, කයින් වදනින් කරණ දෙයෙහි සැනසුම් නැතිකම, ස්ත්‍රී ජනයා හා සහවාසය, බුද්ධානුමත ශික්ෂා කෙරෙහි ගරු නොකිරීම, ඉන්ද්‍රිය සංවරය නැතිකම, වැළදීමේ පමණ නොදනීම, රාත්‍රියේ පසු පළමුයාමයන්හි නිදීම, ධ්‍යාන වැඩීම (භාවනාව) හෝ

ඛණ්ඩ ඇසීම කීම නැති වීම යන මේ තිස්හතර මාර්ගාවබොධයට බාධාකාරී සීලය පැහැර ගන්නා (සිල් හොරු) ය යි කියනු ලැබේ. මේ සූතිස් ධර්මයන්ගේ විලෝම පක්ෂය සීලසම්පත්තියට හේතුවේ.

සීලයාගේ ප්‍රභෙදවීම කෙසේද ? දෙයාකාර, තුන්ආකාර, සතරආකාර වශයෙන් ප්‍රභෙදවේ. එයින් දෙයාකාරය නම්—පුහුණු කිරීම නම් චාරිත්‍ර සීලය, වැළකීම නම් වාරිත්‍ර සීලය කියාද—දුස්සීලතායෙන් පිරිහිය හැකි හාණභාගිය සීලය, දුසිල් බැව් දුරැර උසස් සියලු ගුණයන්ට පමුණුවන පත්තිභාගිය සීලය කියාද අරිය මග්ග එලෙහි අධිගතං සීලං ලොකුත්තරං, සෙ සං ලොකියං යයි දක්වූ බැවින් පෘථජ්ජනයාගේ සීලය ලෞකිකය, ආර්‍යයාගේ සීලය ලෝකොත්තර යයි ද—අනුප සපන් අයගේ සප්පමාණ සීලය බුදුන් පැණවූ උපසම්පන්නයන්ගේ අප්පමාණ සීලයයි ද—සපරියන්ත අපරියන්ත වශයෙන් ද තණ්හා මාණ දිට්ඨි සහගත නිස්සිත සීලය ද විමුත්ති සංයුක්ත අනිස්සිත සීලය කියාද අනුවණ යාගේ නිස්සිත සීලය ද නැණවතාගේ අනිස්සිත සීලයද සම්මාකම්මන්ත, සම්මා ආජීව, සම්මාවායාම යන තුණින් යුක්ත සීලය ආදි බ්‍රහ්ම චරියක කියාද ක්‍ෂුද්‍රානුක්‍ෂුද්‍ර ශික්ෂානම් ආභි සමාචාර සීලය කියාද, සවිත්තක, අවිත්තක වශයෙන්ද, අවිතික්‍රම සාවක සීලය, බුදු පසේ බුදුවරුන්ගේ විසුද්ධි සීලය යි ද දෙයාකාර වන්නේය—

සීලය තෙවැදැරුම් වනුයේ කෙසේද ? පව් මුළුසුන් කරණු සඳහා පවත්නා සීලය, උපදවාගත් කුසලය නොනැසී පවත්වා ගන්නා සමාදන අවිතික්‍රම සීලය, අරියො ජනො අරියෙන මග්ගෙන පාපහෙතු සමුච්ඡිඥති "දක්වූ පරිදි ආර්‍යපුද්ගල තෙමේ ආර්‍යවූ මාර්ග ඥානයෙන් පාපමූලයන් නැසීමෙන් ඇතිවන සීලය සමුච්ඡෙදන අවිතික්කම සීලය වේ—පුබ්බවුත්තස්ස තණ්හාමාණදිට්ඨිකං පරාමට්ඨ සීලං" කී බැවින් තෘෂ්ණාව, මාන්නය, මිථ්‍යා ලබ්ධිය සමග පවත්නා පරාමට්ඨ සීලයද, "පුථුජ්ජන කල්‍යාණකස්ස මග්ගපත්තියා සම්භාරභූතං සීලං අපරාමට්ඨනාම" කල්‍යාණ පෘථජ්ජනයාගේ ආර්‍ය මාර්ගයට පැමිණීමට උපකාරවන සීලය, තණ්හාමාණ ආත්ම ලබ්ධි ආදියෙන් අමිශ්‍ර බැවින් අපරාමට්ඨ සීලයවේ. සියලු අකුසල් දුරලූ රහතුන් වහන්සේගේ සීලය පටිප්පස්සද්ධි සීලය වේ—ලොකාධිපතෙය්‍ය වශයෙන් රක්නා සීලය ලෝකනිස්සිතයි—අත්තාධිපතෙය්‍ය වශයෙන් රක්නා සීලය අත්ත නිස්සිත සීලයයි—ධම්මාධිපතෙය්‍ය වශයෙන් රක්නේ ධම්ම නිස්සිත සීලයයි—නුවණැතියන් ප්‍රතික්‍ෂෙප කළ පරහට හිංසා පීඩා පිණිස පවත්නා මිච්ඡාපනිහිතවූයේ විසම සීලයයි—මෙලෝ පරලෝ දෙක්හි සැපත ප්‍රීතිය සඳහා පවත්නා සම්මා පනිහිතවූයේ සමාන සීලයයි. තමන්ගේ අනුන්ගේ යහපත සඳහා පූරණ අවිප්පටි සාරවූ යේ අප්පණිහිත සීලයයි—සම්බුදු පසේ බුදු උතුමන්ගේ—විසුද්ධ සීලයයි—" සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජති ආපත්තිං පරිගූහති, ආපන්නාය ආපත්තියා අවිප්පටි සාරී හොති—යනුවෙන් දැන දැනම ඇවැත් ඇවදීම ඇවදි ඇවත පිළිසන් කිරීම. ඇවදි ඇවතින් විපිළිසර නොවීමාදි අලජ්ජී පුහුදුන් සීලය—අවිසුද්ධ සීලයයි—" ගම්භිරො විප්පටිසාරො උප්පාදෙතබ්බො, සවෙවෙමතිකං ආපන්නා පත්තිං ජානෙය්‍ය ඉච්චස්ස ඵාසු භවිස්සති යනුවෙන් දක්වන ලද විමති සහිත සීලයයි සත්වැදැරුම් සෙඛ පුද්ගලයන්ගෙ සීලය සෙඛ සීලනම්. රහතන් වහන්සේගේ සීලය අසෙඛ සීලයයි—පෘථුජ්ජනයා ගේ සීලය නෙව සෙඛ න අසෙඛ සීලයවේ. දඬුවම් උවදුරු ආදියට බියෙන් වරදින් වැළකීම භය සීලයයි. කායික මානසික දුක් පීඩාවක් නිසා වැරදි නොකර සිටීම දුක්ඛසීලයයි—ගවයෙකු බල්ලෙකුසේ හැසිරීම ගොසීලකුක්කර සීලයයි කියති. ජයිනාගමේ උගන්වන මෙවැනි සීලයක් නොපිරුව හොත් අපායේ උපදිති යන මුලාවෙන් රකින අජසීලාදිය මොහ සීලනම් වේ. අසන්තුට්ඨිතා පූර්වක දුර්වල සීලය හීණ සීලයයි—අසන්තුට්ඨි සන්තුට්ඨි දෙකින්යුත් සීලය මජ්ඣිම සීලයයි. කිසිවක් අපෙක්ෂා නොකර සන්තුට්ඨිය මුල්කොට රකින සීලය පණීත සීලයවේ—

සීලයාගේ සතර වැදැරුම් විස්තරයෙහි මාර්ගාවබෝධයට බාධක සූතිස් දහම් දුරු නො කෙරේද, උත්සාහවන්තයන් ආශ්‍රයෙන් ඈත්වේද, දැන දැනම වැරදි කරයි ද, සිදුවූ වරද සඟවා ද, වරද වසා ගණිද එවැන්නහුගේ සීලය හාණභාගිය සීලය නම් වේ—

සමාදන්වූ සීලය හොඳින් පුරයි, උප සම දසසන සංඛ්‍යාත ඤාණය නූපදවයි ද එවැන්නා ගේ සීලය ඨිතිභාගී සීල නම් වේ. සපුරා ගත් සීල සමාධීන්හි අප්‍රමාද වෙයි ද උප සම දසසන නම් ඤාණය උපදවා ද එවැනි සීලය විශෙෂභාගි සීල නම් වේ—සම්පූර්ණ කර ගත් සීල සමාධීන්හී අප්‍රමාද වෙයි. උප සම දසසනයෙන් නිවණ කරා ගෙණ යන සීලය නිබ්බෙධභාගිය නම් වේ.

ඤත්තිය සතරවැනි කොට ඇති විනය කර්මයෙන් උපසම්පද ලැබුවන් විසින් පිරිය යුතු සීලය අටඨ වාචික උප සම්පදව ලැබූ මෙහෙණින් විසින් පිරිය යුතු සීලය, හෙරණ හෙරණින් විසින් පිරිය යුතු අනුප සම්පන්න හෝ සාමණෙර සීලය—ගිහි උවසු උවැසියන් විසින් රකිය යුතු ඔදතවසන සීලය හෝ ගහඨ සීලයයි ද සතර ආකාර වේ—ප්‍රකෘති ආචාර ධර්මතා පූර්ව හේතු වශයෙන් ද සීලය සිව් වැදෑරුම් වේ. සීල සීලය—කුසල සීලය අකුසල සීලය කියා දෙයාකාරය. සමුදය සීලය—කුසල චිත්ත සමුඨානයයි. අකුසල චිත්තයෙන් උපදනේ අකුසල සීලයයි—නිරොධ සීලය නම් කුසල සීලය ඉපදීමෙන් අකුසල සීලයාගේ සන්සිඳීම ද රහත් බවට පැමිණීමෙන් කුසල සීලයාගේ ද ව්‍යපසමය නිරොධ සීලයයි—සතර සම්‍යක් ප්‍රධාන වියර්‍ය නිරොධ මගග පටිපද සීලය නම් වේ—

ප්‍රාති මොක්‍ෂ සංවර සීලය, ආජීව පාරි ශුද්ධි සීලය, ඉන්ද්‍රිය සංවර සීලය, ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීල යයිද සතර වැදෑරුම් වේ— ඉධ භික්ඛු–පෙ–සික්ඛාපදෙසු යන පාඨය දක්වා තෙමේම විවරණය කරණුයේ ඉධ යනු මේ ශාස්තෘ ශාසනයේ බුද්ධ ධර්මයෙහි ; භික්‍ෂු නම්, කල්‍යාණ ප්‍රථජ්ජනයාද යලි සෙඛ පුද්ගලයාද, අසෙඛ පුද්ගලයාදුයි සීලයෙන් අකම්ප්‍ය පුද්ගලයාය, ප්‍රාති මොක්‍ෂය නම් සීලය, ප්‍රතිෂ්ඨාවය, මූලය, චරණය, සංයමය, සංවරය, මෝක්‍ෂය, අභිබෑඩය, කුසල ධර්මයන්ගේ ප්‍රමුඛය සමාපත්ති මූලය වේ— සංවරය නම්– කායික වාචසික වැරදි කර්ම නොකිරීමයි. සංවුතො යනු ප්‍රාතිමොක්‍ෂ සංවරයෙන් යුක්ත වූයේ යනුයි—විහරති යනු නම් සතර සංවරයෙන් යුක්ත වේ යනුයි—ආභි සමාචාරික ආදි බ්‍රහම චරියක ගුණයෙන් ආචාර ගොචර යුක්තව ස්වල්ප මාත්‍රවත් වරද භය වශයෙන් දක්නේ ශික්‍ෂා පදයන් සම්පූර්ණ කරන්නේය, ශික්‍ෂා පද නම් කවරහුදයත් පාරාජික, සඞ්ඝාදිසෙස, අනියත, නිසසග්ගිය පාචිත්තිය, ශුද්ධපාචිත්තිය, පාටි දෙසනිය සෙඛියා යන සත් වැදෑරුම් ශික්‍ෂා පද හෝ පරිජි, සඟවෙසෙස්, තුලසි, නිසඟි, පචිති, පිළිදෙස්නිය, දුකුලා, දුබැසි යන සත් ඇවැත් කඳු පිළිබඳ පැණවුම ය.

ආජීව පාරි ශුද්ධි ශීලය නම් මිථ්‍යා ජීවිකාවෙන් වැලකීමයි— මිථ්‍යා ජීවය නම් කුමක් ද? කුහණ–සිව්පස පරිභොගය, වශයෙන්ද, ඉරියව් පැවැත්වීම් වශයෙන් සාමන්ත ජප්පන නම් අවටින් දෙසීමාදියෙන් පවත්නා කුඩුකේඩු ගතියයි— ලපනය, නිමිති කීමාදිය ලාභ පොලී සෙවීමාදිය ද, මිනිසුන්ගේ සිත් ගැණීමට සහසතු උණගස් වැල් මල් කොළ ගෙඩි ආදිය දීම, අංග ලක්‍ෂණ ශාස්ත්‍ර කීම්, ආදියෙන් මිථ්‍යා ආජීවය නානාවිධ වෙයයි දක්වන ලදී— ඉන්ද්‍රිය සංවර සීලය නම්, චක්‍ෂුරාදී ස ඉඳුරන් ලොභාදී අකුසලයන් ඉපදීමට ඉඩ නොතබා රැකවරණ කර ගැණීමයි—

ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලය නම්— සිව් පසය පිළිබඳව පවත්නා උපාය මනසිකාරය නම්වූ අට වැදෑරුම් ප්‍රත්‍ය වෙක්‍ෂාව යි— එනම් නුවණින් අනුසස් මෙණෙහි කොට ආහාර ප්‍රත්‍යය සෙවනය කරන්නේ 1. සෙල්ලම් පිණිස මද වැඩීම පිණිස නොවේ, 2. ශරීරය අලඞකාර ලක්ෂණ වීම පිණිස නොවේ, 3. මේ ශරීරයේ පැවැත්ම යැපීම සඳහාම ය, 4. සාපවස් වෙදනා හිංසා සන්සිඳුවීම පිණිසය, 5. ශාසන මාර්ග බ්‍රහ්ම චරියාවට අනුග්‍රහ වශයෙන්ය, 6. මෙසේ පැරණි ගිලන් වේදනා සන්සිඳුවමි අලුත් වේදනා නූපදවමි, 7. මාගේ ජීවනයත් නිවැරදි බවත්, 8. පහසු වාසයත් සිදුවන්නේ යයි දැන මෙනෙහි කරයි— මේ අට සතර ආකාරයකින් ප්‍රත්‍ය වෙක්‍ෂා කටයුතුය. ප්‍රහීණ කටයුතු දේ පස්විකීම පසයාගේ ප්‍රයෝජන පස්විකීම, ජීවිත ගමන පස්විකීම, සුලු බව හා ආරක්‍ෂාව පස්විකීම යන සතර විධියෙනි— මෙයින් අන්ත දෙක දුර ලීම හා මධ්‍යම ප්‍රතිපදව සේවනයද වන්නේය. ඇඳුම (සිවුර) සෙනසුන ගිලන්පස යන තුන් පසයද පස්විකුම කට යුතුය.

නුවණින් විමසා සිවුර (ඇඳුම) ප්‍රයෝජන විඳිමි එනම් සීතල උණුසුම, ඇට මැස්සන් මදුරුවන්, වාතය අව්රස්නය සර්ප යන මොවුන්ගේ ස්පර්ශ වේදනා නැති කිරීම පිණිසද වෙසෙසින්ම ලජ්ජා කුප්පවන තැන් වසා ලීම පිණිසද ඇඳුම් පරිහරණය කරමි.

නුවණින් විමසා නිවාස සෙනසුන් සේවනය කරන්නෙමි එනම් සීතල හා උණුසුම වැළකීමට ද ඇට මැසි මදුරු සර්ප ආදීන්ගේ උවදුරු වැළැක්වීම වෙසෙසින් ම ඍතු— කාල ගුණ පීඩා දුරලීම පිණිස ද සෙනසුන් පටිසේවනය කරමි—

නුවණින් විමසා ප්‍රයොජන සලකා ගිලම්පස වන බෙහෙත් පිරිකර පරිභොග කරමි. එනම් උපන්නාවූ විවිධ ආබාධයන් ගෙන් ඇතිවන වේදනාවන් සන්සිඳු වීම. නිරොග බව පරමාර්ථ කරගණය— මෙසේ දිනපතා නිතර නිතර සිවුපසය පිළිබඳ සතර ආකාර යෙන්ම ප්‍රත්‍යවෙක්‍ෂා කරන්නේ ය—

මේ සිවුපස පරිභොග ක්‍රම සතරකි. දුස්සීලයාගේ සිවුපස වැලඳීම ථෙය්‍ය පරිභොගය හෙවත් හොරා කෑම වේ. අලජ්ජී ව මිථ්‍යා ජීවයෙන් දිවි රකින්නහුගේ සිවුපස පරිභොගය ඉණපරිභොගය හෙවත් නයට කෑම නම් වේ. ආනාපිස්ස උට්ඨාණවතො පුරිසස්ස පරිභොගො දයජ්ජ පරිභොගො— කෙලෙසුන් නසන උත්සාහයෙන් යුක්ත පුද්ගලයාගේ සිවුපස ප්‍රයෝජන විඳීම දයාද (උරුම) පරිභොගය වේ— අරියානං පච්චය පරිභොගො සාමිපරිභොගොනාම— රහතන් වහන්සේගේ සිවුපස භුක්ති විඳීම ස්වාමි පරිභොගය වේ. සභිරොත්තපපස්සාපි අපච්ච වෙක්ඛිත්වා පරිභුජනං අපරි සුධ පරිභොගො—සිල්වතුන් ගේ ද පස් විකුම් නැතිව වැළඳීම අපිරිසිදු පරිභොග යයි—සභිරොත්තපපස්ස මත්තඤ්ඤුනො පාපකෙසු විත්තුප්පාදෙසු නිබ්බිඤ්ඤනස්ස—පරිසුධ පරිභොගො සිල්වත් ගුණවත් උතුමන්ගේ පරිසුධ පරිභොගය වේ—

විනය සංවර (ප්‍රාති මොක්‍ෂ සංවරය අධික ශ්‍රද්ධාවෙන් පුරණ ලද්දේ ද, ආජීව පාරිසුධි සීලය අධික වීර්‍ය්‍යයෙන් පුරන්නේ ද ඉන්ද්‍රිය සංවර සීලය අධික සිහියෙන් පිරුයේ ද ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලය අධිමාත්‍ර ප්‍රඥවෙන් පිරුයෙද වෙයි. තවද ආජීව පාරිසුධි සීලය ප්‍රාති මොක්‍ෂ සංවර සීලයෙහිම ඇතුළත් වෙයි. ඉන්ද්‍රිය සංවර සීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලයෙහි ඇතුළත් වෙයි. තවද ඉන්ද්‍රිය සංවරය ආජීව පාරි ශුධිය සීලස්කන්ධ යෙහි ද ඉන්ද්‍රිය සංවරය ප්‍රාතිමොක්‍ෂ සංවරය සමාධිස්කන්ධ යෙහි ද ප්‍රත්‍යය සන්නිශ්‍රිත සීලය ප්‍රඥස්කන්ධයෙහි ද සංග්‍රහ වන්නාහ.

කෙසේ භික්‍ෂුවක් සීල විශුධියෙහි පිහිටියේ වේද, සප්තාපත්තිස්කන්ධයන්ට නොපැමිණ සීල විපත්ති, දිට්ඨි විපත්ති ආචාර විපත්ති ආජීව විපත්ති ආදියෙන් අවිපන්නව බ්‍රහ්ම චරියන්තරායෙන් අනතුරු නැතිව ඡේද්‍යගාමී ඇවැත් (පාරාජිකා) වලින් වැළකෙමි. ව්‍යුට්ඨාන ගාමිණී (සඞ්ඝාදිසෙස) ඇවැත් උපනද මානත්ත අබ්භාණාදී වතාවතින් හා දෙසනා ගාමිණී ඇවැතින් සහමැද දෙසා ''නපුනෙවං කරිස්සාමි නපුනෙවං භාසිස්සාමි නපුනෙවං චින්තයිස්සාමි'' කියා '' සමාවගෙණ නොකැලැල්ව භික්‍ෂු ජිවිතය පැවැත්වීමෙන් සීල ශුද්ධියෙන් යුක්ත වූ යේ වෙයි—

සීලයාගේ ප්‍රතිෂ්ඨාවො කී දෙනෙක් ද,? දුස්සීල කමේ දෙස් දැකීම සිල් පිරීමේ අනුසස් දැකීම යන ප්‍රතිෂ්ඨා දෙකකි. සීල විපත්තියේ ආදීනව නො දක්නා පුද්ගලයා බන්ධනා ගාරයෙන් පැණ ගොස් සැඟවී සිටින සොරෙකු මෙන් නිතර නින්ද අපවාද භය සහිතව ජීවත් වන්නේය. තවද රාජකුමාර වරුන්ගේ කෙළිමඩලකට පැමිණි සැඩොලෙකු මෙන් ද හීණ දීන ජීවිතයක් වන බව කියන ලදී— බිජුවට රකිනා කිරලකු මෙන්ද වාළධිය රකිනා සෙමරකු මෙන්ද ප්‍රිය පුතු රකිනා මවක් මෙන්ද, එක ඇසක් ඇති පුරුෂයා ඒ ඇස මෙන්ද හැම විටම තුණුරුවන් ගරු කරමින් සුපෙසල විය යුතුය. සීලය ධ්‍යාන සමා පත්තින්ට ප්‍රතිෂ්ඨාවයි—

3 පරිච්ඡේදය

ධුත

මෙසේ සම්පූර්ණ කරගත් සීලය ඇති යොගාවචරයා විසින් සීලවිශුද්ධිය සඳහා තෙළෙස් ධුතගුණයන් පිරිය යුතුය, ධුත යනු අකුසල් මර්දනය කිරීම පිළිබඳ ක්‍රියා පිළිවෙත් විශෙෂයකි.— එවැනි ධර්මයන් ධුතාඞ්ගයයි කියනු ලැබේ. ඒ ධර්මයෝ තෙළෙස් දෙනෙකි— දෙකක් චීවර ප්‍රතිසංයුක්ත අඞ්ගයෝය. එනම් පංශුකූලික අඞ්ගය හා තෙචීවරික අඞ්ගය යන දෙක ය. පසක් ආහාර හෙවත් පිණ්ඩ පාත ප්‍රතිසංයුක්ත ය. එනම් පිණ්ඩ පාතිකාඞ්ගය, සපදාන චාරිකාඞ්ගය, එකාසනිකාඞ්ගය—ඒකාසන භොජනාඞ්ගය, ඛලු පච්ඡා භත්තිකාඞ්ගය භොජනෙ මත්තඤ්ඤුතා පටිසංයුක්ත අඞ්ගය හෙවත් පත්ත පිණ්ඩිකාඞ්ගය, යන පසයි— පසක් සෙනසුන් පිළිබඳ වෙති. එනම් ආරඤ්ඤිකාඞ්ගය, රුක්ඛ මූලිකාඞ්ගය, අබ්භොකාසිකාඞ්ගය, සොසානිකාඞ්ගය, යථා සන්තතිකාඞ්ගය වීර්‍ය්‍යය පිළිබඳ වූ එක් අඞ්ගයකි—ඒ නෙසජ්ජික අඞ්ගයයි.

පංසු කූලය නම්, හිමියන් විසින් නිරාසව ඉවත දැමූ රෙදි කැබලි යි— මිනී වසා හෝ ගැබ් මළ ආදිය තැවරී හෝ සතුන් සපා තුවාල වී මෙන් හෝ කුණු කසල ගොඩට විසිකළ රෙදි කැබලි ඇහිඳ ගෙණ සොදා මසා පඩු පොවා සකස් කර ගත් සිවුරුම පරි භොග කරණු විනා දයකයෙක් දෙන සිවුරු හෝ රෙදි නොපිළි ගැණීමේ අඞ්ගය පංසු කූලික අංග යයි කියනු ලැබේ. පංසු කූල අංගය සමාදන් වන්නේ කෙසේද? ගහපති දන සිවුරු පෙරවීමේ දෙස් සොයන්ට වීමාදිය සිතා නිරාලයව දැමූ පිළියෙහි අනුසස් සලකා දයක යන් පුදන රෙදි හෝ සිවුරු නොගණිමි පංසු කූල සිවුරුම පාවිච්චි කරමියි ඉටා ගැන්මෙන් සමාදන්වන්නේ වේ—පංසු කූලික වීමේ අනුසස් කවරේද යත්—සොර බියෙන් භය නැතිවීම, පාවිච්චිය ගැණ තණ්හාව නොවීම, එදිනෙදම සැප පහසුකම ආදියයි—

පංසු කූලික වීම කී ආකාරද? දෙවැදෑරුම් ය. මළ සිරුරට අඳවා පෙරවා වසා දැමූ සොසානික වස්ත්‍ර අසුචිගැප්මළ ආදිය තැවරී කසල් ගොඩට දැමූ සංකාර චෝලය ද චීජී මාඟී අසල අඞ්ගධර සිල්වතෙකු ඇහිඳ ගණීවයි දමන ලද පාපනික වස්ත්‍රද, ගවයින්, මීයන්, වේයන්, කැමෙන් පලුදුවූ අමඞ්ගල රජිය වස්ත්‍රද ගින්නෙන් කොණක් දැ වස්ත්‍රද ආදියයි—කෙසේ සමාදන් වූයේ වේ ද ? ඉදින් යොගාවචර තෙමේ ගෘහපති චීවරදනය ප්‍රතික්ෂෙප කළේ නම් එපමණින්ම පංසු කූලික වේ—පංසු කූලික අඞ්ගය බිඳෙන්නේ කෙසේ ද? දයකයන් පුදන සිවුරු පිළිගැණීමෙන් පංසු කූලික අඞ්ගය බිඳෙවි—

2.

ප්‍රත්‍යය ගේධයෙන් තොරව සුභර සුපෝස පැවිදි නිවහල් නිදහස් ජීවිතයක් ගත කරණු පිණිස තුන්සිවුර පමණින් යැපීම අඞ්ගයක් කරගන්නේ තේ චීවරික නම වේ. ඒ තෙචීවරිකත්වය සමාදන් වන්නේ කෙසේද? අද පටන් පරිසකාර චොලාදී අතිරේක චීවර ප්‍රතික්ෂෙප කළ බැවින් තුන් සිවුර පමණක් ඇති බව ප්‍රධාන පිළිවෙතසේ සමාදන් වෙයි.— තෙචීවරික අඞ්ගය සමාදන්වීමෙ අනුසස් කවරහුද? ජීවනොපකරණ සැපයීම අඩුකම, කය පරිහරණ පෝසනය තුන් සිවුරකින්ම සතුටු වීම යනු යි. ඒ තුන් සිවුර කවරේ ද? දෙපොටක් තනි පොටක් සේ ගලපන බැවින් සඟල සිවුරය, එකස් කොට පොරෝනා තනි පට සිවුර නම් වූ උතුරු සඟ සිවුරය ඇතුළට හඳනා බැවින්

අන්තර වාසක නම් අඳන සිවුරද යන තුණය. කෙසේ සමාදන් වූයේ වේද? ඉදින් යම් යොගාවචරයෙක් චොළපරිස්කාරී වශයෙන් දක්වන දෙළොස් පිරිකර සොළොස් පිරිකර අතරින් සතරවැනි සිවුරක් පාවිච්චි නොකෙරේ නම් එපමණින් සමාදන් වූයේ වේ— මේ අඞ්ගය කෙසේ බිඳේද? සතරවැනි සිවුරක් පිළිගත් පමණින් අඞ්ගය බිඳෙන්නේ ය—

3.

ආරාධනා කොට පවරා දෙන දන් පිළිනොගෙණ ගෙයක් පාසා ගොස් ලැබෙන ආහාරය කින්ම යැපෙන සේ ඉටා පැවතිම පිණ්ඩ පාතිකාඞ්ගය නම් වේ. කෙසේ පිණ්ඩ පාතික අඞ්ගය සමාදන් වේද? අද පටන් දන් පිළිගැණීමට කරණ ආරාධනා නිමන්ත්‍රනයන් ප්‍රතික්‍ෂෙප කිරීමෙන් පිණ්ඩ පාතයෙන්ම යැපෙමි කියා සමාදන්වූ යේ වේ—පිණ්ඩපාතික වීමේ අනුසස් කවරහුද? කුසීත බව මට්ටු කිරීම, මානය දුරලීම, රස තණ්හාව වැළැක්වීම, සතර දිශාවටම පොදු නිදහස් බව ආදිය අනුසස් වෙති. නිමන්ත්‍රණය කී ආකාරද? තුන් ආකාරයි. ආහාරයට ආරාධනාවය, රැස්වීම් ආදියට දූත පහීණ ගමන් සඳහා ආරාධනා කියායි—ත්‍රිවිධ නිමන්ත්‍රණ පිළිනොගැණී මෙන් අඞ්ගය සමාදන් වේ— අඞ්ගභෙදය කෙසේද, ආරාධනයන් පිළිගැණීමෙන් අඞ්ගය බිඳෙන්නේය—

4.

අගෝචර පරි සඞ්කිත ස්ථානයන් හැර ලොකු කුඩා වෙනසක් නොතකා ගෙපිළිවෙළින් අතර ගෙවල් අත නැර පිඩු සිඟා යාම සපදානචාරිකාව නම්. එය ප්‍රතිපත්තියක් කරගත් තැනැත්තේ සපදානචාරී නම්. සපදානචාරී ප්‍රතිපදාව සපදාන චාරිකාඞ්ගය නම් වේ. සපදාන චාරිකය කෙසේ සමාදන් වූයේ වේ ද? අද පටන් ප්‍රණීත මිහිරි ආහාර ලැබෙන තැන් සොයා අතර තුර ගෙවල් අත් හරිමින් පිණ්ඩපාතේ යාම අත් හරිමි. ගෙපිළිවෙළින් පිඩු සිඟායාම සමාදන් වෙමියි ඉටා ගැණීමෙන් සමාදන්වූයේ වේ— සපදාන චාරිකවීමේ අනුසස් කවරහුද? අඬගැසීම් ආරාධනාදියට සතුටු නොවීම. සඳමඬලමෙන් සර්ව සාධාරණ වීමාදිය අනුසස්ය. සපදාන චාරිකාව නම් කුමක් ද ආහාර සොයනු සඳහා යම් භික්‍ෂුවක් ගමකට පැමිණි විට සුරාශාලා ධූර්ත ස්ථානවේසිය ගොචරාදී තැන්හැර කොණක සිට ගෙවල් අත නැර ලැබෙන හොඳ නරක වෙනස නොසිතා සිඟා යාමයි. භෙදය අමධුර ලාභය හෝ කුලදූක්කුලතා හෝ සලකා අතර ගෙයක් හැර ගෙයකට යාමෙනි—

5.

ආහාර වැළඳීමට එක ආසනයක පමණක් වාඩිවීම හෙවත් වැළඳීම සඳහා දෙවරක් වාඩි නොවන සීලය හෝ පුරුද්ද ඒකාසනික බව වේ. එක්වර වැලැඳීම එක් වේලේ වැළ ඳීම යයි ද කියනු ලැබේ. වතුරත් බෙතුත් හැර දිනකට අහරක් වැළඳීමට දෙවරක් වාඩි නොවන පුරුද්ද ඇත්තා ඒකාසනික නම්වේ. මෙහි ආසන යනු කෑමට වාඩිවීමයි, එක දවසකට එකවරක් ම අහර අනුභවයට ඉඳ ගැණීම ඒකාසනික අඞ්ගයයි කියනු ලැබේ. මේ ඒකාසනකය සමාදන් වන්නේ කෙසේද? බුඩානු මතය ලෙස පැන්බීම, බෙත් බීමක් හැර ආහාර ජාතියක් නම් එක්වරකට වඩා නොගණිමියි ඉටා ගැණීමෙනි. මේ ඒකාසන භොජනාඞ්ගය සමාදන්වීමේ අනුසස් කවරහුද ලෙඩ රෝග අඩුකම, ආපද සෙවීම් ආදිය අඩුකම ජීවනයේ පහසුකම පරියන්ත නම් සීමා නියමයකි. සීමාතුණෙකි. පාත්‍රයට බෙදගත් ආහාරය අවසන් වනතුරු වාඩිවී සිටීම, වළඳා අවසන්වී පැන් බී අත කට සෝදන තුරු වාඩිවීම, වළඳන ආහාරය අවසන් වනතුරු වාඩිවී සිටීම කියාය. සපපිමණ්ඩ

යතු පිරිසිදු ගිතෙල්ය ඒ බෙත් වශයෙන් පිළිගත හැකි වේ. මේ පුරුද්ද ඇතිකර ගන්නේ තම සිරුරට ඇති වාල් කම අඩුකර ගැණීමටය. ආසාව වැඩෙනු නවත්වා භාවනාදී ශ්‍රමණ ධර්මයන්ට කාලය ලබා ගැණීමද සිදුවේ.

6.

කුස ගන්නා තාක් අහර ගැණීමෙන් ඇති වන නුවණ අඩුවීම, අලස බත්මතය නිදිබර කම, අලසක රොගය ආදී ආදීනව දූන බත් ආලෝප සතරක් පහක් හැකි පමණින් අඩුව වළඳා වතුර බීමෙන් නිවණට ආසාකරණ පුද්ගලයාට භාවනාව පහසුවෙයි නිදිමත නැතිව ඇඟේ දඩබබර ගති නැතිව සිටිය හැක. යනාදී අනුසස් සලකා අඩහ කෑමට පුරුදුවීම භොජනේ මත්තඤ්ඤුතා නම් ධුතාඩගයයි. මෙම පත්ත පිණ්ඩිකාඩග යයි ද කියනු ලැබේ. වැළඳීමේ පමණ දූන ගැණීම සමාදන් වන්නේ කෙසේද ? විකවා ගත හැකිවාට වඩා තත්‍රාවට්ටක කාකමාවක භූත්තවම්තකයන් සේ කෑදර කමින් කෑම බීම ගැණීමෙන් තම සිරුරෙහි දඩබබර මැලිකම් ඇතිවෙයි. කෑදරකම වැඩි වෙන්ට පටන් ගණී. කුස සෑහීමට නොයයි. යනාදී දෙස් දූන පමණට වැලඳීමේ පුරුද්ද ඇතිකර ගණී. මිත භොජනයෙන් අලසක ආදී විපත් නොවීම අනුසස් වෙති. කට බඩ ගන්නා තරම් කෑම මේ අඩගය බිඳීමට හේතුවේ—

7.

යම් අපිස් ගුණැති උතුමෙක් තමා ආහාර වළඳන වේලාවේදී පළමුවරට පිළිගන්නා ආහාරය හැර නැවත නැවත පිළිගන්වන කිසිවක් පිළි නොගැණීම පිළිබඳ පුහුණුව බලු පච්ඡා භත්තය වේ. එය සීලයක් ප්‍රතිපත්තියක් කොට ගත් තැනැත්තේ බලු පච්ඡා භත්තිකයාය ඔහුගේ අඩගය හෝ ප්‍රධාන ප්‍රතිපත්තිය බලු පච්ඡා භත්තික යයි කියනු ලැබේ. ඒ සමා දන්වනු කැමති යොගාවචර තෙමේ අද පටන් අතිරිත්තවූ භොජනය පිළිනොගණිමි බලුපච්ඡා භත්තික අඩගය රක්‍ෂා කරමි. කියා සමාදන් විය යුතුය. බලු පච්ඡා භත්තික වීමේ අනුසස් කවරහුද? වැඩි වැඩි ආහාර සෙවීම රස ගුණ සෙවීම සන්නිධිකාර පරිභොග නැති කමය. බලු පච්ඡා භත්තිකය දෙයාකාරවේ. අපරිච්ජින්නානත්ත අධිඨානනත්ත වශයෙනි. යම් භික්‍ෂුවක් දන් වළඳා අත දෙවු පසු අමුතු අහරක් කැවිලි ආදියක් නමුත් පිළිගන්වයි ද ඒ අතිරිත්තාහාර වන බැවින් නොවැළඳිය යුතු වේ. පවාරිතේ පුන භොජනං කප්පියං කරොති නභුජිතබ්බං''යි කියන ලදී. අධිෂ්ඨා නානත්තය නම් යම් භික්‍ෂුවක් ඉටාගත් පරිදි එක් විසි පිඩක් වළඳා ඉවර වූ පසු හැකිවුවත් වැළඳීම නැවැත් වීමයි. අතිරිත්ත භොජන ප්‍රතිග්‍රහණ යෙන් වැළකීමෙන් සම්පූර්ණ වන බවත් නොවැළකී මෙන් භෙදයක් දත යුතු ය.

8.

යම් සැදූහැතියෙක් ගම් නගර ආදී බහුජනාකීර්ණ පෙදෙස්වල විසීමෙන් සිතට විවේකයක් ලබනු නොහැකි වා සේම පස්කම් සැපයන්ට සිත පෙළඹීමාදී වැරදි සලකා ජන ශූන්‍ය වනසෙන සුනක විසීම ආරණ්‍යක බවයි. අරණ්‍යයේ වසන සීලය ඇත්තේ ආරඤ්ඤික නමි. ආරඤ්ඤික ප්‍රතිපත්තිය ආරඤ්ඤිකාඩගයයි.—ඒ ආරණ්‍යකය සමාදන් වන්නේ කෙසේද? අද පටන් ගම්හී වාසය අත් හරිමි. අරණ්‍ය වාසය සමාදන් වෙමි කියාය. ආරණ්‍යයක ප්‍රමාණය කෙසේද ? වියත් නවයෙක් ධනුවෙකි. යටත් පිරිසෙයින් අරණ්‍යය ධනු පන්සියක් විතර විය යුතුය ගම් මැද වාසය හැර ජනයාගෙන් හිස් වනයෙහි වාසය කිරීමෙන් සම්පූර්ණ වේ. ගාමන්ත විහරණයෙන් අඩගය බිඳේ.

9.

යම් භික්ෂුවක් පියස්සක් යට විසීමේ දෙස් තණ්හා පරියේසණ බහු භණ්ඩිකතාදිය දක ගස් සෙවනක විසීමේ ගුණ සලකා සැදූ හෝ පිහිටි පියසි තුළ නො වැස රුක් සෙවනක විසීම රුක්ඛමූලික නම් වේ. රුක්ඛමූලේ වාසය කරණ සිලය ඇත්තා රුක්ඛමූලිකයා ය. ඔහුගේ ප්‍රතිපත්තිය රුක්ඛ මූලිකඬ්ගයයි. මෙය සමාදන් වන්නේ කෙසේද? අද පටන් ඡදනය හෙවත් සෙවිල්ල ප්‍රතික්ෂෙප කරමි. රුක්සෙවනේ විසීම කරන්නෙමියි සමාදන් වේ. රුක්ඛමූලික වීමේ අනුසස් කවරේද? සෙනසුන් පිළිබඳ මසුරුකම හා අළුත් වැඩියා නවකර්මාන්ත බහුලකම් ආදිය නැතිකම දේවතාවන් සමග වාසය වීමාදියයි— කවර රුක් සෙවන් වාසයට සුදුසු ද ? යම් ගසෙක සෙවනැල්ල දවල් කාලයෙහි තමා සිටි තැන පැතිර පවතිද, කොළ අතු පැතිර සිටී ද එවැනි ලොකු ගසක් විය යුතුය. නො සෙවිය යුතු වෘක්ෂයෝ කවරහුද චෛත්‍යවෘක්ෂ හෙවත් වැඳුම් පිදුම් කරණ බාර හාර වන ගස් ද කබල් දිරකඩ ආදී අනතුරු සහිත ගස් ද පණුවන් විද හුලඟින් බිඳී යා හැකිගස්, නාග යක්ෂ රාක්ෂයාධිගෘහිත ගස්, ඉදී වැටෙන ගෙඩි සහිත ලිහිණි රංචු ලගිනා ගස්ද යනාදිය නොසෙවිය යුතුයි—වහලක් යට නොවිසීමෙන් අඬ්ගය සම්පූර්ණ වන්නේය, බණ ඇසීම පොහෝ පවුරුණු ආදියට විනා ගෙපියස්සක් යට සිටීමෙන් අඬ්ගය බිඳෙන්නේ ය.

10.

යම් සැදැහැති සිල්වතෙක් උඩින් යම්කිසි වැස්මක් පියස්සක් ඇති ස්ථානයට අප්‍රියව ගසක්යට පවා විසීමට අමනාපව බඩුමුට්ටු ගබඩා කළ තැනක විසීමටත් අකමැතිව. මෙකී තැන්වල විසීමේ ආදීනව දක අභ්‍යව කාසවාසයේ අනුසස් දක ගෙයකට හෝ ගසක් යටට නොයමි යි ඉටාගෙණ වාසය කිරීම අබ්භොකාසික නම් වේ. එසේ වාසය කරණ පින්වතා අබ්භොකාසිකයාය. ඒ අබ්භොකාසිකයාගේ ප්‍රතිපත්තිය අබ්භො කාසිකාඬ්ගය වේ.—මේ අබ්භොකාසිකය සමාදන් වන්නේ කෙසේ ද?. අද පටන් නිවාසයක් පිළිනොගණිමි. ප්‍රතික්ෂෙප කරමි. අබ්භොකාස වාසය සමාදන් වෙමි කියාය. අභ්‍යව කාස වාසයෙහි අනුසස් කවරහුද ?. ථිනනම් චෛතසිකයන්ගේ අලස ගතිය මිඬනම් චිත්තයාගේ අලස කම්මැලි නිදි බර ගතිය නැතිවීම, මුවන් මෙන් කිසිතැනක් දෙයක් නැතිකම, ඇල්මක් බැඳීමක් නැති වාසය කෙසේ සම්පූර්ණ වේද?. පලසෙවිල්ල හා ගස් සෙවන ද දුරලමි අභ්‍යවකාශයේ වාසය කරමි සිතා විසීමෙන් අඬ්ගය පිරේ— පලසෙවිලි ගස් සෙවන්හි විසීමෙන් මේ අඬ්ගය බිඳේ වී—

11.

සසර දුකින් මිදෙනු කැමති යොගාවචර කෙනෙක් නිසි පරිදි වැඩිකාලය සොහොනක වාසය කෙරේ නම් ඒ තෙමේ සොසානික නම් වේ. පමාද පාපයන් දුරලනු කැමති ඔහුගේ සුසානවාස සිලය සොසානිකාඬ්ගය නම් වේ—සෝසානිකාඬ්ගය සමාදන් වන්නේ කෙසේද ?. අද පටන් සොහොනේ වාසය අත් නොහරිමි. සොසාණිකඅඬ්ගය සාමාදන්වෙමි කියා හිතා ගැණීමෙනි—සෝසාණික අඬ්ගය සමාදන්වීමේ අනුසස් කවරේද?. මරණ සතිය පහළවීම, අප්‍රමාදී විහරණය, කාමාසාවන් දුරුවීම, අමනුෂ්‍යයන්ගේ ගරු සම්භාවනා ලැබීමාදිය යි—කෙසේ මේ අඬ්ගය සම්පූර්ණවෙද ? කොහි විසිය යුතුද ?. තමා සොහොනට යන විට පළමු කොටම ඉඳීමට පහසු සුදුසු තැනක් සලකා ගත යුතුය. කෑ කෝ ගැහිලි වැඩිතැන්, දුම්වැඩිතැන්, නිතර මිනී පුළුස්සන ගිනි ඇති තැන්, අත්හැර සොහොණෙ විසිය යුතුය. එසේ ම සොහොනෙහි ගෙවල් සාද නොගත යුතුය. ඇඳක් හෝ මැස්සක් සාදගත යුතු නොවේ. උඩු සුළඟද නොසිටිය යුතුය. යටි සුළඟේද. නොසිටිය යුතුය. පුළුටු පළා මස්මාංශ නොකෑ යුතුය. දවල් නොනිදිය යුතුය. දුන්

විය යුත්තන්ට දන්වා සිටිය යුතුය. මහතෙරුන්ට, ගම්මුලාදැනියා, සොහොනපාලක යාටය, මිනී දවන, දමන, වළලන තැන්වල විසීම නිසා අඞගය සම්පූර්ණවේ. සොහොනේ වාසය අත්හැරීමෙන් අඞගය බිඳේවි—

12.

යම් ගුණවතෙක් ඇඳ පුටු ආරාම ආදිය පිළිබඳ ආලය හැර දමයි නම් ඒ යථාසන්‍ථික නම් සවභාවාසථරණය හෝ ඇතිරිලිබුමතුරුණු පලස් ආදිය අත්හරිද ඒ යථාසන්‍ථික යාගේ ප්‍රතිපත්තිය යථා සන්‍ථිකාඞග යයි. ඒ සමාදන්වන්නහු විසින් මිනිස්සු ලොල් වන දේට ආසා නොකරයිද මිනිස්සු තමා වැද්ද නොගණී යන්නට වෙහෙස නොගණීද මෙවැනි ලැහැල්ලු ජීවිතය ප්‍රියවේද එහි අනුසස් දකීද අදපටන් සේනා සන ලෝලය අත් හරිමි යථා සන්‍ථිකාඞග සමාදන්වෙමිකියා සමාදන්විය යුතුය. සවභාවාසථරණික වීමේ අනුසස් කවරහුද? පදිංචි සථානය අලංකාරකිරීම එවැනි අලංකාර නිවසට ඇලුම වේද ඒ පිළිබඳ ආලයහැර දැමීම බොහෝ දේක ආසාව බිඳින ලද්දේ වේ එවැනි දේ පුහුණු කිරීමෙන් අංගය පිරිමත් පුහුණු නොකිරීමෙන් භෙදයත් දතයුතුය.

13.

නිද ගැණීමේ ආදීනව සලකා ධ්‍යාන ඉපදවීමේ බලවත් ආසාවෙන් ඉදගණම කල් යවන්ට ඉටා ගැණීම නේසජ්ජික නම් වේ නිසජ්ජාවෙන් කල් යවන අංගය නෙසජ්ජික අඞගනම්වේ—නෙසජ්ජිකය පුරුදුකර ගන්නේ කෙසේද? නිද සිටී මේ ආදීනව හා වාඩිවී සිටී මේ අනුසස් දැන අදපටන් සයනය (ඇඳ-හෝනිඳා ගැණීම) අත්හරිමි නිසද්‍යාව සමාදන්වෙමි කියාය. නිසද්‍යකවී මේ අනුසස් නම්, අලස කුසීත බැව් දුරලීම. කයේ දුබල ගති දුරලීම. සැපපහසු ගිජු කම් හැරදැමීම නින්ද දුරලී මේ ප්‍රීතිය, හැම විට ම වීරිය ඉස්මතුව තිබීම හා ධ්‍යාන සමාපත්ති ඉපදවීමට ලේසිවීම ආදියයි. නිදි දුරලීමෙන් සම්පූණ් වීමත් නිදීමෙන් අඞග භෙදයත් දත යුතුය.

පකිණණක කථා

මේ තෙළෙස් ධූත ගුණ යන් සැබෑ සිතින් සමාදන්වන විට සුළු වෙනසකින් අංග බිඳීමක් නොවේ. තුන්සිවුරුදුහඟ දරන්නාට නිසීදනයක් ඉඳුල්කඩක් වශයෙන් සාලුවක් ලේන් සුවක් හෝ රෙදි කැල්ලක් තබා ගැණීම ද. සපදන චාරිකයා තම ගුරුවරයා දැක ඉදිරියට යා මෙන් කැඳවුවොත් පසුව යාමෙන් වන ගෙපිළි වෙළ කැඩීමද අබෙහා කායික රුකබ මූලිකයන් ධර්‍මශ්‍රවන සඞඝකර්‍මාදිය සඳහා පියස්සක් යටට යාමද ධූතගුණය නැතිවීමට හෙතු නොවෙති—තමා සමාදන් ව රකිනා ධූතාඞගයක් බිඳියාමෙන් පවසිදු වේද? නැත. නමුත් පිණ්ඩ පාතික භොජනෙමත්තඤ්ඤුතා බලු පච්ඡා භත්තික අඞගයන් බිඳිමට අනතුරු ව උපදනා හිත් අකුසල් වියහැකි බැවින් පවපිරෙන්ට ඉඩ ඇතිබව සැලකිය යුතුය.

කෙනවුත්තානි ධූතඞගානි.?. තෙරසධූතානි භගවතා වුත්තානි, භගවතා පඤ්ඤත්තානි;= මේ තෙළෙස් දුහඟයෝ කාවිසින් කියන ලද්ද හුද? බුදුන් විසින් වදරණ ලද්දහුය පණවන ලද්දහුය. මෙහි පැණ විමනම් සික පද පැණවීම මෙන්නොව පහළකරණ ලද්ද හුය යන අදහස යයි කියාතිබෙ.—ධූතානි කුසලාවා අකුසලාවා අබ්‍යා කතාවාති?. සියා කුසලා සියා අකුසලා—

යම් පුඟුලෙක් පාපයන් දුර ලන අද හස නැතිව, පාප සිතිවිලි දුරනොලා ලාමක බලා පොරොත්තු අත්නැර ධූතාඞග සමාදන් වෙතොත් ඒ අකුසල විය හැක. කුසල් සිතින් රකිනා දුහඟ දහම් කුසල්වේ. කුසල අකුසල නොවන සිතින් රක්නා ධූතය අව්‍යාකෘත වේ. අතොධූතානි කුසලත්තිකවජ්ජිතානිති—එබැවින් ධූතාඞගයෝ කුසලත්‍රික. වජ්ජිත

යෝය. ධුතස්ස කති විධා ධම්මා ? වෙ ධම්මා අලොභොච ආදොසොචාති ධුතාඞ්ග යෙන් සංසිදෙනා අකුසලධර්මයෝ කි ආකාරද ? දෙයාකාරය. අලෝභය අද්වේෂයද යන දෙකය රාගාදි චරිතෙසු කොධුතං සෙවති ? රාගචරිතොච මොහචරිතොච, රාගචරි තාදීන්ගෙන් කවරෙක් ධුතාඞ්ග සමාදන් වේද ? රාග මොහ චරිතයොදෙදෙනාය. ෙවෂ චරිතයාට ධුතාඞ්ගය ප්‍රිය මනාප-නොවේ. උෂ්ණ රොගයෙන් පෙළෙන පුද්ගලයෙකුට උණුසුම් බීම වර්ග අහිත කරවන්නාක් මෙනි, එහෙත් රුක්ඛමූලිකාංගය හා ආරණ්‍යක අඞ්ග දෙක දෙෂචරිතයා විසින් ද රක්ක යුතුවේ—ආරඤ්ඤිකඞ්ග රුක්ඛමූලිකඞ්ග පටිසේවනං දෙස චරිත ස්සාපි සප්පායමයි කියන ලදි—

ධුතාඞ්ග කීයක් කාලසීමා සහිත වේද? රුක්ඛමූලික ආබ්භොකාසික සොසානිකයන අඞ්ගතුණ අටමස් කාල සීමා සහිතයෝය. වැසිසාර මසතුළ ආවරණ සෙවිලි සහිත ස්ථානයක විසීමට බුදුරදුන් විසින් නියමකර තිබෙන නිසා ය.

අකුසල් මර්දනය කළ තැනැත්තා ධුතනම් කවරෙක් ධුත හා ධුතවාදී වේද? රහතුන් වහන්සේද ධුතගුණ සම්පූර්ණ තැනැත්තාද ධුතධුතවාදී වෙති. ධුත ගුණ යුක්තවූ යේ ධුතවාදී නොවූයේ, ධුතාඞ්ග සමාදන් නොවූ රහතුන්වහන්සේය. ධුතනොවූයේද ධුතවාදී වූයේද—ධුතාඞ්ග සමාදන්වූ සෙඛ පුථුජ්ජන පුද්ගලයෝය—ධුතත්නොවූ ධුතවාදීත් නොවූයේ—ධුතාඞ්ග සමාදන්නොවූ සෙඛප්‍රථජ්ජනදෙදෙනාය—ධුතාඞ්ගයෝ කුමක් ලක්ෂණ කොට ඇත්තාහුද?කුමක් රස (ස්වභාව) කොට ඇත්තාහුද? කුමක් වැටහීම් කොට ඇත්තාහුද, අලෙපවජ තාව ලක්ෂණයි—සතුටුබව ස්වභාවයි. ලද පමණින් සැනසීම වැටහීමයි—යලිත්—කැදර ගිජුකම් නැතිකම ලක්ෂණයි—නිදෙස් පැවැත්ම ස්වභාවයි-නොපිරිහීම වැටහීමයි—ධුතාඞ්ගයන්ගේ ආදි මධ්‍යාවසානයෝ කවරහුද? සමාදන් වීම ආදියයි—රැකී ම මධ්‍යයයි. සොම්නස අවසානයයි—පටිසේවනය

සීලය හා සීලයාගේම අංසයක්වූ ව්‍රතයෝද නිමියේය—

4 පරිච්ඡේදය

සමාධි

සීලයෙන් හා ධුතගුණ යෙන් යුත් යෝගාවචර තෙමේ සමාධි භාවනා කටයුතුයි—එහි කෙසේ සමාධි භාවනාව කටයුතු ද ? සමාධි යනු කුමක් ද ? එකම ආරම්මණයේ කුසල් සිත පිහිටුවා ගැණීම සමාධියයි. ඒ සමාධියේ ලක්ෂණ සවභාව වැටහිම ආදිය කවරහුද. කවර පුද්ගලයෙක් සමාධි උපදවාද ? ධ්‍යාන, විමොක්ෂ, සමාධි සමාපත්තින් ගේ වෙනස කවරේ ද ? ධ්‍යාන නම් පළමුවෙනි ධ්‍යානය ආදි චිත්තබල සතරයි—විමෝක්ෂ නම්, අජ්ඣත්තං රූපසඤ්ඤී බහිඩා රූපානි පස්සති යනාදි අට වැදැරුම් විමොක්ෂයෝය. සමාධි නම් සවිතක්ක සවිචාරාදී තුන් සමාධියයි. සමාපත්ති නම්, නවානු පූර්ව සමාපත්තීහුය. ආරම්මණූපනිධ්‍යානයෝයි—සමාධි භාවනාවේ අනුසස් කෙතෙක් ද ? සතරකි. දිඪ්ධම්ම සුඛවිහාරිතා=ධ්‍යානයට සමවන් විට ඔහුට ලැබෙන උසස් ප්‍රීති සැපයයි—විදසුන් වැඩීමට පහසුවීම—මිනිසෙකුගේ හිත නිවරණවලින් මිදුනු පසු සමාධි උපදවන්ට හැකි බව ලැබේ. ඉන්පසු ස්කන්ධ ධාතු ආයතනාදිය තතුසේ පෙණේ. ඉඩිවිධ ඤාණය, දිබ්බසොත ඤාණය, පරයිත්දන්නා ඤාණය පෙර උපන් ජාති දැනගන්නා ඤාණය, දිව්‍යස් නුවණ යන විශිෂ්ඨ දැනුම් පස ලැබීම නම් වූ අභිඥ ප්‍රත්‍යක්ෂ කිරීම. භවසම්පත්තිය හෙවත් පළමු වන ධ්‍යානය හීණ වශයෙන් වඩා බ්‍රහ්ම පාරිසජ්ජ බවට පැමිණේ ආදී වශයෙන් රූප අරූපභව විශෙෂයට පැමිණිම—යන සතරයි—සමාධියට අනතුරු කරණ ධර්ම කීයද ? අටකි, කාමච්ඡන්දය, ව්‍යාපාදනම් වූ කෝපය, චිත්ත චෛතසිකයන්ගේ අලස දුබලගතිය නම් වූ ථීන මිඩය. සිතේ උඩඟු නොසන්සුන් බව හා පසුතැවිල්ල බුඩාදී අටතැනක උපදවන දෙපණස් වැදැරුම් අනුමාණය හෙවත් සැකය, අවිජ්ජා නම් නොදත්කම හෝ වැරදි දැනීම, ප්‍රිතිය හා සැප රහිත බව, හා සියලු ලාමක පාප සිතිවිලි යන මේ අටදෙනයි—සමාධිය ඉපදීමට හා පැවතීමට හෙතුධම්ම කීයද ? අට දෙනෙකි—සවුපනිශ්‍රය තාව හෙවත් පෙරදී භාවනා කොට ලබා ඇති පුරුද්ද, පැවිදිබව හෙවත් තණ්හා මාණදිට්ඨි වැඩෙන ගිහි ජීවිතයෙන් තොරවීම, නීවරණයන් දුරුකිරීම, කෝප නොවීම, විද්‍යා හෙවත් ඤාණය. අවික්ෂෙප හෙවත් අමතක නොවීම හා සියලු සිත පොබයන කුසල් සිතිවිලි ධර්ම ඤාණ සමුප්පාදක සියලු කුසලයෝ ද යන මොහුය—

සමාධිය උපදවන්ට හා රැකගැණීමට උපකාරී ධර්ම (සම්භාර) කෙතෙක්ද ? සත් වැදැරුම්ය. අනේක විහිත සීලය. යථාලාභාදී සන්තුෂ්ටිතාව, ඉන්ද්‍රිය සංවරය වැළදීමේ පමණ දැනීම, රාත්‍රියේ පළමු යාමය මැද යාමය, අලුයම් හී නොනිදීම, සිහි නුවණින් නිතර යුක්තවීම, කායචිත්ත අතිසය විවේකය යන මොව්හුය—සමාධිය කී ආකාරද ? ආයර්‍ය ඵලයට නොපැමිණියන්ගේ සමාධිය=ලෞකිකය, ආයර්‍ය ඵලය හා උපන් සමාධිය, ලෝකෝත්තරය කියා දෙයාකාරය, මේ ලෞකික සමාධිය ආශ්‍රව සහිතය, දුක හා සසර හා බැඳීම් ඇත්තේය. සසර ගැට ගැසෙන සවභාව ඇත්තේය. කෙලෙස් කිලුටෙන් යුක්තය. ලෝකෝත්තර සමාධිය මේ සියල්ලෙන් මිදුනේය. අකුසල චිත්තයාගේ එකඟතාව මිථ්‍යාසමාධියය වඩාගතයුතු කුසල චිත්තයාගේ එකාග්‍රතාව නම් සම්මා සමාධි නම්—උපචාර සමාධි, අර්පණා සමාධියයිද දෙයාකාරවේ—ඒ ඒ ධ්‍යානයන්ට පූර්වභාගයේ පැවැති චිත්තෙකාග්‍රතාව උපචාර සමාධියයි—ගොත්‍රභුඥනයට අනතුරුව පරිකර්ම ඤනයට අනතුරුව උපදනේ අර්පණා සමාධියයි—විතර්ක විචාර සහිත (ප්‍රථම ධ්‍යාන)

සමාධිය, අවිතර්ක පරිත්ත විචාර (ද්‍විතියධ්‍යාන) සමාධිය—අවිතර්ක අවිචාර (තෘතීය චතුර්ථ ධ්‍යාන) සමාධිය කියා තුන් ආකාරයි—ප්‍රීතිය සමග උපන් (ප්‍රථම ද්‍විතිය ධ්‍යාන) සමාධිය, සුවය සමඟ හටගත් (තෘතියධ්‍යාන) සමාධිය, උපෙක්‍ෂාව සමඟ උපන් (චතුර්ථ ධ්‍යාන) සමාධිය කියාත් තුන්වැදෑරුම්වේ. කුසල විපාක කිරිය වශයෙන්ද සමාධිය තුන් වැදෑරුම්වේ—කුශලනම් ආර්‍ය්‍යමාර්ගයයි—සෙඛ පුථුජ්ජනයන් විසින් වඩන රූපාවචර අරූපාවචර අට සමවත්හුය—විපාකනම් ආර්‍ය්‍ය ඵලයයි—සත්සේඛයන් විසින්ද කල්‍යාණ පුථජ්ජනයන් විසින්ද ඉපදවූ රූපාවචර ධර්මයෝය. කිරියා සමාධිය නම් අශේඛවූ රහතුන් විසින් සමවන් රූපාවචර අරූපාවචර සමාධිහුය.

සතරවැදෑරුම්—කාමාවචර රූපාවචර අරූපාවචර, අපරියාපන්න වශයෙන් සමාධිය සිව්වැදෑරුම්වේ. ඒ ඒ කරුණුවල ඒ ඒ පුද්ගලයන් විසින් පුහුණු කරණ සමාධිය කාමාවචරසමාධියයි—රූපාවචර නම් ධ්‍යාන සතරයි. අරූපාවචර නම් සතර අරූපාවචර සමාධි කුසල විපාකයෝයි. අපරියන්න නම් සතර මාර්ග ඵලයෝය—දුක්වූ පිළිවෙතින් ප්‍රමාදයෙන් අවබොධය දුක්පිළිවෙතින් වහා වැටහීමය සැප පිළිවෙතින් පමාව වැටහීම සැප පිළිවෙතින් නොපමා අවබොධයයිද සතරාකාරවේ—පරිත්ත සමාධි පරිත්තාරම්මණය, පරිත්ත සමාධි අප්පමාණාරම්මණය අප්පමාණ සමාධි පරිත්තාරම්මණය, අප්පමාණ සමාධිය පරිත්තා රම්මණයයිද සතර වැදෑරුම්වේ. ඡන්ද සමාධි. විරිය සමාධි, චිත්ත සමාධි විමංසා සමාධි යයිද සතර ආකාරවේ.

බුදුවරුන් පමණක් සමවදනා සව්වන් සමනොවදනා සමාපත්ති ඇත්තාහ. මහා කරුණා සමාධිය හා යමකප්‍රාතිහාරිය සමාධියයි—ශ්‍රාවකයන් පමණක් උපදවන බුදුවරුන් නොවදනා සමවත් කොටසක් ඇත. සෝවාන්, සකදගාමි අනාගාමි ඵල සමවත්හුය. සව්වන් විසිනුත් බුදුවරුන් විසිනුත් සමවදනා සමවත්හුද ඇත්තාහ. නවානුපූර්‍ව සමාධිහුය අරහත්තඵල සමාධියයි. බුදුවරුන් විසිනුත් බුදුසව්වන් විසිනුත් සමනොවදනා සමාධිය කුත් ඇත. එනම් අසඤ්ඤසමාධියයි—සසර ඉපදීමට මුත් නිවණට හේතුනොවන සමාධිය කුත් ඇත කාමාවචර කුසල අකුසල සමාධිහුය. පිරිනිවීම සඳහාම පවත්නා ඉපදීමට හේතුනොවන සමාධියක් ඇත. ඒ සතර ආර්‍ය්‍ය මාර්ග සමාධියයි. උප්පාදයට හා නිරොධයට හේතුවන සේඛ පුථුජ්ජනයන් සමවදනා රූප අරූප කුසල සමාධිහුය. උප්පාදයට හෝ නිරොධයට හේතු නොවන සමාධියකුත් ඇත. සියලු ඵල සමවත් හා කිරියා සමාධිහුය. පඨම. දුතිය, තතිය චතුත්ථ ඣාන වශයෙන්ද සතර වැදෑරුම්වෙති—මෙකී සතරත් සමග පඤ්චකජ්ඣානය ගත්විට සමාධිය පස්වැදෑරුම්වේ—පඤ්චඟ සමාධිය හෝ පඤ්චාඩ්ගික සමාධිය නම් පළමු දෙවන ධ්‍යානයන්හීමෙන් ප්‍රීතිය පැතිරීම, මුල් තුන් ධ්‍යානයන්හිමෙන් සැප පැතිරීම, පරසිත් දැන්මෙහිමෙන් චෙතොඵරණතාවය දිබ්බචක්ඛු අභිඤ්ඤදියෙහි ආලෝක පැතිරවීමය. ඒ ඒ සමවතින් නැගිටියහුගේ පච්ච වෙක්ඛණ ඤාණයද පචඩ්ගගික සමාධියයි.

පඤ්චඤාණික සම්මා සමාධිය—මේ සමාධිය ඉහාත්ම සැපවිහරණය හා අනාගත සැප විපාක ඇතැයි තමා පිළිබඳවම ඤාණය උපදී—මේ සමාධිය ආර්‍ය්‍යනිරාමිස සමාධියයි. මේ සමාධිය සප්‍රාඥවූ මහා පුරුෂයන් විසින් සෙව්නේය. මේ සමාධිය ශාන්තය. ප්‍රණීතය, කෙලෙස් සන්සිඳීමෙන් ලැබුනේ එකඟභවයට පැමිණියේය.—මේ සමාධිය සිහියෙන්ම සමවදින්නේය. මේ සමවතින් සිහියෙන්ම නැගීසිටී තමා පිළිබඳවම නුවණ උපදී—

5 පරිච්ඡේදය

කල්‍යාණ මිත්‍ර පරියෙසනා

ධ්‍යාන සමාපත්ති උපදවනු කැමැති ආදිකම්මික යොගාවචරයා විසින් කල්‍යාණ මිත්‍ර කම්මට්ඨානාචාර්‍ය්‍යවරයෙකු සොයාගත යුතුය. මක්නිසාද යත් කමටහන් උගන්වන ආචාර්‍ය්‍යවරයා යොගාවචරයාගේ මාර්‍ග දේශකයා වන බැවිනි, ඤාතියාත් නියම මිත්‍රයාත් හැම අභිවෘද්ධියකම උපකාර ස්වාමියා මේ ගුරුවරයායි. ඉදින් යම් යොගාවචරයෙකුට එවැනි කලණ මිතුරකු නොලැබිනි නම් ඒ තෙමේ ඇතරුවකු නැති ඇතෙකු මෙන් තමා කැමති අතක ගමන් කරන්නේය. මේ කලණ මිතුරා දක්‍ෂ රියැදුරකු, යතුර දරන්නා, වෙදවරයා, පියා, මව, ගුරුවරයා, වන උතුමෙකි. පරම කල්‍යාණ මිත්‍රයා කවුද ? සූත්‍ර අභිධර්‍ම විනය යන ත්‍රිපිටක ධර්‍මයෙහි විශාරදවූ, කර්‍මස්ථාන විභාග විස්තර ප්‍රගුණවූ, ධ්‍යාන, අභිඥා, මාර්‍ග, ඵල, අෂ්ට විද්‍යා, පිළිසිඹියාදී, ලොව්තුරා දහම් අතිමානුසක ගුණ උපදවා ගත් චතුස්සත්‍යාවබෝධකළ උතුමාය. එවැනි සත්‍යතාවබොධකළ ආර්‍ය්‍ය ආචාර්‍ය්‍යයෙකු ලැබගත නොහැකිනම්, ඉහත ගාථා වෙන් සඳහන්වූ ලෞකික සත්ගුණයෙන් යුත් උතුමෙකු ඇසුරු කටයුතුය. ඒ සත් ගුණය නම් ආචාර සමාචාරාදියෙන් ප්‍රියවර්‍ධන කෙනෙකුවීම, සීලසුතධුතාදියෙන් ගරුකටයුතු වීම, කරුණාදයානුකම්පාදියෙන් සම්භාවනා කටයුතුවීම, වාක්චතුරතාවෙන් යුත් දෙශකයෙකුවීම, දුර්ග්‍රාහස්ඛලිත වචන ඉවසන බොරු තෙජස් අනුභස් නොදක්වන්නෙකුවීම, ගැඹුරු ධර්‍ම විනය පිළිබඳ ඥාණවාද ගැඹුරු කතා ඇතිවීම. අතවැසියා, කුල, ඥාති, ආවාස, කම්ම, ගණ, ගන්ථ ආදී පළිබොධ සංඛ්‍යාත අස්ථානයක නොයොදන්නේද යන ගුණසතින් යුක්ත වීමයි.

කල්‍යාණ මිත්‍රවූ එවැනි ගුරුතුමෙක් කෙසේ සෙවිය යුතුද ? උට්ඨාණ වීර්‍ය්‍යයෙන්යෙදී විමසා බලා අසවල් අසුවල් තැන මෙවැනි මෙවැනි ඇදුරන් වෙසෙතැයි අසා සොයා යා යුතුය. උසස් අන්දමින් ගරු බුහුමන් දක්වා විමසා බලා ඉහත සඳහන් ගුණාඩ්‍ය යුක්තනම් කර්‍මස්ථානාචාර්‍ය්‍යවරයෙකු වශයෙන් ඔහු වෙතට යායුතුයි. මෙසේ උපස්ථානයෙන් පළමු අනුන්ගෙන් අසා විමසා රට ගම, වාසස්ථානය ආදිය දැනගණම ඒ ධ්‍යානාචාර්‍ය්‍යයන් වෙත යා යුතුය. සුස්සූසා—ලොකුම ලොකු සුවච කීකරු කම, පාරිචරියා—අත්පා මිරිකීම් ආවතේව කිරීම සකසා කමටහණ උගෙණීම් ආදියෙන් ඇසුර කටයුතුයි. අලුත විවාපත් කුමරියක් ඇගේ නැදි මයිලන් ඉදිරියේ ලැජ්ජා භය ගරුසරුකම් දක්වා සිටින්නී ද එසේ ගුරුවරයා ඉදිරියේ ගරුසරුකම් දක්වා සිටියයුතුය. ඒ ගුරුතුමා විනය අභිධර්‍මය. ධූත ගුණාදිය පිළිබඳ ආචාර්‍ය්‍යවරයෙක් නම් ඒ ඒ දෙයත් උගතයුතුය. වයසින් බාල උවද ගුරුවරයාගේ සිවුර පාත්‍රය ගෙණ කැටුව යාමාදී වත් දැක්විය යුතුය. ඉඩ පහසු ලැබුණු විට තම අදහස දැක්විය යුතුය. කෙසේ හෝ අණ පිළිපැදීමෙන් ගුරුවරයාගේ හිත දිනා ගත යුතුය. තමාගේ කය, වීර්‍ය්‍යය සමග ජීවිතයෙන් පිදූවාම, සියලු ගුරුභරුකම් කියා දෙයි—කලණමිතුරා සොයන්නේ මේ ලෙසිනි—

6 පරිච්ඡේදය

චරියා විභාගො

ඉහත සඳහන් පරිදි ලෝකෝත්තර ගුණසමන්විත වූ හෝ අලාමක ලෞකික සත්ගුණ සමන්විතවූ ඇදුරුතුමෙකු විසින් තම අතවැසියාගේ චරිතයට අනුරූපවූ කමටහණක් උගැන්විය යුතු යයි ද තම තමාගේ චරිතයට යෝග්‍ය කර්මස්ථානයක්ම ඉගෙණ භාවනා කටයුතුයයිද කියනලද බැවින් චරිත විභාගයක් කියයුතුය. පුද්ගලයන්ගේ ස්වභාවය හෝ සහජ පිහිටි ගතිගුණය චරියාව හෝ චරිතය නම් වේ. එකී චරිත තුදුසක් 14 ඇත්තාහ. එනම් රාගචරිතය, ද්වේෂ චරිතය, මෝහ චරිතය, ශ්‍රද්ධා චරිතය, බුද්ධි චරිතය විතර්ක චරිතය, රාග ද්වේෂ චරිතය, රාග මොහ චරිතය, ද්වේෂ මොහ චරිතය, රාග ද්වේෂ මොහයන් සමභාගවූ චරිතය, ශ්‍රද්ධා බුද්ධි චරිතය, ශ්‍රද්ධා විතර්ක චරිතය, බුද්ධි විතර්ක චරිතය, ශ්‍රද්ධා බුද්ධි විතර්ක සමභාගවූ චරිතයයි තුදුසකි. තණ්හා චරිත, දිට්ඨි චරිත, මාණ චරිතාදි තවත් බොහෝ ප්‍රභේද ඇත්තාහුය, ඒ හැම ප්‍රභේද අතුරෙන් වෙන්ව පහැදිලිව පෙණී යන මේ තුදුස අප දැකගත් චරිතයෝය. මේ තුදුස ලුහුඬු කිරීමෙන් සතක්වනු ඇත. එනම් රාග, ශ්‍රද්ධා දෙක, සමානය. ද්වේෂ, බුද්ධි දෙකද, මොහ, රාග, ද්වේෂය—සද්ධා බුද්ධි සද්ධා විතර්ක යෝද ද්වේෂ මොහආදී සමානකම් අනුසාරයෙනි—ඒ කෙසේද යත හොත් සම සම කම් දක්නට ලැබෙන බැවිනි—

මේ ප්‍රධාන සත්දෙනා අතුරෙන් රාගචරිතයා, ද්වේෂ චරිතය, රාගද්වේෂ චරිතයාය යන තිදෙනාට ඛිප්පාභිඤ්ඤ පටිපදාවද, මොහචරිතයා, රාගමොහ චරිතයා, දෙස මොහ චරිතයාය සමභාග චරිතයාය, යන මොවුන්ට දන්ධාභිඤ්ඤ පටිපදාවද ලැබෙන බව කියන ලදී. විශෙෂයෙන් මේ සත් චරිතයන් රාගද්වේෂ මෝහ තුණටම ඇතුළත් වෙති. මේ ත්‍රිවිධ චරියාව කුමක් නිදන (මුල් හෙතුව) කොට ඇත්තාහුද ? පූර්වයෙහිදි පුහුණුව නිදන කොට ඇත්තාහුය, ධාතු ගුණ නිදන කොට ඇත්තාහුය. රාගද්වේෂමොහාදිය ධාතුහුය, දෙෂත්‍රය නිදන කොට ඇත්තාහුය. වා, පිත්, සෙම්, යන මොහු දෙෂ යෝය, සෙම් අධික ප්‍රකෘතිකයා රාගචරිතයාය. පිත පියවිවූයේ ද්වේෂ චරිතයාය වාතාධිකයා මොහ චරිතයාය.—නොහොත් සෙම් පියවිවූයේ මොහ චරිතයාය, වා පියවිවූයේ රාගචරිතයායයිද කියති.

මේ පුද්ගලයා රාග චරිතයාය මේ ද්වේෂ චරිතයාය මොහු මෝහ චරිතයායයි දැනගන්නේ කෙසේද ? ආරම්මණ වශයෙන් නොහොත් දැකීම් වශයෙන්ද, බලපාණ කෙලෙසුන් වශයෙන් ගමනින් හෙවත් ඉරියව් වශයෙන්, හඳනා පොරෝනා සිවුරු ඇතිරිලි ආදියෙන්, වැලඳීම් වශයෙන් හා ප්‍රිය ආහාර වශයෙන් ඇමැදීම්, මැසීම් රැඳීම් ආදී කෘත්‍ය වශයෙන් නිදීමාදි ඉරියව් වශයෙන් ද දතයුතුවේ. කෙසේ සිවුරු ඇඳීම පෙරවීම කෙරෙයිද, කෙවැනි අහර කෙසේ බුදීද ඔහුගේ ඇඳ ලැගුම් ගෙය කෙසේ තබාගෙණ සිටීද. හැසිරීම කෙසේද. ඉරියව් පැවැත්වීමද විමසා බැලිය යුතුය. චීවර සමාදන යනුවෙන් සිවුරු හෝ ඇඳුම් අඳින පෙරවන ආකාරය ගණු ලැබේ. භොජනාහාර පරීක්ෂණයෙදි කැඳ බත් කැවිලි ආදී රුචි දැයත් බුදිනා ආකාරයත් විමසනු ලැබේ. මෝහ චරිතයාගේ සෙනස්න ගුරුවරයාට

අසලම තිබිය යුතු බව. ආදිය, සෙනසුන් විචාරයවේ. ගොචර යනුවෙන් පිඩුසිඟායන මාර්ග‍ය ගම ආදී හැසිරෙණ ස්ථාන හැඳින්වේ—පිඩු සිඟා යන විට රාගචරිතයා ඉරටමුණලායයි. දෙෂ චරිතයා බස්නාහිරටද මෝහ චරිතයාට ලැබුනු විධියකටද ගමන් රුචිවේ. දෙෂ චරිතයා හිටගණ හෝ නිද ගණ වැඩිකල් ගත කරණ බවත් මොහ චරිතයා සක්මණින් වැඩිකල්යවන බවත් සඳහන් වේ.

ප්‍රකීණක වශයෙන් රාගචරිතයා ඇදහිය හැකිදේ විශ්වාස කරයි. වෙෂ චරිතයා ඇදහිය නොහැකිදේ විශ්වාස කරයි, මොහ චරිතයා කිසිවක් විශ්වාස නොකරයි. රාග චරිතයා දසයෙකු වැනිය. වෙෂ චරිතයා අධිපතියෙකු වැනිය. මෝහ චරිතයා විෂ ජාතියක් මෙනි. රාග චරිතයා වර්ණයට කැමතිය. වෙෂ චරිතයා වැරදි සෙවීමට කැමතිය. මොහ චරිතයා කම්මැලි කමට කැමති බව කියා තිබේ—

7 පරිච්ඡේදය

කම්මට්ඨාණ

ඉහත සඳහන් ගුණාඞ්ග සමන්විත වූ ගුරුතුමා තම අතවැසියාගේ චරිතය විමසා දැනගෙණ අටතිස් අරමුණු කර්මස්ථානයන් ද, විඤ්ඤාණ කර්මස්ථානයන් ගැණ ද පුහුණු කරගැණීමට උපදෙස් හා අවවාද දිය යුතුය. ඒ අටතිස් කර්මස්ථානයන් කවර හුදයත්—දස කසිණ, එනම්, පඨවි, ආපෝ, තෙජෝ, වායෝ යන භූත කසිණ සතර හා, නිල, පීත, ලෝහිත, ඕදත, ආකාසායතන, විඤ්ඤාණායතන යන වර්ණකසිණ හයත් ය. දස අසුභ—මැරී ඉදිමීගිය මිනිය, උද්ධුමාතකය, විනීලක—නිල්වගිය මළ කුණ, විපුබ්බක—කුණුව සැරව ගලන මිනිය, විච්ඡිද්දක—අව්මුව ආදියෙන් සිදුරුව ගිය මිනිය, වික්ඛායිතක—බලු හිවල් ආදීන් විසින් කා ඉතුරු මිනිය, වික්ඛිත්තක—ඉවත දැමූ මිනිය, හත වික්ඛිත්තක—විශෙෂයෙන් ඉවත දැමූ මිනිය, ලෝහිතක—කැපුණු කැඩුනු තැනින් ලේගලන සිරුරය, පුලවක—හටගත් පණු කැදලි ඇති මිනිය, අට්ඨික—ඇටසැකිල්ලය යන අසුභ දශයයි—අනුස්සති දසය, බුදුන් සිහිකිරිම, නවලොව්තුරා දහම් සිහිකිරිම, අට අරිය සඟුන් සිහිකිරිම, සීලගුණ සිහිකිරිම, ත්‍යාගී ගුණ සිහිකිරිම, දෙවියන්ගේ පින්ඵල සිහිකිරිම, මරණය සිහිකිරිම, කයෙහි තතු සිහිකිරිම, ආශ්වාශ ප්‍රශ්වාසය සිහිකිරිම, උපසමය (නිවණ සිහිකිරිම) යන දශයයි—බ්‍රහ්ම විහාර නම් වූ මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යන අප්‍රාමාණ්‍ය සතර ය. අරූප සමාපත්ති සතරය යන තිස්අට හා ආහාරේ පටිකූල සංඥාවය චතුධාතුවවත්ථානය යන දෙකත් සමග සතළිස් කර්මස්ථානයයි දත යුතුය—

මෙ අටතිස් හෝ සතළිස් කර්මස්ථාන නව ආකාරයකින් උගෙණ දරා පුහුණු කට යුතුය. පළමුවෙනි ආකාරය කර්මස්ථාන සංඛ්‍යාව පැහැදිලිව දැනීම් වශයෙනි. ධ්‍යාන වශයෙන් හෙවත් අර්පණා උපචාර ආදී ධ්‍යානාංග වශයෙනි. චතුනය පඤ්චනය වශයෙන් චතුක්ක පඤ්චක ධ්‍යාන වශයෙන් ද දත යුතුවෙ. පළමු කසිණ අටත්, ආණාපාණ සතියත් අරූප කමටහන් යයි දක්වයි—උපෙක්ෂාවත් සමග චතුනය වශයෙන් චතුක්ක ධ්‍යානික කමටහන් යයි දක්වනු ලැබේ—සමතික්‍රම නම්—රූප සමතික්‍රමය, අරූප කසිණයොය. අරූප සමතික්‍රමය ත්‍රිවිධ කසිණ කර් ස්ථානයි. අරූප කසිණ දෙකත් ආකිඤ්චඤ්ඤ යතනයත් තුණකි. සංඥා, වේදනා සමතික්‍රමයට අටතිස් අරමුණු පමණක් නොවේ. අඞ්ග සමතික්‍රමය, ආරම්මණ සමතික්‍රමය යන දෙයාකාරයෙනි—වඩ්ඪණාවඩ්ඪන වශයෙන්. කසිණ නිමිත්ත ද අප්‍රාමාණ්‍ය සිත් සතර ද දියුණු කිරිම පැතිරවීමත් ඉතිරි කමටහන් නොවැඩීමත් වශයෙනි—පච්චය වශයෙන්, මුල් කසිණ අටත්, පරිච්ජින්නාකාස කසිණයත් පඤ්චනය වශයෙන් අභිඤ්ඤ පාදක වෙති—එබැවින් විපස්සනාවට ප්‍රත්‍යය වීම වශයෙන් සැලකීමයි ආරම්මණ වශයෙන්. විඤ්ඤාණ කසිණ දෙකත් සමග එක්විසිකමටහණකි. දස අසුභය, ආනාපාණ සතිය, කායගතා සතිය සමග එක් විස්සය—සබාව ධර්මාරම්මණයො නම් විඤ්ඤාණ කසිණය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයත් සමග අනුපස්සනා දසය යන දෙළොසයි. පටිභාගාරම්මණ නම් සබාවාරම්මණයොම යයි නොකිය යුතුය. සතර බ්‍රහ්ම විහාරයන් හා ආකිඤ්චඤ්ඤායතන හිත යන පසය විශෙෂ වශයෙන්—

එකෙකී කමටහණ පිළිබඳ වෙන් වෙන්වූ විස්තර විභාග දත යුතුය. චතු ධාතු වවත්ථානය විශෙෂ වූ ප්‍රඥ භාවනාවකි. භූමි වශයෙන් කාමරූප, අරූප, ලොකුත්තර යන සිව් භූමියකි. මිනිසාට සතර භූමින්ට හිමි කමටහන් වැඩිය හැකි වේ. සතර භූමි

විපාකම පවති. ගෝචර වශයෙන් තම තමාගේ චරිතයට ඔබිනා හිතවූ කමටහණ වැඩිමය. රාග චරිතාදි වශයෙන් රාගචරිතයා විසින් අප්පමඤ්ඤ සතර පළමුව පුහුණු නොකට යුතුය. ඒ ඔහුට ශුභ නිමිත්ත විය හැකි නිසාය. රාග චරිතයාට ශුභ සඤ්ඤව අපථ්‍යය, සෙම්හාධිකයාට පැණිරස කැවිලි අගුණ වැනිය. වෙෂ චරිතයා විසින් දශ අශුභ පුහුණු නොකට යුතුය. ඔහුට ඒ පථ්‍ය නොවේ. පිත්කෝප ඇතියෙකුට උණුසුම් පාණ වර්ග මෙනි. අවබෝධය නොදියුණු මොහචරිතයාට තනිව කිසි කමටහණක් වඩන්ට ඉඩ නොදිය යුතුය. ඔහුට උපාය ඤාණය නැති නිසා වැරදි ලෙස තේරුම් ගත හැකිය. එසේ වැරදි අදහසක් වී නම් ඔහුගේ උත්සාහය නිශ්ඵල වේ. අකුසස නැතිව ඇතුපිට නැඟුණු අයෙකුට ඔහු සම විය හැක.

රාගචරිතයා විසින් අසුභ අරමුණු හා කාගියාසි (කායගතා සති) පුහුණු කටයුතුයි. රාගයට නියම පිළියම බැවිනි. වෙෂචරිතයා විසින් සතර බ්‍රහම විහාර හැදෑරිය යුතුය. වෙෂයට නියම ප්‍රතිකාරය වන බැවිනි. දෙෂ චරිතයාට වණ් කසිණයෝද හිතකර වෙති. ඔහුගේ හිතට එකහවන බැවිනි. ශ්‍රඩාචරිතයා විසින් සානුස්සතිහු පුහුණුකට යුතුය. බුඩානුසසතියේ පටන් සිහිකරණ විට ශ්‍රඩාව තහවුරු වන බැවිනි. බුඩි චරිතය ප්‍රගුණ කටයුතුය. චතුධාතුවවත්ථානය ආහාරෙ පටිකකූල සඤ්ඤව, මරණ සතිය, උපසමානුසසතිය ද හිතවත් වෙති. කිසිම චරිතයකට කමටහණකට බුඩා නුසසතිය බාධක නොවේ. විතක් චරිතයා විසින් ආණාපාණ කමටහණ පුහුණු කට යුතුය. එයින් විතර්කය කැඩියන බැවිනි. මෝහ චරිතයා සුවච බැවින් ශ්‍රඩාවෙන් යුක්ත විය යුතුය. ධම් සාකච්ඡා ශ්‍රවණ වැඩිවිය යුතුය. ධම් ගරුක විය යුතුය. නිතරම ගුරුවරයා ළඟ විසිය යුතුය. මෝහචරිතයා තම දැනිම දියුණු කරගන්ට ලොකු වෑයමක් කටයුතුය. මෙ අටතිස් අරමුණු වලින් තමා කැමති කමටහණක් පුහුණු කරණ අතර මරණ සතිය චතු ධාතු වවත්ථානය යන දෙකින් එකක් ප්‍රගුණ කළ යුතුයි. මුදින්ද්‍රිය රාගචරිතයා විසින් අශුභානු පස්සනා වැඩිය යුතුය. එයින් මෘදු ඉන්ද්‍රිය තියුණු වන බැවිනි. ඒ සතිඨාන නම් වේ. එයින් රාග දෙෂයන් දුරුවේවි. මුදින්ද්‍රිය දෙෂ චරිතයා සතර අප්‍රාමාණ්‍යයන් වැඩිය යුතුය. බුඩිහිණ මෝහචරිතයා විසින් කිසි කමටහණක් වැඩිය යුතු නොවේ. මෝහ විතක් චරිත දෙදෙනාටම එකම ආණාපාණ සති කමටහණ යෝග්‍ය වේ—

8 පරිච්ඡේදය

කසිණ

පඨවි කසිණයෙහි ලක්‍ෂණ රස පච්චු පට්ඨාන පදට්ඨාන ආනිසංස දත යුතුය. පඨවිය දෙයාකාරය. ලක්ඛණ සසම්භාර කියා හෝ සකස් කළ පඨවිය පිහිටි පඨවිය කියාය. යොගාවචරයා හට අකත පඨවිය සුදුසු නොවේ. පටිභාග නිමිත්ත නූපදින බැවිනි, සකස් කරගත් පඨවිය කසිණ මණ්ඩලය ගතයුතුය. එද සුදු, කළු, රතු අරුණවන් යන පැහැ අතුරෙන් අරුණුවන් අරමුණ සුදුසුය. අන් පැහැ අරමුණ වණි කසිණ බවට යා හැකිය. පළමු කිසුණු පිරියම් කොට පුහුණුවී සිටින්නෙකුට නම් යුහුව පටිභාග නිමිත්ත උපදනේය. ධ්‍යාන භාවනා පුහුණු නොකළ ආදි කම්මිකයා විසින් කසිණ මණ්ඩලයක් සාදගත යුතුය. ඒ මණ්ඩලය සතරැස් ත්‍රිකෝණ කව ආදි හැඩයකින් ගතයුතුය. ප්‍රමාණයෙන් එය කුලුපිටක් බත්වළඳක් තරම් වියයුතුය. රෙදිකඩක, ලැලිකැබැල්ලක හෝ පවුරු බිත්තියෙක සාද මිනිසුන්ගෙන් බාධා නැති තද එලිය හෝ අඳුර නැති නිශ්ශබ්ද තැනෙක තබාගත යුතුය. කොයි හැඩයක මණ්ඩලය වුවද වරදක් නොවේ. පුවරු රෙදිකඩ ආදි කොයි එකක වුවද වරදක් නැත ද රෙදිකඩෙක වූ කවාකාර නෙත් මැටියෙන් සැදූ මණ්ඩලය පෙරැදුරන් විසින් පසසනු ලැබේ.

මෙසේ සකස් කරගත් පඨවිභාවනාව කෙසේ කටයුතුද යත්— පඨවි කසිණය භාවනා කොට ධ්‍යාන ගුණ උපදවා ගණු කැමති තැනැත්තේ පළමු කොට කම් සැපතෙහි දෙස් දක ගිහි බැවින් වෙන් වීමේ නෙකඛම්මයෙහි අනුසස් දනගත යුතුය. කාමයො මඳ සැනසිලි හා දුක් වෙහෙස වැඩියෝ ය යි දු කීමය, නෙක්ඛම්මය දෙයාකාරය. පළමු ආකාරය ගෙය නැමැති අඹුදරු පොෂණයෙන් වෙන් වීමය. දෙවන ආකාරය සිත්හි ලැගුම් ගෙණ සිටින කෙලෙසුන් නෙරපා දැමීමයි— මෙසේ කාමාදිනවත් නික්මීමේ අනුසසුත් දුටු යොගාවචර තෙමේ කටයුතු නොකට යුතු දැනගණී. මඳ ආහාරයක් ගණී. අලස ගති දුරලයි. අත්පා මුහුණ සොදගණ ආසනයේ වාඩිවිය යුතුය. වාඩිවී අරහාදි බුදුගුණද ස්වාක්ඛාතතාදී නෛයණීනික ධර්මගුණද සුපිළිපන් බැව් ආදී සඞ්ඝ ගුණද මෙනෙහි කටයුතුය. තම ආසනය කසිණ මණ්ඩලයෙන් යුගප්‍රමාණයේ රියන්දෙක හමාරකට නුදුරින් තබාගත යුතුය. වාඩිවනවිට ඌරු බඩා සනයෙන් ඇහ ඇදනැතිව කෙළින් තබාගණ පය්‍යඞ්කා භොග වශයෙන් වාඩිවිය යුතුය. පහසුවෙන් මණ්ඩලය පෙණෙන ලෙස තබා අඩැසින් එදෙස බැලිය යුතුය— නිමිත්ත හිතට ඇදගන්නා ක්‍රම තුණකි. සම, උන්නාම, අවනාම යන බැලීම් තුනෙනි. කසිණ නිමිත්ත මෙනෙහි කිරීමේ උපාය සතරකි. ඉදින් නිමිත්ත නොපෙණී ගියේ නම් භාවිකයා තමාගේ යම්තරා වරදක් ඇතැයි සිතන්නේය. කුඩාව හෝ අඩක් හෝ නිමිත්ත පෙණෙ නම් කසිණ මණ්ඩලය තිබෙන ආකාරයේ වරදකැයි දන්නේය. මෙසේ නිදෙස් ව තබාගෙණ භාවනා කටයුතුය.

විකෙඛපපහාණය නම් නොයෙක් අරමුණු කරා දිවීමෙන් හිතේ ඇතිවන විසිරීම දුරුකිරීමයි. සතර ආකාරයකින් සිතේ එකඟ කම රැක ගැණීමයි. අමුතු දේට හිත ඇදී යාම නැවැත්වීම, හිත උඩගු වන්ට හෝ ඇකිලෙන්ට ඉඩ නොදීම අකුසල අරමුණු දුරලීමාදී වශයෙන් උනන්දු හිත නමාගත යුතුයි. මෙසේ භාවනා කරණවිට උග්ගහ පටිභාග නිමිති පහළවන්නේය. උග්ගහ නිමිත්ත නම් සංඥාමාත්‍රයකි. එය මණ්ඩලය හාත්පස ආලෝක කදම්බයක් මෙන් පහළවේ. පටිභාග නිමිත්ත නම් උග්ගහ නිමිත්ත පලාගණ

එමෙන් සියදහස් ගුණයෙන් මහත්ව පහළ වන ආලෝක කදම්බයකි. පටිභාග නිමිත්ත සංඥ ප්‍රතිබිම්බයකි. හෙවත් හිතේම පිළිරුවකි— මේ උපන් නිමිත්ත යොගාවචරයා තුන් ආකාරයකින් රැකගත යුතුය. අකුසල් දුරලීම, කුසල් වැඩීම, හා නිතර පුහුණු කිරිමෙනි—

ධ්‍යාන උපචාරය කුමක්ද ? අර්පණා නම් කවරිද ? ඒ දෙදෙනාගේ වෙනස කුමක්ද ? නිවරණයන් හිතින් දුරුවතු සමග පළමු වරට ධ්‍යානාඞ්ගයන්ගෙ පහළවීම ධ්‍යාන උපචාරයයි— ධ්‍යානාඞ්ගයන්ගේ පළමු පහළවීම අර්පණා නම්— අතදරුවකු හා දහර කුමරු වෙකුගේ වෙනස සමානය. යමෙකු උපචාරධ්‍යානයට පැමිණියොත් ඒ කසිණය වඩා අර්පණා කරගත යුතුය. උපචාර සමාධිය උපන් පසු අර්පණා සමාධිය නූපදිනම් කසිණා ලෝකය අඟලින් අඟල වඩා මුළු පොළව පුරා පැතිර වියයුතුය. මෙලෙසින් පුහුණු කරමින් ක්‍රම දසයකින් අර්පණා සමාධිය උපදවයි. අනාශ්වාද වශයෙන් සිත මදිනය කිරිම, සමාධි රහිත පුද්ගලයන් සෙවනය නොකිරිම හා සමාහිත පුද්ගලයන් සේවනය කිරිමාදි දශ විධියෙන් ඔහු නිමිත්ත පැහැදිලිව දැනගණී. ඉන් ඔහු ලබා තිබුනු නිමිත්ත පිළිබඳ ස්ථිර අවබෝධයක් ලබා දහම් රසය විඳී—

කාම සිතින් වෙන්ව සෙසු නීවරණ අකුසලයන්ගෙන් වෙන්ව අරමුණට සිත නැගීම වූ විතර්කය සහිත අරමුණේ හිත හැසිර වීමවූ විචාරයෙන් යුක්තවූ විවේකයෙන් ජනිත ප්‍රීතිය හා සැප ඇති පළමුවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයි. මේ පඨවි කසිණය භාවනා කිරිමේ අනුසස වේ.

මෙහි කියන ලද වෙන්වීම නම් වස්තු කාම කිලෙශකාමයන් අත්හැර හුදකලාව විසීම නම් වූ කාය විවේකය ද, නිවරණ නම් හිතේ නිතර සමග පවතින පස් අකුසල ඉවත්කර ගැණිම නම්වූ චිත්ත විවේකයද දස වැදැරුම් සංයොජනයන්ගෙන් මිදීම නම්වූ උපධි විවේකයද කියා වෙන්වීම් තුණකි. තදඞ්ග විෂ්කම්භණ දෙයාකාරයෙන් නිවරණයන් ඉවත්කිරිම විනා සමාධි භාවනාවෙන් අකුසල ප්‍රහාණියක් නොමැතියි. ගේදෙර අඹුදරුවන් අත්හැරයාමත් පචනිවරණයන් යටපත්කර ඈත්කර තැබීමත් මෙහි වෙන්වීම වශයෙන් සැලකිය යුතුය. විදර්ශනා වැඩීමෙන් සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ යන ත්‍රිවිධ විමුක්ති වශයෙන් අකුසලයෙන් මිදිම වන්නේය.

කාමය නම් වස්තු කාමය, කිලෙ ස කාමය කියා දෙයා කාරයි, ආලය උපදවන වස්තු ජාතිය හා ඒවා පරිහරණය කිරිමෙන් ලබන ආශ්වාදය යන දෙකය. මෙය සැහවීම ඈත් කිරිම මෙහිලා විවේක වීම නමින් දක්වන ලදී. අලෝභ හිත පරිපූරණයෙන් කාමයෙන්ද අදෙස, අමොහ සිත් පරිපූරණයෙන්, සෙසු අකුසල ධර්මයන්ගෙන්ද, වෙන්වීම සැල සෙන්නේය. විතර්කය නම් කසිණ මණ්ඩලය වූ අරමුණට හිත නැංවීම ද. විචාර නම් ඒ අරමුණෙන් බැහැර යා නොදී හිත හැසිරවීම මිණිගෙඩියට ගැසූ නාදය හා ඉන් නික්මෙන අනුරාවය නම් කුඩා ශබ්දය වැනිවේ. ලිහිණියෙකුගේ ඉගිලීමට පියාපත් දිගහැරිම සෙලවීම සමාන වන්නේය. පළමුව සිතින් අරමුණ අල්වා ගැණිම විතර්කයයි. ඒ පිරිසිඳ ගැණිම විචාරය වේ. ඈතින් ගමන්කරණ අයකු දුටු පමණින් ගැණු පිරිමි බවක් හෝ තරාතිරමක් නොදනේ. ලංලං වන විට හොඳින් දත හැකිවේ. පළමු දුරදී දැකීම, විතර් නම්, ළඟදී විස්තර දැකීම විචාර වැනි වේ. විතර්කය නිරුත්ති පිළිසිඹියාවය පටිභාණ පිළිසිඹියාව සලසයි. විචාරය අත්‍ථ ධම්ම පිළිසිඹියාවන් සලසයි. ප්‍රීතිනම් කය සිත පිණා යාමයි. එනම පස් වැදැරුම් ප්‍රීතියයි. තවද කාමයෙන් ජාත ප්‍රීතිය, ශ්‍රද්ධාවෙන් හටගත් ප්‍රීතිය, කුකුස් දුරුවීමෙන් හට ගන්නා ප්‍රීතිය, විවේකයෙන් හට ගත් ප්‍රීතිය, සමාධියෙන් හටගත් ප්‍රීතිය බොධ්‍යාඞ්ගයෙන් හටගත් ප්‍රීතිය කියා ප්‍රීතිය සවැදැරුම් බව කියන ලදී.— සැපය නම් ඉන්ද්‍රිය ධර්මයන්ට ලැබෙන ආශ්වාදයයි. ඒ පස් වැදැරුමිය, හේතු සැපය, සම්භාර සැපය, විවේක සැපය, නිරුපක්කිලෙස බාධක රහිත සැපය, වෙදනා සැපය යන පස් ආකාරයයි— මෙලෙසින් පළමුවෙනි ධ්‍යානය අඞ්ග පසක් පහකොට, අඞ්ග පසකින්

යුක්තව, කල්‍යාණ ගුණ තුණක් ඇතිව, ලක්‍ෂණ දහයක් ඇතිව පස් විසි ගුණයකින් යුක්තව පහළ වන්නේ ය. පහ කට යුතු පචාඞ්ගය නම් නීවරණ පසයි. කාමාසාව, කෝපය හිත කය දෙකේ අලස මැලිගතිය, උඩඟු බව හා පසුතැවිල්ල, දෙ පණස් ආකාර සැකය, යන පසින්, මිඩය නම්. කායික මැලි ගතියයි. ආහාරයෙන් ජනිතය, ඉර්තු ගුණයෙන් ජනිතය, කෙලෙස් සිතින් ජනිත යයි තුන් ආකාරය. මේ තුන් ආකාරයෙන් චිත්තජ මිඩය පමණක් නිවරණ වන්නේය. ඉතිරි දෙයාකාර අලස බව රහතුන් වහන්සේට ද ඇතිවිය හැකිය. ඒබව අනුරුඩ ථෙරාපදානයෙන් සැපැහැදිලිය.

රහත් බවට පැමිණ පණස් පස් අවුරුදු වූ මම මිඩය දුරු කොට ගතවූයේ විසි පස් අවුරුද්දකි යනු එහි අදහසය. මින් රහතුන් වහන්සේටද කාය කිලෙසයක් වූ මිඩය ඇතිවණ බවත් එය නිවරණයක් නොවණ බවත් දත යුතුය. ඒ උතුජ, ආහාරජ ගිලන් බැවකි— මෙ මිඩය රූප ධර්‍මයක් වුවත්, එය චෛතසික උපකෙලසයෙකි, රූපය අනෙකක් වූ වත් සිතට සම්බන්‍ධවේ. ථිනය චෛතසික ධර්‍මයකි, මෙ දෙක එකතුව එකම නිවරණයක්සේ ගණං ගණිති, එකම අරමුණ හා ලක්‍ෂණ ඇති බැවිනි, චිත්තජ මිඩය හා ථිනය සගාමගාා වරණ වේ.

විචිකිච්ඡාව නම් අසථිර දැනීම හෝ පිළිගැණීමයි, එය සතර ආකාරයි.— පචාඞගයකින් යුක්තය යනු විතක්ක, විචාර, පීති, සුඛ, එකග්ගතා යන අඞ්ග පසින් යුතු බවයි— රථයක අවයව නැතිව රථයක් නොවන්නාසේම මෙ අඞ්ග එකකුත් අඩු වූවොත් ධ්‍යානයක් නොවේ. මේ අංග පසක්ම වනුයේ නීවරණ පසට ප්‍රතිපක්‍ෂ වශයෙනි, සමාධිය කාමච්ඡන්‍දයට ප්‍රතිපක්‍ෂයි. ප්‍රීතිය ව්‍යාපාදයටද විතර්කය ථිත මිඩයටද, සුවය, උච්චඩ කුක්කුච්චයටද, විචාරය විචිකිච්ඡාවටද, ප්‍රතිපක්‍ෂ වෙති. ත්‍රිවිධ කල්‍යාණතාව නම් ආදි කල්‍යාණ මධ්‍ය කල්‍යාණය පරියොසාන කල්‍යාණ යනුයි— පටිපද විසුඩිය ආදියයි සසම්භාරික උප චාරික යයි— උපෙක්‍ෂාව වැඩීම මධ්‍ය යයි අර්‍ජිණාවයි. කාය චිත්තයන් ප්‍රබෝධ කිරීම අවසානයයි. ප්‍රත්‍යවෙක්‍ෂාවයි— දශ ලක්‍ෂණයෙන් යුක්ත වීම නම්— විවෙකයෙන් පිළිපන් බව සමථ පටිපන්නතාව ආදී දශ ගුණයයි.

පස් විසි මහ ගුණයෙන් යුක්තය යනු නම් විතර්ක විචාර, ප්‍රිති, සැප, ඒකාග්‍රතා, ශ්‍රඩා, සමෘති, වියර්‍ය, සමාධි, ප්‍රඥ, ආදි, මජ්ඣ අන්ත සඞෙඛප, සංග්‍රහ, භාවනා, විවේක, නිස්සය සංග්‍රහ, අනුනය විපස්සනා, සෙවනා, බල, විමුත්ති විශුඩි, පරම විසුද්ධි, යොගසිඩි විහාර යන පස් විසි ගුණයෝයි. මෙ ධ්‍යාන ගුණය දිව්‍ය විහාරය, උත්තරි මනුෂ්‍ය ධර්‍මය, විවේක යෙන් හටගත් ප්‍රිති සැපය— මහණෙනි, යම්සේ දක්‍ෂවූ නහාපනය කරවන්නෙකුමෙන් ප්‍රීති සැපයෙන් මුළු ශරීරයම පිරී යාම ආදී ගුණ නාමයෙන් වර්‍ණනා කරණු ලැබේ.

මෙ ධ්‍යානය පරිත්ත, මජ්ඣිම, පණීත කියා තුන් ආකාරයකින් උපදින්නේය, ප්‍රථම ධ්‍යාන පරිත්තහො මෘදුක වශයෙන් වඩා බ්‍රහ්ම පාරිසද්‍ය බඹලොව ඉපිද කල්පයකින් තුණෙන් කොටසක් ආයු සැපවිඳී— එයම මධ්‍යම පමණින් වඩා දැහැණින් නොපිරිහී කලුරිය කළොත් බ්‍රහ්ම පුරොහිත බඹලොව ඉපිද අඩකපක් ආයු සැපවිඳී— එයම ප්‍රණීත වශයෙන් වඩා මහා බ්‍රහ්මය නම් බඹ ලොව මහා කල්පයක් පුරා සැප විඳින්නේය. මෙසේ බඹලොව උපනුන් හාණභාගිය ආයු කෙළවර පහත වැටෙන්නාය. ඨිති භාගිය — මුදින්ද්‍රිය වුවද ඒ ගුණය වඩා එහිම නැවත උපදින්නාය. විසෙස භාගිය — තීක්ඛින්ද්‍රිය බැවින් දෙවෙනි ධ්‍යානය උපදවා වීතිය ධ්‍යාන තලයේ උපදින්නාය. නිබ්බෙධ භාගිය — ඒ බඹලොව දී විදසුන් වඩා ලොව්තුරු මහපල ලබා වීතරාගී වන්නා යයි සතර කොට සක්වෙති.

8 පරිච්ඡේදය

කම්ඨානං—දෙවන භාගය

පඨවි කසිණය

විතිය ධ්‍යානය උපදවනු කැමති යෝගාවචරයා විසින් පළමුවන ධ්‍යානයේ ආදීනව සිතා දෙවැනි ධ්‍යානයේ අනුසස් සිතිය යුතුය. නමුත් ඔහු පළමු වන ධ්‍යානයේ හොඳම පුහුණුව ලැබ සිටිය යුතුය. ඔහුට පළමුවෙනි දැහැන නුපුහුණු නම් දෙවන දැහැන නූපදිනු පමණක් නොව පළමු දැහැනින්ද පිරිහී යන්නේය. එබැවින් ප්‍රථම ධ්‍යානය ප්‍රගුණව සිටිය යුතුය. මේ බව පහද දෙනු සඳහා පර්වතයක් මුදුනෙ සිටින ගවදෙනකගේ උපමාවක් දක්වන ලදී. කඳු මුදුනක සිටින ගවදෙන තහවුරුව සිටියොත් ඇගේ පණත් වස්සත් කිරි තෙල් ආදී ප්‍රයොජනත් ලැබෙන්නේය. අප්‍රවෙසම් උවොත් ඒ හැම දේම නැතිවන්ට හැකි වේ. එමෙන් උපදවාගත් මහඟුරත්නය හිතුනු විගසින් උපදවන්ට තරම් තියුණු පුහුණුව තිබිය යුතුය. මෙසේ පුහුණු පළමු දැහැන ඇති යොගාවචර තෙමේ විතර්ක විචාර දෙක දෙෂ වශයෙන් සලකන්නේය. එවිට වැඩි වෙලාවක් නො ගොසින්ම දෙවන ධ්‍යානය උපදින්නේය.

විතර්ක විචාරයන් සන්සිඳීමෙන් තම සන්තානය පහද වන්නා වූ චිත්තයාගේ එකඟ බැවින් යුත් විතර්ක රහිත වූ විචාර සහිත වූ සමාධියෙන් හටගන්නා ප්‍රීතිය හා සැප ඇති දෙවන ධ්‍යානය උපදනේය. මේ ධ්‍යානය දෑයහකින් හිණවූයේ, දෙයහින් යුතුවූයේ තෙ කළණ ඇති දශ ලක්‍ෂණින් හෙබියේ තෙ විසි මහා ගුණ යුතු ව යෙදවේ. මහණෙනි යම්සේ උණන දිය පිරුණු දිය විලක ගැළී නාන පුරුෂයෙකුගේ මුළු සිරුර ම තෙම් සිසිල් වන්නේ යම සේ ද එසේ ම මේ ධ්‍යානය උපන් සන්තානය පිණවා ප්‍රබොධ කරවන්නේය. මේ ධ්‍යානය පරිත්‍ත හෝ මෘදුකය, මධ්‍යම, ප්‍රණීත වශයෙන් තුන් ආකාර වේ. මෘදුක වශයෙන් දෙවන ධ්‍යානය වැඩුවොත් පරිත්‍තාභයෙහි ද මධ්‍යමයා අප්පමාණභයෙහි ද ප්‍රණීතයා ආභස්සර බඹලොවෙහි ද ඉපිද දෙකප සිව්කප අටකප බැගින් ආයු සැප විඳිති—

තුන් වෙනි ධ්‍යානය

අනුලොම පටිලොම වශයෙන් ප්‍රගුණ කළ පළමු දෙවන ධ්‍යාන ඇති යෝගී තෙමෙ තුන් වැනි දැහැන සඳහා භාවනා කටයුතුයි. එය ප්‍රීතියෙහිත් ආලය හැර මධ්‍යස්ථ භාවය නම් වූ උපෙක්‍ෂාව ඇතිව සිහිය හා උපායඥනය ඇතිව සැපය කයින් විඳින්නේ ආර්‍යයෝ උපෙක්‍ෂාව ඇති සිහියෙන් සැප වාසය ඇත්තෙකැයි යමක් සඳහා කියත් නම් ඒ තුන් වැනි දැහැන උපදවා ගණී—සංස්කාර හෙවත් නාමරූප ධර්‍ම කෙරෙහි අනුනයපටිඝ—ආලය හෝ විරුද්ධ නොවීම නම් සඞ්ඛාරුපෙක්ඛාවත් ඒ ඒ සත්ව පුද්ගලාදීන් කෙරෙහි මැදහත් බව තත්‍රමජ්ඣත්තු පෙක්ඛාවය මේ අට ආකාරයෙන් හෝ දශ ආකාරයෙන් විස්තර කරති—දෙන කරා දිවන වසුපැටවකුගේ උපමාවක් මේ ධ්‍යානය සඳහා දක්වනු ඇත. මේ ධ්‍යානය එක් අංගයක් පහකළ පසහකින් යුතු තෙ වැදැරුම් කලණතා ඇති, දස ලක්‍ෂණ ඇති, දෙවිසි මහ ගුණ යුත් සමාධිය මේ ය යි දක්නා ලැබේ. මේ ධ්‍යානය ද පරිත්ත මජ්ඣිම පණීත වශයෙන් තුන් ආකාරවේ. මෘදුක වශයෙන් තෘතිය ධ්‍යානය

වඩන්නා පරිත්ත සුභයෙහි ද මධ්‍යම වශයෙන් වඩන්නා අප්පමාණ සුභයෙහි ද ප්‍රණීතව වඩන්නා ශුභ කිණ්හකයෙහි ද ඉපිද සොළොස් කප, දෙතිස් කප, සූසැට කපක් ආයු හා සැප ලබන්නේය.

සතරවෙනි ධ්‍යානය

මනාව පුහුණු කළ තුන් දහැන් ඇති යෝගියානෝ, සිව් වැනි ධ්‍යානය සඳහා භාවනා කටයුතුය. එවිට සැපයත් දුරලා දුකත් දුරලා පෙරමෙන් සොම්නස දොම්නස අතුරුදන් කොට, දුකත් නොවූ සැපත් නොවූ උපෙක්‍ෂාව, සිහිය පිරිසිදු බව ඇති සතර වෙනි ධ්‍යානය උපදී—එක අංගයක් පහවූ තෙයඟකින් යුත් තෙකලණ යුත් දශ ලක්‍ෂණක් ඇති, දෙවිසි මහ ගුණැති ධ්‍යානය මෙය වේ. මහණෙනි, යම්සේ පුරුෂයෙක් සුදුවතෙකින් ඉසවසා පෙරවා ගෙණ සිටියේ වේ ද ඔහුගේ ශරීරයේ කිසි කොටසක් ඒ සුදු වස්ත්‍රයෙන් නොවැසී නොසිටියේ වේ ද එපරිද්දෙන් මේ ධ්‍යානය ද මුළු ශරීරය ම පැතිර පවත්නේය. මේ ධ්‍යානය පෘථජ්ජනයෙක් ඉපදවී නම් වෙහප්ඵල බඹලොව උපදනේය. ඉදින් ඔහුගේ සිත නිර්වේද හෙවත් විත්ත විරාග වශයෙන් පැවැත්තේ නම් අසඤ්ඤසත්ත නම් බඹ ලොව උපදනේය. එහි ආයු ප්‍රමාණය පණස් කල්පයකි. මේ ධ්‍යානය පුථුජ්ජන මහණ කෙණෙක් වැඩුවේ නම් වෙහප්ඵල බඹලොව උපදනේය. සෙඛ පුද්ගලයෙක් නම් සුධාවාස පස් බඹතලයෙහි එකක උපදනේය. පළමු දෙවන තුන්වන ධ්‍යානයන්හි මෙන් මෙහි හීණ ප්‍රණීතනාදී පනති භෙදයක් නැත්තේය. එබැවින් ඵල භූමි ප්‍රභෙද නැත්තේය. වෙහප්ඵල අසඤ්ඤසත්ත දෙකට නිවරණ ප්‍රහාණය ප්‍රමාණ වුවද පච ශුධාවාසයට නිවරණ හා සංයොජන දෙක්හිම ප්‍රහාණය අවශ්‍ය බව සැලකිය යුතුය.

සතර අරූප ධ්‍යාන

ආකාසානඤ්චායතන සමාධිය

අරූප ධ්‍යාන උපදවනු කැමති භාවකයා විසින් රූප ධ්‍යාන සතර අභිගමන අනුගමන ඔක්කම පටික්කම වශයෙන් අනුලෝම පටිලෝම වශයෙන් මනා පුහුණුව ලැබිය යුතුයි. අනතුරුව දණ්ඩාදන, සත්ථාදන, කලහ ආදී රූපයේ ආදීනව ද එහිම භෙදන වෙදනාදී දෙසුත්, අරූපයේ ශාන්ත විමොක්ෂතාදී අරූපයේ අනුසසුත් මෙනෙහිකර පඨවි කසිණය ප්‍රගුණකර ඒ පඨවි නිමිත්ත (කසිණ මණ්ඩලය) බිඳ දමා ඒ කසිණ මණ්ඩලය තිබුණු හරිය ආකාශය (කිසුණු ඉගුළු අහස) අනන්ත ය යි බැවිය යුතුය. එසේ මනස්කාර පවත්වන ඒ යොගී තෙමේ හැම ලෙසින් ම රූප සංඥවන් ඉක්මවා, ප්‍රතිඝ (හැපෙණ, ගැටෙන) සංඥවන් අතුරුදන් කිරීමෙන් නන් අයුරු සංඥවන් සිතට නොගැණීමෙන් කිසුණු ඉගුලු අහස අනන්තයයි මෙනෙහි කිරීමෙන් ආකාසානන්ත සමාධියට පැමිණේ. බොහෝ තේරුම් ඇති ආයතන ශබ්දය වාසස්ථානය යන අර්ථයෙහි මෙහි යෙදී ඇත. දෙවියන්ගේ වාසස්ථානය දෙවතායතන වූ සෙ ආකාසානන්ත සංඥ ඇත්තවුන්ගේ වාසස්ථානය ආකාසානන්තායතන ය යි සැලකිය යුතුය. තිවඩ්ග සමන්නාගත ත්‍රිවිධ කල්‍යාණ යුත් දශ ලක්‍ෂණයකින් සම්පූණි දෙවිසි මහ ගුණ ඇති සමාධිය මෙය වේ. දෙදහසක් කල්ප ආයු ඇති ආකාසානඤ්චායතන බඹලොව උපදනේය.

විඤ්ඤාණඤ්චායතනය

දෙවැනි අරූප සමාධිය උපදවනු කැමති යෝගාවචර තෙමේ රූපයට ආසන්නතාව ආදී ආකාශානඤ්චායතනයෙහි දෙස් දැක ඒ ආකාශය අල්ලාගත් විඤ්ඤාණය ශාන්තය ප්‍රණීතය ආදී අනුසස් සලකා ඒ විඤ්ඤාණය අනන්ත ය යි භාවනා කරන්නේය. එවිට

හැම අතින් ම රූප සංඥවෙන් තොර ආකාසානන්තායතනය ඉක්ම ගොස් විඤ්ඤාණය අනන්ත ය යි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වෙසෙයි—මේ විඤ්ඤාණඤ්චායතන සමාධි ලාභීහු දෙවෙනි අරූප තලයෙහි සාරදහසක් කප් සැප විඳිති—

ආකිඤ්චඤ්ඤායතන සමාධිය

තුන්වෙනි අරූප සමාධිය උපදවනු කැමති යෝගාවචර තෙමේ විඤ්ඤාණඤ්චායතනයෙහි දෙස් දක ආකිඤ්චඤ්ඤායතනයේ අනුසස් මෙනෙහි කරන්නේය. එවිට හැම අයුරින් ම විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා සත්ව සංස්කාර ආත්ම පුද්ගලාදී කිසිවක් නැත කියා ආකිඤ්චඤ්ඤායතන සමාධියට පැමිණ වාසය කරන්නේය. අඞ්ග තුනකින් යුත් ත්‍රිවිධ කල්‍යාණ තා ඇති දශ ලක්‍ෂණ යුත් දෙවිසි ගුණ ඇති සමාධිය මෙය වේ. ආකිඤ්චඤ්ඤායතන සමාධිය ලැබුවෝ සදහසක් කප් ආයුෂ හා සැප ඇති ආකිඤ්චඤ්ඤායතන අරූප ලොකයේ උපදනාහ—

නෙවසඤ්ඤා නාසඤ්ඤායතන සමාධිය

නේව සඤ්ඤා නාසඤ්ඤායතන සමාධිය උපදවනු කැමති යෝගාවචර තෙමේ, සඤ්ඤා රොගො, සඤ්ඤා ගණ්ඩො කණ්ටකො ආදී වශයෙන් භාවනා කරන්නේය. එවිට සච්ඡකාරයෙන් පඨවිසඤ්ඤාව පහවී නෙව සඤ්ඤා න අසඤ්ඤා කිව හැකි සමාධිය උපදනේය. තිවඞ්ග සමන්නාගතය, තිවිධ කල්‍යාණ යුක්තය, දස ලක්‍ෂණ සමන්විතය, දෙවිසි ගුණැති සමාධිය මේ ය යි කියති. මේ සමාධිය ලැබුවෝ නෙවසඤ්ඤා නාසඤ්ඤායතන බඹලොව ඉපිද මහාකල්ප අසූහාරදහසක් විවේක ගණිති.

පොදු විස්තර

පොදු සාමාන්‍ය උපදෙස්—සද්ද නිරොධය, ප්‍රථම ධ්‍යානයට පැමිණියහු විසින් කථාකිරීම නැවැත්විය යුතුය. සතර වැනි ධ්‍යානය ලැබූ පසු ආශ්වාස ප්‍රශ්වාශයන් හින් කළ යුතු ය. ශබ්දය හා ගන්ධය නැවැත් වීමට යි. ධ්‍යාන වඩන්නාට ශබ්දය කැණහිරාවකි (බාධාවකි). එබැවින් ශබ්ද නිරොධය අවශ්‍යය. විපල්ලාස සඤ්ඤා—කසිණ සංඥවම හැර වෙණ සංඥවක් ඇති කිරීම විපල්ලාස ය යි. වැරදි කල්පනාව ධ්‍යානයට සතුරුයි. වුට්ඨාණ :—පස් වැදෑරුම් විය්‍යීය වුඨාණ නම්. අරූප සමාපත්තියට පැමිණි පසු ඒ සමාධිය ආනෙඤ්ජ විහාර බවට පත් වේ. නිරොධ සමාපත්තියට හෝ ඵල සමාපත්තියට පැමිණියහුගේ විය්‍යීය පළමු ඉටා ගෙණ තිබුණු විය්‍යීයමය. වෙන ලබන්ට දෙය නැති නිසාය. සමතික්කමණය නම් : අංග සමතික්‍රමණය, රූපාවචර ධ්‍යාන පසු කොට අරූපාවචරයන් කරා යාම ය. ආරම්මණ සමතික්‍රමණය අරූපාවචර සමාධියක් ඉක්මවා අන් සමාධියකට පැමිණීමය. උපචාර, හැම සමාධියකම අංගයකින් යුක්ත වන්නේය. විතක්—ද්‍විතියධ්‍යානයේ පටන් ගොත්‍රභූ අතර අවිතක්ක අවිචාරයොය. වෙදනා—චතුර්ථධ්‍යානය පටන් ගොත්‍රභූ අන්තයට උපෙක්‍ෂා වේදනායි. විචිකිච්ඡා—කාමච්ඡන්දාදී නීවරණ දුරු වූ බව සැක සහිත නම් ගස උඩ සිටින සර්පයා දක ඒ ලඟින් යන්ට බය මිනිසා මෙනි. සමාධි උපදවන්ට අසමතා—සතර වර්ගයක මිනිසුන් ට සමාධි උපදවන්ට බැරිය. ඒ අභව්‍යයෝය—

ආපො, තෙජො, වායො කසිණය

ආපො කසිණ, තෙජො කසිණ, වායො කසිණයන්ගේ ලක්‍ෂණ සවභාව වැටහීම ආසන්න කාරණ ආදිය සැලකිය යුතුය. මේ තුන් භූත කසිණයන් එක එක වෙන වෙන ම සැලකිය යුතුය. ආපො කසිණය වඩන ආදිකම්මිකයා විසින් ළිං, පොකුණු, ගංගා, මුහුදු

දිය අරමුණට නොගත යුතුය. දිය පාත්‍රයක් කොරහක් වැනි බඳුනක් ගත යුතුය. තෙජො, වායො දෙ කසිණය සඳහා දැකීම වශයෙන් සපශී ලැබීම වශයෙන් නිමිත්ත ගත යුතුය. අතුකොළ සැලීම ආදිය වායො නිමිත්ත සේ ද ගත හැක.

නිල, පීත, ලොහිත, ඕදත යන වණී කසිණයන් සඳහා වෙන වෙන ම ලක්‍ෂණ සවභාවා දිය සැලකිය යුතුය. අරමුණ වශයෙන් පැහැයම ගන්නා බැවින් මල් වගී රෙදි කැලි ගත හැකිය. ආදි කම්මිකයා විසින් සවභාව වණී තිබෙන ලෙසින් අරමුණට නොගත යුතුය. යම්කිසි මල් වට්ටියක් වැනි සකස් කරගත් නිමිත්තක් විය යුතුය.

ආලොක කසිණය වඩනු කැමති අය ප්‍රදීපාලොකයක් හෝ සූය්‍යී ලොකය අරමුණු කරගත යුතුය.

අටවෙනි පරිච්ඡෙදයේ තුන්වෙනි කොටසෙහි ආකාශ කසිණය අරූප බවත්, එය සනිදස්සන අනිදස්සන වශයෙන් හෙවත් පරිච්ඡින්න අපරිච්ඡින්න වශයෙන් දෙයාකාර බවත් දක්නා ලැබේ.—මේ දෙකම විඤ්ඤාණ කසිණ බව දත යුතුය. ප්‍රකීණික වශයෙන් හෙවත් සාමාන්‍ය උපදෙස් වශයෙන් යෝගාවචරයා විසින් එක් කසිණයක් හෝ අරමුණක් හොඳින් පුහුණුවූ පසු තමා කැමති නම වෙන යම් කසිණයක් පුරුදු කටයුතුයි.—කසිණ අතුරෙන් වණී කසිණ විමොක්‍ෂයට තුඩු දෙන බැවින් වඩා හොඳය. අභිභායතනයට නොයවන නිසාත් හොඳය. ඉනුත් ඕදත (සුදු) කසිණය වඩාම හොඳය. ඉන් ආලොක උපදවන බැවිනි. ආලෝක කසිණයම වඩා උසස් වේ. අෂටකසිණයන් පුහුණු කිරීමෙන් අටසමවත් උපදවා ගත හැක. මේ කසිණ ප්‍රගුණ කොට අෂට සමාපත්තිහු අභික්කම පටික්කම වශයෙන් ද අනුලෝම පටිලෝම වශයෙන් ද ප්‍රගුණකර නැවත අභිඥ විද්‍යාදිය ඉපද විය යුතුය.—ඒ ධ්‍යාන පාදක කොට විදසුන් වඩා මාගී ඵල විමොක්‍ෂයන් ලැබිය හැකි වන්නේය.

දශ අශුභයයෝ

අශුභ දශයෙහි පළමු වැන්න උද්ධුමාතක ය යි. ඉදිමී ගිය මළ සිරුරය. මේ භාවනාවට අරමුණු කරගන්නේ ලක්‍ෂණ සවභාව, වැටහීම ආසන්න කාරණය යන මේ විභාග දත යුතුය. මේ උද්ධුමාතක සංඥව වැඩීමේ අනුසස් නවයකි. එනම්, තම කය පිළිබඳ සිහිය ලැබීම, අනිත්‍ය සංඥව ලැබීම, මරණ සංඥව ලැබීම, සසරට කලකිරීම වැඩිකම, කාම චෙතනා මැඩ පැවතීම, රූප මදය පහවීම, ආරොග්‍ය මදය පහවීම, සුගතියට යාම, නිවණ මුදුන් පත් වීම යන අනුසස් ඇත්තාහ. උද්ධුමාතකය නිමිත්ත කරගන්නේ කෙසේ ද? අටුවා වන්හි කියන ලද ආකාරයෙනි. එනම් : ආදි කම්මිකයා හෙවත් අශුභ භාවනාව මුලින් පටන් ගන්නා විසින් තම සහාය යෙකුසේ දෙවැන්නෙකු නැතිව හුදකලාව ම සොහොනට යා යුතුය. උද්ධුමාතක අශුභය ලිඞ්ග සමතතාදී එකොළොස් ආකාරයකින් සදෙස් නිදෙස් අයුරු බලාගත යුතුය. ලිඞ්ග වශයෙන් බලන යෝගාවචර තෙමේ මළ සිරුර ගැහැණු ද පිරිමි ද උසඳ මිටි ද බාල ද මහළු ද ආදී විසතර දත යුතුය. ස්ත්‍රී ශරීර පිරිමින්ටත් පිරිමි ශරීර ගැහැණුන්ටත් විසභාග වේ. අරමුණ විසභාග නම් අපීණා උපදින්නේ නැත. භාවනාව පටන් ගන්ට පළමු ව ඒ අවට ඇති ගස් ගල් වළ ගොඩ ආදී අවට හොඳින් සිහි තබාගත යුතුය.

පිළිකුල් නිල් පැහැව ගිය මිනිය, කුණුව පණු කැදලි බැඳුනු මිනිය, බලු කැණහිල් ආදීන් විසින් කණු ලබන මිනිය ඒ මේ තැන විසි කරණ ලද මිනිය, එසේ ම ඉවත දමූ මිනිය, ලේ තැවරී ඇති මිනිය, පණු කැදලි පිරුණු මිනිය, ඇට සැකිල්ලය. මෙකී අශුභයන් ගැණ ද අනුසස් ආදිය කී පරිදිම ය. අට්ඨික අශුභය වැඩීමට ඇට සැකිල්ලක්—ගොඩක්ම වියයුතු නොවේ. හිස් කබලක් වැනි එක් මිනිස් ඇටයකුදු ප්‍රමාණ වේ—ප්‍රකීර්ණ සාමාන්‍ය

උපදෙස් වල දක්වන්නේ විසභාග අශුභයත් පුහුණු වූවන්ට අන්තරායකර නොවිය හැකි බවයි. අඩු වැඩි නැතිව අශුභ දශයක් ම වන්නේ කෙසේ ද යන ප්‍රශ්නය අශුභ සංඥ දශයක් බැවින් සංඥ නිමිත්ත වූ අශුභයත් දශයක් ම වන බව විසදීමෙහි පෙණේ.

දස අනුස්සතිහු—බුධානුස්සතිය

යම් ඒ භාග්‍යවතුන් වහන්සේ නමක් වේ නම් සිය නුවණින් අන් ගුරු උපදෙසක් නැති ව සත්‍යාවබෝධ කළ උතුමා බුද්ධ නම් වේ. තමා පරමාර්ථ සත්‍යය අවබෝධ කළ නිසාත් අනුන්ට චතුරාර්‍ය සත්‍යය අවබෝධ කරවන නිසාත් බුද්ධ ය යි කියනු ලැබේ. මෙසේ බුදු ගුණ සිහි කරණ විට ඔහුගේ සිතෙහි බුදුරුව ඇඳී පෙණෙන්නේය. ඔහුගේ සිත පිළිම ගෙයක් මෙන් ගරුකටයුතු පිරිසිදු තැනක් වන්නේය. ඔහුගේ ශරීරය ද බුදු ගුණ යෙන් පිරි චෛත්‍යයක් මෙන් පිදීමට සුදුසුවන්නේය. එබැවින් කමටහන් වඩන යෝගාවචර තෙමේ මෙසේ බුදුන් සිහිකට යුතුය. උන්වහන්සේ භාග්‍ය ඇත්තේය. රහත්ය, තමන් වහන්සේගේම නුවණින් දතයුතු සියලු ආකාරයෙන් සත්‍යාවබොධ කළ උතුමා ය. විද්‍යා නමැති ඥණ අටකින් හා හැසිරිමෙ ගුණාඩග පසළොසකින් යුක්තය. සුගතය තුන් ලොව දන්නාය. උසස් ම චණ්ඩ පුරුෂයන් හික්ම වන්නා ය. දෙවියන් ගේත් මිනිසුන්ගේත් එකම අනුශාසකයා ය. යනාදී වශයෙන් බුදුගුණ සිහිකිරිම සතර ආකාරයකින් කටයුතුය.

එහි පළමුවන බුද්ධගුණානුස්මරණය නම් බෝධි සම්භාරය පිරූ කාලයේ බෝසත් තුමා උපයා ගත් ගුණ මෙණෙහි කිරීමය. අපගේ අමා මැණියන් වහන්සේ සම්මා සම්බුදුවන්ට පෙර සිව්සස් දහම් අවබොධ නොවීම බෝධි සත්වම සාරඅසංඛ්‍යයක් හා කල්ප ලක්‍ෂයක් පාරමී ධර්‍ම පුරන්නේ දාන, සීල, නෛක්ඛම්ම, ප්‍රඥ, වීර්‍ය, ක්‍ෂාන්ති, සත්‍ය, අධිෂ්ඨාන, මෛත්‍රී, උපෙක්‍ෂා යන මහා ගුණ දශය අසවල් අසවල් ජාතින්හි පිරුවේය යනා දී වශයෙන් සිතිය යුතු ය. එහි දී බොහෝ සෙයින් සාමජාතකය, මහා ගෝවින්ද ජාතකය, සච්චංකිර ජාතකය, මූගපක්ඛ ජාතකය, ලොමහංස ජාතකය, දීඝායු සෙට්ඨි ජාතකය, ඡද්දන්ත ජාතකය, වලාහක ජාතකය, නිග්‍රොධ, මිග, මහාකපි ආදී ජාතක චරිතයන් මෙනෙහි කටයුත්තේය.

බුදුගුණ මෙනෙහි කරණ දෙවෙනි ආකාරය නම් ඒ ඒ සත්වයන් අපාය ගමනින් වළකා නිවන් මඟ යෙද වූ ආකාර සිහිකිරීමයි. මේ අයුරින් බුදුගුණ මෙනෙහි කරණ යෝගාවචර තෙමේ උන්වහන්සේ බෝසත් කෙනෙකුව සිටියදී ම අඹුදරුවන් දෙමාපියන් නෑ මිතුරන් අත්හැර නිවන් සොයා ගිය ආකාරය ද මේ වර නේරංජරා නදියෙන් එතරව මගධ රාජ්‍යයේ ගයාවෙහි ජය සිරිමා බෝධි මණ්ඩලයට පැමිණ මරු හා මර සෙනඟ පරදවා වෙසක් පුණු පොහෝද රාත්‍රී පළමු යාමයෙදී තමාගේ පෙර ජාති සිහිකර පූර්වෙනිවාසානුස්මෘතිය උපදවා එම රෑ මැදයාමයේ දී දිව්‍ය චක්‍ෂුඥනය උපදවා අලුයම් හී සමුදය නම් තණ්හාව දුරුකොට අමත ධාතුව නම් සම්මා සම් බුදු බව ලැබූ සේක යනාදී වශයෙන් මෙනෙහි කටයුතුය.

තුන්වෙනි ආකාරය නම් බුදු බවත් සමග උන්වහන්සේ උපදවාගත් අති මානුස අතිදෙව කල්‍යාණ ධර්‍ම සමූහය මේ මේ ය යි සිහි කිරීම යි. දස තථාගත ඥණ බලය, තුදුස් මහා බුද්ධ ඥණ, තුන් සැත්තෑ බුදු නුවණ, අටළොස් (18) බුද්ධ ධර්‍ම නම්—භාග්‍යවතුන් වහන්සේ ගේ අතීතාංශයෙහි පැවති අප්‍රතිහත ඥනය, අනාගතාංසයේ අප්‍රතිහත ඥනය, වර්‍තමානයේ අප්‍රතිහත ඥනය, ඥණය පෙරටුකොට ඇති කායකර්මය, ඥණයෙන් පිරිවැරුණු වචීකර්‍මය, ඥණානුකූල මනොකර්‍මය, ඡන්දයට හාණි නැති කම, වීර්‍යයාගේ පිරිහීමක් නොවීම, සිහියේ පිරිහීමක් නොවීම, සමාධි නම් චිත්තෛකාග්‍රතාවේ හාණියක් නොවීම, ප්‍රඥවේ හාණියක් නැතිකම, විමුක්තියට හාණියක් නැතිකම, දෙවධායිත බවක් වෙනස් වීමක් නැතිකම, සෙල්ලම් විහිලු තහලු නැතිකම, නුවණට අවිසය දෙයක් නොවීම,

විනෝද ක්‍රීඩා නැතිකම, කිසිවක ව්‍යාවෘත සිතක් නොවීම, පිරිසිඳ නොදුන උපෙක්‍ෂක නොවීම ද, සිව් වෙසරද නුවණය, සතර සතිපට්ඨානයෝය. සතර සම්‍යප්‍රධාන වීර්‍යයෝ ය. සතර ඍද්ධිපාදය පංච ඉන්ද්‍රියයෝ ය. පංචබලයෝ ය, සඩභිඥය, සපත සම්බොධ්‍යඞගය, අෂ්ටාඞගික මාර්ගය, අෂ්ට අභි භායතනය, අෂ්ට විමොක්ෂය, නවානු පූර්ව සමාපත්තිහුය, දස විධ ආර්‍ය වාසය, දශ ආසවක්ඛය බලයෝය, අවසේස නොයෙක් කුසල ධර්ම අධිගත ය යි මෙනෙහි කටයුතු යි. සතර වැනි බුද්ධ ගුණානුස්මරණ ක්‍රමය නම් මෙ තුන් ලොවග අමා මෑණියන් වහන්සේ මෝහාන්ධකාරයෙන් වැසී පැවති මේ ලෝකයේ ධර්මාලෝකය පතුරුවා නැණ පහණ දල්වා ලෝකයට මහසෙතක් කර වදළ සේක. උන්වහන්සේ ලෝවැසියා කෙරෙහි මහානුකම්පා ඇති සේක. දහම් සක පැවැත්තු සේක. අමා පුර දෙර ඇරි සේක. අප්‍රමාණ දෙව් මිනිස් සමූහයකට සාමඤ්ඤ ඵල ලබා දුන්හ. ත්‍රිවිධ ප්‍රාතිහාර්‍යයන් පහළ කළ සේක. සත්‍වයන්ගේ සිත් තුළ ශ්‍රද්ධාව පිහිටුවා වදළ සේක. සුගතිය පෙන්නා ලූ සේක. පාමොක් දෙසූ සේක. යනාදී වශයෙන් අභික්කමන පටික්කම වශයෙන් බුදුගුණ මෙනෙහි කිරීමයි.

මෙකී සතර ආකාරයෙන් බුදු ගුණ මෙනෙහි කරණ යොගාවචරයාගේ හිත අචල ශ්‍රද්ධාවේ පිහිටයි. ඒ ශ්‍රද්ධාවෙන් නිවරණ යටපත් වෙයි. ප්‍රීතිය ආදී ධ්‍යානාංග පහළ වෙති. මේ බුද්ධ ගුණ අනුස්සති භාවනාවෙන් අර්පණා පමණක් නොව උපචාර ධ්‍යානද පහළ වන්නේය. එ සේ පිළිවෙළින් චතුර්ථධ්‍යානය ද ධ්‍යාන පාදක විදර්ශනාවෙන් නවලොවුතුරා ගුණයන් ද පහළ වන්නේය.

ධර්මානුස්මෘතිය

ධර්මය නම් නිර්වාණය හා නිර්වාණයට පමුණුවන ප්‍රතිපදාවයි. නිර්වාණය කරා පමුණුවන පිළිවෙත කුමක් ද ? සතර සිවටන් (සතිපට්ඨාණ) ය. සම්‍ය ප්‍රධාන සතර ය. සතර ඍද්ධිපාදය. ශ්‍රද්ධාදී පස් ඉන්ද්‍රියයෝ ය. ශ්‍රද්ධාදි බල පසය, සත් බොධ්‍යංගයෝ ය, ආර්‍ය මාර්ගාංග අටය යන මේ ධර්ම 37 නිවණ කරා ගෙණ යන ප්‍රතිපදාවයි. නිර්වාණය නම් කුමක් ද ? සියලු සංස්කාරයන් සංසිඳීම, සියලු උපාදානයන් දුරළීම, තණ්හාව නැති කිරීම, විරාග වූ නිරෝධ ධර්මය නිර්වාණය නම් වේ. මේ ධම්මානුස්සතියේ ලක්ෂණය රසය ධම්ම විචයමය ආනිසංසය නම් බුද්ධ ගුණානුස්සතියේ සඳහන් අනුසස්ම ය. මේ අනුස්සතිය වඩන්නා විසින් භාග්‍යවතුන් වහන්සේ ඉතා හොඳින් ධර්මය ප්‍රකාශකර තිබේ. තමාට ම පැහැදිලි වන්නේ ය. මාර්ගය ලැබූවෙකුට ඵලය ලැබීමට කල්ගත නොවේ. ඉදිරියට පමුණුවා දෙන සවභාවය ඇත්තේය. ඇවිත් බලනු කිව හැකි සවභාව ඇත්තේ ය. නුවනැතියෝ තම තමන් ම දත යුතු ය. යනාදී වශයෙන් මෙනෙහි කටයුත්තේ ය. මෙහි ධර්මය සන්දිට්ඨික ය යි කියනු ලබන්නේ මාර්ගය පළමුවත් ඵලය අනතුරුවත් අනුපූර්ව වශයෙන් ලැබිය යුතු බැවින් මාර්ග ඵල නිර්වාණයන් එකිනෙකට ප්‍රත්‍යක්‍ෂ වන්නේය. මේ පිළිවෙළින් ධර්මය සිහිකරණ යොගාවචරයාගේ හිත ශ්‍රද්ධාවෙන් ඉපිලෙයි. එවිට නිවරණ තුරන් වෙයි. නිවනට බාධක ඉවත් ව ධ්‍යානාංග පහළ වෙයි. උපචාර සමාධියට පැමිණේ. ඒධ්‍යානයේ පිහිටා විදසුන් වැඩුවාම මාර්ග ඵල පිළිවෙළින් සාක්ෂාත් වන්නේය—

සඞ්ඝානුස්මෘතිය

සංඝ නම් කවරේ ද ? දිඪී ශීල ආචාර සංඛ්‍යාත ආර්‍ය ගුණ සමූහයෙන් ඒකාබද්ධ ආර්‍ය පුද්ගල සමූහයා ද සමශික්‍ෂා සමානාචාර ඇති පංචවිධ වර්ගයට ඇතුළත් තථාගත ශ්‍රාවක සමූහයා ආර්‍ය පුද්ගල සම්මුති වශයෙන් ප්‍රභෙදවූ යේ සංඝ නම් වේ. ඒ සංඝ රත්නය සම්බන්ධි ගුණ සිහි කිරීම සංඝානුස්සති නම් වේ. ඒ සංඝ ගුණානුස්මරණය කටයුත්තේ කෙසේ ද ? භාග්‍යවතුන් වහන්සේගේ ඖරස පුත්‍ර වූ ඒ ශ්‍රාවක සංඝරත්නය

මනාව පිළිපන්නේය, අන්ත විරහිත සෘජු ප්‍රතිපත්ති ඇත්තාහු ය, ආර්‍ය්‍ය අෂ්ටාංගික ඤාය මාර්ගය සඳහා පිළිපන්නාහුය, සාමීචි සංඛ්‍යාත නිවැරදි පිළිවෙත් ඇත්තාහුය, පුරුෂ යුග වශයෙන් සතරක් වූ පුද්ගල වශයෙන් අට දෙනෙකු වූ ඒ බුද්ධ ශ්‍රාවක සමූහය තෙමේ ආහුණ නම් වූ වැඳුම් පිදුම් වලට හා පාහුණ නම් අධික ආදර සත්කාර සම්මාණනයන්ට යොග්‍ය සේක. දක්ෂිණ සංඛ්‍යාත පින්පල සඳහා පිදීමට සුදුසු ය. ගෞරවාදර නමස් කාර පැවැත්වීමට සුදුසුය. ලෝවැසියාට පින්පල උපදවා ගැණීමට සොඳුරු සරු මහරු පිං කෙත වන්නේය යනාදී වශයෙන් මෙනෙහි කටයුත්තේය. මෙසේ සංඝ ගුණ මෙනෙහි කරණ විට යෝගාවචරයාගේ හිත ශ්‍රද්ධාවෙන් පිරී සිටින්නේය නිවරණ පහවී ධ්‍යානාංග ද ධ්‍යාන පාදක විදර්ශනාවෙන් ලොව්තුරා දහම් ද පසක්කර ගත හැකි වන්නේය.

සීලානුස්මෘතිය

කය, වචන, හිත යන තුන් දෙර අකුසලයන්ට හැසිරෙන්ට ඉඩ නොතබා රැක ගැණීම සීලයයි. සමාදන විරති චේතනා වශයෙන් පිරිය යුතු සතර සංවර සීලයාගේ අනුසස් ගුණ සිහිකිරීම සීලානුස්සති යයි. සීලගුණ මෙනෙහි කිරීමෙන් ශ්‍රද්ධාව ඇතිවේ නිවරණ දුරුවී ධ්‍යානාංග පහළ වේ. ධ්‍යාන පාදකව විදසුන් වඩා ලොව්තුරා ගුණ පහළ වේ.

ත්‍යාගානුස්මෘති

ප්‍රත්‍යය ගේධය (දේපොල ගැණ ඇතිවන ගිජු මසුරු ලොල්බව) දුරලීම ත්‍යාග යයි. මසුරු මළ දුරලා දන්දීමෙහි අනුසස් මෙනෙහි කිරීම චාගානුස්සති යයි. චාගයේ අනුසස් මෙනෙහි කිරීමෙන් හිත ශ්‍රද්ධා වෙන් ඉල්ප සිටී. ඉඳුරන් පිණාගොස් ප්‍රබෝධය ඇතිවන විට, නිවරණයෝ යටපත් වෙති—විනිවරණ වූ සිතෙහි ප්‍රඥෙන්‍ද්‍රිය විකසිතව ධ්‍යානාඞ්ග අර්පණා උපචාර සමාධි පහළ වෙති. ධ්‍යාන ගුණ යෙහි පිහිටා, විදසුන් වඩා ලොව්තුරා දහම් උපදවා දෙන්නේය—

දෙවතානුස්මෘතිය

පෙර කළ කුසලානුභාවයෙන් දිප්තිමත් සැපයක් විඳින්නාවූ පුද්ගලයා දෙවියායි. ඒ මිනිසුන් අතුරෙන් ඉසුරුමත් ප්‍රධානියෙකුට '' නරදෙව '' යයි සම්මත කරගත් බැවින් සම්මුති දෙවියෝය, පුණ්‍ය බලයෙන් සැප හා ආයු වැඩි වනයේ උපත ලබන උත්පත්ති දෙවිය, කෙලෙස් කුණු දුර ලීමෙන් පිවිතුරු වන ආර්‍ය්‍ය පුද්ගල විශුද්ධි දෙවිය, භූමිනිශ්‍රිත දෙ දෙව්ලොව දෙවියන් ඇතුළු රුක්දෙවි ආදී බූමාටු දෙවිය. යාමාදි සිව්තලයෙහි වූ තලාටු (ආකාසට්ඨ) දෙවිය. සොළොස් බඹතල අරූතල වැසි රූපා රූප දෙවිය යන මොවුන්ගේ ඉසුරු සැපසම්පත් සිතා ඒ සැපත් ලැබීමට ඔවුන් කළ පින්කම් ගැණ සිතයෙදීම දෙවතානුස්සතියයි හෙවත් දෙවියන් සාක්ෂි කොට ගෙණ පින්පල අදහා ගැණීම මෙහි අදහස වේ. දෙවියන් ඇදහීමක් නොව දෙවි බව ඇතිකර වන පින්කම ඇදහීම නිසා ශ්‍රද්ධාව උපදී ශ්‍රද්ධාවෙන් නිවරණ පහවී ධ්‍යාන හා ධ්‍යාන පාදයෙන් විදසුන් වැඩීමෙන් ලොව්තුරා දහම්ද පහළකර දෙනවා ඇත.

8 පරිච්ඡේදය

සතරවැනි භාගය

ආණා පාණ සති භාවනාව

නාසයෙන් පිට වන වායුව හා කය තුළට ඇදගන්නා වායුව ආණ අපාණ නම් වේ. මීට ආශ්වාස ප්‍රශ්වාස ය යි ද කියති. ආණ අපාණ දෙක පිළිබඳව සිහිය උපදවා සිහිය පිහිටුවා දියුණු කර ගැණීම මෙහි අදහසය. මෙය අපේ බෝධි සත්වයින් වහන්සේත් බුදුරදුන් වහන්සේත් වැඩිපුර පුහුණු කළ කමටහණ වේ. සමථ විදසුන් දෙකටම එකසමාන උපකාරවන විදසුන් කමටහන් කීපයක් ඇතුළත් ඉතා අගනා කමටහණ මේ ආණාපාණ කර්ම ස්ථානය බව දේසිත ය.

මේ භාවනාවේ අනුසස් පළමුවම දක්වනුයේ ආණා-පාණ සතිය භාවනා කිරීම මහත් ඵලය මහත් ඵල මහානිසංස ඇත්තේය. මේ ආණාපාණ සති භාවනාව මනාව වඩා පුහුණු කිරීමෙන් සතර සති පට්ඨාණ භාවනාව සම්පූර්ණ වන්නේය. සතර සතිපට්ඨාණ භාවනාව බහුලව කිරීමෙන් සත්ත බොජ්ඣඞ්ග ධර්ම භාවනා කළා වෙයි. බොධ්‍යංග භාවනාවෙන් අටවැරුම් විද්‍යා ඥාන විසතාකාර විමුත්ති ඥාන පරිපූර්ණ වන්නේය. එකී මහත් ඵල මහානිසංසයෝ ලැබෙන්නේ කෙසේ භවනා කිරීමෙන්ද යත්—ආරණ්‍ය සෙනසුනකට හෝ නිදෙස් රුකක්මුල හෝ ජන සංචාර පිඩා නැති විවෙක ස්ථානයකට හෝ ගොස් ඌරුබද්ධාසනයෙන් වාඩිවී ඇද නැතිව කය පිහිටුවා නාසය අග හෝ උඩු තොල් අග සිහිය පිහිටුවා සිහියෙන්ම ආශ්වාස හුස්ම එළිමත් හුස්ම ගැණීමත් කටයුතුය. කය පුරා පැතිර සිටිනා දිග හුස්ම එළිමක් ගැණීමක් නම් දිග හුස්ම එළිමය ගැණීම ය යි දැනගන්නේය, කයපුරා නොපැතුරුණු ලුහුඩු හුස්ම හෙළීමක් ගැණීමක් නම් ලුහුඩු හුස්ම එළිමය ගැණීම කැ යි දන ගන්නේ ය. ආශ්වාස ප්‍රශ්වාසයන් පිළිබඳ මුල මැද අග වශයෙන් දැනගණ හුස්ම එළිම හා ගැණීම කරන්නේ ය—කාය සංස්කාර නම් ආශ්වාස ප්‍රශ්වාසයන් සන්සිඳුවා ගෙණ හෙවත් හික්මවාගෙණ හුස්ම එළිම ගැණීම කරමි දැන ගණම ත්‍රි ශික්ෂා පුරන්නේය. හිත පිණායාම පවතිද්දී හුස්ම එළිම හෝ ගැණීම පවතී නම් ප්‍රීතිය විඳිමින් හුස්ම එළිම ගැණීම කරමි යි දන්නේය. කය, හිත පිණා තිබිය දී ආශ්වාස ප්‍රශ්වාස පවතිනම් ඒ බව දැන ගන්නේය. චිත්ත සංස්කාර නම් ආශ්වාස ප්‍රශ්වාස දැන හුස්ම එළමි ගණිමි යි දන්නේය. චිත්ත සංස්කාර නම් අස්සාස පස්සාසයන් හික්මවාගෙණ හුස්ම එළමි ගණිමි කියා දන්නේය. සරාග විතරාගතාදී චිත්ත ස්වභාව දැන හුස්ම එළමි ගණිමි කියා දැන ගන්නේය. හිත ප්‍රමෝද කරමින් හුස්ම එළමි ගණිමි කියා දන්නේය. හිත එක අරමුණක නොසැලී සිටුවමි දැන හුස්ම එළන්නේ ගන්නේ වේ. පංචනිවරණයන්ගෙන් හිත මුදා ගණිමින් හුස්ම එළමි ගණිමියි දන්නේය. හැම දෙයම අනිත්‍ය ය යි දකිමින් හුස්ම එළමි ගණිමි කියා දැන ගන්නේය. හිත කිසිවක නො ඇලෙන ස්වභාවයෙන් හුස්ම ගණිමි එළමි කියා දන්නේය. නිවණ අනුගමනය කරමින් හුස්ම එළමි ගණිමියි දන්නේය. සියලු කෙලෙසුන් සන්සිඳුනු නිවණ දකිමින් හුස්ම එළිම හුස්ම ගැණීම කරන්නේය. මෙලෙසින් ආණා පාණ සතිය වැඩුවොත් මහත් ඵල මහානිසංස ලැබෙන්නේ වේ—

මේ ආණා පාණ කමටහණ භාවනා කරණ යොගාවචර තෙමේ ගස් ඉරණ වඩුවා කියත ඉහල පහල හෙලමින් දරකඳක් දෙපලු කරණ විට කියත හෙලන නහන ප්‍රමාණයන්

කැපෙණ ප්‍රමාණය මුවහත තියුණු මොට බවත් දනගන්නාක් මෙන් තොල හෝ නාසය අග හිත පිහිටුවා හුස්ම එළන හුස්ම ගන්නා අතර ම ඉහත සඳහන් දැනීම් ඇති ව ආශ්වාස ප්‍රශ්වාස කරන්නේය. එසේ චිත්ත සවභාවයත් සමග ආශ්වාස ප්‍රශ්වාස පිළිබඳ සිහිය දියුණු නවවැදැරුම් උපකෙලෂ හා නිවරණ දුරුවී පටිභාග නිමිත්ත පහළ වන්නේය. මේ පටිභාග නිමිත්ත වැල් පුළුන් රොදක් වාත ධාරාවක් මෙන් ද, දුම් රොදක් වලා පටලයක් මෙන් ද හවඩිය නම් ඉණ පළඳනාවක් හෝ ඉදිකඩක් මෙන් ද පෙණෙනු ඇත. මෙ සේ ප්‍රතිභාග නිමිති පහළ වූ පසු වඩාත් හිත පිරිසිදු වී ධ්‍යාන උපදී. ප්‍රථම ධ්‍යානයේ සිට චතුර්ථ හෝ පචමධ්‍යානය තෙක් උපදවා ප්‍රගුණ වූ පසු විදර්ශනා වඩා නොපමාව ලේයි යෙන් ම නව ලොව්තුරා දහම් හා විජ්ජා විමුත්ති ආදිය පසක් කරගණී. තවද පූර්වාචාර්‍යවරයෝ මේ ආණාපාණ සති භාවනාව වඩන අමුතුක්‍රම සතරක් දක්වති. එනම් : ගණන අනුබන්ධන ඨපන සල්ලක්ඛණ කියා ය. එහි ගණ න නම් හුස්ම එළන වාර හා හුස්ම ගන්නා වාර මේ වේලාව තුළ මෙපණය කියා ගණන් ගැණීම යි. එය එකේ සිට පහ දක්වා හෝ එකේ සිට දහය දක්වා එඬේර ගණිතයෙන් හා බැතයාල්ලන (විමණින) ක්‍රමයෙන් ගිණිය යුතු වේ එසේ කිරිමෙන් ආශ්වාස ප්‍රශ්වාසයන් ගිතට අනුකූලව වාර ගණන අඩු වීමත් හිත (සිහිය) එහි ම බැඳීමත් සිදු වේ—

අනුබන්ධන නම්, ගණන එකතු කොට සිහියත් ආශ්වාස ප්‍රශ්වාසයන් එකට ම පැවැත් වීම යි. ඨපන නම් හුස්ම එළන විට හෝ හුස්ම ගන්නා විට වායුව නාසය අග හෝ තොල් අග හෝ තිබෙන තැන සිහිය තැබීම යි—සල්ලක්ඛණ නම් මේ සුසුම් හෙලීම ගැණීම නිමිති කරගන්නා සිහිය සමග උපදනා ප්‍රීතිය සැපය ආදී ධර්මයන් දැන ගැණීමයි— ඉහත සඳහන් සික්ඛති යන වචනයෙන් සුසුම් හෙළීම ගැණීම පිළිබඳ සිහිය වඩන අතරම, අධි සීල, අධි චිත්ත, අධි පඤ්ඤ යන ත්‍රිවිධ ශික්ෂාවෙහි හික්මෙන බව පෙන්වයි. හෙවත් අසංවර අයෙකුට ආණාපාණ සිහිය එළදයි නොවේ යයි දක්වේ. එවිට ආරම්මණය පැහැදිලි වීම හා හිතේ නුමුලා බවත් නිසා ප්‍රීතිය උපදනේය. මේ හුස්ම එළිම හුස්ම ගැණිම සිහිකරණ ක්‍රම සොළසින් පළමු දෙළස සමථ විදර්ශනා දෙකමත් අග සතරින් විදර්ශනාවත් දක්වන්නේය. එබැවින් සමථයානිකයාටත් විපස්සනා යානිකයාටත් මේ කමටහණ එකසේ ම හිතකර වේ. ඉහත සඳහන් සොළොස් ආකාරය සතර සතර පිළිවෙළින් කායානු පස්සනා වෙදනානුපස්සනා, චිත්තානු පස්සනා, ධම්මානු පස්සනා, සතිපට්ඨාන භාවනා වෙති. සතිපට්ඨාන භාවනාවද මෙයින් ම සම්පූර්ණ වන්නේය. කායානු පස්සනාදි සතිපට්ඨාන භාවනාවෙන් සති, ධම්මවිචය, විරිය, පිති පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන සම්බොධි අංගයන් සම්පූර්ණ වෙති. එයින්ම, විපස්සනා ඤාණ මනොම ඉඩි ඉඩි හෙද, පරචිත්ත විජානන පුබෙබ නිවාස ආසයානුසය දිබබසොත ආසවකඛය යන අට වැදැරුම් විජ්ජාඤාණ අට ද ආයර්‍ය ඵලයට පැමිණි විගස උපදනා ප්‍රත්‍ය වේක්ෂා නම් විසි වැදැරුම් විමුත්ති හුද පහළ වෙති. මෙ නිසා මේ ආණාපාණ සතිය අගනා මිණි රුවනක් මෙන් සලකා කාවිසිනුත් පුහුණු කටයුත්තේමය.

මරණය සිහිකිරිම

ඒක භවනම් උපන් වාරයකට ජීවිතේන්ද්‍රියයාගේ ආයු සංස්කාරය (පවත්නා හේතුව) සිඳී යාම මරණය නම් වේ. එක උපන් වරකට සීමිත ආයු ශක්තිය අවසන් වීම නමවූ මේ තමාගේ මරණය හෝ අනුන්ගේ මරණය සිහිකිරීම මරණ අනුස්සති යයි කියනු ලැබේ. මරණ සතිය වඩනු කැමති යොගාවචරයා විසින් සෝකය, විශ්මය, මිනියක් දුවෙද්දී ඇතිවන වෙනස් සිදුවීම් නිර්වෙද නම් කලකිරුණු නුවණ යන සතරින් එකක පිහිටා ආරම්භ කටයුතුය. සෝකය නම් තමාට ප්‍රිය මනාපවූ පුත්‍රඥාති කෙණෙකුගේ මරණයෙන් තම හිතට වැදගන්නා දුක්පීඩාවයි—අද්භූතතාවය හෙවත් විශ්මය නම් හදිසියේ මියයාමකදී මේ දැන් උදේ හොඳින් ක්‍රියා කළ මොහු කෙසේ මළේද මේක මහ පුදුමයක් නොවේ දැයි උපදනා විශ්මයයි—ජවඩාභ දුක්ම නම් මිනියක් දුවෙන විට නැමීම් දිගැරීම් පිරිම්

පිපිරීම් ආදි දෙය සිදුවනු දැකීමෙන් හටගන්නා සංවේගයයි. නිබ්බිද ඥණනම් ජීවිත කම් කටොල් නිසා හෝ රොගපීඩාදිය නිසා කයට සසරටම ඇතිවන කලකිරීමයි. මේ සතරින් එකක් මුල්කරගෙන මරණය සිහිකළොත් ප්‍රයෝජන වීම ඉක්මන් වේ. මරණයේ ප්‍රභෙදයන් අතුරෙන් අගදක්වන තුං ආකාරය අරමුණු කරගත යුතුය. සාධාරණ මරණය සියලු සතුන්ට හා ද්‍රව්‍යයන්ට පොදු ඉරණම නැතිවී යාමට නමකි— සමුච්ඡෙද මරණය නම් රහතුන් වහන්සේගේ කෙලෙස්දුරලා පිරිනිවන්පෑමයි. ඛණික මරණය නම් සිත් හා සිතිවිලි ඇතිවූ විගසම වන නැති වීමයි. අකාලික මරණය නම් යම් මිනිසෙක් හෝ සතෙකු මැද වයසට යන්ටත් පළමු බාල වයසේදීම හදිසි ලෙඩකින් අනතුරකින් මළේ නම් ඊට අකාල මරණයයි කියති. කාලිකමරණය නම් සතෙකුගේ මහළු වයසේදී සිදුවන මරණය කාල මරණයයි කියති. මරණයක් කාල මරණ අකාල මරණ කියා වෙන්කොට දැනගැණීම අපහසුය. ආයුෂත් පිණත් හෝ කර්ම ශක්තියත් ඉතුරුව තිබියදී මළොත් අකාල මරණ යයි. ඒ අවසන්ව තිබුනේ නම් කාල මරණය වේ.—

මරණය සිහි කරන්නාවූ යොගාවචරයා විසින් අට ආකාරයකින් ඒ සිහිකට යුත්තේය. එනම් වධක පච්චු පට්ඨාන (අළුගොසුවා ඉදිරියට පැමිණ සිටින්නෙකු සේ තමාගේ මරණය ලඟට පැමිණ තිබෙන බව වශයෙන් සැලකීමය. දෙවැනි අකාරණ වශයෙන් හෙවත් මරණය පැමිණීම වළක්වන්ට හේතු වන උපාය මාර්ගයක් නැතිබව වශයෙන් සිහිකිරීමයි— ඉර හඳ උදාවීම අවරවීම වැලැක්විය නොහැකි ලෙසිනැයි සිතීමයි— තෙ වැන්න උපසං හරණ යයි— පෙර ලොවෙහි විසූ මහා පුරුෂයන් මැරුණු බැවින් තමාටත් නොමැරී සිටින්ට බැරිබව සිතීමය. එවැනි මහා පුරුෂයන් සිහිකිරීමේදී ධන, බල, යස පිරිවර ආදියෙන් අගතැන් පැමිණි මහා සුදර්ශන ආදි මහරජවරුන්ය. වෙස්සාමිත්ත යමතග්ගි ආදි තේජස් ඇත්තවුන්ද, සාරිපුත්ත මොග්ගල්ලාණ ආදි මහා ශ්‍රාවකයන්ද පසේ බුදුවරුන් හා තථාගතයන් වහන්සේ ගේ පිරිණිවන් පෑමද සිහිකටයුතුය. සතර වෙනුව කාය බහු සාධාරණ වශයෙන් මේ ශරීරය වා, පිත්, සෙම් ආදි දෙෂ මළයන්ටත් සාධාරණය. නානා වර්ග පණු කැලන්ට ද ආහාර පාණ සෘතු ගුණ ආදීන්ටද එක සේ උරුමය. වෂ විෂ මැසිමදුරු සර්ප සිංහ ව්‍යාඝ්‍රාදීන්ටද සාධාරණය. ඔවුන්ගේ කෝපයකින් විනාස වියහැකි වේයයි සැලකීමයි. පස්වැනිව, ආයු දුබ්බල වශයෙන් මේ සත්ව ශරීරය දිය බුබුලක් පෙණ පිඩක් මෙන් අසාරය. ඒ කය ආරක්ෂක හේතුහුද දුර්වලය. ආශ්වාස ප්‍රශ්වාස ප්‍රතිබද්ධ නිසා ආයුෂය හෙවත් ජීවන ශක්තිය දුර්වලයයි.

සැලකිය යුතුය.—සවැනිව, අද්ධාන පරිච්ඡෙද වශයෙන් බැලීමයි. ලොවෙහි කිසිවෙක් නියම මුළු ආයු සංඛ්‍යාව ගත නොකරයි. එසේම කිසිවෙක් ජීවත් වන කාල පරිච්ඡෙද සීමාවක් නැති බව සැලකීමයි. සත්වැනිව අනිමිත්ත වශයෙන් සැලකීමයි. මරණයට නියම වේලාවක් තැනක් සලකුණක් නැති බව මෙනෙහි කිරීමයි. අටවැනි වූයේ ඛණ වශයෙන් බැලීමයි. මරණයට නියම වේලාවක් නැති බව සැලකීමයි. මේ මරණ සතිය වැඩීමෙන් අනිච්ච සංඥව පහළවේ. අනිච්ච දුක්ඛ අනත්ත සංඥවන් පහළවන බැවින් ජීවිතමදාදී සත් විසිමදයන් පහවෙති. ආත්ම ලබ්ධිය මුළුසුන් කරයි. එවිට කෙළින්ම හිත විදර්ශනා වීර්යට බැසගණී. ලොව්තුරා දහම් අත්පත් කරගන්නේය.

කායගතාසතිය

පිළිකුල් කටයුතු කාමාදි ආශ්‍රව ධර්මයන්ගේ උත්පත්ති ස්ථාන ය රැස්ව සිටින ස්ථානය කාය නම් වේ. ඒ කාය කොට්ඨාස පිළිබඳව මෙනෙහි කිරීමෙන් අනිත්‍ය දුක්ඛ අනාත්ම සංඥා ඇතිවීම කායගතා සතිය නම් වේ. මේ සිහිය උපදවනු කැමති යොගාවචරයා විසින් ඵදතිස් කොටස පිළිබඳව වෙනවෙනම මෙනෙහි කටයුතුය. මේ ශරීරයෙහි ඉසකෙස්ය. ඇඟ ලොම්ය, නියපොතුය, දත්, ඇටය, ඇඟ සමය, මාංසය, නහරය, ඇටකටුය, ඇට මීදුලුය, වකුගඩුය, හදවතය, අක්මාවය, දලබුවය, බඩ දිවය, පපුසමය, බඩවැලය, අතුණු

බඩණය, නොපැසුණු ආහාරබොක්කය, අහරමළය, හිස්මුලය, පිතය, සෙමය, පූයාව හෙවත් සැරවය, ලේය, සෝ(ඩා)දියය, මේදස්ය, කඳුලුය, වුරුණුය, කෙළය, සොටුය, සඳම්දුලුය, මුත්‍රය යන මේ දෙතිස් කොටස මේ ශරීරයෙහි ඇත්තාහ.

කාය ගතා සතිය වඩන දෙෂ චරිතයා විසින් වර්ණයද රාගචරිතයා විසින් පිඩාකාර විනාස සවභාවය ද ප්‍රඥ (බුඩි) චරිතයා ධාතු භාවයද නිමිත්ත වසයෙන් ගෙණ භාවනා කටයුතුයි. අනතුරුව තෙළෙස් ආකාරයකින් කාය සවභාව මෙනෙහි කටයුතුය. එනම්,

පළමු බීජ සවභාව යම්සේ කුෂතෘණ ආදී විෂ ඇටවර්ග ඒ විෂ වර්ගය උපදවන්නේ යම්සේද මේ ශරීරයත් මව්පිය දෙදෙනාගේ ධාතු බීජයෙන් හට ගැණි කිලුටම පතුරුවයි යනාදිය සැලකීමයි—දෙවනු සථාන වසයෙන්—මේ ශරීරය හටගන්නේ නෙළුම් මානෙල් ආදී පවිත්‍ර දෙයකින් නොවේ. මව් කුසක ඉතා සම්බාධ ඉඩමකය. එය ඉතාම අපවිත්‍ර තැනකි, යනුවෙන් සැලකීමයි— තෙවනු ප්‍රත්‍යය වශයෙන් මේ ශරීරය කොයි ලෙසකින් වත් රන් රිදී මුතු මැණික් ආදියකින් ඇතිවූයේ හෝ ඇති කරන්නේ නොවේ. සඳුන් තුවර ආදී සුවඳ දෙයකින් හටගත්තේ හෝ හටගන්වන්නේ නොවේ. කුණු ගොඩක කුණු කසලින් සකස්වී කුණු කසලම වගුරුවන්නකැයි සිතීමයි— සිව්වැනි නිස්සන්දන වශයෙන් කුණු මස් අසුචි පිරවූ මල්ලක් කුණු වගුරුවන්නාක් මෙන් දෙරවූ නවයකින් කුණු වගුරුවයි ආහාර පාණාදිය එක් දෙරටුවකින් ඇතුල්ව නවදෙරටුවකින් පිටවන්නේය යනාදිය මෙනෙහි කිරීමයි— පස්වැනිව ප්‍රභව සංවර්ධන වශයෙන් කලල ප්‍රභවරූපය අර්බුද පේසි ඝණ සාඛා ප්‍රසාඛාදී අවසථාවශයෙන් සතියෙන් සතිය වැඩී ගොස් දෙසාළිස් සතියක දී වැඩී අවසන් වේ. එකුන් තිස් වැනි සතියේදී දරුවකුගේ සියලු අවයව සෑදී ඇත. නවාතු දහසක් රොම කූප ආදී සියලු අවයව මෝරා බිහිවීමට සති දෙසාළිසක් පිරියන්නේ ය යනාදිය මෙනෙහි කිරීමය. සවැනිව කිමි කුල වශයෙන් මේ ශරීරයෙහි සියලු අවයවයන්හි වෙන්වශයෙන් වෙසෙන පණු සමූහය කුල වශයෙන් අසූ දහසකි. තාල හිරක මෘණාලමුඛ ආදී නානා කොට්ඨාස වලින් යුක්ත වෙති. සත්වැනි අසම්බන්ධ වශයෙන් එකෙකුගේ උපත අනෙකෙකුට කිසිත් සම්බන්ධයක් නැති බව. අටවැනි කලාප වශයෙන් මේ ශරීරයේ දත් ඇට දෙතිස හැර තුන්සියයක් ඇටකටු ඇත්තාහ යනාදී වශයෙන් කොටස් ගණං සීමා පිරිසිඳ බැලීමයි. නවවැනි පිගුච්ඡන වශයෙන් මේ කය අගනා කසී සලු ආදී පටපිළියෙන් සැරසූවත් හඳුන් කොකුම් ආදී සුවඳ ගැල්ලුවත් සවාභාවික අපවිත්‍ර පිළිකුල් කුණු ගතිය කිසිසේත් අත්නොහරී. ඇඳුම් පැලඳුම් ආදි ශරීරයට එක්කරණ පිරිසිදුදේත් අපිරිසිදුකර දුගඳ හමන දේ බවට හරවන බැවින් පිළිකුල් කටයුතුමය. දශවැනි අශුභ වශයෙන් දූකීම නම් හටගැණීම, උපදින සථානය පවතින ආකාරය, පෑය සටහණ ආදී හැම අයුරකින්ම අසුභ බව සැලකීමයි— එකොළොස් වැනිව නිදන වශයෙන් මේ කයනම් නානා විධ රොගයන්ට වාසසථානය වේ. එසේම අනන්ත ආදීනව ඇත්තේ යයි මෙනෙහි කිරීමයි—දෙළොස් වනු අකෘතඥ වශයෙන්—මේ ශරීරය නම් අපක්ෂපාත නෑයෙකු වැනිය. කෘතොපකාර නොසලකයි. එක් අයෙක් කය සතුටුකරන්ට සිතා කොතෙක් රසගුණැති ආහාර වැලඳුවත් එය ලෙඩ වීම මහළුවීම මැරීම නවත්වන්නේ නැත. කෑමෙන් බීමෙන් ඇඳුමෙන් තමාට සංග්‍රකරණ බව සලකා තම සවභාව මඳකුත් වෙනස් නොකරන්නේයයි සැලකීමයි—තෙළෙස් වැනි සපරියන්ත වශයෙන් මේ ශරීරය ඒකාන්තයෙන්ම අවසාන වන්නේය. පිළිස්සීමෙන් හෝ වළලා දැමීමෙන් සතුන් විසින් කා දැමීම ආදී විධියකින් විනාසවීම කෙළවරකොට ඇත්තාහයි සැලකීමයි.

මෙසේ කාය සවභාවය ඇති සැටි විමසා දැනගත් යොගාවචරයාගේ චිත්තොපකෙලෂ නිවරණ පහවී යයි. ධ්‍යානාඞ්ග උපදී. අනතුරුවදෙතිස් කුණු කොටස් පිළිබඳ ත්‍රි ලක්ෂණ වැඩීමෙන් ලොව්තුරා දහම්හු පහළ වන්නාහ.

උපසමානුස්සතිය

වූපසමය නම් සියලු සංස්කාරයන්ගේ සන්සිඳීමයි හෙවත් කාය චිත්ත දෙදෙනාගේ ඉජන නම් චලනය විප්ඵන්දන නම් ක්‍රියාවන්හි යෙදෙන සෙලවෙන ස්වභාව සන්සිඳීම හෝ නැවතීමයි. ව්‍යපසමය සිහිකිරීම උපසමානුස්සති නම්වේ. එය කා විසින් කෙසේ භාවනා කට හැකිදයත්, සිව් පිරිසිදු සීලයෙන් සම්පූර්ණව, කුසල චිත්තයාගේ ඒකාග්‍රතා සංඛ්‍යාත සමාධියෙන් යුක්තව, අනිත්‍ය දුඃඛය අනාත්මය යන ලක්‍ෂණත්‍රය වැටහෙණ විදර්ශනා ප්‍රඥාවෙන් යුක්ත පහාණාඞ්ග නම් නිවරණ සංයොජනයන් මේ මේ යයි දැනගන්නා විමුක්තියෙන්ද ප්‍රත්‍යවේක්‍ෂාඥානයෙන්ද යුක්ත වූ යොගාවචරයා විසින් භාවනා කටයුතුය. ප්‍රහීණාඞ්ග දර්ශනයෙන් ව්‍යුපසමය දක්ක යුතුය. ප්‍රථම ධ්‍යානයට පැමිණියහු විසින් නිවරණ පචකයාගේ ප්‍රහාණිය දක්නා ලැබේ. විතීය ධ්‍යානයට පැමිණි තැනැත්තේ විතක් විචාරයන් ද තෘතිය ධ්‍යානිකයා ප්‍රිතිය චතුර්ථ ධ්‍යානලාභී සුඛයද පිළිවෙළින් ප්‍රහීණාඞ්ග වශයෙන් බලන්නේය. මෙසේ පිළිවෙළින් අරූපාවචර චතුර්ථධ්‍යාන සංඛ්‍යාත සඤ්ඤාවෙදයිත නිරොධය තෙක්ම බලන්නේය. එලෙසින්ම සොතාපත්ති පලයට පැමිණි යේ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන සංයොජනයන්ද, සකදගාමී පලයට පැමිණියේ ඕලාරික කාමරාගය හා පටිඝ නම් ව්‍යාපාදයද අනාගාමී පලයට පැමිණියේ පස් ඕරම්භාගිය සංයොජනද රහත් ඵලයෙන් පස් ආකාර උඩංභාගියසංයොජන ද නිර්වාණය සාත්කිරිමෙන් සර්වසංස්කාර ධර්මයන්ගේ උපසමය දැකීමද සිදුවන්නේය. මෙසේ සිහිකර උපචාර සමාධිය ලබනවා ඇති. අනුස්සති නිමි.

බ්‍රහ්ම විහාර නම් අප්‍රමාණ්‍ය සතර

මෛත්‍රී භාවනාව

මෛත්‍රිය නම් ස්නෙහය යි—යම්සේ පියාණ කෙණෙක් හෝ මවෙක් තමන්ගේ එකම දරුවා කෙරෙහි බලවත් ප්‍රේම ඇත්තාහු වෙද්ද, නිතර ඔහුගේ යහපත වැඩි දියුණුව පිළිබඳ හිත ඵරණ වශයෙන් මෛත්‍රී සහගත වෙද්ද එසේම සර්ව සතුන් කෙරෙහි ස්නේහය ප්‍රේමය හා යහපත පැතීම මෛත්‍රිය කිරීම නම් වේ. ඒ මෛත්‍රිය වැඩි මෙහි—සැප සේ නිඳියාම, පහසුවෙන් අවදි විය හැකි වීම, නපුරු බිය අනතුරුදයි හීණ නොපෙණීම, මිනිසුන්ට ප්‍රිය වීම, තිරිසන්, දේව, යක්ෂා දී අමනුෂ්‍ය යන්ට ප්‍රියවීම, දෙවියන්ගේ ආරක්ෂා ලැබීම, ගින්නෙන්, විෂ විෂයෙන්, අවිආයුධයෙන් පිඩා නොපැමිණීම, හිත වහා සමාධි ගත වීම ඔහුගේ මුහුණේ පැහැය වැඩිවීම, මුලා නොවී කළුරිය කිරීම යන අනුසස් එකොළොසක් ඇත්තාහ.

මෛත්‍රී භාවනාව පටන් ගැණීමට පළමුව ඔහු වෙෂයෙහි දෙස් දතයුතුය. ක්ෂාන්ති යෙහි අනුසස් අනතුරුව මෙනෙහි කටයුතුය. වෙෂ හිත කියත වැනිය. එය දැතට ගමන් කිරීමෙන් දැවටුණු හැපුණු දෙය කැපී යන්නේය. පහලට මෙන් ඉහළටත් ඈතට මෙන් මෑතටත් කපාගණ යන ස්වභාව ඇත්තේය. එමෙන් වෙෂය ද තමන්ට හා අනුන්ට එකසේ අනතුරුදයකය. යමෙක් කෝප හිත වැඩෙන්ට ඉඩ හරි නම් දියනා පිරිසිදු වන අදහසින් දුගඳ කුණු දිය නාන්නෙක් වැනිය. ලෙඩකින් පෙළෙමින් සිටින වෙදරාළ කෙණෙකු වැනිය. පියන නොවසා පිටත සිතියම් කර අසූචි පුරවා තිබෙන භාජනයක් වැනිය, විෂ මිශ්‍ර ආහාරයක් ප්‍රීතියෙන් අනුභව කිරීමක් වැනිය, තමා අතින් අල්ලාගණ යන විසකුරු සර්පයෙකු දෂ්ටකරද්දීත් හැරදමා පිළියම් නොකිරීමක් වැනිය. යනාදී වශයෙන් කෝපයේ දෝෂ සලකන්නේය, කෝපගින්න ක්ෂාන්ති ජලයෙන් නිවෙන්නේය. ක්ෂාන්ති සිසිල සැපය සලසන්නේය යනාදියෙන් ඉවසීමේ අනුසස් ද සිතිය යුතුය. මෙත් වැඩීමට අරමුණු කරණ පුද්ගලයා මළ අයෙකු හෝ වෛරියෙකු මැදහත් අයෙකු

පළමුව අරමුණු නොකට යුතුය. එසේ ම පළමුවරට පෙම්වතෙක් හිතවතෙක් ද නොගත යුතුය. පළමු කොට තමා කෙරෙහි ම මෙත් වැඩිය යුතුය. මම නිදුක් වෙමි, නිරෝග වෙමි, වෛර නොවෙමි, යනාදි වශයෙන් තෙමේ ම අරමුණ කරගත යුතුය. අනතුරුව ටිකින් ටික මෙත් සිත පතුරුවමින් පෙම්වතා හිතවතා කෙරෙහි ද මැදහත් හෝ හොඳ නොහොඳ නොදන්නා අයද අන්තිමට විරුද්ධකාරයන් කෙරෙහි ද මෙත් වැඩීම යෝග්‍යවේ.

මේ ක්‍රමයෙන් හතුරු මිතුරු දන්නා නොදන්නා කා ගැණත් මධ්‍යම දේශයේ උපදින්ට ලැබෙව්වා, සත් පුරුෂ ආශ්‍රය සැලසේවා, නිරෝග වෙවා, දීර්ඝායු වෙවා, නිත්‍ය සැප විහරණය සැලසේවා, අකුසල් රැස් කිරීමෙන් වළකීවා, පූර්ව පාප කර්ම විපාක සිදු නොවේවා, යටපත් පාප කර්ම ඉදිරිපත් නොවේවා, කුසල කර්මයන්හි නිරත වෙවා, යටපත්ව තිබෙන පින්කම් විපාක ඉදිරි පත්වේවා, ලැබූ සැපතින් යස ඉසුරෙන් නොපිරිහේවා, යනාදී වශයෙන් මෙනෙහි කටයුතුය. අමිතුරු හෝ මැදහත් අයෙකු ගැණ මෙයාකාර මෙත් සිතක් උපදවන නොහැකි හෝ අපහසුවක් දූනේ නම් මඳ වේලාවක් විවේක ගෙණ නැවත තමා හිතවතා, මැදහතා, හතුරා පිළිවෙළින් අරමුණු කරගණ මෙත් වැඩිය යුතුය. ඒ වරත් හිත අමිතුරු මැදහත් අය වෙත පැකිලේ නම් තමාම ලැජ්ජා විය යුතුය. තමාගේ ශාස්තෘවරයා සම්බුද්ධ පියාණන් වහන්සේ තම දරුණු හතුරාටත් මෛත්‍රී කළ සේක. ඒ පියාණන් ගේ දරුවකු වූ මට ඒ බැරිවේ නම් මා උන්වහන්සේගේ පුතෙකු හෝ ගෝලයකු වන්නේ කෙසේ ද ? මා මගේ හතුරාට මිතුරා විය යුතුයි. මටත් හතුරෝ මිතුරු වෙත්වා යි සිතිය යුතුය. එවිටත් හතුරු මැදහතුන් කෙරේ යම් පැකිලීමක් වේ නම් ඒ පුහුලාගේ වැදගත් ගුණ පමණක් මෙනෙහි කට යුතුය. යම් කුණු කසලක් තම ගත තැවරුණු පසු ශුද්ධ කර ගැණීමට වතුර අවශ්‍යවාක් මෙනැ යි සිතිය යුතුය. ඉවසීමේ සමාවීමේ ගුණ වශයෙන් කම්මස්සකතාව හෙවත් එකෙකු කළ කිහිතු දෙයට ඔහුටම විපාක දෙන බව දනසංවිභාගය ආදී ගුණාංග මෙනෙහි කටයුතුය. අනතුරුව සීමා සමෙහද නොකර පිළිවෙළින් මෙත් සිත පතුරු වන්නේය. එක් දිශාවෙක දෙ දිශාවෙක යනාදී වශයෙන් දශදිශා වෙහිම පැතිර විය යුතුය. මෙසේ ජීවත් ව සිටින මුළු ලොවේ ම වසන ප්‍රාණීන් කෙරෙහි මෛත්‍රී සිත පැතිර විය යුතුය.

අනතුරුව මෛත්‍රියගේ මුල කුමක් ද ? වැටහීම කුමක් ද ? සම්පත්තිය කවරේ ද ? විපත්ති කවරේ ද ? ආරම්මණය කුමක් දූ යි පැහැදිලිව සිතා ගතයුතුය. එහි අලෝභ, අවෙෂ, අමෝහ, රාග, උපාය මනසිකාර යන පස මෛත්‍රී චිත්තයාගේ ඉපදවීමට මුලවේ. මෛත්‍රී චිත්තය ඉපදීමට අරමුණු වන්නේ සත්වයා ය. නමුත් පරමාර්ථ වශයෙන් සත්වයෙක් පුද්ගලයෙක් නැති බැවින් සත්ව ලෝකය අරමුණ වන්නේය. අපගේ අමා මෑණියන් වහන්සේ බොධි සත්ව කාලයේ දී දන්දීම ,සිල් රැකීම, සැපත් හැර දමා පැවිදිවීම, නුවණ දියුණු කිරීම, වීරිය, ඉවසීම, සත්‍ය වචන, අධිෂ්ඨාණ, මෛත්‍රී, උපෙක්ෂා යන දස පැරුම් දහම් පුරමින් මෙත් සිත පුහුණු කළ සේක. සතර වැදෑරුම් අධිෂ්ඨාණයා ගේ බලයෙන් සමථ විදර්ශනා සම්පූර්ණ කළහ. සමථය සම්පූර්ණ කිරීම වශයෙන් ධ්‍යාන අටය, විමෝක්ෂ අටය, සමාධි අටය, සමාපත්ති අටය, යමක ප්‍රාතිහාර්‍ය සමාධිය, මහාකරුණා ඥාණ සමාධිය, විදර්ශනාව සම්පූර්ණ කිරීමෙන් අභිඥා, පටිසම්භිදා, බල වෙසාරජ්ජ පියවි නුවණ හා සර්වඥතාඥාණය ද සම්පූර්ණ කරගත් සේක. මෙසේ බුදුබැව්හි ඇලුණු මහා සත්වතෙමේ මෙත්තාව වඩා පිළිවෙළින් ලොව්තුරා බුදු බව මුහුකුරා ගත් සේක. එබැවින් මෛත්‍රී සිත පළමුව තමා දෙවනුව හිතවතා තෙවනුව මැදහතා සිව්වැනිව සතුරා අරමුණුකර භාවනාවෙන් පුහුණු වී සිය ගෙවැසියා, ගම්වැසියා, පළාත්වැසියා, රටවැසියා, ලෝවැසියා යන පිළිවෙළින් ද එක් දිශාවක් දෙදිශාවක් පිළිවෙළින් දශ දිශාවම පතුරුවා මුළු ලොව සියලු ප්‍රාණීහු සියදරු කැලමෙන් ප්‍රෙම ස්නේහයෙන් පතුරුවා විසීම මෙත්තා විහරණය නම් වේ—

කරුණා භාවනාව

අනාශයා දුකින් මුදවනු කැමැත්ත කරුණාවයි. කරුණාව වඩනු කැමති යොගාවචරයා විසින් පළමු කොට අකාරුණිකතාවෙහි දෙසුත් කරුණාව වැඩීමේ අනුසසුත් මෙනෙහි කටයුතුයි—කරුණා භාවනාව පටන් ගන්නා ආදි කර්මිකයා විසින් පළමු ව, ප්‍රිය අති ප්‍රිය මළ පුද්ගලයන් අරමුණු කර නොගත යුතුය. ස්ත්‍රී පුරුෂ විශෙෂය ද හෙවත් ස්ත්‍රීන්ට පුරුෂයන්ද පුරුෂයාට ස්ත්‍රීන් ද අරමුණු කිරීම යොග්‍ය නොවේ. යම්සේ දුකට පැමිණි එක පුද්ගලයෙකු දැක කරුණා කරන්නේ ද එසේ ම සියලු සත්වයන් කෙරෙහි කරුණාව පතුරුවන්නේය. අතිශයින් දුකට පැමිණි කැඩුනු බිඳුනු අත්පා ඇතිව කබල් ගත් දීන විලාප කියන පුරුෂයෙකු දැක අහෝ මේ මිනිසා මහා දුකකට පත්ව සිටින්නේය. අනේ මොහු මේ දුකින් මිදෙන්නේ නම් යහපතැ යි කරුණාව ඉපදවිය යුතුය. සුවසේ සිටින්නාවූ ද පවිකරණ පුද්ගලයකු දැක මව් පියවරු දුකට පැමිණි සියදරුවා දැක කරුණා කරයි ද එසේ යෝගාවචරයා විසින් දුක්ඛිතවූත් සුඛිත පාපකාරිවූත් පුද්ගලයන් කෙරෙහි කරුණා කටයුතුය. මෙත්තා භාවනාවෙහි කී පරිදිම තමාත් ප්‍රිය පුද්ගලයාත් මධ්‍යස්ථයාත් හතුරාත් යන සතර තන්හී කරුණා ව වඩා තෘතිය චතුර්ථධ්‍යාන උපදවා අර්පණා වඩා මෙත්තාවෙහි කී එකොළොස් අනුසස් ලබාගන්නේය—

මුදිතා භාවනාව

සැප පහසුවෙන් ප්‍රමොද වන ප්‍රිය පුද්ගලයකු දැක අනේ හොඳයි කියා අනුමත කිරීම් වශයෙන් උපදනා හිත මුදිතාවයි. මුදිතා භාවනාව වඩනු කැමති යොගියා විසින් පළමුව ප්‍රිය පුද්ගලයා අරමුණට නොගත යුතුය. මළ අය හා ලිංග විෂ භාගයන් ද අර්පණා භූමි නොවේ. යම සේ මව්පියවරු සුවපත්ව මනාව සැරසී විනොද වන සිය පුතු දැක අසා හෝ ප්‍රමොද වෙද්ද අනේ හොඳයි පුතාගේ දියුණුව අනුමොදන් වෙද්ද එපරිද්දෙන් සවසතුන් වෙත මුදිතාව වැඩිය යුතුය. '' මහණෙනි, යොගී මහණ තෙම මුදිතාව යුත් සිතින් එක් දිශාවෙක පතුර වා කෙසේ වෙසේ ද, යම්සේ ප්‍රිය මනාප වූ එක පුද්ගලයෙකු දැක මුදිතාවක් ප්‍රමොදයක් ඇති වේ ද, එසේ ම හැම සතුන්ගේ සැපතෙහි ප්‍රමොද වන්නේය. ඉදින් වත්සල මිත්‍රයෙකු ප්‍රිය පුද්ගලයෙකු දුන් දුගී දුප්පත් ව සිටි නම් ගත වූ කාලයේ ඔහු පිළිබඳ ව පැවති සැප සම්පත් සලකා ප්‍රමොද විය යුතුය. ඒත් නැතිනම් අනාගතයෙ දී පැමිණෙන සැප සම්පත් සලකා මුදිතාව වැඩිය යුතුය. පළමුව තමා කෙරෙහි ද අනතුරු ව ප්‍රිය මධ්‍යස්ථ වෙරී පුද්ගලයන් කෙරෙහිත් අනුක්‍රමයෙන් මුදිතාව පැතිර විය යුතුය. අර්පණා වැඩිය යුතුය. ඉදින් වයිරී පුද්ගලයා කෙරෙහි පැකිලීමක් ගැටීමක් වේ නම් මෙත්තා භාවනාවේ දී කී පරිදි සන්සිඳුවා ගතයුතුය. තමා මිතුරා මැදහතා හතුරා යන සතර තැන සීමා සම්භෙද නොකර සම තත්ත්වයෙන් මුදිතාව වැඩිය යුතුය. ත්‍රික චතුෂ්ක ධ්‍යාන වශයෙන් අර්පණා වැඩිය යුතුය. ඕයි අනොයි වශයෙන් විකුර්වන එකොළොස් ආනිසංස ද ලබන්නේය—

උපෙක්‍ෂා භාවනාව

සත්‍වයන් හෝ සංසකාරයන් (ද්‍රව්‍යයන්) කෙරෙහි මධ්‍යස්ථ බව—ආලය හෝ විරොධය නැති කම උපෙක්‍ෂාවයි. මේ උපෙක්‍ෂාව වඩනු කැමති යොගාවචරයා විසින් මෙත්තාදිය වඩා ප්‍රගුණ වූ තෘතිය ධ්‍යානයෙන් නැගී සුවපත් වේවා යනාදී වශයෙන් සත්‍වයන්ට සංස්කාර යන්ට ප්‍රෙම කිරීම බැවින් ආලය කෝපයන්ට ඉතා සමීප බැවින් සොමනස හා යෙදී ඕලාරිකව ඇති බැවින් මුල් තුණෙහි දෙස් දැක සාන්ත බැවින් මැදහත් බැව්හි අනුසස් දැක තමාට ස්වභාවයෙන්ම මධ්‍යස්ථ පුද්ගලයෙකු කෙරෙහි ප්‍රෙම කෝප නොකොට මැදහත් බැව්හි තබා උපේක්‍ෂාව ඉපද විය යුතුය. ප්‍රිය අති ප්‍රිය පුද්ගලයාද වස්තුවද එසේ සමබවට ලා සැලකිය යුතුය. අන්තිමේ දී තමාත් හතුරා මිතුරාත් එක සැටියකින්ම

සම සම බව සැලකිය හැක්කේය. '' මහණෙනි යෝගී තෙමේ මැදහත් බැවින් යුත් හිත එක් දිසාවෙක පිහිටුවා වාසය කරන්නේ කෙසේද ? යම්සේ මනාප හෝ අමනාප නැති එක් පුද්ගලයෙකු දක හතුරු මිතුරු හිතක් නොගන්නේද. එසේ සියලුම සත්වයන් කෙරෙහි උපෙක්‍ෂක බව ඇතිකර ගණී. යනුයි—යම්සේ ප්‍රිය මිතුරෙක් හෝ ඥාතියෙක් කලක් දුර බැහැරක සිට පැමිණියාම නෑ මිතුරෝ එක්ව සාදර සංග්‍රහයෙන් පිළිගන්නේ නමුත් කල්යත් යත්ම ඒ ලෙංගතුකම අඩුවී සමඛයට එන්නාක් මෙනි—එසේ මැදහත් අයෙකුගෙන් පටන්ගෙන අනතුරුව හතුරාත් මිතුරාත් තමාත් එක ලෙසින්ම ආලයක් හෝ විරොධයක් නැතිව සැලකීමට පුරුදු වියයුතුය. ප්‍රිය අප්‍රිය සීමාව බිඳ තමා අනුන් යයි හිත අහිත පරතරය මකාලිය යුතුය. එසේ පුරුදු පුහුණු කිරීමෙන් සතරවෙනි ධ්‍යානය උපදී අනතුරුව විකුර්වණ හා අනුසස් උපදනාහ—

පොදු උපදෙස්

මේ සිව් බඹ විහරණ හෝ අප්‍රාමාණ්‍යයන් භාවනා කරන්නෙකු විසින් සජීව පුද්ගලයෙකුම අරමුණු කරගත යුතුය. මළ තැනැත්තෙකු අරමුණු නොකට යුතුයි. අරමුණු කරගන්නා පුද්ගලයා තිරිසන් සතෙක්, දුස්සීල මිනිසෙක්, සිල්වතෙක්, කම් සැපෙහි කලකිරුණු බ්‍රහමචාරි තවුසෙක්, බුදුසව්වෙක්, පසෙ බුදු උතුමෙක්, ලොවුතුරා බුදු වරයෙක් යන මින් කැමති ජීවත්ව සිටින කෙණෙක් අරමුණු කරගත හැකිය. මෙහි මුල් කමටහන් තුණින් පළමුවන ,දෙවන, තෙවන දහැණුන් මුත් සිව්වැනි දහැණය නූපදින්නේ මක්නිසාද? යනු ප්‍රශ්නයකි, පිළිතුරනම් සඛ සංඥව නිසා ව්‍යාපාද අහිංසා, අරති ආදිය උපදී ඔවුන්ට එකිනෙකට වෙන්වූ පිළියම් යෙදිය යුතුය. සොම්නස් හිතින් මෙත්තාවද, කරුණා මුදිතා ද වැඩිය යුතුය. ඒ නිසා මුල්තුන් ධ්‍යාන මුත් සිව්වැන්න පහළ නොවේ. චතුර්ථ ධ්‍යානයට භූමි වනුයේ උපෙක්‍ෂාව මය. සතර අප්‍රාමාණ්‍යයො වෙන වෙනම ධ්‍යාන සතර සතරම උපදවනු සමත්වෙතැයි සමහරු කියත්. ඒ මෙහි පිළිනොගන්නේය. මේ අප්‍රාමාණ්‍යයෝ තුණක් පහක් නොවී හරියටම හතරක් වනුයේ මක්නිසාද ? යනු තවත් ප්‍රශ්නයකි. පිළිතුර නම් ව්‍යාපාද, විහෙසා, අරති, පටිඝානුනය යන සතරට ප්‍රතිවිරුද්ධ ධර්ම වශයෙන් යනුයි—මේ සතර අප්‍රාමණ්‍යයන්ගේම සාධාරණ ලක්ෂණ නම් ආදීනව යන්ට විරුඩ වීම, අරමුණ වශයෙන් පණ ඇති සතෙක්ම වීම, හා හිත සුව සිතිවිලි ඇති බව යන මොව්හුය. එක එකෙහි වෙන වෙනම සිටින ලක්‍ෂණ නම්, ප්‍රතිපක්‍ෂ ආරම්මණ හිත සුව සාධන යයි— මෙසේ මේ සතර අප්‍රාමාණ්‍ය යෝ දනාදී සියලු කල්‍යාණ ධර්‍ම යන්ට මුල් වේ. මේ සතර ප්‍රත්‍යුපකාර අපේක්‍ෂා රහිතව ම පිරිය යුතුයි.—

ධාතුමනසිකාරය

නාමරූප ධර්මයන්ගේ සම්බන්ධාණීය දරන්නේ ධාතු නම් වේ. මේ සතර මහා භූත සංඛ්‍යාත ධාතූන්ගේ සබභාව ලක්ෂණ සනිටුහන් කරගැණීම ධාතු වවත්ථානය. ධාතු මනස්කාරය ධාතු කර්ම ස්ථානයයි ද කියනු ලැබේ. ඒ චතුධාතු වවත්ථාන නම් මේ කමටහණ සංක්‍ෂේප වශයෙන් තියුණු නුවණැතියන් විසින්ද මඳනුවණ ඇතියන් විසින් විස්තර වශයෙන් ද භාවනා කටයුතු බැවින් සංඛෙප විස්ථාර වශයෙන් දෙයාකාර වේවි. මහණෙනි, යම් සේ දක්ෂවූ ගවමරුවෙක් හෝ ගවමරුවෙකුගේ අතවැසියෙක් හෝ ගවයෙකු මරා සතර මංසන්දියක මස් ගොඩවල් සතරක් කොට බෙදා සිටින්නේ වේද එපරිද්දෙන්ම මහණෙනි ධාතු මනසිකාර කමටහණ වඩන යෝගාවචර මහණ තෙමේ මේ ඛ්‍යාම මාත්‍ර පචස්කන්ධ ශරීරයම, අඳුරු හරවා ධාතු භාවය පැහැදිලි කරමින් සිටි පිහිටි පරිද්දෙන් ධාතු වශයෙන් මෙනෙහි කරන්නේය. මේ ශරීරයෙහි පඨවි ධාතු, ආපො ධාතු, තෙජො ධාතු, වායො ධාතු ඇත්තාහ. සත්වයෙක් පුද්ගලයෙක් ආත්මයක නැත්තාහයි මෙනෙහි කරන්නේය. පඨවි ධාතුව අජ්ඣත්තික බාහිර යයි දෙයාකාරය.

එහි අජ්ඣත්තික හෙවත් ශරීරය සම්බන්ධවූ පඨවි ධාතු නම් කවරේද යත්? මේ ශරීරය තුළවූ යම් දෙයක් කර්කශ (=තදගතිය ඇත්තා හු රළු ගති යුක්ත වේද මමය මගේ යයි තණ්හා මාණ දිට්ඨි වශයෙන් ගන්නා ලද්දහුද ඒකවරහුද ඉසකෙස්ය. ඇඟලොම්ය, නියපොතුය, දත්ය, සමය, මාංශය, නහරවැල්ය, ඇටකටුය, ඇට මිදුලුය, වකුගඩුය, හෘදයමාංශය, අක්මාවය, දලබුවය, බඩදිවය, පපුසමය, අතුණුය, අතුණු බහන්ය, අමු ආහාර බොක්කය, අසුචිය, හිස්මොළය යන මොවුන් හා තවත් යම් කිසි කර්කෂ තද සවභාව ඇති දේ වෙත්නම් ඒ සියල්ලම පඨවි ධාතු යයි සලකන්නේය. මේ අභ්‍යනතර පෘථිවි ධාතුවය—

ආපො ධාතුව ශරීරය තුළ පවත්නා ද්‍රව කොට්ඨාස නම් අභ්‍යන්තර ආපොධාතුය. ගඟේ, වැවේ, ලිඳේ, මූදේ ආදී බාහිර ආපො යයි දෙයාකාරය. එහි අභ්‍යන්තර ආපො ධාතු නම්, කයෙහි වූ යම් ද්‍රවයක් වැගිරෙණ සවභාව ඇති දෙයක් වේ නම් මම මගෙ යයි ගන්නා දේ වෙත්නම් එබඳු බද්ධ අබද්ධ පිතය, සෙමය, සැරවය, ලේය, ඩාදියය, වුරුණු තෙල්ය, කඳුලුය, කෙළය, සොටුය, සඳමිදුලුය, මුත්‍රය යන දෙළොස් කොටස හා වෙනත් යම්කිසි ද්‍රව ජාතියක් වෙත්නම් ඒ අභ්‍යන්තරික ආපො ධාතුවයි මෙනෙහි කරයි—

තෙජො ධාතුව අභ්‍යන්තරය, බාහිරයයි දෙයාකාරය, එහි අභ්‍යන්තර තෙජො ධාතුව කුමක්ද යත් ? යම් අභ්‍යන්තරයේ මම මගේ යයි ගන්නා උණුසුමක්, තෙජසක් වේ නම් ඒ යමකින් තැවීම වේද යම උණුසුමකින් ජරපත් වේද යම් උණුසුමකින් දැවිලි තැවිලි ඇතිවේද, යම් ගින්නකින් කැව බීව දෙය දිරවාද අනිකුත් අභ්‍යන්තරික උණුසුමෙක් වෙත්නම් ඒ අභ්‍යන්තරික තෙජො ධාතුවයි—

වායෝ ධාතුවද අභ්‍යන්තර බාහිර යයි දෙකකි. එහි අභ්‍යන්තරික වායො ධාතුව නම් මේ ශරීරය තුළ පවත්නා මම මගේ කියා ගන්නා වායො ධාතු කොටසක් වේ නම්— හික්කා, වමන, ඔක්කාරාදිය ඇතිකරණ උඩු ගමන් වායුවය, මළමුත්‍රාදිය පහකරවන යට ගමන් වායුවය, බඩ වැලින් පිට කුස තුළ හැසිරෙණ වාතය බඩවැල ඇතුළත හැසිරෙන වාතය, දඹුරුවක් නූල් ඇදීමෙන් මෙන් මේ සිරුරේ ඉරියව් පවත්වන අඟ පසඟ පුරා දිවෙන වායුවය, කය තුළට නැහැසිදුරෙන් ඇදගන්නා වාතය කය තුළින් බැහැරලන වාතය ද, තවද චිත්තකිරිය වාතාදී යම්වායු කොටසක් වේ නම් ඒ අභ්‍යන්තරික වායෝ ධාතුවය—

මෙකී සතර ධාතූන් හෙවත් මහා භූතයන් ව්‍යවස්ථාපනය භාවනාව කරන්ට කැමති යෝගී තෙමේ කේසයෝ පෘථිවි ධාතුය. ලෝමයෝ පෘථිවි ධාතුයයි විස්තර වශයෙන් හෝ මේ සිරුරෙහි යම් දෙයක් තද ලක්ෂණ ඇත්නම් ඒ පඨවි ධාතුයයි යම් දෙයක් ගමන් කරණ වැගිරීම ඇතිනම් ආබන්ධන ලක්ෂණ ඇති යේ ආපොධාතුවය යම් තෙජොධාතුවක් පැසවන ලක්ෂණ ඇත්තේද ඒ තේජෝ ධාතුය. යම් වායු කොට්ඨාසයක් විෂ්ඹහන දෘඩිකරණ ලක්ෂණ ඇත්තේද ඒ වායො ධාතුවය කියා මෙනෙහි කටයුතුය. මෙසේ සංක්ෂෙප වශයෙන් සතර ධාතුහු නැවත නැවත පඨවි ධාතු ආපොධාතු ආදී වශයෙන් ධාතු මාත්‍රය පමණක් මුත් සත්ව ජීව පුද්ගල බවක් නැතැයි මෙනෙහි කටයුතුයි. ආවර්ජනය ප්‍රත්‍යවෙක්ෂාව කටයුතු ය, මෙසේ භාවනා කරණ ඔහුට ධාතු සඞ්ඛ්‍යාව බබුලු වන ප්‍රඥව උපදී. එයින් සවභාව ධර්මා රම්මණය බැවින් අර්පණා සමාධි නොයිපදීම උපචාර සමාධියම උපදින්නේය.

විස්තර වශයෙන් ධාතුමනසිකාරය භාවනා කරණ නොයියුම් නුවණ ඇත්තහු විසින් පඨවි ධාතු විස්සය, ආපොධාතු දොළසය, තෙජො ධාතු සතරය, වායො ධාතු සයය යන දෙසාළිස් ධාතූන් ඉගෙණ පඨවි ධාතු කොට්ඨාසයෙහි සම්බන්ධ ලක්ෂණය ව්‍යවස්ථා කොට දොළොස් ආපො ධාතුවේ වැගිරෙණ යූෂගතිය දියර සවභාව හා ඒකාබද්ධ කරණ ලක්ෂණය ද ආභොග කොට තෙජො ධාතු සතර කොටසෙහි පැසවන දිරවන සවභාවය ද අවබොධ කොට

වායො ධාතු සකොටසෙහි විෂ්ටම්භනය හො පුම්බන සවභාවය ද වවත්ථාන කටයුතුය. මෙසේ වෙන වෙනම ගෙණ සවභාව ලක්ෂණය විනිශ්චය කරණ ඔහුට ධාතු දෙසාළිස පැහැදිලි වෙති. ව්‍යාළ, මෘග, යක්ෂ, රාක්ෂසාදි විශේෂ කල්පනාවන්ට නොපැමිණ ස්ත්‍රී පුරුෂ වෙණස ද සිතින් පහවන්නේය. සත්ව, පුද්ගල, ජීව යන කල්පනා දුරුවී ධාතු බව පමණක් ම පැහැදිලි වේ. ඒ ධාතු සඥව නැවත නැවතත් මෙනෙහි කරණ විට, උපචාර සමාධිය උපදනේය. මෙපමණිනුත් යමෙකුට මේ ධාතු මනසිකාරය සමෘධ නොවෙනම් ඒ තෙමේ කාය ගතා සතියෙහි දී කියන ලද ක්‍රමයෙන් සත්වැදෑරුම් උද්ග්‍රහණ කුශලතාවය ද දශ වැදෑරුම් මනසිකාර කුශලතාවය ද ප්‍රගුණකරගණ මෙ දෙසාළිස් ධාතුහු පංචක වශයෙන් ද ජක්ක වශයෙන් ද බෙදගණ අනුලෝම පටිලෝම වශයෙන් මුල සිට අගට අගසිට මුලට කියා හිතා ප්‍රගුණ කරගණ එකෙකී කොටස වර්ණ වශයෙන් සටහන් වශයෙන් පිහිටා තිබෙන දිශා වශයෙන් ස්ථාන වශයෙන් සීමා වශයෙන් මෙනෙහි කරන්නේය. අනතුරුව වචනාර්ථ වශයෙන් සාමාන්‍යාර්ථ විශෙෂාර්ථ වශයෙන් ද මහත්ව හටගැණීමාදී මහා භූත වශයෙන් අසත්‍යවූ සත්‍ය ප්‍රතිරූප වශයෙන් ද මිනිස්, තිරිසන්, දෙවි, ගැහැණු, පිරිමි, උස්, මිටි, ගස්, වැල්, කඳු ආදී ආකාරවලින් සිට පෙණෙනු විනා පරමාර්ථ වශයෙන් සැබෑවක් නම් ධාතු බව හැර නැත්තේම ය යි යනාදී වශයෙන් ද තථ්‍ය නොවූ තථ්‍ය ප්‍රතිරූපතාවය ද මේ මේ ධාතුව මේ මේ ක්‍රියාව කරන්නේ ය යි කෘත්‍ය වශයෙන් ද කලාප වශයෙන් ද හෙවත් කර්මයෙන් හටගන්නා චිත්තයෙන් හට ගන්නා ඍතු ගුණයෙන් හටගන්නා ආහාරයෙන් හටගන්නා ධාතු මේ මේ යයි වෙන් කිරීමෙන් ගුණ වශයෙන්, අවිනිබ්භොග වශයෙන් වෙන්කර නොගැණීමෙන්, ප්‍රත්‍යය වශයෙන්, ලක්ෂණ වශයෙන්, සභාග විසභාග වශයෙන් පළමු ධාතු දෙකොටස ගරුක තාවයෙන් ද දෙවන දෙ කොටස ලැහැල්ලුකමින් ද සමාන හා එකිනෙකට හැම අතින්ම අසමාන සැටි ද—නානත්වය-එකත්වය වශයෙන් ද සංග්‍රහ වශයෙන් ද දඬු රූකඩය නූල් ඇදීමෙන් ක්‍රියා කරන්නාක් මෙන් පවත්නා සවභාවය ද විශෙෂ ක්‍රම දශයකින් මෙනෙහි කටයුතුය. එසේ සලකන්නහුට සත්ව පුද්ගල ජීව සංඥ පහවන්නේය. ජීවයක් ආත්මයක් නැත. නාම හා රූප යන ධාතු පමණක් ම ඇත්තේය. මේ නාම රූපයෝ තණ්හාව මුල්කර ඇත්තාහුය. තණ්හාව දුරලීම දුක දුරු කිරීමයි. දුක නැති කිරීම නිර්වාණයයි. ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගය නිර්වාණ ගාමිණී ප්‍රතිපදවයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම සංඥවන් පහළ වෙති. මෙ සේ දුක් නැති කිරීමේ යෙදුනෝ වේ. ඉන්ද්‍රිය, බල, බෝධ්‍යාංග ධර්මයන්හී මැනවින් පිහිටියේ වේ. මේ ධාතු කර්මස්ථානයේ යෙදුනහුගේ සිත සංස්කාර නිමිත්තෙන් නැගී සිටී. අමත ධාතුව සාත් සාත් කරගණී—

ආහාර පිළිකුල් සංඥව

ආහරණය හෙවත් ඉපදවීම කරණ දෙය ආහාර නම් වේ. ඒ වනාහී කටින් සපා ගිලිනා කබළිංකාර නම් ආහාරය, ස්පර්ශාහාරය, මනො සංචෙතනා ආහාරය, විඥ්ඥණ ආහාරය යන සතරයි, මොව්හු කුමක් ආහරණය ඉපදවීම කරත්ද ? කබළිංකාර ආහාරය ආයු වර්ණ සැප බල වර්ණ ගන්ධ රස ඕජා යන අට වැදෑරුම් රූප උපදවයි. ස්පර්ශාහාරය සැපදුක් මැදහත් වේදනාවන් ආහරණය කෙරේ, මනො සංචෙතනා හාරය කාම රූප අරූප තුන්භවයෙහි පිළිසිඳ ගැණීම ගෙණදෙයි විඥ්ඥණාහාරය පිළිසිඳීමේදී නාමරූපයන් ආහරණය කරයි. මෙසේ ආහරණය කරණ බැවින් ආහාර නම් වෙති. එහි භයනම් කුමක්ද ? කබලිංකාරාහාරයෙහි නිකන්තිය හෙවත් තෘෂ්ණාව භය වේ. ඵස්සාහාරයෙහි උපගමනය ලොල්වී ම භය වේ. මනො සංචෙතනාවෙහි ඒ ඒ තැන ඉපදීමේ භයද විඥනාහාරයෙහි පිළිසිඳ ගැණීම භය වේ. මෙසේ භය වශයෙන් ම සරිලන උපමා යෙදිය යුතුය. කබලිංකාරාහාරය සිය පුතුගේ මස් කෑමටද ඵස්සාහාරය සම්රහිත ගවයෙකු ගේ ද මනො සංචෙතනාව ගිනිඅඟුරු වළකද විඥ්ඥණාහාරය යවුල් අඩ යටින්වද උපමා කටයුතුය.

මෙසේ මේ සිව් ආහාරයන් අතුරෙන් කබලිංකාර ආහාරය අසිත නම් සපා ගිලින බත් ව්‍යඤ්ජන ආදිය පීත පානය කරණ වර්ග ඛායිත කැවිලි වර්ග සායිත නම් උරාබොන උද්දඹු මීවද පලතුරු ආදිය යන කබලිංකාර ආහාරයම මෙහිදි පිළිකුල් වශයෙන් ගත යුත්තේය. ඒ කබලිංකාරාහාරය පිළිකුල් කිරීම වශයෙන් උපදනා සංඥව ආහාර පටික්කූල සඤ්ඤ නම් වේ. එය භාවනා කරණු කැමති යොගාවචරයා විසින් පස් ආකාරයකින් පිළිකුල් බව මෙනෙහි කටයුත්තේය. පළමුවෙනි ක්‍රමය ව්‍යාපාර වශයෙන් සැලකීමයි. එය සොයා යාම සෙවීමාදි වශයෙනි. එනම් මේ උතුම් සස්නෙහි පැවිදිවූවහු මුළුරැයම බණ අසා කියා භාවනා කොට අළුයමින් නැගී චෛතිය බොධි මාලකාදියෙහි වතාවත් කොට පැන් සපයා කුටිය ඇමඳ පිසදමා ශරීරකෘත්‍ය කොට, වාඩි වී විසිතිස් වරක් කමටහන මෙනෙහිකොට නැගිට පාත්‍රය ගෙණ ජන සම්බාධ නැති අතිසය විවේක සැප ඇති සෙවන හා ජල පහසු ඇති පිරිසිදු සිත්කලු තාපසාරාමය ටිකවේලාවකට නමුත් අත් හැරයන්ට වීම උතුම් විවේකය හැරදමා අමු සොහොණ කරා යන හිවලෙකු සේ ආහාර සොයා යා යුතුය. ගමන පිටත්වූ පසු තම ▫යනසුන කිලුටු වී යන්නේය. එද ආහාර සෙවීමේ වරදය. කණු කටු කුණු කසල පාගමින් සංචාරය කරන්ට වීමද ආහාරයේ දෙෂයය. වළ ගොඩලි ආදි නොසම මාර්ගවල ගමන සැඩඵරුස සතුන්ගෙන් පීඩාදිය නිසා ආහාරය පිළිකුල් කටයුතුය. පරියෙසන වශයෙන් සපයා සකස් කරගණ වැලඳිය හැකි නමුත් කබල අතට ගෙණ ගෙදෙරක් පාසා යන යාචකයෙකු සේ වචනයෙන් නොඉල්ලා දෙරක් පාසා අහරක් දෙන තුරු බලා සිට සොයා ගත යුතුය. අගල් ගොඩලි මඩවගුරු පාගා ගෙදෙරකට පැමිණියද ගෙවැසියෙකු දකිනතුරු නිසොල්මනේ හුහ වේලා හිටිදරණයේ ඉන්ට වීම එසේත් සමහරු නිසරු බස් කියා නොදී සිටිති. පිණ්ඩපාතය දෙන අයද පිළුණු ආහාර, පරණ කැවිලි ඉදුනු නොයිදුණු උණු සිසිල් අහර ආදිය දෙති. සමහරු නුදුටුවා සේ ඉවත බලා සිටිති. උණු සිසිල් බත් ව්‍යඤ්ජන කැවිලි පලතුරු ජාති එකට ඇණී බලු ඔරුවකලූ සුනඛ ආරයක් මෙන් මිශ්‍රව පිළිකුල් වන්නේය. පරිභොග වශයෙන් මෙසේ වූ මේ මිශ්‍රක ආහාරය වළඳන්ට පටන් ගන්ට පළමු නම් සිල්වත් අයෙකුට උවත් දිය හැකිය. වළඳන අදහසින් පාත්‍රයට අතදැමූ පසු ඇඟිලි වලින් මැඩීමේදී අත දඩියට තද වියලි අහර මෙලෙක් ව පොඩිවන්නේය. අතින් ඇණු පමණින් පැහැය සුවඳ වෙනස් වූ ආහාරය යට දත් නැමති වංගෙඩියේ ලා උඩ දත් මෝලින් කොටා දිව නැමති හැන්දෙන් පෙරළා අණා කෙළ නැමති දිය ඉස හකුවල දත් අතරෙහි මිරිකී තැවරෙමින් අශුචියක්ම වී උගුරු නළය දිග කුසට රොක්වන්නේ ය. මෙසේ ආහාර පරිභොගයම පිළිකුල් වන්නේය. ආසය වශයෙන් ඉහත සඳහන් පරිදි පාගා පදම්කර ගත් මැටිරුසක් හුණ දඹු සිදුරක පුරවන්නා සේ ආමාසය නම් දලගයක පිරෙන්නේය. බුදු පසේ බුදු සක්විති උතුමන්ගේද පිත් සෙම් ලේ සැරව යන සතරින් එක් වගයක් රැස්ව සිටි තැනකට වන්නේය. මඳ පිණැතියන්ට ඒ සතර වගය ම රැස්ව සිටිනා තැන මේ ආහාරය වැටෙන්නේය. පිත් අධිකව මුසුවී නම් මීතෙල් මණ්ඩිය සමග ඇණුවා සේ පිළිකුල්ය. සෙම හා වැඩිය මුසුවී නම් කැලිය නාපිරිත්ත කොළ යූෂයෙන් ඇණුවා වැනිව පිළිකුල් වන්නේය. පූයාසය මුසුවී නම් කුණු මෝරුදිය මිශ්‍රකළා සේද ලෝහිතාසය මිශ්‍ර වී නම් ගුරු සායම් තැවරුණා සේ ඉතා පිළිකුල් වන්නේය.— නිධාන වශයෙන් මෙසේ ආමාසයට ගොස් පිත්, සෙම්, ලේ, හැරව මිශ්‍ර වූ පසුද රන් රිදී මැණික් බඳුනක තැන්පත් වන්නේ නොවේ. අනුභව කරන්නාගේ වයසේ පමණට පරණ නොසේදූ අසූචි වළක වැටෙන්නේය. පක්වාසය අවුරුද්දක් පිරුණු පුද්ගලයා ගේ අවුරුද්දක් පරණ අසූචි වළකි. අසූ අනූ වයස් ඇති යන්ගේ අසූ අනූ අවුරුදු ශුධ නොකළ පැරණි අසූචි ගොඩවල් වැනිය. මෙවැනි අසූචි වළකට අනාලයව ඉවත දමන කසලක් වැනි යයි සැලකීම නිධාන වශයෙන් පිළිකුල් බව සැලකීමයි. නො පැසුණු පැසුණු වශයෙන් යම්කිසි අහරක් ආමාසයට ගොස් මනා පැසී සිටින අතර තද ගණඳුර ඇති නොයෙකුත් කුණු ගඳ ඇති වායුවෙන් පිරුණු ඉතා දුර්ගඳ පිළිකුල් තැනක තද නියඟ කාලයක සැඩොල් ගම් දෙර ගවර වළකට තද වැසි දිනක පිරී තිබුනු දිය සිඳී නිල් පැය පෙණ බුබුලු දමමින් පැසෙන්නේය. ඒ අහර කර්මජ

තෙජො උණුසුම නම්වූ ශරීර උණුසුමෙන් පැසෙන්නේ මෙළෙක් වී ඇඹරී ඉතා පිළිකුල් දුගඳ හමන දෙයක් බවට පෙරලී අධොමාර්ගයෙන් නික්මෙන්නේය. ඵලවශයෙන් මෙලෙසින් පැසෙන මේ ආහාරය කෙස් ලොම් නිය දත් ආදී කුණු කොටස්ම උපදවන්නේය. ආහාරය නොමනාව පැසුනේ නම් දද, කැසීම්, කුෂට, කිලාය, අතීසාරාදී රෝග ජාති උපදවයි.—මෙසේ ආහාරයාගේ මනාව පැසීමේ හෝ නොමනාව පැසීමේ ප්‍රතිඵලය අනිටු අසැප දැය ඉපදවීම බැවින්ම පිළිකුල් කටයුතුය. නිසසෑන වශයෙන්, එකම දෙරටුවකින් ඇතුල් කරණ ආහාරය පැසී වැගිරෙණ විට ඇස්වලින් කබ, කදුලු නමින්ද කන්වලින් කරාදු වශයෙන්ද, දත් මැලියම ආදී නම්වලින් නව දෙරකින් වැගිරෙන්නේය. ආහාර අනුභව කරණ විට පිරිස මැද දී අනුභව කරණමුත් මළමූත්‍රාදී වශයෙන් පිටකරණ විට පිළිසත් හුදකළා තැනකට යා යුතුය. පළමු දවසේ අනුභව කරද්දී තුටු පහටු සිතින් සිනා සෙමින් අනුභව කළ ආහාර දෙවෙනිද පිටකරණ විට තනිව මූණ පැහිරිකර නාසය වසා ගණ පිළිකුලින් පිටකරන්නේය. නවදෙරින් අසූචි වැගිරීම් වශයෙන් පිළිකුල් කට යුතුය. තැවරීම් වශයෙන් මේ ආහාරය අනුභව කරද්දී අතේ ඇඟිලිවලත් තොල්හකු ආදී යේ තැවරෙයි—සෝද පිසදමා අත ශුද්ධකර ගතයුතු වේ — කුස තුළ පැසෙන අතරද බත ඉදෙද්දී දහය්‍යා කුඩු ඇඟි ආදිය උතුරා පිටවන්නේ හැලි මුව විටේම තැවරෙන්නේය. එසේ මුළු සිරුර පුරා පැතිර කායාගනියෙන් පෙණ නගමින් පැසී උතුරමින් දත් මැලියම, තලුතොල් ආදියේ කෙළ වශයෙන් කබ, කරාදු, සොටු, ආදිය, මුත්‍ර අසූචි වශයෙන් වැගිරෙන්නේය. දිනපතා මේ දෙරටු සෝද පිරිසිදු කටයුතුය. මෙසේ අසූචි තැවරීම් වශයෙන් පිළිකුල් බව මෙනෙහි කටයුත්තේය—

මෙසේ ඉහත සඳහන් ක්‍රමවලින් ආහාරය පිළිකුල් කොට සලකන යොගාවචරයාට උපදනා පිළිකුල භාවිත බහුලීකෘත වශයෙන් වැඩිදියුණු කරගත යුතුය. එසේ භාවිතා කිරීමෙන් නිවරණ යෝ යටපත් වෙති. කබළිංකාරාහාරය සවභාධර්මයක් නිසා අර්පණා වට නොපැමිණ උපචාර යෙන්ම හිත සමාධිගත වේ. පිළිකුල් බව මෙනෙහි කිරීමෙන් ම සඥව බලවත් වේ. ආහාරයේ පිළිකුල් සඥව වැඩීම නිසා රෂතෘෂ්ණාව නැතිවෙයි. රෂ තණ්හාව දුරුවීමෙන් පඤ්චකාම ගුණික රාගය ප්‍රහීණ වන්නේය. ඔහු සිව් පසය පරිභොග කරන්නේ කාන්තාරය පසුකර ගැණීමට සිය පුතුගේ නොයෙක් අතින් පිළිකුල් මාංශය අනුභව කිරීම ලෙසය. මේ විරාගී ප්‍රතිපදව නිසා මාර්ග ඵලාධිගමය සිදුවන්නේය. ඉදින් ධ්‍යාන අභිඥමාර්ග ඵලයන් උපදවා ගන්ට බැරි වුවොත් මරණින් පසු සුගතිගාමී වීම මෙහි අනුසස් වන්නේය—

අරූපාවචර සමාපතති සතර

අරූපාවචර සමාපත්ති සතරකි. මේ සතර ධ්‍යාන රූපය හා ආරම්මන රූපය හැර අරූප අරමුණෙහි උපදවන සමාපත්ති බැවින් අරූප සමවත් නම් වෙති. කසිණ මණ්ඩලය රූප නම් වේ. කිසුණු ඉගුළු අහස හෙවත් කසිණාරම්මනය වූ මණ්ඩලයෙන් වැසී තිබුනු අහස අනන්ත ආකාශයයි. අනන්තාකාසයයි පැවති සංඥව අනන්තාකාස නම් වේ. අනන්තාකාස සංඥව වැඩීමෙන් උපදනා සමාධිය ආකාශානන්තායතන නම් වේ. එහි අභාව සංඥවම විඤ්ඤාණ යයි—.විඤ්ඤාණය අනන්ත ය යි ගත් හිතින් උපදවාගත් සමාධිය විඤ්ඤාණනන්තා යතන යයි. ඒ විඥනයාගේ අභාව මාත්‍රය බලමින් කිසිවක් නැතැයි ගන්නා ලද සංඥවෙන් උපදනා සමාධිය ආකිඤ්චඤ්ඤයතන නම් වේ. ඊට ආරම්මණ වූ සඤ්ඤවගේත් අභාවය සඤ්ඤ හෝ අසඤ්ඤ නොවේ. සංඥ හෝ අසංඥවෙන් උපදනා සමාධිය නෙව සඤ්ඤ නාසඤ්ඤ නම් වේ. මේ අරූප සමාපත්ති උපදවනු කැමති යොගී තෙමේ පළමු කොට රූපයෙහි දෙස දක්නේය. රූපය මුල්ව ඇති වන දඬු මුගුරු ගැණීම් සණ්ඩු දබර කෝලාහල වාද විවාදයෝ රූපය නැති කල නැත්තාහු ය යි සලකා ගණී. ඇස් රෝග, කණේ, නාසයේ, දිවේ රෝග ආදී රෝග

දහස් ගණනකට නිවාස ය යි රූපයේ දෙසුත් ඒ රූපය පිටු දකිමෙ ආසාවත් ඇතිව රූපාවචර චතුර්ථධ්‍යාන රූපයත් ආරම්මණ සංඛ්‍යාත කසිණ මණ්ඩල රූපයත් ඉක්මවනු කැමති වෙයි.

පළමු වෙනි අරූප සමාපත්තිය වන ආකාසානඤ්චායතනය උපදවනු කැමැත්තේ එය සාන්ත ප්‍රණීත බව හොඳින් සලකා කසිණ මණ්ඩලය තමා කැමති තරම් මහතට පතුරුවා එයින් වැසුණු පමණ ආකාශය අනන්ත ය යි සලකා කසිණ මණ්ඩලය ඉවත් කරන්නේය. මණ්ඩලය ගැණ කල්පනා නොකොට ඉන් වැසී තිබුණු අහස කිසුණු ඉගුලූ අවකාසය යි කියනු ලැබේ. කිසුණු ඉගුලූ අහස අනන්තය යි නැවත නැවත සිතන විට නීවරණ පස යටපත් වෙති. සිහිය එළඹ සිටී. උපචාරයෙන් ම හිත සමාධි ගත වේ. ආකාසානන්තායතනයට පැමිණෙයි—මෙ විට ඒ යෝගාවචර තෙමේ ධ්‍යාන රූපය ආරම්මණ රූපය පිළිබඳ හැඟීම් හැම අයුරින් ම ඉක්මවා රූප කොට්ඨාශයන් වන අභ්‍යන්තර ඇස, කණ ආදී ආයතනයන් රූප ශබ්දදී බාහිර ආයතනයන් එකට ගැටීමෙන් උපදනා පටිස සංඥවන් සිතට නොගෙණ හැර නානා විධ ආතම සංඥවන් මෙනෙහි නොකර ආකාසය අනන්ත ය යි ආකාසානන්තායතන සමාධියට පැමිණ වාසය කරයි—

දෙවන අරූපාවචර සමාපත්තිය නම් විඤ්ඤාණනන්තායතන ය යි. කිසුණු ඉගුලූ අහස විසය කොට පැවති සිත හෙවත් කසිණ මණ්ඩලය තිබුණු ස්ථාන වන අවකාස අනන්ත ය යි කියා ගත් හිත විඤ්ඤාණ නම් වේ. ඒ විඥනය අනිත්‍යය අනන්ත ය යි ගත් පිරියම් සිතින් උපදනා සමාධිය විඤ්ඤාණ අනන්තායතන ය යි කියනු ලැබේ. විඤ්ඤාණ අනන්ත ආයතන යන වචන තුන එකතුව් විඤ්ඤාණඤ්චායතන යන නාමය සෑදී ඇත්තේය. ආයතන යනු රැස්ව සිටින තැන හෝ උපදිනා තැන යන අදහසයි—මෙ විඤ්ඤාණඤ්චායතන සමාධිය භාවනා කරණු කැමති යෝගී තෙමේ ආකාසානඤ්චායතනය මනාව පුහුණුකර එය රූපයට ආසන්න බැවින් නොමනා ය යි සලකා විඤ්ඤාණඤ්චායතනය සාන්ත ප්‍රණීතතාදී ගුණ සලකා කසිණුගඝාතාකාසය විසය කොට පැවති විඤ්ඤාණය අනන්තය යි මෙනෙහි කරන්නේය. නැවත නැවත මෙනෙහි කරමින් ආසේවනය කරන්නේය. මෙසේ එම නිමිත්තෙහි හිත හසුරුවන්නාහට නීවරණ පස යටපත් වෙති. සිහිය එළඹ සිටී උපචාරයෙන්ම හිත සමාධිගත වේ. ඒ නිමිත්තම ආසේවිත භාවිත බහුලීකෘත කෙරෙයි. ආකාසවිසය වූ විඥනය උපදී සවීකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්ත ය යි දියුණු කළ සිතින් උපදනා සමාපත්තියට පැමිණ වාසය කරයි. මෙ දෙවෙනි අරූපාවචර සමාපත්ති ය යි.

තුංවෙනි අරූපාවචර සමාධිය නම් ආකිඤ්චඤ්ඤායතනයයි. විඤ්ඤාණයාගේ අභාව මාත්‍රය සලකා කිසිවක් නැත්තේයයි සිතීම අකිඤ්චන නම්. අකිඤ්චන භාවමාත්‍රයෙන් ලබාගත් සමාධිය ආකිඤ්චඤ්ඤායතන නම් වේ. මෙ සමාපත්තිය උපදවනු කැමති යෝගාවචර තෙමේ විඤ්ඤාණඤ්චායතනයෙහි බලවත් ප්‍රගුණතාව ඇතිව ආසන්න ආකාසානඤ්චායතනතාදී විඤ්ඤාණඤ්චායතනයේ ආදීනව සලකා ආකිඤ්චඤ්ඤායතනයේ සාන්ත ප්‍රණීතතාදී ගුණ මෙනෙහිකොට අකිඤ්චනතාව විවිත්ත ශූන්‍ය භාවය මෙනෙහි කරන්නේය. ශූන්‍යයයි ශූන්‍යයි කියා හෝ නත්ථිකිඤ්චි කියා හෝ විවිත්තය විවිත්ත යයි කියා හෝ පරිකර්ම කටයුතුය. නැවත නැවත ආභොග සමන නාහාර කටයුතුය. මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරන්නාහට පචනීවරණය යටපත් වෙති. සිහිය එළඹ සිටී. උපචාරයෙන් හිත සමාධිගත වේ. ඒ නිමිත්ත ආසේවනය කරයි. මහග්ගත විඤ්ඤාණයාගේ ශූන්‍ය විවිත්ත ආකිඤ්චන සවභාවයෙහි සිත පිහිටයි. මෙ විඤ්ඤාණය හිස්යයි නාස්තික මාත්‍රයම දකී ඒ තෙමේ සවීකාරයෙන්ම විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා සුඛ ජීව ශාස්වතාදී කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාධිය උපදවා ගණ වාසය කරයි.

සතර වැනි අරූපාවචර සමාධිය නම් නෙවසඤ්ඤා නාසඤ්ඤා යතනයයි. කිසිත් නැතැයි අභාවමාත්‍රය බැවින් නේවසඤ්ඤා යයිද අභාවය අරමුණු කළ සංඥව පවතින බැවින්

අසඤ්ඤ නොවීයයි ද සැලකිය යුතුය. විඤ්ඤාණ සංඥව නැති නිසාත් අභාවාරම්මණ සංඥව ඇති නිසාත් සංඥත් නොවූ අසංඥත් නොවූ සමාධියයි නම් කරණ බව දතයුතුය. සංඥව ඇතැයි ගැණීමට හෝ නැතැයි දැමීමට නොහැකි සියුම් සංඥවක් ඇති බව පෙන්වයි. මේ සතරවන සංඥ විරාග අරූප සමාධිය භාවනා කරණු කැමති යෝගාවචර තෙමේ ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය මනාව ප්‍රගුණ වී ආකිඤ්චඤ්ඤායතනය සමීපගත රූපාවචර ආකාස විඤ්ඤාණාදි පස මිතුරන් ඇත්තේය යනාදි ආදීනව සලකා මේ සසංඥත් නොවූ අසංඥත් නොවූ සමාධිය සාන්තය ප්‍රණීත යයි අනුසස් දැන අභාව මාත්‍රයම මෙනෙහි කරන්නේය. මෙසේ පුන පුනා අභාව නිමිත්ත මෙනෙහි කරන්නාහට නීවරණයන් විෂ්කම්භණය වී සිහිය එළඹ සිටින්නේය. උපචාරයෙන්ම හිත සමාධිගත වේ. ඒ තෙමේ ඒ නිමිත්තම පුහුණු කරයි. නැවත නැවත වඩයි. විඤ්ඤාණය ප්‍රහීණ වී මෙන් ආකිඤ්චඤ්ඤායතන සිතමෙන් නේවසඤ්ඤා නාසඤ්ඤා සිත උපදී. ඒ යොගී තෙමේ සර්වාකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නේවසඤ්ඤා නාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරන්නේය.

අටතිස් සමාධි කර්මස්ථාන පිළිබඳ භාවනා ක්‍රමය මෙතෙකින් නිමියේය.

9 පරිච්ඡේදය

පඤ්ච අභිඥා ඥාන

සමාධි භාවනාවෙහි මනා අභ්‍යාසය ලැබූ යෝගියා විසින් අභිඥා නම් අතිමානුෂක ඥාන ගුණ විශේෂය උපදවා ගතයුතුය. ඉර්ධිවිධ ඥානය (දිව කණය,) දිබ්බසොතය (පරසිත් දන්නා නුවණය.) පෙර ජාති සිහිකරණ නුවණය දිව්‍යචක්‍ෂු (දිවඇස) යන මහානුභාව ඇති අභිඥා නම් විශිෂ්ඨ ඥාන පසය—

ඉර්ධිවිධ ඥානය

සිතුදේ ඉටුවීමේ බලය ඉර්ධිය නම් වේ. ශරීරය ලොකු කුඩා කිරීම් ආදී දශ වැදෑරුම් විශෙෂ ක්‍රියා දක්වන බලය හෝ මහිමය ඉර්ධියයි කියනු ලැබේ. මෙකී ඉර්ධිය කී ආකාරද? කවරෙකුට ඒ බල ලැබිය හැකි ද ?. ඉර්ධිබල උපදවා ගන්නේ කෙසේද ?. මේ ප්‍රශ්න කීපය තොරාගත්විට දැනීම යහපත්වේ. අධිෂ්ඨාන ඉර්ධිය, විකුර්වණ ඉර්ධිය, මනෝමය ඉර්ධියය සංක්‍ෂෙපයෙන් තුන් ආකාරද පුණ්‍යවත් ඉර්ධිය කර්ම විපාකජ ඉර්ධිය ආදී දශ වැදෑරුම්ද වේ. රූපාවචර සතර ධ්‍යානයන් ඉපදවූ යොගාවචරයා විසින් සතරවැනි ධ්‍යානයේ අතිපුහුණුවෙන් මේ ඉර්ධි විශෙෂය ඉපදවිය යුතුය. මෙ සමාධි භාවනා වේ ප්‍රවීණතාව ලැබූ භික්‍ෂුතෙමේ කුසලච්ඡන්දයෙන් හා චිත්තෙකග්‍රතා ප්‍රධාන උත්සාහයෙන් උපදවන ඉර්ධිපාදය උපදවයි. වියර්‍ය ප්‍රධාන චිත්තෙකාග්‍රතා යුත් සමාධිය, චිත්තය ප්‍රධාන චිත්තෙකාග්‍රාතා සමාධිය, වීමංසා ප්‍රධාන චිත්තෙකාග්‍රතා සමාධිය යන සතර ඉර්ධිපාද උපදවන යෝගාවචරයාට ම ඉර්ධි ආදී අභිඥාවෝ පහළවෙති. අධිෂ්ඨාණ විකුර්වණ ඍඬි වයෙහි එකිනෙකට ඇති වෙනසනම් අධිෂ්ඨාණ ඉර්ධියෙන් පියවි වෙසස අත්නැර යම්තරා විශෙෂ හාස්කමක් පෑමය. විකුර්වණ ඍඬියෙන් පියවි වේසය හැර අමුතු වෙස් මවා ගැණීමාදිය කිරීමයි—ප්‍රකීර්ණක වසයෙන් මේ මාහැඟි බලමහිමය උපදවා ගැණීමට උපකාරවන ගුරුකම් සවල්පයක් දක්වා ඇත. නිර්මිත කළ දෙය මෙතෙක් කල් පවතී වයි ඉටාගත් කාලය අවසන් වේ. පළමු කාල සීමාවක් නොකර කළ මැවීම හිත ඉවරවනු සමඟ ඉවර වන්නේය. ඉද්ධබලයෙන් මවන හැම දෙයම ජීවිතින්ද්‍රිය රහිතය ජීවිත ඉන්ද්‍රිය සහිත සතෙකු හෝ දෙයක් මැවිය නොහැක. මේ ඉඩිවිධඥානය උපදවන්ට ආරම්මණ නවයකි එනම් පරිත්ත, මහග්ගත, නවත්තබ්බ, අතීත, අනාගත, පච්චුප්පන්න අජ්ඣත්ත, බාහිර, අජ්ඣත්තබාහිර යන නවාරම්මණ වෙති.—

දිබ්බසොතඥානය—දිවකණ

මේ දිව්‍ය ශ්‍රොතස හෝ ඥානය උපදවනු කැමති යෝගි තෙමේ සතර ඍඬි පාදයන් මැනවින් පුහුණුවී සිටිය යුතුය. රූපාවචර සතරවන ධ්‍යානයට සමවැදීමේ ප්‍රගුණ බව අවශ්‍යය. සිය ශ්‍රොතස සොතප්පසාදරූපය නොපලුදුව නීරෝගව තිබිය යුතුය. මෙසේ පුහුණු කළ ඍඬි පාද ඇති සිව්වෙනි ධ්‍යානයට සමවත් නීරොගි කණ ඇති යෝගී තෙමේ ක්‍රමයෙන් ටිකින්ටික ලඟ හා දුර මිහිරි අමිහිරි දිශා අනුදිශාහිවූ ශබ්ද ඇසීමට කණ යොමු කරන්නේය. මෙලෙසින් පුරුදු කරමින් ශ්‍රොතධාතුව ටිකින් ටික පිරිසිදු වෙමින් දෙවියන්ගේද මිනිසුන් ගේද ශබ්ද අසන්නට පටංගණී. අජ්ඣත්ත ශබ්ද වශයෙන් සිය ශරීරය තුළ සිටින පණුවන්ගේ ශබ්දද අසනවා ඇත. ආදි කම්මික යෝගාවචරයනට තම කය තුළ වසන

පණුවන්ගේ ශබ්ද ඇසිය නොහැකිය. ඔහුගේ පියවිකණින් ඇසිය නොහැකි හිං ශබ්ද ද ඇසිය නොහැක. ටිකින් ටික පුහුණුව ලබා සියලු ශබ්දයන් අසන්නේය. මේ දිව්‍යමය ශ්‍රොතස, ඉපදවීමට පරිත්ත, පච්චුපපන්න බහිධා යන ආරම්මණ තුණක් වෙති. පියවි කණ නැසුණුවිට දිව්කණද නැසෙන්නේය. බාහිර තවුසකුට බුදුසව්වකුට සහස්සි ලොක ධාතුවෙක්හි දෙව්මිනිස් ආදීන්ගේ ශබ්ද ඇසිය හැකි වේ. පසේ බුදුන්ට දසදහස් ලෝදහිද සම්බුදු උතුමාට අනන්ත පරියන්ත ලෝක ධාතුන් හි ද ශබ්ද ඇසිය හැකි වෙති.

පර සිත් දන්නා නුවණ

අනුන්ගේ සිත් දැනගන්නා නුවණ උපදවනු කැමති යෝගාවචර තෙමේ රූපාවචර සතරවැනි ධ්‍යානය මැනවින් පුහුණුව සිටිය යුතුය. ආලොක කසිණය වඩා දිවැස ද ලබා සිටින්නකු විය යුතුය. සතර ඍධිපාදයන් ප්‍රගුණකර තමසිත පිරිසිදු කර ගන්නේය. අනතුරුව ආලොක කසිණය භාවනා කොට චතුර්ථධ්‍යානයට සමවැදී හෙමින් හෙමින් අනුන් සිත් සැටි දැනගන්ට වෑයම් කටයුතුය.

පළමුව තම කය ආලෝකයෙන් පුරවා ගන්නේය. අනතුරුව දිවැසින් හදවතෙහි පැහැය හෝ මනොමනොවිඥනයන්ට ආධාර ජීවරුධිරයාගේ පැහැය බලන්නේය. ඒ පැහැයේ අනුසාරයෙන් හිත් කියන්නේය. හදවතෙහි පවත්නා ලෙය, සොමනස පවත්නා විට දී කිරේ හෝ වෙඩුරේ පැහැයද, දෙමනස ඇති විට අරුණුවන්— (දම්) පාටද, මැදහත් බව පවතිනවිට මී පැණි සමාන පාටද ලෝබ සිත් ඇතිවිට කහපාටද ද්වෙෂ සිත් ඇතිවිට කලුපැහැයද මෝහ සිත් ඇතිවිට බොරමඩ පාටද සැදැහැසිත් ඇතිවිට හෝ නුවණ ඇතිවිට පවිත්‍රවද පවත්නේය. රතුපැහැයනම් ඉදුනු නුගපලයේ පැහැයයි. කලුව ඉදුණු දඹපලයේ පැහැයයි, පිරිසිදු පැහැය තලතෙල් පැහැය වැනි වේ. හිත්වල ආශ්‍රයවූ ජීවරුධිරය එවිට පවත්නා හිතේ හැටියට පැහැය වෙනස් වන්නේය. තම උපදවා තිබෙන කසිණාලෝකය අනිකාගේ හදවතට යවා ඒ එළියෙන් ඔහුගේ හදවතේ පැහැය දැන මෙවිට මෙවිට මේ සිත මොහුට ඇතැයි දැනගන්නේය. පළමුව පැහැය බලා හිත තොරා ගත යුතුය. ටිකින්ටික වැඩිකරමින් පුහුණු කිරීමෙන් හිතේ සරාග, වීතරාග, සදෙෂවීතදෙෂ සමොහ වීත මෝහාදි හිතක් ඇතැයි පැහැදිලිව දැනගන්නේය. මේ චෙතෝපරිය ඥණයට ඉහත සඳහන් ආරම්මන අටක්ම හේතුවේවි—පුථුජ්ජන ඍධි මතෙකුට වීතරාගී උතුමෙකුගේ හිත බැලිය නොහැකිය. සතර අරූපලෝකයන්හී සත්වයන්ගේ හිත ලොව්තුරා බුදුන්ට විනා අන් කිසිවෙකුට බැලිය නොහැක්කේය. බාහිරක හෝ ශාසනික සාමාන්‍ය ඍධිමතෙකුට සහස්සි ලොකධාතුවක පරසිත් දැක්ක හැක. පසේ බුදුන්ට දසසහස්සී ලෝකධාතුවකද ලොව්තුරා බුදුන්ට ප්‍රමෙයාවක් නැතිවද පරසිත් දතහැකි වේ—

පෙර විසූ කඳ පිළිවෙළ දක්නා නුවණ

පූර්වයෙහි උපන් ජාතීන් සිහිකිරීමේ නුවණ ප්‍රභෙද තුණකින් යුක්ත වේ. පළමු වැන්නෙන් ආසන්න පූර් ජාති සතක් දක්ක හැකි වේ. දෙවැනි නුවණින් ලහලහවූ පූර් ජාති තුදුසක් පෙණෙනු ඇත. තුන්වෙනි පූර්වේ නිවාසානුස්මෘතිය ඍධි පාදයන් ප්‍රගුණ කිරීමෙන් උපදවන්නේය. එනිසා පරිකර්ම සමාධියෙන් උපන් පූර්වේ නිවාසානුස්සති යයි කියනු ලැබේ. අතීතංසඥනයයි සමහරු කියතත් ඒ පුබ්බෙනිවාසානුස්සතිය නොවේ—

පූර් ජාති සිහිකිරීමේ බලය උපදවා ගණු කැමැත්තහු සතර ඍධි පාද භාවනාවෙහි නිපුණව රූපාවචර චතුර්ථධ්‍යානයට සමවැද ගතවූ තමාගේ ජීවිත පරම්පරාව ගැණ සිත යොමු කළ යුතුය. එවේලාවේ පටන් භාවනාව පටංගත් දවස ද එද සිට උපන් දවස දක්වාද මරණය ඊට පළමු සිටි ආකාරය ආදී වශයෙන් ජීවිතය ආපසු බැලිය යුතුය. එසේ තමාගේ යටගියාව සිහියට නොනැගේ නම් නිරුත්සාහී නොවිය යුතුය. කැඩපත ගෙණ මූණ බලන විට නොපෙණේනම් එය ඉවත නොදමා මැද ශුධකරගණ බලන්නේය.

කැඩපත පිරිමැද පිරිමැද මූණබලා ගන්නාසේ නැවත නැවත ධ්‍යානයට සමවැදී සිහි කිරීම පටංගත යුතුය. ආයුෂ්මත් සොභිත ස්ථවිරයන් වහන්සේ පූර්ව ජාති සිහිකරන්ට සමතුන් අතර අග්‍රවේ යයි සලකණු ලැබේ. මෙසේ උපදවන මේ ඤාණයෙන් බාහිරකයෝ (තිත්ථකයෝ) හතළිස්කල්පයක් අතීතය සිහිකරති. එතරම් ඈත අතීතයෙහි තමාගේ හෝ අනුන්ගේ උත්පත්තිය වැඩපිළිවෙල පැහැදිලිව දකගණිති. නමුත් අනුන් පිළිබඳ දැක්ම ඉතා දුර්වලය. සම්මා සම්බුද්ධවරයන්ගේ පුබ්බෙනිවාසඤාණය ඊට බොහෝ වෙනස්ය සෙස්සෝ එතන මොහොතේ සිට ආපසු සිහිකරමින් පිළිවෙළින් බලා යා යුතුය. සම්බුද්ධ වරයෝ උවමනා ජාතියම සර්වසම්පූර්ණ දැකීමක් ඇත්තාහු වෙති. පටිපාටියෙන් සිහි කිරීමක් උන්වහන්සේලාට අවශ්‍ය නැත. බාහිරක හෝ ශාසනික කවුරු නමුත් සතරවන ධ්‍යානයට සමවැදී පූර්ව ජාති සිහිකළ යුතුයි. සම්බුද්ධවරයෝ සමවැදීත් නොවැදීත් සිහිකෙරෙති.—

දිව්‍ය චක්ෂු ඥානය

දිවැස් නුවණ ලැබීමට සතර ඍද්ධිපාදයන්හි ප්‍රවීණතාව ලබා ඇති යොගියා ආලෝක කසිණය උපදවා සතරවැනි ධ්‍යානයට සමවැදීමේ පුහුණුව ලැබ සිටිය යුතුය. තම ඇස ද හොඳින් පෙණීම ඇතිව සිටිය යුතුය. නිරෝගී චක්ෂුප්‍රසාදය නැතියන්ට දිවැස පහළ නොවේ. කණ බිහිරිවූවන්ට දිබ්බසොතයත් එසේම නූපදින්නේය. එසේ උපදිනා අතිමානුසක චක්ෂුෂ දෙයාකාර වේ. කර්මඵල විපාක දිවැසය භාවනා බලයෙන් උපන් දිවැස වසයෙනි. සුචරිත කර්ම බලයෙන් හා විත්තවීර්‍ය බලයෙන් උපදනා දිවැසය කියාය. පළමුවැන්න නිධානගත මඤ්ජුසාදියෙහි අන්තර්ගත රත්නාදිය දැන ගන්නා සහජ බුද්ධි විශෙෂයක් වන අතර දෙවැන්න සතර ඍද්ධිපාද පුහුණුකර ආලෝක කසිණයෙන් සිව්වැනි දුහැණ උපදවා ආලෝක සංඥවෙන් ඉපදවිය යුතු වේ. මෙසේ ආලෝක සංඥවෙන් හිත පුරවාගත් විට රෑ දවල් වෙනසක් හෝ හිත හැසිරවීමට කිසියම් බාධාවක් අවහිර යක් නොපෙණේ. අඳුර කිම බවත් නොදනී, ඔහුගේ ධ්‍යානාලෝකය සූර්‍යාලෝකයට අධික වේ. මෙසේ අනුක්‍රමයෙන් තමාගේ ඇස දිව්‍යචක්ෂුස බවට හරවා ගණී. ඒ යොගී තෙමේ මිනිස් ඇස ඉක්ම සිටි දිවැසින් සැවයන්නාවූද උපදනාවූද හීණවූද ප්‍රණීතවූද මනා පැහැතිවූද නොමනා පැහැතිවූද යහපත් සුවපහසු ඇත්තාවූද, නොසැප පැවතුම් ඇත්තාවූද, කර්මානුකූලව සුවදුක් විඳිනා සියලුසත්වයන්ද සත්වයා පිළිබඳ සියලු දෙය දක්නේය. මෙයාකාරවූ දිව්‍යමය ඇසක් දැකීමක් ලැබූ යෝගාවචරතෙමේ, කෙලෙස් නැසිය යුතුය. කෙලෙස් නැති කර නොගත්තේ නම් දිවැසින් පමණක් නොව සමාධියෙන්ම පිරිහෙන්නේය, සමාධිය පිරිහෙණවාත් සමග කසිණාලෝකය අතුරුදහන් වේ. ආලෝකය අතුරුදහන්වූ පසු කසිණ රූපයද අතුරු දන්වන්නේය. මේ දුරු කටයුතු අකුසලයන් අතර විචිකිච්ඡාව හෙවත් තුණුරුවන් කෙරෙහි ද හේතුඵල ධර්මයන් කෙරෙහිද සැක කිරීම, මිච්ඡානුසසතිය, ථීනමිද්ධ, මාන, පාපවචන, සම්ඵප්පලාප, නානාත්ම සංඥදියයි. මේ ආදී කෙලෙසුන් නුදුරුවී නම්, ධ්‍යානය, රැකගන්ට බැරිවේ. දිවැසත් දුර්වලය, ආලෝකයත් අවිසදය, කයද දුර්වල වේ. මේ දිවැස ලැබීමට අරමුණු පසකි, එනම් පරිත්ත පච්චුප්පන්න, අජ්ඣත්ත, බහිද්ධා, අජ්ඣත්තබහිද්ධා යනුයි. මේ දිව්‍ය චක්ෂුඤාණය ප්‍රභෙද සතරක් වේ. අනාගතය දැනගන්නා අනාගතංස ඤාණය, තමා කළ කර්මයට තමා ඵල විඳිය යුතුය යන කම්මස්සකතා ඤාණය, කර්මානුරූප විපාක දන්නා යථාකම්මූපගඤාණය, කර්ම විපාක ඵල ඤාණය යන සතරය.

ප්‍රකීර්ණක—පොදු සාමාන්‍ය උපදෙස් වශයෙන් යමෙක් අසාගන්ට හෝ දැකගන්ට ආසා වෙන් සමාධිභාවනා කරන්නාට දිවකණ දිවැස පහළ වේ. නොකැමැතියාට නොවේ. අභිඥ එක එක හෝ පසම එක්කෙනෙකුට උපදවත හැක. ලෞකික (පෘථජ්ජනයාගේ) අභිඥවන් ආශ්‍රව සහිතයි—රූපප්‍රතිබද්ධවේ. සෙඛයාගේ අභිඥවෝ කුසල සහගතය. රහතුන්ගේ අභිඥවෝ අව්‍යාකෘතය—අරූපාවචර වාසීන්ට පඤ්චාභිඥ උපදවන්ට නොහැකිවේ.

10 පරිච්ඡේදය

ප්‍රඥාව උපදවා ගැණීම

ප්‍රඥාව කවරි ද ? කවර අර්ථයකින් ප්‍රඥා නම් වේද ? ඒ ප්‍රඥාවෙහි ලක්‍ෂණය සවභාව වැටහිම ආසන්න කාරණය කවරෙද යන මෙ ප්‍රශ්න විසඳා ගත් පසු ප්‍රඥා භාවනාව නිසිසේ කටහැකි වන්නේය. ඒ පිළිතුරු හෝ විසඳිම මෙසේය. ප්‍රඥාව නම් කුසල චිත්තය සමග යෙදුනු විදර්ශනා ඥාණය යි. ඥාණ ප්‍රඥා දෙක සමානාර්ථයි—ප්‍රඥා යයි කියන්නේ කුමණ අර්ථයකින් ද යත්, උසස් අන්දමින් සර්ප්‍රකාරයෙන් දැන ගැණීම යන අර්ථයෙන් ප්‍රඥා නම් වේ. සජානන නම් පැහැ සටහන් පමණ ඇඳිණීම හා විජානන නම් පැහැ සටහන් හා හේතු ඵලයන් දැනිමට අධික වූ ඒ පිළිබඳ දතමනා හැම දෙය ම දැන ගැන්ම පජානන ය යි—ඒ දැනිම ප්‍රඥාවයි. ධර්මයන්ගේ හෙවත් ස්කන්ධධාතු ආයතනාදීන්ගේ ඇති සැටිය දැන ගැණීම ප්‍රඥාවගේ ලක්‍ෂණ ය යි. ස්කන්ධ ධාතු ආයතනාදියෙහි උපදනා මුලාව මෝහ නැමති අඳුර දුරළිම ප්‍රඥා වේ රසය හෙවත් සවභාව ය යි. මුලා නොවීම වැටහිමයි. සමාධිය ආසන්න කාරණ ය යි. ප්‍රඥාවේ අනුසස් කවරේ ද ? ප්‍රඥා තොමෝ එකොළොස් අනුසසක් ඇත්තිය. පැහැදිලි කර දීම ලක්‍ෂණය වේ. නව ලොවුතුරා දහම් නැමති සද්ධර්මයට ඇතුල් කිරීම සවභාවයි. අවිද්‍යා අඳුර නැසීම පියවි ගතියයි. සිව් පිළිසිඹියාවන් ලැබීම ආසන්න කාරණ ය යි. එබැවින් පැහැදිලි වශයෙන් දැන ගැණීම, විශෙෂ වශයෙන් දැන ගැණීම ආද්‍යාත්‍මයන් සෙවීම විමසීම ධම්මවිචය ප්‍රඥාව ය යි කියනු ලැබේ.

ප්‍රඥාව කී ආකාරදයත්, ධර්ම සවභාව ප්‍රතිවේධ කිරීම වශයෙන් එක ආකාරය. ලෞකික ලෝකෝත්තර වශයෙන් දෙයාකාරයි. චින්තාමය, සුතමය, භාවනාමය වශයෙන් තුන් ආකාරයි. ආවය කුසල අපාය කුසල, උපාය කුසල වශයෙන් ද තුන් ආකාර වේ. ආවය නම් කාම රූප අරූප භවතුනෙහි කුසල් පිළිබඳ ප්‍රඥාවයි. අපාය පඤ්ඤා නම් සතර මාර්ග ප්‍රඥාවයි. සිව් භූමියෙහි සිව්ඵලයන්හි ද තුන් භවයෙහි ක්‍රියා චිත්ත ද අව්‍යාකෘත ප්‍රඥාව ද ආවය හෝ අපචය නොවන්නේය. කම්මස්ස කතා ඥානය දශ ප්‍රභෙද සම්මා දිට්ඨිය ද සත්‍යානුලෝම ඥාණය—ස්කන්ධ අනිත්‍යය දුක්ය, අනාත්මය යි සිතීම ද සතර ලොවුතුරා මාර්ග ප්‍රඥාව ද සිව්ඵලයන්හි ප්‍රඥාව ද යි සතර ආකාරවෙති. කාමාවචර කුසල අව්‍යාකෘත සිත් නැමති කාමාවචර ප්‍රඥාවය රූපාවචර ප්‍රඥාවය අරූපාවචර ප්‍රඥාවය අපරියා පන්න ප්‍රඥාවය කියාත් ප්‍රඥාව සතර වැදැරුම් වේ. ආවය පිණිස මුත් අපචය පිණිස නොවන ප්‍රඥාවය. අපචය පිණිසමමුත් ආවය නොවන ප්‍රඥාවය. නිවේදය හා ප්‍රතිවේධය පිණිස පවත්නා ප්‍රඥාවය, නිවේදය ප්‍රතිවේධය පිණිස නොපවතින ප්‍රඥාවය කියා ද ප්‍රභෙද සතරකි—අත්‍ථ පටිසම්භිද ධම්ම පටිසම්භිද නිරුත්ති පටිසම්භිද පටිභාණ පටිසම්භිද ය යි ප්‍රඥා සතරකි—අත්‍ථපටිසම්භිද නම් හේතු ඵල ඥාණයයි. ධම්ම පටිසම්භිද නම් හෙතු පිළිබඳ ඥාණ ය යි. නිරුත්ති ප්‍රති සම්භිද නම් ධර්ම පදයන්ගේ නියම අර්ථය දැන ගැණීමෙ ඥානයයි. ප්‍රතිභාණ ප්‍රති සම්භිද නම් ප්‍රඥා කොඨාසයන් පිළිබඳ ඥාණයයි—සූත්‍ර ගෙය්‍ය වෙය්‍යාකරණ ගාථා උදන ඉතිවුත්තක ජාතක අබ්භූත ධර්ම වෙදල්ල යන නවාඞ්ග ශාස්ත්‍රෑ ධර්මය දැන ගැණීම ද ධර්ම ප්‍රතිසම්භිද ය යි කියනු ලැබේ. දුක්ඛ සත්‍යය පිළිබඳ ඥාණය, සමුදය සත්‍යයේ ඥාණය, නිරොධයේ ඥාණය, මාර්ග සත්‍ය ඥාණ ය යි කියා ද ප්‍රඥාව සතර ආකාර වන්නේය—

11 පරිච්ඡේදය

භවයෙන් මිදෙන උපාය පස

සසර ඉපදීම දිරීම මැරීමෙන් මිදෙනු කැමති යොගාවචර තෙමේ ඉපදීමට හා මරණයට මුල් හේතුව වූ අවිද්‍යා ව හෙවත් නොදත්කම හෝ වැරදි දැනීම තණ්හාව නම් එක්සිය අටක් ප්‍රභෙද ඇති ආසාවය සංයෝජන නම් සසර දුක හා සත්වයා සම්බන්ධ කරවන භව බැඳුම් දශයද දුරුවන් කරගණු කැමැත්තේ නිවැරදි උතුම් ඥානය වූ ආර්‍ය්‍ය ප්‍රඥාව උපදවා ගණු කැමැත්තේ ස්කන්ධ ධාතු ආයතන හෙතු ඵල විභාග ආර්‍ය්‍ය සත්‍ය යන උපාය පස සොයා දත යුත්තේය. එහි ස්කන්ධයෝ නම් රූප වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන ධර්‍ම පසය, හෙවත් සිත, උෂ්ණාදි ප්‍රත්‍යයෙන් විනාස වන සවභාව ඇති ධර්‍ම රාශිය, විඳීම් හැඟීම් ඇතිකරණ ධර්‍ම රාශියය, පැහැ සටහන් හැඳිනීම් මාත්‍රවූ සංඥා නම් ධර්‍ම රාශියය, කුසල් අකුසල් උපදවා එකතැන් කරණ සිතිවිලි සමූහය, විශෙෂ විභාග දැන ගන්නා සිතිවිලි රාශිය යන මේ පස එක් රැස්වූ ගොඩවල් පසක් බැවින් පචස්කන්ධය නම් වේ. එහි රූපස්කන්ධය නම් කවරේද ? පෘථිවි ධාතු ආපො, වායො, තෙජො යන සතර මහා භූත රූප හා මේ මහා භූතයන්ගෙන් හටගන්නා උපාදය රූපය යන මොව්හූය. එහි පඨවි ධාතු ආපො ධාතු තේජො ධාතු වායෝ ධාතු කියා මහා භූත රූප සතරකි. උපාදය රූපය සවිසි වැදෑරුම් වේ. එනම්—චක්ඛායතනය හෙවත් චක්‍ෂු ප්‍රසාදය නම් දෘෂ්ටි මණ්ඩලය, සොතායතන නම් ශබ්ද දැන ගන්නා කන් අඩිය නැමති පසාද රූපය, ඝාණායතන නම් ගඳ සුවඳ දැන ගන්නා නාසයේ ඇතුළත පිහිටි පසාද රූපය, ජිව්හායතන නම් රස දැන ගන්නා දිව මුල රසදිව නම් ප්‍රසාද රූපය, කායපපසාද නම් ඇඟ සම තුළ පිහිටි පහස් දැන ගන්නා පසාද රූපය. අබභ්‍යන්තර ආයතන වන මේ ඇස, කණ, නාසය, දිව, කය යන මොවුන්ට ගොදුරුවන බාහිර රූපය ශබ්දය ගඳය රසය ස්ත්‍රී භාවය පුරුෂ භාවය ජීවිතේන්ද්‍රිය හෘදය වස්තුවය කාය වචීවිඤ්ඤත්ති රූප දෙකය රූපයන්ගේ එකි නෙක අතර පරිච්ඡෙද වශයෙන් පිහිටි ආකාස ධාතුය. රූපයන් ගේ ලැහැල්ලු බව, මොළොක් බව, ක්‍රියාභී බව උල්පතක දිය මෙන් රූපයන් දිරණ දිරණ විට උපදවන උපචය නම් සවභාවය. රූප පරම්පරාව නොසිඳී සම්බන්ධ කරගන්නා සන්තති රූපය, දිරායාම, අනිත්‍යතා නම් අසථිරභාවය සපා නොසපා හෝ ගිලිනා කබලීකාර ආහාරය, ජාතිරූප මිඩ රූප ය යි සවිස්ස සමග තිසක් වන රූප සමූහය සීත සුළං දිය ගිනි ආදියෙන් නැසෙන බැවින් රූප කියාද සමූහය රාශිය යන අර්‍ථයෙන් ස්කන්ධ (නම් වී.) රූප ස්කන්ධය යි කියනු ලැබේ. මඩුලු තුණක් හා පටල සතකින් යුත් මස් ලේ හා වායුව හා සෙමින් යුක්ත වූයේ චක්‍ෂු ප්‍රසාද රූපය යි, යම් චක්‍ෂු ප්‍රසාදයක් නිසා රූප දැකීම සිදුවේ නම් කුඩා සියුම් උකුණු හිසක් පමණ වූ දෘෂ්ටි මණ්ඩලය ප්‍රසාදය වේ. මේ ප්‍රසාද රූප පස උනුනුන්ට ආධාර වෙමින් තම කෘත්‍යය සිඩ කෙරෙති. තිස් ආකාර වූ භූතපාද රූපයන් වෙසෙසා බලන යොගාවචර තෙමේ පස් ආකාරයකින් විමසා බලයි. පළමු සමුට්ඨාන (හට ගැන්ම) මේ රූපයන්ගේ හට ගැණීම කර්‍ම බලයෙන් ද චිත්ත බලයෙන් ඍතු කාලගුණ වශයෙන් ආහාරයෙන් හටගන්නාහු එකිනෙකට සහජාත වශයෙන් උනුනුන්ට උපකාරී භාවයෙන් පවත්නාහුය. කලාප වශයෙන් ඇස පිළිබඳ රූප කොටස් දහය චක්ඛු දශකයයි. කණ පිළිබඳ රූප කොටස් දශය සොත දශකය වේ. ඉන්ද්‍රිය දශකය, භාව දශකය, වස්තු දශකය යනාදී වශයෙන් මේ රූපයන් අතුරෙන් මෙතෙක් කර්‍ම බලයෙන් හට ගණිති, මෙතෙක් චිත්ත සමුඪාණ යි මෙපමණක් කාලගුණය නිසා හටගන්නාහුය මෙතෙක් ආහාර බලයෙන් හට ගණිතැයි විමසා බලයි. ගඟක දිය පහර මෙන් ද පහන් දලුව

මෙන් ද ඇස් පරම්පරාව පවත්නේය. කාම ලෝකයෙහි රූප කලාප සන්තතිය කාම ලෝකයෙහි පහන් දැල්ලක් මෙන් ද, ගඟදිය පහරක් මෙන්ද නොසිඳී පවතී. යොනි වශයෙන්—කාමාවචර ලෝකයෙහි ඕපපාතික, ද්‍රගතික, බ්‍රම්හකායික වශයෙන් ඇති නානා භෙදය ද ඕලාරික සුඛුම වශයෙන් වන දෙයාකාරය ද අභ්‍යන්තර බාහිර වශයෙන් ද ජීවිතේන්ද්‍රිය ප්‍රතිබද්ධ ජීවිතෙන්ද්‍රිය ප්‍රතිබද්ධ නොවන වශයෙන් ද, දෙයාකාරය. තණ්හා මාණ දෘෂ්ටි ගැණීමෙන් උපාදන නොගැණීමෙන් අනුපාදන විකාර වශයෙන් ද සනිදස්සන සප්පටිඝ, අනිදස්සන සප්පටිඝ අනිදස්සන අප්පටිඝ වශයෙන් තුන් අකාර ද, සවභාව ආකාර, ආකාර විකාර ලක්‍ෂණ පිරිසිඳීම් වශයෙන් සතර ය එකන්ධ වශයෙන් සියලු රූපයො නාහේතුය අහේතුකය හේතුන්ගෙන් වෙන් වූ යේ ය යනාදි වශයෙන් භාවනා කරන්නේය—

වෙදනාසඛන්ධය—විඳීම දැනීම වශයෙන් වේදනාව එක් ආකාර වුවද සථාන වශයෙන් කායික වේදනා මානසික වේදනා වශයෙන් දෙයාකාරවේ. සැපය දුක්ය නුදුක් නොසැප ය යි සවභාව වශයෙන් තුන් ආකාර වේ. කුසල වේදනා අකුසල වේදනා විපාක වේදනා ක්‍රියා වේදනා ය යි, ධර්ම වශයෙන් සතර ආකාර වේ. සැප ඉන්ද්‍රිය දුක් ඉන්ද්‍රිය සොම්නස් ඉන්ද්‍රිය දෙම්නස් ඉන්ද්‍රිය ය උපේක්‍ෂා ඉන්ද්‍රිය ය යි ඉන්ද්‍රිය වශයෙන් පස් ආකාර වේ. කණ්හ (පාපය) සුක්ක (කුසල) වශයෙන් ද වේදනාව සිව් ආකාර වේ. ආශ්‍රව සහිත ය ආශ්‍රව රහිත ය, උපදීම් වාර වශයෙන් ද සත් ආකාර වේ. චක්ඛු සම්ඵස්සයෙන් ජනිත වෙදනාවය ශ්‍රොත සපර්‍ශයෙන් ජනිත වේදනාවය, ඝ්‍රාණ සපර්‍ශයෙන් ජනිත වේදනාවය, ජිව්හා සපර්‍ශයෙන් හට ගන්නා වේදනාවය කාය සපර්‍ශයෙන් හටගන්නා වේදනාවය, මනො ධාතු සපර්‍ශයෙන් හටගන්නා වේදනාවය, මනො විඥාණ ධාතු සපර්‍ශයෙන් හටගන්නා වේදනාව ය යි යනාදී වශයෙන් පිඬු කරගත් විට එකසිය අටක් වේදනාවෝ ඇත්තාහ.

සංඥ සඛන්ධය—පැහැයෙන් සටහණින් යම් දෙයක් දැනගැණීම සඤ්ඥා නම් වේ. ඒ සඤ්ඥා රාශියක් එක්තැන්වීම සංඥ සඛන්ධ නම් වේ. සංජානනාර්ථයෙන් සංඥව එකක් වුවද කණ්හ සුක්ක වශයෙන් හෙවත් පව් පින් වශයෙන් දෙයාකාරවේ. විපරීත —වැරදි සංඥ අවිපරීත—ඇති සැටි වූ සංඥ අකුසල වශයෙන් තුන් ආකාර වේ. රාග සහිත සඤ්ඥා වෙෂ සහගත සංඥ විහෙස සඤ්ඥා වශයෙන් ද තුන් ආකාර වේ. නිෂ්ක්‍රමණ සංඥය, අවෙෂ සංඥය, අවිහිංසා සංඥය, කියා ද තුන් ආකාර වේ. අශුභයෙහි ශුභ සංඥය, දුකෙහි සැප සංඥය, අනිත්‍යයෙහි නිත්‍ය සංඥය, අනාත්මයෙහි ආත්ම සංඥ වශයෙන් සතර ආකාර වේ. අසුභ සංඥය, දුක්ඛ සංඥය, අනිත්‍ය සංඥය, අනාත්ම සංඥය යි විනයෙහි සංඥ පසක් දක්නා ලැබේ. අසුභ දෙය සුභයයි දැන ගැණීම අසුභය අසුභය යි දැනීම, සුභදෙය අසුභය යි හැඟීම සුභය සුභ වශයෙන් දැනීම විචිකිච්ඡා සංඥය යි අරමුණු වශයෙන් සඤ්ඥාව සයාකාරය. රූප සංඥ, ශබ්ද සංඥ, ගන්ධ, රස, සපර්‍ශ, ධර්ම සංඥ වශයෙනි. උත්පත්ති වාර වශයෙන් සත් වැදෑරුම්ය. චක්ඛු සම්ඵස්සයෙන් ජනිත සංඥය ශ්‍රොත සපර්‍ශයෙන් ඝ්‍රාණ සපර්‍ශයෙන් ජිහ්වා සපර්‍ශයෙන් ශරීර සපර්‍ශයෙන් මනො ධාතු සපර්‍ශයෙන් මනො විඥාණ ධාතු සපර්‍ශයෙන් ජනිත සංඥ වශයෙනි. කුසල සංඥ වශයෙන් තුණකි. නෛෂ්ක්‍රම්‍ය සංඥ අවෙෂ සංඥ, අවිහිංසා සංඥ කියා ය. මෙසේ වූ නානාත්ම සංඥ රාශිය සංඥ සඛන්ධ නම් වේ.

සංස්කාර සඛන්ධය

කුසලා කුසලයන් රැස්කරණ චෙතනාවෝ සංස්කාර නම් වෙති. එවැනි චෙතනා රාශිය සංස්කාරසඛන්ධය වේ. අභිසංස්කරණය ආයුහණය රාශි කරණ ලක්‍ෂණයෙන් එකක් වුවද කුසල අකුසල අව්‍යාකෘත වශයෙන් සංස්කාරය ත්‍රිවිධවේ. කුසල විඥාණ සම්ප්‍රයුක්තවූයේ පුණ්‍යාභිසංස්කාරයයි. අකුසල් සිත් සමග යෙදුන සංස්කාරය අපුණ්‍යාභි සංස්කාර නම් වේ. කුසල් අකුසල් වශයෙන් නොවූ සිතිවිලි සමහ යෙදුනේ ආනෙඤ්ජාභි

සංස්කාර නම්. එහි කාමාවචර පළමුවන කුසල විඥානය හා යෙදුනු වේදනා සඤ්ඥා හැර සියලු දෙතිස් හෝ සතිස් ධර්මයෝ සංස්කාර නම් වෙති. එනම් ස්පර්ශය, චේතනාය, විතර්ක, විචාර, ප්‍රීති, විරිය, ජීවිතේන්ද්‍රිය, සමාධි, ශ්‍රද්ධා, සති, හිරි, ඔත්තප්පය, අලොභය, අදෙසය, අමොහ, කාය චිත්ත පස්සද්ධි දෙකය, කාය චිත්ත ලහුතා දෙකය, කාය චිත්ත කර්මණ්‍යතා දෙකය, කාය චිත්ත ඍජුතාවය, කත්තුකාමතාව නම් ඡන්දය, අධිමොක්ෂය මනසිකාරය මධ්‍යස්ථතාව කරුණා, මුදිතා, විරතිත්‍රය, කාය වචීමිච්ඡාජීවය, යනු සවිසි සංස්කාරයෝය. මේ සවිසි දහම්හු කලින් කල උපදිති, එකවර හෝ එකතුව් නුපදිති. මොවුන්ගේ රාශිය සංස්කාර ස්කන්ධ නම් වේ—

විඥානස්කන්ධය—වෙසෙසා දැනගණීනුයි විඥාණ නම් වේ. ඒ විඥානය සත් වැදෑරුම්ය. චක්ෂු විඥානය, ශ්‍රොත විඥානය, ඝ්‍රාණ විඥානය, ජිව්හා විඥානය, කායවිඥානය, මනොවිඥානය, මනොධාතු විඥානය, යන මොහුය. මේ විඥාණ එකක් පාසා තුන්තුන් ආකාරයෙන් විමසා දතයුත්තාහුය. පළමුව වස්තු හා ආරම්මණ වශයෙනි. චක්ෂු සොත ඝාණ ජිව්හා කාය යන පස වෙන් වෙන් වස්තු අරමුණු ඇත්තාහුය. මනොධාතු මනොවිඥාණ ධාතු දෙදෙනාට එයම වස්තු ආරම්මණ වෙති. මුල කී ආරම්මණ පහත් සමග සාරමුණෙකි. ඒ සාරමුණ අභ්‍යන්තර බාහිර වශයෙන් දෙළොස් ආකාරවේ—ආරම්මණ වශයෙන් බාහිර විවිධාරම්මණ විමසිය යුතුය. ධර්මස්වභාව වශයෙන් අරමුණට සිත නැංවීමවූ විතර්කය අරමුණෙහි හිත හැසිරවීම් ස්වභාවවූ විචාරය කය හිත පිණවන ප්‍රීතිය, කයට හිතට පහසු සැනසිළි ස්වභාවවූ සැපය, අප්‍රිය විඳීමවූ දුකය, දෙම්නසය, මධ්‍යස්ථස්වභාවවූ උපෙක්‍ෂාව ය යන මොව්හු එක්ව යෙදුනු විඥාණ යෝය. මෙකී පස පචඋපාදන ස්කන්ධයෝ ඒකාන්තවත් බැවින් සියලු ස්කන්ධ ධර්මයෝ සාශ්‍රවයයි පස් වැදෑරුම් කුසලස්කන්ධයන් සීලස්කන්ධය සමාධිස්කන්ධය ප්‍රඥස්කන්ධය— විමුත්ති ස්කන්ධ ය විමුත්ති ඥාණ දස්සන ස්කන්ධය සංග්‍රහ වෙති— ආයතන ධාතු සත්‍යයන්ද සංග්‍රහවෙති. රූප උපාදන ස්කන්ධය ගිලං හලක් වැනිය. ගිලනා වැනි විඥාණ ස්කන්ධ යයි. වෙදනා උපාදනස්කන්ධය රොගය වැනිය. සඤ්ඥස්කන්ධය රොගීවීම වැනිය. ගිලන්බවට අහිත දෙය සංස්කාරස්කන්ධ වැනිය. මේ උපාදනස්කන්ධ පචකයම සර්පයන් පස්දෙනෙක් වැනිය. කඩුව අමොරාගණ ලුහුබැඳ එන සතුරකු වැනිය. ඉසට ගත් බරක් වැනිය. පෙණ පිඩක් දිය බුබුලක් මිරිඟුවක් කෙසෙල්කඳක් මායාවක් වැනිය යනාදී උපමා වශයෙන් සලකා පචුපාදනස්කන්ධයන් කෙරෙහි ආලය හැරදමන්නේය.

ආයතන

ආය නම් සසර දුක පතුරාද ආයතවූ දීර්ඝ සසරදුක ගෙණදෙනුයි ආයතන නම් ලද ඇස කණ නැහැය දිව කය සිත රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්ම යන මෙ දෙළොස ආයතන නම් වේ. මෙහි අභ්‍යන්තරික ආයතන සයක්ද උනුනට ගොදුරුවන බාහිරායතන සයක්ද වෙති. වචනාර්ථ වශයෙන් චක්ඛනම් රූප දක්නා ශක්තිය දර්ශන ශක්තිය ඇති අවයවය චක්ෂු නම් විය. ඒ චක්‍ෂුස පාපයන් උපදින රැස්වන ස්ථානය වන බැවින් චක්ඛායතන නම් වේ.—ශබ්දයන් අසාගැණීමට හැකි අවයවය ශ්‍රොත ප්‍රසාද රූපයයි. එයම පාපයන්ට ආකරයක් සමාගම් ශාලාවක් වේ නම් ඒ සොතායතන නම් වේ. ඝාණ නම් ගඳ සුවඳ දැනගන්ට ශක්තිය ඇති අවයවයකි. ගඳ සුවඳ ඇදගන්නා යන අදහසින් ඝාණප්පසාද ය යි ද එයම පාපයන්ට ජන්මස්ථානය නැවතීමේ ස්ථානය රැස්වන ස්ථානය වන බැවින් ඝාණායතන නම් වේ. රසවිභාග දැනගන්නා අවයවය රහදිව නම් වූ ජිව්හාපසාද රූපයයි. එයම ඉහත සඳහන් අර්ථයෙන් ආයතන වන බැවින් ජිව්හායතන නම් වේ.—කාය නම් පහස් වෙසෙසා දැනගන්නා සමයි. සමෙහි පිහිටි සිව්යම කායපසාදය වේ. එයම ආයතන බැවින් කායායතන යයි කියනු ලැබේ—දැන හැඳිනගන්නා අරූපි ධර්මය ශක්තිය මනසයි. ඒ මනසම ආයතන වන බැවින් මනායතන නමි. සීතොෂ්ණාදී හේතුන් නිසා වැනසී යන සජීවාජීව ද්‍රව්‍ය සමහාරය රූපනම් වේ. මේ රූපයම පාපයන්ට ජාත

8—

භූමිය වාස සඞ්ගමස්ථානය වන බැවින් රූපායතන නම් වේ. සවන් වෙත ගමන් කෙරේනුයි ශබ්ද නම්. ශබ්දය ආයතනවන්නේ ශබ්දයතනයයි. වස්තුවෙක පවිත්‍ර අපවිත්‍ර බව හඟවන්නේ ගන්ධයයි. එයම ආයතනවූයේ ගන්ධායතනයයි—ආස්වාදය හැඟවීම කරන්නේ රසයයි එයම රසායතන නාම වේ—ස්පර්ශය හෙවත් කයින් දැනගන්නා දෙය පොට්ඨබ්බ නම් වේ. එයම ආයතනවූයේ පොට්ඨබ්බායතන හෝ ඵස්සායතන නම් වේ. ධර්මනම් ත්‍රිවිධ අරූපස්කන්ධයෝය. තමන්ගේ ස්වභාවය දරණ බැවින් ධර්මනම් වේ. මේ ධර්මය ආයතන බැවින් ධම්මායතන නම් වේ.—ආයතනම් ගොචරවන ධර්ම පතුරුවයි කියාද ආයතනම් වන සසර දුක ගෙණ දෙන්නේනු යි ආයතන නම් වේ, උත්පත්ති ස්ථානය, නිවාස ස්ථානය, රැස්වන ස්ථාන යන අදහස් වේ—

මේ ආයතන විභාගකර භාවනා කරණු කැමති යොගාවචරයා පස් ආකාරයකින් විමසිය යුතුය. එනම් වචනාර්ථ වශයෙන් ධර්මවශයෙන් නිස්සත්ත්වනිජ්ජීව ස්වභාව අනුව බැලීමයි, මනස නම් සපනම විඤ්ඤාණ ධාතුවය, විසය වශයෙන් ප්‍රත්‍යය වශයෙන් චක්ෂුර්විඥානය රූප, ආලෝක මනසිකාර විෂයකර ඇත්තේය. මනොධර්මයෝ අධිමොක්ෂ මනසිකාර විසයකොට පවති විථි භෙදවසයෙන් මහන්ත පරිත්ත අතිපරිත්ත වශයෙනි මහන්ත විථිය හිත් හතකින් යුක්ත වේ එනම් භවාඞ්ග හිත, ආවජ්ජන හිත, චාරවිඤ්ඤාණය සම්පටිච්ඡන හිත, සන්තිරණ හිත, වොත්ථපන හිත, ජවන හිත, තදරම්මණ ඵල විපාක හිත, භවාඞ්ග පාත හිත වශයෙනි. සංග්‍රහ වශයෙන් මේ දෙළොස් ආයතනයො ස්කන්ධ ධාතු සත්‍ය විභාගයන්හි සංග්‍රහ වෙති.

මෙහි විථිභෙදය පැහැදිලි කරණ උපමාවක් මෙසේය. එක්තරා රජෙක් සිය ලැගුම් ගෙහි නිද සිටියේය. ඒරජුගේ බිසවත් කණ්බිහිරි සේවිකාවකුත් රජුට උවටැන් පිණිස එහි සිටියහ. බිරි මෙහෙකාරිය රජුගේ පා මිරිකමින් සිටියාය. ඒ රජ ගෙයි දෙරටු පාල යාද බිරි මිනිසෙකි. රජුගේ උයන් පල්ලා රජතුමාට දෙනු පිණිස අඹගෙඩි කිපයකුත් රැගෙන ආයේය. දෙරටුව වසා තිබුනු නිසා ඔහු දෙරට තට්ටු කළේය දෙරටුපාලයා හා සේවිකාව බිරි නිසා රජු අවදිවී සේවිකාවට දෙර අරින්ට අණකළේය. ඉන්පසු ඕතොමෝ බිරි දෙරටුපාලයාට අත් සංඥවකින් දෙර අරින්ට දැන්නුවාය. එවිට උයන් පල්ලා අඹ ගෙණැවිත් රජුට පිළිගැන්විය. රජතෙමේ අඹ සේවිකාව අත තබා පිහියක් අතට ගත්තේය. එවිට එක් රාජ සේවකයෙක් එතනට පැමිණ ඒ අඹ ගෙණ මෙහෙසිය අත තැබුවේය. බිසව අඹගෙඩි සෝද කපා ඒවා හොඳින් ඉදුනු නොයිදුනු බව දැනගන්ට රාජවල්ලභයාට කැල්ල බැගින් දී පසුව රජුට දෙන්නිය. රජතුමා අඹ අනුභව කොට අඹ රස හොඳ හෝ නරක බව කියන්නේය. ඉන් පසු රජතෙමේ නැවතත් නිදන්නේය.

මේ උපමාව සැසඳෙන්නේ මෙසේ ය. භාවඞ්ග හිත නිද සිටි රජුමෙනි, චක්ෂුරාදී චාරයන්ගේ අරමුණු ගැණීම, අඹගෙණ ආ උයන් පාලයා දෙරට තට්ටු කළ ශබ්දය නෑසුණු දෙරටුපාලයා මෙනි, භවාඞ්ග චලනය රජුට ශබ්දය ඇසී පිබිදී සෙවිකාවට දෙර අරින්ට අණ කිරිම මෙනි. ආවජ්ජනා සිත බිරි සේවිකාව අත්සලකුණකින් චාර පාලකයාට දැන්වීම මෙනි, ඒ ඒ චාරවිඤ්ඤාණයන් බිරි දෙරටුපාලයා හළදෙරින් ආ උයන් පල්ලා රජුට අඹ පිළිගැන්නිම මෙනි, සම්පටිච්ඡන චිත්තය-රජු සේවිකාව අත අඹ තබා සියතට පිහිය ගැණිම හා සේවකයා එතනට පැමිණීම වැනිය.—සන්තිරණ චිත්තය, රාජසේවකයා බිහිරි සේවිකාව අත තිබුණු අඹ රැගෙණ මෙහෙසියගේ අතේ තැබීම වැනිය, වොත්ථපන චිත්තය-බිසව අඹ සොද රාජවල්ලභයාට කැල්ල බැගින් දී හොඳින් ඉදුනු නොයිදුනු බව දැන රජුට පිළිගැන්නිම වැනිය. ජවන චිත්තය, රජුගේ අඹ වැළඳීම මෙනි. තදරම්මණ ඵලවිපාක සිත එරජුගේ අඹ රසයේ හොඳ නොහොඳ කීම මෙනි. භවාඞ්ග පතනය රජුගේ නැවතත් නිඳට යාම වැනියයි දත යුතුය.

ධාතුහු

ධාතුහු අටළොසකි. චක්ඛු ධාතුය, රූප ධාතුය, චක්ඛුර්විඥානය, ශ්‍රොත ධාතුය, ශබ්ද ධාතු ශ්‍රොත විඥාන ධාතුය, ඝ්‍රාණ ධාතුය, ගන්ධ ධාතුය, ඝ්‍රාණ විඥාන ධාතුය, ජීවනය දිඝ කරගැනීමට උපකාරවන ජිව්හා ධාතුය, රස ධාතුය, ජිව්හා විඥාන ධාතුය, කාය ධාතුවය, ඵොට්ඨබ්බ ධාතුය, කාය විඤ්ඤාණ ධාතුය, මනො ධාතුය, ධම්ම ධාතුය, මනො විඤ්ඤාණය යන දහ අට තම තමා අයත් ස්වභාවයන් දරණ බැවින් ධාතු නම් වෙති. චක්ඛණය හෙවත් රූප දර්ශණය කරන්නා චාක්‍ෂුසය චක්ඛදස්සනෙ යන ධාතුවෙන් සිධයි— රූපතී නස්සතීති රූපං රූපනායේ යනුවෙන් සීතොෂ්ණාදියෙන් වැනසෙන ස්වභාව ඇත්තේ රූපයයි වචනාර්ථ ඉහත සඳහන් බැවින් මෙහි නැවත දක්වීම අනවශ්‍යයි. මේ එකම ධර්මයෝ ස්කන්ධ නාමයෙන් ද ආයතන නාමයෙන් ද ධාතු නාමයෙන් ද දක්වනු ලැබේ. ස්කන්ධ වශයෙන් ඔවුන්ගේ සමූහ ලක්‍ෂණ ද ආයතන නාමයෙන් චාරාලම්බණ ලක්‍ෂණ ද ධාතු නාමයෙන් ස්වභාව ලක්‍ෂණ ද දක්වූහ. සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ තියුණු නුවණ ඇති පුද්ගලයාට සත්‍යාවබොධය පිණිස ස්කන්ධ වශයෙන් ද මධ්‍යම ප්‍රමාණ නුවණ ඇත්තාට ආයතන නාමයෙන් ද මඳ නුවණ ඇතියන්ට ධාතු නාමයෙන් ද දෙශනා කළ බව දත යුතුය—

පටිච්ච සමුප්පාදය හේතුප්‍රත්‍යය විභාගය

මේ හේතුප්‍රත්‍යය විභාගය නිදානය නමිනුත් ප්‍රතීත්‍ය සමුත්පාදය නමිනුත් දෙශනාකර ඇත්තාහ. ඒ මෙසේය, අවිද්‍යාව හෙවත් නොදැනීම හෝ වැරදිලෙස දැනීම සංස්කාර (කුසල් අකුසල් මැදහත්) කය වචන සිතින් සිතිවිලි රැස්කිරීමට හේතු වෙයි— අවිද්‍යාව සංස්කාරයන්ට ප්‍රත්‍යය වේ. සංස්කාර නැමති කුසල් අකුසල් සිතිවිලි නිසා ප්‍රතිසංධි විඤ්ඤාණ නම් ප්‍රාණය හටගණී—පිළිසඳ ප්‍රාණය නිසා නාම සතර හා රූපය හටගණී. මේ නම් රූ දෙවගය නිසා සදෙර අරමුණු හටගණී, සදෙර එල්බෙන සිත නිසා බාහිර රූපා දිය සමග ගැටීම වේ. ඇතුළත් පිටත් ආයතන ගැටීමෙන් වේදනා නම් හැඟීමෙක් හට ගණී, ඒ වේදනා නම් විඳීම නිසා ආලය උපදී ආසාව නිසා මම මගේ යයි ගැණීම ඇතිවේ. ගැණීමවූ උපාදනයන් නිසා කම් රූ අරූ තුන්ලොවේ උපදවන කර්මසිත් හටගණී. භවය නිසා ඉපදීම ඇති වේ ඉපදීම නිසා දිරීම මැරීම සෝකය විලාපකිම කායපීඩා හිත් වේදනා දුර්දුක් පහළවෙති අවිද්‍යාව නැතිකිරීම නිසා සංස්කාරනම් තුන්දෙරින් කර්ම නැති වෙති. තිදෙරේ කර්ම රැස් නොකිරීමෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිරුධවේ. විඤ්ඤාණය නිරුධවීමෙන් නාමරූප නිරුධ වෙති—නාම රූප නිරුධවීමෙන් සළායතන නිරුධවෙති. සළායතන නිරුධවීමෙන් ඵස්ස නම් ගැටීම නැතිවේ. ඵස්සය නිරුධවීමෙන් වෙදනාව නිරුධවේ වේදනාව නිරුධ වීමෙන් තණ්හාව නිරුධ වේ. තණ්හාව නිරුධ වීමෙන් උපාදන නිරුධ වෙති. උපාදන නිරුධවීමෙන් භවනිරුධවේ. භවනිරොධයෙන් ජාතිය නිරුධ වේ, ජාතිය නිරුධවීමෙන් දිරීම මැරීම සෝපිරිදෙව් දුක් දෙම්නස්හු නිරුධවෙති, මෙසේ මේ සම්පූර්ණ දුක් සමුදය ගේ නිරෝධය වන්නේය. මේ සසර දුක් ගොඩ වැඩෙන වැනසෙන ආකාරය මෙසේය—

එහි අවිද්‍යාව නම් සතර ආර්‍ය්‍යසත්‍යයන් නොදැනීමයි එය වී ඇටයකට සමානයි. සඞ්ඛාරනම් කය වචනය සිත යන තුන් දෙරින් රැස්කරණ කර්මසමූහයයි–පැලවන බීජ වර්ගයක් වැනි වේ. විඤ්ඤාණය නම් පිළිසිඳගත් කෙණෙහි පැවති සිතය. එය බීජයකින් පැලවුනු අඞ්කුර (පැලැටි) යක් වැනිය නාම රූප නම්, සිත් සිතුවිලි හා කලලරූපයයි එය පැලැටියක දලුපත් වැනිය—සළායතන නම්, තම සිරුරෙහි පිහිටි ඇස්, කන් ආදී දෙරවු සයයි—එය ඒ පැලැටිය අතු බෙදී වැඩීම මෙනි. ස්පර්ශය නම් ඇස කණ ආදී සදෙරෙහි උපදනා ඵස්සයො සදෙනාය. එය වැඩුණු රුකක්වැනි වේ—වේදනා නම් සවැදෑරුම් විඳීම හෝ දැනීමයි—එය ඒ ගසෙහි මල් හට ගැණීමක් වැනිය. තණ්හා නම්, රූපතණ්හාදී සයයි එය මල්ගෙඩිවලට උරා ගන්නා පෘථිවි ආපො රසය වැනිය. උපාදන නම් සතර උපාදන යෝය. එය වී සහල් වැනිය,—භවය නම් කාම රූප අරූප උත්පත්ති සාදන කර්මයයි.

එය නැවත පැලවීමක් මෙනි. ජාති නම් භවයෙහි ස්කන්ධ ආයතන පහළවීමයි. දෙවනු පැලය වැනි වේ—ජරා නම් ස්කන්ධයන්ගේ මේරීමයි, නැවත ගත් ගෙඩි ඉදීමක් මෙනි, මරණ නම් ස්කන්ධයන් විනාසවීමේ සීමාවයි. එය ගෙඩි-වැටීමක් වැනි වේ.

මෙසේ මුළ කොණ හෝ අගකොණ නොපෙණෙන හේතුඵල චක්‍රය බීජය අඩකුරය ගසවී ගෙඩි සැදී නැවතත් බීජ අඩකුර ඵල සැදෙන ආකාරයෙන් හේතුඵල චක්‍රය භ්‍රමණය වන්නේය. අවිද්‍යාවට කුමක් ප්‍රත්‍යය වේදයත් අවිද්‍යාවම අවිද්‍යාවට ප්‍රත්‍යය වන්නේය. සියලු කෙලෙස්ම අවිද්‍යාවට ප්‍රත්‍යය වෙති, කාමාදී ආශ්‍රව හටගැණීමෙන් අවිද්‍යාව හටගණී, අවිද්‍යාවය තණ්හාවය උපාදනය යන තිදෙනා ක්ලේශ යෝය. සංස්කාර භවදෙදෙනා කර්මයෝය, ඉතිරි සත්දෙනා විපාකයෝය. අවිද්‍යා සංස්කාර දෙදෙන අතීත හේතුහුය. ජාති ජරා මරණ තුණ අනාගත හේතුය. සෙස්සෝ වර්තමාන හේතුහු වෙති. මේ හේතු පච්චයන්ගේ හටගැණීමම පටිච්ච සමුප්පාද නම් වේ. මේ දෙළසම හේතුපච්චය අඩග යෝත් සමුප්පන්න ධර්මයෝත් වෙති. මේ දෙළොස් ධර්මයෝ සඩ්ඛතධර්ම කියා හෝ අසඩ්ඛත ධර්මකියා හෝ කියන්ට නොපිළිවන. ඒ හේතු වන ධර්මයෝම ඵලධර්මයෝද වෙති. පළමුව උපදනා ඒ ධර්මයෝ පූර්වහේතුවෙන් සකස් කළාහු වෙති. ගාම්භීරභාවය නිසා මේ හේතුප්‍රත්‍ය ධර්මවිභාගය සත් ආකාරයකින් විමසා දතයුතුය. පළමුව ත්‍රිසන්ධි වශයෙනි— සංස්කාර විඥාණ අතර එක් සන්ධියකි. වේදනා, තණ්හා අතර දෙවෙනි සන්ධියයි. භවය ජාති අතර තුංවෙනි සන්ධියයි, හේතුවට ඵලය සන්ධි වීමය ඵලය හා හේතුව සන්ධිය නැවත හේතුවෙන් ඵලය සන්ධිවීම වශයෙන් ත්‍රිසන්ධියක් වේ— පළමු වෙනි තුංවෙනි දෙක හේතුවට ඵලය සන්ධිවීමයි දෙවැන්න ඵලයන්ගෙන් හේතු පහළවීම පිළිබඳ සන්ධියයි— ඒ භවය සන්ධිවීමක් නොවේ. කර්ම කර්මනිමිත්ත-ගති ගති නිමිත්ත වශයෙන්ද ත්‍රිසන්ධිය දත යුතුවේ—

සතර සංක්ෂෙප වසයෙන් ගිය දූයෙවූ කර්මකෙලශයෝ, වර්තමාන ඵලවිපාකයන්ද වර්තමාන කර්ම කෙලශයො අනාගත ඵලවිපාක වශයෙන් පැවැත්මයි විසති ආකාර වශ යෙන් බැලීමේදී-පූර්ව කර්ම භවයෙහි මුලාවීම නම් වූ අවිද්‍යාවය. රුස්කිරීමවූ සංස්කාරය. නිකන්ති ඇලුම් කිරීම නම් තෘෂ්ණාවය හිතින් බඳගැණීමවූ උපාදනය. සිතිවිලිනම් භවය යන මේ පස මේ උපන් ජීවිතයට ප්‍රත්‍යයෝය. මේ ජීවිතයේ ප්‍රතිසන්ධි විඥාණය ගර්භාවක්‍රාන්තිය නම් නාමරූප හටගැන්ම පසාද රූප නම් වූ සළායතනය. ආයතන ගැටීමවූ ඵස්සය විඳීම හැඟීමවූ වේදනාවය, යන මේ පස පූර්ව හේතු නිසා හැදෙනා ඵල පසය. මෙහිදී උපදිනා අවිද්‍යාව, සංස්කාරය තෘෂ්ණාවය, උපාදනය කර්මය යන මතු උපතට හේතු පසකි—මේ හෙතුන් නිසා මේ ලඟ පිළිසිඳගැණීම නාමරූප, ආයතන ඵස්ස වෙදනා යන පස ඇතිවන්නාහ. මෙසේ අතීත හෙතු පසද දූන් ඵලපසක්ද දූන් හෙතු පස හා අනාගත ඵල පසදූයි විසි ආකාරයෙන් පෙරළෙන සංසාර චක්‍රය-හේතුඵල චක්‍රය නම් වේ. හේතුවෙන් ඵලය ඵලයෙන් හේතුවයයි පෙරලීම වේ.

චක්‍ර වශයෙන්—අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාරද ජාතිප්‍රත්‍යයෙන් ජරාමරණද මේ ක්‍රම යෙන් මේ සියලු සංසාර දුක්ඛ රාශිය රියසකක පෙරළීමමෙන් හටගැණී බිඳී යන්නේය— පරිච්ඡෙද වශයෙන්-මේ හේතුඵල චක්‍රයාගේ බැමීම ලෞකික පිරිසිඳීම ලෙවිතුරා පිරිසිඳීම යයි පරිච්ඡෙද සීමා දෙකකි. ඒ ඒ ප්‍රත්‍යය ප්‍රත්‍යොත්පන්නයන් එයාකාරයෙන් පැවතිය හැකි සීමාව නොයික්ම බිඳීයාම ලෞකිකය අරහත් මාර්ග ඥානයෙන් මුල් හේතුව උපුටාලීම ලෝකෝත්තර පරිච්ඡෙදයවේ—අවිද්‍යාව අවිද්‍යා චකගේත් දුක දුකගේත් ශ්‍රද්ධාව ශ්‍රද්ධාව ගේත් පහළ වීමට හේතු ඵලභාවයෙන් පෙරළීයයි. චතුර්විධ කර්මකෙලශ වශයෙන් සැලකීම, අවිජ්ජාදී පූර්ව හේතුවෙන් බීජ අඩකුර භාවයෙන් අඩකුර බීජ භාවයෙන් සම්බන්ධ භාවයෙන් ඕපපාතිකවස්තූන්ද සහජාත කර්මහේතුන් නිසා පෘථිවි පර්වත හිම චන්ද්‍ර සූර්‍ය්‍ය සාගරාදීන්ගේ ඒ ඒ තැන එයාකාරවන සවභාව යෙන් හට ගැණීම මෙන් කර්මභව හේතුඵල හරිවර්තනය පවත්නේය. මේ අවිද්‍යාදී හෙතු ප්‍රත්‍යය දෙළසට ඇතුළත් දේම ප්‍රත්‍යය ස්කන්ධය ආයතනධාතු ආදී විභාගයන්හි සංග්‍රහ වෙති.—

11 පරිච්ඡේදය

පමවිධූපායයන් අතර දෙවැනි වූ චතුරාර්‍ය සත්‍යාවබෝධය

ආර්‍ය වූ හෝ ආර්‍යයන් වහන්සේ දෙසා වදළා වූ හෝ ආර්‍ය බව සිඩකර දෙන්නා වූ සත්‍ය කරුණු සතරක් ඇත්තාහ. එනම්, දුක නම් ආර්‍ය සත්‍යය. දුක උපදනා හේතුව නම් ආර්‍ය සත්‍යය. දුක නැසීම වූ ආර්‍ය සත්‍යය. දුක නැති කරණ පිළිවෙත වූ මාර්ග ආර්‍ය සත්‍යය කියා සතරකි. එහි පිළිකුල් කටයුතු වූ නොයෙකුත් උවදුරු උසුලන්නා වූ ජෛන ශිවාදි අන්‍ය ලබ්ධිකයන් ඇතැයි සලකන සදකාලික බව යහපත් සැප බව ජීව ආත්ම බව යන මෙයින් හිස් වූ. පෙළන රුස්කරණ වෙනස් වන කාය චිත්ත පීඩා ඇති කරණ ස්ථිර වූ වෙනස් කළ නොහැකි වූ සත්‍ය ස්වභාවය තෙමේ දුක්ඛ සත්‍යය නම් වේ. එකී දුක්ඛ රාශිය එකාබද්ධ කිරීම ඉපදවීමට කාරණ වූ ආයූහණ නම් එක්රැස් කිරීම, ඒකාබද්ධ කිරීම, මුල් හේතුව පීඩා බාධාකාරී ස්වභාව ඇති එක්සිය අටක් ප්‍රභේද ඇති තෘෂ්ණාව සැබෑ වූ නො සැබෑ නොවන බව සමුදය සත්‍යය නම් වේ. දුක්ඛය නමැති රෝධයාගේ අභාවය වූ හික්මීම හෙවත් ඉවත් වීම විවේක බව වූ දුක දුක් හේතුවෙන් ඇත්වූ බව හේතු ප්‍රත්‍යය යෝගයෙන් සකස් නොවූ නොනැසෙන සත්‍ය ස්වභාවය තෙමේ නිරෝධ සත්‍ය නම් වේ. ඒ දුක්ඛ නිරෝධය කරා පැමිණීමට උපාය හෝ පිළිවෙත වූ නිර්‍යාණ=ගෙණයාම දක්වීම පිහිටවීම අධිපති භාව ලක්ෂණ වූයේ දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපද ආර්‍ය සත්‍යය නම් වේ. ආර්‍ය වූ නිකෙලෙසි උතුමන් විසින් ප්‍රතිවේධ කළ නිසාත් ආර්‍ය බව කරදෙන්නා වූ වෙනස් නොවන සැබෑවූ ස්ථිර වූ සර්වෝත්කෘෂ්ට ගුණ ධර්මය බැවින් ආර්‍ය සත්‍ය නම් වේ—

මෙහි දුක්ඛාර්‍ය සත්‍යය, ජාති දුකය, ජරාදුකය, ව්‍යාධි දුකය, මරණ දුකය, ශෝකය, පරිදේවය, කායික මානසික පීඩා දූඩි ආයාසය අප්‍රිය ද්‍රව්‍ය පුද්ගලාදීන් එක්වීමය, ප්‍රියමනාප වස්තු පුද්ගලාදීන්ගෙන් වෙන් වීමය, ඉෂ්ට ප්‍රිය දෙය නොලැබීම, ලුහුඬින් තණ්හා මාන දෘෂ්ටි සහගත ස්කන්ධ පඤ්චකයම දුක්වේ ය යි දක්වනු ලැබේ. එහි ස්කන්ධයන්ගේ පහළ වීම හෝ අමුතු අමුතුව හට ගැණීම ජාති නම් වේ. ධාතූන්ගේ මෙරිම නිසා කාය සැණ බලයන් ද රූපයන් ද ඇස් ආදි ඉඳුරන් ද සිහිය, ප්‍රඥව යන මොවුන් පිරිහියාම ජරාව නම් වේ. එක සත්ව වර්ගයකට වෙන්ව හටගත් ජීවිත ඉන්ද්‍රිය රක්නා ධර්ම සමූහය සිඳියාම මරණ නම් වේ. රෝග පීඩා වස්තු ඥාතීන් නැතිවීමෙන් හටගන්නා සිත් තැවුල ශෝක නම්. ඥාති, භෝග රෝගාදි වැනසීමකින් පෙළුණු අයෙකුගේ වාක් ප්‍රලාපය පරිදේව නම් වේ. කයෙහි පීඩාවන් දුක නම් වේ. සිතෙහි හටගත් පීඩාවන් දෙම්නස් නම් වේ. ව්‍යසනාදියෙන් පෙළුණකුගේ අධිමාත්‍ර සිත් පෙළීම නිසා ඇතිවන චිත්ත දහය උපායාස නම් වේ. සිතට රුචි නොවන සත්වයන් හෝ ද්‍රව්‍යයන් එකතු වීම නිසා ඇතිවන හිතට වෙහෙස අප්‍රිය සම්ප්‍රයෝග නම් වේ. සිතට ප්‍රිය මනාප වස්තූන් ගෙන් පුද්ගලයන්ගෙන් වෙන්වීම, හෙවත් මනාප වස්තු පුද්ගලාදීන් හෝ තමා නැසීයාම ප්‍රිය විප්‍රයෝග දුක නම් වේ. කිසි ලෙසකිනුත් සිදුකර ගත නොහැකි අජාති, අජර, අමරතා දියක් කැමතිවී බලාපොරොත්තු කඩවීම, සිතූදේ නොවීම ඉච්ඡා විඝාත දුක ය යි කියනු ලැබේ. මේ හැම දුකක් ම පිඩුකර උපාදන ස්කන්ධ පස මුළුමණින්ම දුක්වන්නේ ය යි කියන ලද්දේය.

මෙහි, ජාතිය, මරණය, අප්‍රිය දෙය එක්වීම හෝ සිදුවීම, ප්‍රිය මනාප දෙයින් වෙන්වීම, පඤ්ච උපාදන ස්කන්ධ යන මොහු තුමූත් දුක් වන අතර තවත් දුක් උපදනට ආකරවන බැවින් වස්තු දුක්ඛ හෝ දුක්ඛ වත්ථු ය යි කියති. ශෝකය, විලාපය, දෙම්නස, දූඩි

ආයාසය යන මොවුහු සවභාව දුක් නම් වේ. කායික වාචසික පීඩා දුක්ඛ දුක්ඛයයි කියනු ලැබේ. සාසව සැප වේදනාවෝ, විපරිණාම දුක්ඛ නම් වේ. උපාදන සකන්ධ පස සංස්කාර දුක්ඛ නම් වේ. මේ දුක්ඛ සත්‍ය විස්තර ය යි.

දුක්ඛ සමුදය සත්‍යය

සමුදය යනු හට ගැණීම හෝ පහළවීමයි. දුක්ඛ නම් ස්කන්ධ ධාතු ආයතනයන්ගේ හට ගැණීම දුක්ඛ සමුදය නම් වේ. එනම්, දුක්ඛ රාශියගේ ප්‍රභව හේතුව වූ තෘෂ්ණාවයි. පුනර්භවය හෝ පුනරුත්පත්තිය නැවත ඉපදීම සිදු කරන්නාවූ ඒ ඒ සත්ව සංස්කාරයන් කෙරෙහි ඇලුම් කරවන්නා වූ නන්දිරාගය එක්ව පවතින භවයෝනිගති සත්තාවාස ආදියට ආලය කරවන්නා වූ යම් මේ තෘෂ්ණාවක් වේ නම් එය දුක්ඛ සමුදය නම් වේ. එය වස්තු කාම කෙලෂකාම විෂය කොට පවතින විට කාමතණ්හා කියාද සස්සත දිට්ඨිය සදකාලික ආත්මය සවර්ගය යනාදී ලබ්ධිය සමග පවත්නා විට භව තණ්හා කියාද උච්ඡේද දෘෂ්ටිය=නාස්තික වාදය සමග පවතින විට විභව තණ්හා ය යි ද කියනු ලැබේ. මෙසේ තුන් ආකාර වී ප්‍රභේද වශයෙන් එක්සිය අටක් වන තෘෂ්ණා තොමෝ දුක්ඛයාගේ සමුදය හෙවත් ප්‍රබල හේතුව බව ආර්‍ය්‍යයන්වහන්සේ දූන වදළ සත්‍යය බැවින් දුක්ඛ සමුදයාර්‍ය්‍ය සත්‍යය නම් වේ. මෙයින් යම් ආසාවක් නැවත ඉපදීම සලසා ද වෙළෙන ඇලෙන පැටලෙන සවභාව ඇත්තේ ද භවයෝනි ආදියෙහි සතුටු කරවන කාම වස්තු පිළිබඳ වූ ශාසවත උච්ඡේද ලබ්ධි සහගත වූ තණ්හාව ම දුක්ඛ සමුදය බව කියන ලද්දේය—

දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍යය

එකියන ලද තෘෂ්ණාව ඉතුරු නැතිව අත්හැරීම නිරුඬ කිරීම දුරළීම ඉන්මිදීම නිරාලය වීමක් වේ නම් ඒ තෘෂ්ණා නිරොධයෙන් ඇතිවෙන දුක්ඛ නිරොධය නිර්වාණය දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍ය ය යි කියනු ලැබේ. මෙයින් සමුදය නම් වූ තෘෂ්ණාව මුළු මණින් නො ඇල්ම, ඉතිරි නො කොට ප්‍රහීණ කිරීම නිර්වාණය දුක්ඛ නිරොධ ආර්‍ය්‍ය සත්‍ය ය යි කියන ලද්දේ වේ.

දුක්ඛ නිරොධ මාර්ගය

ආර්‍ය්‍ය වූ අෂ්ටාඬගික මාර්ගය දුක්ඛ නිරොධ ප්‍රතිපදව නම් වේ. සම්මා දිට්ඨිය නමැති චතුස්සත්‍ය දූනීම, නිවණ දක්නා නුවණැසය. සම්මා සඞකප්පය නම් තුං ආකාර කුශල සංකල්පනා හා නිවණ අරමුණු කරණ කල්පනාය. සම්මා වාචා නම් සතර වැදැරුම් පාප චරිත හා මිථ්‍යා වචනයන්ගෙන් වෙන්වීමය. සම්මාකම්මන්ත නම් තුන් වැදැරුම් පාප චරිතයෙන් වැලකීම හා මිථ්‍යා කර්මාන්තයෙන් වැළකීමය සම්මා ආජීව නම මිථ්‍යා ආජීවයෙන් වැළකීම හා අයුතු ජීවිකා වෘත්තියෙන් වෙන්වීමයි. සම්මා වායාම නම් සතර සම්‍යක් ප්‍රධාන වීර්‍ය්‍ය වැඩීම මිත්‍යා වීර්‍ය්‍ය දුරළීමයි. සම්මා සති නම් සතර සතිපට්ඨාණය හා නිවණ පිළිබඳ සිහියයි. සම්මා සමාධි නම් ධ්‍යාන සතරය, නිවන් අරමුණෙහි සිතේ එකඟ බවය, සත්තිස් බොධි පාක්ෂික ධර්මය, ආර්‍ය්‍ය අෂ්ටාඬගික මාර්ගයෙහි ම ඇතුළත් වෙති.

තවද මේ සිව් සස් දහම් පරිඥනය සඳහා වචනාර්ථ වශයෙන් ලක්ෂණ වශයෙන් ක්‍රම වශයෙන් සංක්ෂෙප වශයෙන්ද ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබොධ කට යුතුය. ලුහුඩින්—දුක්ඛාර්‍ය්‍ය සත්‍යය. සක්කාය දිට්ඨියේ දෙර වැසීමට සමත්ය, සමුදයාර්‍ය්‍ය සත්‍යය උච්ඡේද දෘෂ්ටියේ දෙර වැසීමට සමර්ථය, නිරොධාර්‍ය්‍ය සත්‍යය සාසවත දෘෂ්ටිචාරය වැසීමට සමර්ථය, මාර්ගාර්‍ය්‍ය සත්‍යය මිත්‍යා දෘෂ්ටි චාරය වැසීමට සමර්ථය—උපමා වශයෙන් විෂවෘක්ෂය, එතෙරය, භාරය භාරනික්ෂෙපයන්ට පිළිවෙළින් උපමා වන්නාහ. පිරිසිඳීම් වශයෙන්, මේ ආර්‍ය්‍ය සත්‍ය සතර සම්මුති සත්‍යය, ප්‍රත්‍යෙක සත්‍යය, පරමාර්ථ සත්‍යය,

ආර්‍ය්‍ය සත්‍යය යන සතර ආකාරයෙන් ආර්‍ය්‍ය සත්‍යයම අදහස් කරණු ලැබේ—ගණන වශයෙන් එකත්ව බහුත්ව වශයෙන්, සත්‍යතා වශයෙන් වෙනස් නොවීම් වශයෙන්, ධර්‍මාර්ථ වශයෙන්, ශූන්‍යතා වශයෙන්, නානාත්ව වශයෙන්ද සත්‍ය විභාග දත යුතුය. ලෞකික සත්‍ය ඥානය ආශ්‍රව සහිත සංයොජන සහිත වේ. එබැවින් කිලුටු වන්නේය. ලෝකෝත්තර සත්‍ය ඥානය ආශ්‍රව රහිතය. කිලුටු නොවේ. දුක්ඛ, සමුදය, මාර්‍ග සත්‍ය තුණ සඞ්ඛතය. නිරොධය අසඞ්ඛත නම් වේ. නිරොධ මාර්‍ග සමුදය සත්‍ය තුණ අරූපය, දුක්ඛාර්‍ය්‍ය සත්‍ය සරූප වේ. කුසල අකුසල විභාගයෙන් සමුදය සත්‍යය අකුසලය, මාර්‍ග සත්‍යය කුසල වේ. නිරොධ සත්‍යය අව්‍යාකෘතය. දුක්ඛාර්‍ය්‍ය සත්‍යය, කුසල අකුසල අව්‍යාකෘත ද වේ. කෘත්‍ය වශයෙන් දුක්ඛ සත්‍යය පරිච්ඡෙදයා හෙවත් පිරිසිඳ දත යුතුය. සමුදය සත්‍යය දුරළිය යුතුය. නිරොධ සත්‍යය පසක් කළ යුතුය. මාර්‍ග සත්‍යය භාවනා කටයුතුය. හෙවත් පුහුණු කටයුතුය. ක්‍රම විස්තර වශයෙන් සතර වැදෑරුම් ය. දුක්ඛය සවිඤ්ඤාණ කය පිළිබඳ වේ. සමුදය අභිමාන සහිතය. නිරෝධය නම් සමුදය පහකිරීමය. මාර්‍ගය කායගතා සති වශයෙන් පවතී. නාම රූප වශයෙන් අවිද්‍යා භව තෘෂ්ණා ප්‍රහාණ සමථ විදර්‍ශනා වශයෙන් දෙයාකාරවේ. ත්‍රිවිධ අකුසල මූලය සීල සමාදි ප්‍රඥ වශයෙන් තුන් ආකාර වේ. සක්කාය භාව වස්තු විපල්ලාස, සතිපට්ඨානාදී වශයෙන් සතර වැදෑරුම්ය. පචගතිය, පඤ්ච නිවරණ ඉන්‍ද්‍රිය වශයෙන් පස් වැදෑරුම් වෙති. ඵස්සායතන සය තණ්හා කොටස් සය, පටිනිස්සග්ග ධම්ම වශයෙන් සවැදෑරුම් වේ. විඤ්ඤාණස්ථිති, අනුසස, බොධ්‍යඞ්ග වශයෙන් සත් වැදෑරුම් වේ. ලෝකධම්ම, මිච්ඡත්ත මාර්‍ගාඞ්ග වශයෙන් අට වැදෑරුම් වේ. සත්තාවාස තණ්හා මූලක ධර්‍ම සඤ්ඤ මනසිකාර මූල ධර්‍ම වශයෙන් නව වැදෑරුම් වේ. දිසා චරියා සංයොජන, සංඥදී වශයෙන් දශ වැදෑරුම් වේ.

සඞ්ග්‍රහ වශයෙන් ස්කන්ධ සඞ්ග්‍රහයෙහි දුක්ඛය රූප ස්කන්ධයෙහිද සමුදය මාර්‍ග දෙක සංස්කාර ස්කන්ධයෙහිත් සඞ්ග්‍රහ වෙති. නිරොධය පච ස්කන්ධයෙහි සංග්‍රහ නො වේ. ආයතන සංග්‍රහයෙහි—දුක දෙළොස් ආයතනයන්හිද, ඉතිරි තුණ ධම්මායතනයෙහිද ඇතුළත් වෙති. ධාතු සංග්‍රහයෙහි දුක්ඛය අටළොස් ධාතූන්හි ද සමුදය නිරෝධ මාර්‍ගයෝ ධර්‍ම ධාතුවෙහි ද ඇතුළත් වෙති.

මෙතෙකින් එකොළොස් වැදෑරුම් සත්‍යාධිගම උපායයන් දක්වන ලදහ.

12 පරිච්ඡේදය

දෙළොස්වන පරිච්ඡේදයේ පළමු කොටස

පළමු කොටම යොගාවචර තෙමේ ස්කන්ධ, ධාතු, ආයතන, පටිච්ච සමුප්පාද ආර්ය්‍ය සත්‍ය යන ධර්මයන් පිළිබඳ මනා දැනීම ලබා ගත යුතුය. අනතුරුව ඒ ස්කන්ධාදියෙහි ආත්ම සත්ව ජීවයන් නැති බව දත යුත්තේය. පෘථග්ජනයා සත්ව ජීව වශයෙන් ගන්නේ නාම රූප මාත්‍රය පමණකි. මේ නාම රූප දෙකොටස ස්ව ප්‍රධාන භාවයෙන් පවත්නේ නමුත් එක්ව පවත්නාහුය. නාමයෝ රූප බැවින් ශූන්‍යය, රූපයෝ නාමයෙන් ශූන්‍යය. මේ නාම රූප දෙදෙනා එකක් නිසා අනෙක සිටිනු විනා අන් උපකාරයකින් සිටින්නාහු නොවෙති. යම් සේ බෙරය නිසා ශබ්දයත් දැඅඳපිළුන් උනුනුන් පිහිටෙන් ගමනත් සිදුකර ගණිද අන්ධයාට හා කොරාට තනිතනිව යා නොහැකි ද එමෙන් නාමයාගේ පිහිටෙන් රූපය ද රූපයාගේ උදව්වෙන් නාමය ද පවතිය යි. මේ දෙදෙන නැති නම් ශරීරයක් ජීවයක් නැත්තේමය. පෘථුජ්ජන තෙමේ මම යමි, සිටිමි, ඒ තෙමේ ය යි සිටියි හෝ කියති. ඒ නුසුදුසුය. නාම රූප දෙකම ය යි සිටියි, නිඳයි, බුදියි, උපදියි, මියයි—යනුවෙන් නාම රූප ගැණම සිත පිහිටුවා ගණී. එසේ උපදනා උතුම් ඥාණය තත් වූ පරිදි දැකිම නම් වූ යථාභූත ඥාණ දර්ශනය විසුද්ධි මාර්ගය නාම රූප ව්‍යවස්ථානය තෙමේ දිට්ඨි විසුද්ධි ය යි කියනු ලැබේ.

කඞ්ඛා විතරණ විසුද්ධිය නම්—ඉහත සඳහන් නාම රූප ධර්මයන්ගේ හේතු ප්‍රත්‍යය පිරිසිඳ දැන ගැණීමයි. ආජීවය අටවැනි සීලයෙන් හා සිව් පිරිසිදු සීලයෙන් ද යුත් අෂ්ට සමාපත්ති ධ්‍යාන අභිඥාදී චිත්ත විසුද්ධියෙන් ද නාම රූප දෙදෙනා පිළිබඳ නියම දැනීමෙන් ද යුක්ත වූ යෝගාවචරයා ගේ සිතෙහි තවත් සත්ව පුද්ගල යන හැඟීම් ඉතිරිව තිබේ නම් එවිට දුක්ඛයාගේ නිදනය හෝ මුල්ම හේතුව සෙවිය යුතුය. හේතු ප්‍රත්‍යය විස්තරය මුල සිට අගටත් අග සිට මුලටත් ඇති වන සැටි නැති වන සැටිය මෙනෙහි කරන්නේය. ඉඳුරන් සැනසීම නම් වේදනාව ඇති වුවොත් තණ්හා නැමති ආසාව හටගන්නේමය. විඳීම නැතිවුවොත් තණ්හා නම් දෙයක් ඇති නොවන්නේම ය යි ඇති වන සැටිය සිතීම අනුලෝම දැනීම ය යි දතයුතුය.

එසේ අනුලෝම වශයෙන් සිතන විට—සතර ආර්ය්‍ය සත්‍යයන් නොදැනීම හා වැරදි ලෙසින් දැනීමත් අවිද්‍යා නම් වේ. මේ සැබෑ දැනීම නැතිකම හා වැරදි බොරු දැනීම ඇති කමත් නිසා පුණ්‍ය අපුණ්‍ය ආනෙඤ්ජ යන අභිසංස්කරණ රැස්කිරීම් සඞ්ඛ්‍යාත සංස්කාරයෝ පහළ වෙති. මේ කුශලාකුසල සිතිවිලි සමූහාරය නැමති සංස්කාරයන් පවත්නා නිසා පිළිසිඳ ගැණීම් විඤ්ඤාණය පහළ වන්නේය. ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ යන නාම ධර්මයන්ගේත් රූපයන්ගේත් හටගැණීම වේ. මේ නාම රූප හටගැණීම නිසා ඇස, කණ, නාසය, දිව, සම, මනස යන සදෙර පිළිබඳ විඤ්ඤාණ නමැති ආයතන සයෙහි හට ගැණීම වේ. ඒ ආයතන සදෙනා ඇති වී මෙන් රූප, ශබ්ද, ගන්ධ, රස, ඵස්ස ධම්ම යන බාහිර ආයතන සයත් සමග ගැටීම වූ ස්පර්ශය ඇති වේ. අභ්‍යන්තර ආයතන හා බාහිර ආයතන එකට හැපීම නිසා සැප දුක් මැදහත් විඳ දැන ගැනීම් වේදනා හටගණී. වේදනාවන් නිසා තණ්හාව උපදී, තණ්හාව නිසා උපාදන නම් ස්කන්ධ පඤ්චකය හටගණී. පස් උපාදනයන් නියා උත්පත්ති කර්ම සඞ්ඛ්‍යාත භවය හටගණී. කර්ම සඞ්ඛ්‍යාත භවය නිසා ඉපදීම සිදුවේ. ඉපදීම නියා දිරීම, මැරීම, සෝකය, විලාපකීම, කාය පීඩා, සිත් පීඩාදී දුඃඛ ආයාසයෝ හට ගණිති. දුකෙහි

හට ගැණීම මෙයාකාරයෙනැයි අනුලොම් වශයෙන් මෙනෙහි කරන්නේය. මෙලෙසින් දුක් ඉපදීම පිළිබඳව හේතු ප්‍රත්‍යය තේරුම් කරගන්නා යෝගාවචරයාට උපදින ඥාණය, ධම්මට්ඨිති ඥාණය, හෙතු ප්‍රත්‍යය පිරිසිඳ ගන්නා ඥාණය, කඞ්ඛා විතරණ විශුද්ධිය නමැයි දතයුතුය.

යම් විටක යෝගී තෙමේ දුක් උපදින පිළිවෙළ අනුලෝමයෙන් සලකා බලන්නේ ද එසේ ම පටිලෝම—නැතිවන ක්‍රමය ද මෙසේ සලකන්නේය. එනම් දතයුතු සත්‍යයන් නොදැනීම හා අනිත්‍ය දුක්ඛ අනාත්මාදිය නිත්‍ය ශුභ සුඛ ආත්ම ය යි වැරදි සේ දැනීම වූ අවිද්‍යාව නැතිවීමෙන් සංස්කාරයන් නිරුද්ධ වෙති. සංස්කාර නිරෝධයෙන් ප්‍රති සන්ධි විඥ්ඥාණය නිරුද්ධ වෙයි. ප්‍රතිසන්ධි විඥ්ඥාණය නිරුද්ධවීමෙන් නාම හා රූපයෝ නිරුද්ධ වෙති. නාම රූප නිරුද්ධිය නිසා සළායතන නිරෝධයෙන් ස්පර්ශ නිරෝධය වේ. ස්පර්ශ නිරෝධයෙන් වේදනා නිරුද්ධිය වේ. වෙදනා නිරුද්ධ වීමෙන් තෘෂ්ණාව නිරුද්ධ වේ. තෘෂ්ණාව නිරුද්ධවීමෙන් උපාදාන නිරෝධය වේ. උපාදාන නිරෝධයෙන් භව නිරෝධය ද භවය නිරුද්ධ වීමෙන් ජාතිය ද ජාතිය නිරුද්ධවීමෙන් දිරීම, මැරීම, සොක, පරිදෙ ව, කාය චිත්ත පීඩා සියලලම නිරුද්ධ වන්නාහ. මෙසේ මේ ප්‍රතිලෝම හේතු ප්‍රත්‍යය පිරිසිඳ දන්නා ප්‍රඥාවෙන් දුක්ඛ මූලය පැහැදිලිව දැන ගන්නේය. අනතුරුව ඒ තෙමේ තණ්හාව දුරළන උපායයන් සොයන්නේය. උපාදානස්කන්ධ පංචකයෙහි එක්සිය අසූ ආකාරයකින් තෘෂ්ණාව දුර ලන්නේය. ඒ මෙසේය පළමු කොට රූපස්කන්ධයෙහි අතීත රූපය අනාගත රූපය, පවත්නා රූපය අභ්‍යන්තර රූපය බාහිර රූපය, මහත් රූපය, කුඩා රූපය, ඕලාරික රූපය, සියුම් රූපය, දූරයෙහි රූපය, සමීප රූපය යන දෙළොස් ආකාර සියලුම රූපය අනිත්‍යයයි දක්නේය. මෙලෙසින් වේදනා ස්කන්ධය දෙළොස් ආකාරයකින් ද සඤ්ඤා සංඛාර විඤ්ඤාණ ස්කන්ධයෝ ද දෙළොස් දෙළොස් ආකාරයෙන් අනිත්‍ය බව දක්නේය. මෙසේ පංචස්කන්ධයෙහි ආකාර හැටක් වේ. එය දුක්ඛ, තණ්හා දෙකින් ගුණ කළ විට මුල් හැටත් සමග එක්සිය අසූවක් තණ්හා ප්‍රහාණ ක්‍රම වෙති. තවත් ක්‍රමයකින් එක්සිය අසූ ක්‍රමය දැක්ක හැකිය. එනම්: අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්ෂණ තුනෙන් ෂට්ක දශය අභ්‍යන්තර ආයතන සයද බාහිර ආයතන සයද චක්ෂුර්විඥානාදි විඥාන සයද චක්ෂු ස්පර්ශාදී ඵස්සකාය සයද චක්ඛු සම්ඵස්සජාදී වේදනා සයද, රූප සඤ්ඤා දී සයද චෙතනා සයද රූප තණ්හාදි සයද විතක්ක සයද විචාර සයද ගුණ වූ කල්හි (3 × 6 × 10)—එක්සිය අසූවක් තණ්හාව ප්‍රහීණ කරණ ආකාර දක්නා ලැබේ.

මෙසේ යෝගී තෙමේ සියලු සංස්කාරයෝ ඇසිල්ලක් පාසා පෙරළෙන වෙනස් වන ස්වභාව ඇත්තාහු ය යි දැන ගණී. සෑම සංස්කාරයෝම හැමදම අලුත්ම ය යි දැනගණී. පහන් දළුව වැනිය, එය හැම විට ම අලුත්ය. නිත්‍ය නවක නිත්‍ය අභිනවයෝමය. එසේ ම සියලුම සංස්කාරයෝ දුක්ය. අවසවර්ති අකීකරු බැවින් අනාත්මය. අනිත්‍යානු දර්ශනයෙන් අනිමිත්ත ධාතුව ද දුක්ඛානු පස්සනාවෙන් අප්පණිහිත ධාතුව ද අනාත්මානු දර්ශනයෙන් ශූන්‍යතා ධාතු නම් නිවණ ද දක්නේය. තුන් භවය, පස් ගතිය විඤ්ඤාණස්ථිති සතය සත්තාවාස නවය ද අනිත්‍යය දුකය අනාත්ම ය යි විශෙෂයෙන් දැන ගණී. භව පරිච්ඡෙද ඥාණ ය යි.

උදය ව්‍යය ඥාණය

උපාදානස්කන්ධ පසෙහි ඉහත සඳහන් පරිදි පැහැදිලි ලෙස ත්‍රි ලක්ෂණය දැනගත් යෝගා වචර තෙමේ ඔවුන් පිටු දැකීමටම කැමති වන්නේය. එසේ උපාදානයන් පහ කිරීමට ත්‍රිවිධ නිමිත්තක් අනුව හටගැණීම හා වැනසීම ද විමසන්නේය. ඒ තුන් ආකාර නිමිත්ත ග්‍රහණයන් අතර පළමු වන කෙලශ නිමිත්ත ග්‍රහණය වරදවා තේරුම් ගැණීම නැති කිරීම පිණිසය. අනිත්‍ය වූ අස්ථිර වූ අශොභන වූ දුක් වූ අනාත්ම වූ ස්කන්ධාදී ධර්මයෝ පෘථජ්ජනයන්ගේ නිත්‍ය ස්ථිර ධෘව ශුභ සුඛ ආත්මාදී වරදවා ගැණුම් දුරලීම වේ. පහණ

කට තෙල් වක්කරන්නාක් මෙන් කෙලෙස් අඳුරු දුරලයි. දෙවැන්න සමාධි නිමිත්ත ග්‍රහණ ය යි. අටතිස් අරමුණු කමටහන් අතුරෙන් එකක් වඩා හිත පිරිසිදු කරගණ හිත බලවත් කරගණී. තුන් වැන්න විපස්සනා නිමිත්ත ගැණීමයි. ස්කන්ධයන් හි ඇති නියම තත්වය දැකීම උදයව්‍යය විදර්ශනා නිමිත්ත නම වේ. මෙ විට මත්ස්‍යයෙකැ යි සිතා දරුණු විෂ ඇති සර්පයෙකු අතින් අල්ලාගණ දියෙන් උඩට මතුකොට බැලුවාම නපුරු සර්පයෙකු බව දැනුණු පුරුෂයාට ඇති වන කල්පනාව උගෙන් බේරි දිවි රැක ගැණීමටය. එම මේ උදයවය දක්නා යෝගී හුගේ අදහසත් සසරින් මිදීමම වන්නේය. ඉහත සඳහන් පරිදි තුන් වැදෑරුම නිමිති වශයෙන් පිරිසිඳ දත් ලක්‍ෂණ ඇත්තේ? ආරම්මණ වශයෙන් හා මනසිකාර වශයෙන් ද ඒ ධර්‍මයො පිරිසිඳ දැනගණී. හේතු වශයෙන් ප්‍රත්‍යය වශයෙන් ස්වභාව වශයෙන් තුන් ක්‍රමයකින් උදයව්‍යයය පිරිසිඳ දනී. මෙසේ සියලු සංස්කාරයන් හටගැණීම හා විනාස වීම පැහැදිලිකර ගනිමින් එකම ලක්‍ෂණ ධර්‍මයන් නා නා ස්වභාව ධර්‍මයන් අකිරිය ධර්‍මයන් මනා ලෙස ඒකත්වන්‍යාය නානාත්වන්‍යාය අව්‍යාපාරන්‍යාය ධර්‍මතා න්‍යායාදී වශයෙන් සතර ආකාරයකින් ආසාව දුරු කරන්නේය. මෙ සේ හට ගැණීම වැනසීම බලා සංස්කාර පරිඥව උපදවයි.

භඞ්ගානුපස්සනා ඤාණය නම—සංස්කාරයන්ගේ උදයව්‍යය වශයෙන් ආදීනව දැනගත් යොගාවචර තෙමෙ සංස්කාරයන්ගේ උත්පාදය හැර විනාසයම අනුව බලන්නේය. සංස්කාර ධර්‍මයන් බිඳෙන අයුර තුන් ආකාරයකින් බලන්නේය. කලාප වශයෙන් යුගල වශයෙන් පරිච්ඡෙද වශයෙන් ද සියලු සංස්කාර ධර්‍මයෝ විපරිණාම වෙනස්වීමේ ලක්‍ෂණයෙන් උපදින අයුරු දිරණ අයුරු මියන අයුරු හොඳින් දක්නේය. ඕභාස නම් ආලෝකය, ඤාණය, ඉන්ද්‍රියයන් ප්‍රබොධ කරවන ප්‍රීතිය කය හිත බර ඇරීම, සැනසීම, අධිමෝක්‍ෂ නම් නිශ්චය දැඩි සේ ගැණීම, එළඹ සිටීමාදිය උපේක්‍ෂාව ආදී විදර්ශනා උපක්ලෙශයෝ පහ වෙති. නෛක්ඛම්ම නිස්සරණයෙහි ම ඇලුනේ වේ. සංස්කාරා රම්මණයෝ ලෞකිකයෝය. නිර්‍වාණාරම්මණ ධර්‍මයෝ ලොකෝත්තරය. මේ බැව් තත්වූ පරිදි දක්නා වූ සංස්කාරයන්ගේ විනාස ස්වභාවය ම බලන්නේය. භඞ්ග මාත්‍රය අනුව ඤාණය උපදවයි.

13 පරිච්ඡේදය

තෙළෙස් වැනි සත්‍ය විභාග පරිච්ඡේදයේ දෙවන භාගයයි

භයතුපට්ඨාණ ඥාණය—සංස්කාර ධර්මයන්ගේ විනාස මාත්‍රයම පැහැදිලිව දුටු යොගාවචර තෙම විනාස වන සවභාවය ගැණ කළකිරෙයි. සර්ව සංස්කාරයන් කෙරෙහි භය වෙයි. කාම රූප අරූප යන තුන් භවයම, දෙව, මනුස්ස, නිරය, ප්‍රෙත, තිරිසන් යන ගති පසම සත් වැදෑරුම් විඥාන ස්ථිතියම නව සත්වාවාසයන් ද ලැව් ගිනිගත් වනගහණයක් මෙන් වැටහෙයි. කඩුව ඔසවා ගණ ලුහුබඳනා බිහිසුණු පුරුෂයෙකු ලෙස ද දරුණු විෂඝෝර සර්පයෙකු මෙන් ද හැඟෙයි. මෙවැනි දැකීම් හැඟීම් ඇති බියගුලු පුරුෂයෙකු ඉන් ගැලවී මිදියාමට සිතන්නාසේ අනිමිත්තානුපස්සනාවෙහි සිත යොදයි.

මුඤ්චිතු කම්‍යතා ඥාණය—යම් විටක ඒ යොගාවචර තෙමේ භය වසයෙන් දක්නේවේද, ගිනි ඇවිලි දැවෙන ගෙයකින් දිවි රැක ගණු කැමති ගෙවැසියන් මෙන් ද සොරුන් විසින් මැදි කරගත්තෙකු මෙන් ද සියලු සංස්කාරයන්ගෙන් මිදෙනු කැමති වේද, ආදිනව දැකීමෙන් කළකිරී නිරාලය වීමෙන් ද අනතුරු කාරයෙකු ආසන්නව සිටින බව සැලකීමෙන් ද මිදී යනු කැමති වන්නේය.

අනුලෝම ඥාණය—යම් විටක යොගාවචරයාට සසර දුකින් මිදී යනු කැමැත්ත පහළවේද සියලු සංස්කාර ධර්මයන්ගෙන් මිදෙන උපාය සොයයි ද විමෝක්ෂය නම් සම්පූර්ණ නිදහස ලබන අදහස වේ ද පටිසඞ්ඛානු පස්සනාව හා සංස්කාරයන් නිරාලය වසයෙන් සලකා අනතුරුව සත්‍යානුලෝම ඥාණය උපදවන්නේය. හැම සංස්කාරයක්ම, අනිත්‍යය, දුකය, අනාත්මය, ඔවුන්ගේ නිත්‍ය බවක් සැපයක් පරමාර්ථතාවක් නැත්තාහු යයි සලකයි. සත්තිස් බොධි පාක්ෂික ධර්ම මෙනෙහි කරයි. සතර සතිපට්ඨානාදී ධර්මයන් පිළිබඳ ඥාණය චතුස්සත්‍ය ධර්මයන්ට අනුකූල වූ ඥාණය අනුලෝම ය යි කියනු ලැබේ.

ගොත්‍රභූ ඥාණය—පෘථජ්ජන ගොත්‍රය අභි භවනය කරමින් අරිය ගොත්‍රය පහළ කරවමින් උපදනා ඥාණය ගොත්‍ර භූ නම් වේ. මේ ගොත්‍ර භූ ඥාණය විදර්ශනා ඥාණයකුත් නොවේ. මාර්ග ඥාණයක් ද නොවන්නේය. නව මහා විදර්ශනා ඥාණයන්ගේ අවසානයේ සතර මාර්ග ඥානයන්ට පළමුව උපදනා මාර්ග ඥානයාගේ ආවර්ජන ස්ථානය වේ. විදර්ශනා ශ්‍රොතාවසානයේ ඇති වන නිසා විදර්ශනා නම නොලබයි. මාර්ගය ආවර්ජනය කරයි. ගොත්‍ර භූ ඥාණයට අනතුරුවම දුක්ඛය පිළිබඳ ඥාණය ද උපදී. දුක්ඛ සමුදය නම් තණ්හාව දුරලයි. නිරොධය ප්‍රත්‍යක්ෂ කරයි. මාර්ගය වඩයි යන සතර කාර්‍යයන් එකවර කරමින් සොතාපත්ති මාර්ග ඥාණය උපදනේය. පහණක් දල් වෙනු සමග එකවර තෙල් සිඳවීම, වැටිය අලුකිරීම, අඳුර දුරලීම, එළිය පැතිර වීම යන වැඩ හතරක් සිදු කරන්නාක් මෙන් සෝවාන් මාර්ග ඥානය සතර ආර්‍ය සත්‍යයන් පැහැදිලි කරමින් උපදනේය. සියලුම බොධි ධර්මයො උපදනාහුය. මේ සියල්ලම පෙර පසු නොවී එකවර සිදුවෙති. සච්ච පරිච්ඡේද ය යි කියා මේ ඥාණයට විශෙෂ නමකි.

මේ සත්‍ය පරිච්ඡේද ඥාණය සසර මහ සයුර තරණයට නැවක් සමානය. ප්‍රදීපයක් මෙන් කෙළෙස් අඳුරු දුරලා ඥාණාලෝකය උපදවා සූර්‍යෝදයෙන් ද්‍රව්‍යයන් මෙන් නව ලොවුතුරා දහම් පැහැදිලි කරමින් උපදී. ගොත්‍රභූඥාණය කෙලෙස් ගින්නෙන් දැවෙන තුන් භවය නැමති කාන්තාරයේ දුවන්නා වූ සත්ව සමූහයා නිර්භය වූ නිවන් නගර දෙරටුවෙහි එක පයක් ඇතුළත තබා සිටි පුරුෂයකු සමානය. මාර්ග ඥානය අභය පුරය තුළ

දෙපයම තබා සිටින පුරුෂයෙකු වන්නේය. එයින් ගොත්‍ර භූ ඥාණය එක් පයක් අභය පුරයෙහිත් අනික් පය භවදූගියෙහිත් බැවින් යෙහෙන් මිදුනේ නොවේ. මාර්ග ඥානය නිවන් පුරයටම ඇතුල්ව සිටිනා බැවින් සම්පූර්ණයෙන් භවයෙන් මිදුනේ වේ.

මේ සත්‍ය පරිච්ඡේද ඥාණ ලැබූ යෝගාවචර තෙමේ සක්කාය දිට්ඨිය නමැති ආත්ම දෘෂ්ටිය ද විචිකිච්ඡා නම් තුනුරුවන් කෙරෙහි ද හේතු ඵලයන් ගැණ සැකය සීලබ්බත පරාමාස නම් බාහිරාගම් වල දක්වන අජසීලාදි සීලයන් ද කුක්කුරව්‍රතාදි ව්‍රතයන් ද සමාදන් වීම යන සංයොජන තුණ දුරලා නිවන් ශ්‍රොත්‍රසට පැමිණි ආර්‍ය්‍ය පුද්ගල සඞ්ඛ්‍යාවට ඇතුළත් වන්නේය. සක්කාය දිට්ඨිය දුරලීමෙන් සියලු දෙසැට මිථ්‍යා දෘෂ්ටීන්ගේ මුල සක්කාය දිට්ඨිය බැවින් සියල්ල දුරු කළේම ය. ඒ සෝවාන් ආර්‍ය්‍ය තෙමේ රහත්වීම දක්වා පිළිවෙළින් ම භාවනා වඩන්නේය. ඒ ඒ ඵලයන්ට පැමිණි පසු ප්‍රත්‍යවේක්‍ෂා නම් විමුක්ති ඥාණය උපදනේය. සෝතාපන්න පුද්ගලයො තිදෙනෙකි. මෘදු වූ ශ්‍රද්ධා ප්‍රඥ දී ඉන්‍ද්‍රියයන් ඇති සත්තක්ඛත්තු පරම පුද්ගලයාය. හෙවත් මිශ්‍රක භව වශයෙන් හත් වරකට වඩා නූපදනා ආර්‍ය්‍යයාය. ප්‍රණිත (මධ්‍යම) ඉන්ද්‍රිය ඇති කොලංකොල හෙවත් මිශ්‍රක භව වශයෙන් පස්වාරයකට අඩුව උපදනා ආර්‍ය්‍ය පුද්ගලයාය. තියුණු වූ ශ්‍රද්ධා ප්‍රඥදී ඉඳුරන් ඇති ඒක බීජි නම් එක වරක්ම කාම භවයේ උපදනා ආර්‍ය්‍ය පුද්ගලයාය කියායි.

සක්කාය දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන තුන් සංයෝජනයන් දුරලා කාම රාගය හා ව්‍යාපාදයද තුනී කරලීමෙන් සකදාගාමී වන්නේය. එක වරක්ම කාම ලෝකයේ ඉපිද රහත් වන්නේය. කාම භවය නම් වූ මිනිස් ලොව සදෙව්ලොව හා සතර අ පායයන්හි ඉපදීම විපාක විඳීමට හෙතුවන කරුණු පස ඕරම්භාගිය සංයෝජන ය යි කියනු ලැබේ. මේ කාම ධාතුක සංයෝජන පස දුරුකිරීමෙන් අනාගාමී වන්නේය. කාමාවචර ලෝකයේ ඉපදීමට හේතුනොවන්නේය. මේ අනාගාමී ආර්‍ය්‍යයන් උපදනා ස්ථාන සුද්ධාවාස බ්‍රහ්ම ලොක නම් පස් පොළක් ඇත. එහි නමින් කිය වෙන පරිදි පස් නිවරණ මැඩ පවත්වා සතර වැනි ධ්‍යානය ලබා සිටීමය. සංයෝජන දසයෙන් මුල් පස දුරලා තුන් වෙනි ආර්‍ය්‍ය ඥාණය ලැබ සිටීම ඒ පස් බඹතලයෙහි ඉපදීමට සුදුසුකම් වෙති. මේ දෙයාකාර සුදුසු කම් නැති කිසිවෙකුට සුද්ධාවාසයන්ට යා නොහැකිවාසේ ම එහි උපන් කිසිවෙක් අන්කිසි ලොවක උපදින්නේත් නැත. ඒ පස් බඹතලයෙහි දී ම රහත්ව පිරිනිවෙන්නාහුය. එහි අවිහ, අතප්ප, සුදස්ස, සුදස්සි යන මුල් සතරෙහි එක එක තලයෙක අසඞ්ඛාර පරිනිබ්බායි සසංඛාර පරිනිබ්බායි අන්තරා පරිනිබ්බායි උපහච්ච පරිනිබ්බායි උද්ධංසොත අකනිට්ඨ ගාමී ය යි පස් පස් දෙනා බැගින් විස්සක් ද, පස්වැනි අකනිට්ඨ වෙහි උද්ධංසොත අකනිට්ඨගාමීන් හැර ඉතිරි සතර දෙනා බැවින් අනාගාමී පුද්ගලයෝ සූවිස්සකි. මේ ආර්‍ය්‍යයෝ එහි දී ම රහත් ව පිරිනිවන් පාන්නාහුය.

ප්‍රකීර්ණක කථා මිශ්‍ර උපදෙස්

මෙහි දී මිශ්‍රක උපදෙශ වශයෙන් ධර්ම විස්තරයක් දතයුතුය. විදර්ශනා, විතර්ක, ප්‍රීති, වෙදනා, භූමි, ඉන්‍ද්‍රිය, විමෝක්‍ෂ, කෙලෙස, සමවත්, රහත්වීම සඳහා කටයුතු පිළිබඳ උපදෙශ විස්තර දතමනාය. විපස්සනා විශිෂ්ට පිරිසිදු දැකීමය. එය ධ්‍යාන විපස්සනාය සුක්ක විපස්සනා ය යි දෙයාකාරයි. යම් යෝගියෙක් සමාධි භාවනාවෙන් පචනිවරණාදි අකුසල් විෂ්කම්භනයෙන් ප්‍රහීණ කොට ධ්‍යාන වඩා විදර්ශනා භාවනා වෙන් මාර්ග ඵල ලබා නම් ඒ ධ්‍යාන පූර්වාඞ්ග විදර්ශනාවයි. ඉදින් සිය නුවණ බලයෙන් නීවරණ දුර දමා විදර්ශනා පූර්වාඞ්ගම සමාධි උපදවයි—සුඛ—සුක්ක—හුදු විදසුනෙන් යුත් ආර්‍ය්‍යයාය මෙය සුක්ඛ නොව සුක්ක හෝ සුඛ විපස්සක විය යුතු නොවේ ද ? විතක්ක නම් අරමුණට සිත නැංවීමයි. විචාර ඒ අරමුණ තුළ හිත හැසිරවීමය. භූමි වශයෙන් සවිතක්ක—විතර්ක සහිත භූමිය. අවිතර්ක භූමිය, සප්පීතික භූමිය නිප්පීතික භූමිය කියා ද දර්ශන භූමි නම් සොතාපත්ති මාර්ග ය යි. නොහොත් මිථ්‍යා දෘෂ්ටි ය යි. සඞ්කලප භූමි—සෙසු තුන් මාර්ග ඵලයෝය. අනිච්ච දිට්ඨිය මෙනෙහි කිරීම යි. සේඛ භූමි යනු

සතර මාර්ග ඥාන හා මුල් ඵල තුණය. අසෙඛ භූමිය නම් රහත් ඵලය වේ. ඉන්ද්‍රිය නම් ආධිපත්‍යය දරණ ධර්මයෝය. ලොකෝත්තර ඉන්ද්‍රිය අනඤ්ඤාත ආයර්‍ය ධර්ම ඥසාමීතින්ද්‍රිය අඤ්ඤින්ද්‍රිය අඤ්ඤාතාවින්ද්‍රිය යන මොව්හුය. සොතාපත්ති මාර්ගඥානය. සෙසු මාර්ග ඥාන තුණය සෙසු ඵලතුණය රහත් ඵලය ද ඉන්ද්‍රිය නාමයෙන් සලකනු ලැබේ.

විමොක්ෂ තුණකි, අනිමිත්ත, අප්පණිහිත සුඤ්ඤතාවශයෙනි— කෙලශනම්— ලෝභය ද්වේෂය මොහයයි. අකුශලමූල තුණකි. කාමපයෙර්ෂනය භවපයෙර්ෂණය බ්‍රහ්මචර්‍ය පයෙර්ෂණයයි සෙවීම් තුණකි. කාම, භව, දෘෂ්ටි, අවිද්‍යායයි ආශ්‍රව සතරකි. දැඩි ලෝභය, වනස්සිතය, සීලව්‍රතපිළිගැණීම, මෙම සැබවයි ගැණීම යන මේ සතර ග්‍රන්ථ හෝ භවබැඳුම් වෙති. කාම, භව, දිට්ඨි, අවිජ්ජා යයි ඕඝ සතරකි. යෝග නමුදු වෙති. කාම, දිට්ඨි, අත්තවාද සීලව්‍රතයයි උපාදාන සතරකි. ඡන්ද ද්වේෂ, භය මොහ යයි අගති සතරකි. ආවාස මසුරුකම, කුලමසුරු කම, ලාභ, වණ්ණමච්ඡරිය ධම්ම මච්ඡරිය කියා මසුරුකම් පසකි—කාමච්ඡන්දය, ව්‍යාපාද ථීනමිද්ධය උද්ධච්ච කුක්කුච්චය විචිකිච්ඡායයි නිවරණ පසකි. ක්‍රොධය, මාණය, ගුණමකුකම, ඊර්ෂ්‍යාව, කපටිකම පව්වු අදහස් ඇති බව, තම ලබ්ධිය ඉස්මතු කරන්ටයාම යන මොව්හු විවාද මූලයෝය.—කාමරාග අනුසය, පටිඝ නම් ක්‍රොධ, මාණ දිට්ඨි විචිකිච්ඡා භවරාග අවිජ්ජා යන සත අනුසය නම් වෙති— ලාභ අලාභ යස අයස, නින්ද, පැසසුම්, සැපදුක යන අට ලොකධර්ම නම් වෙති—නවවිධ මාණය, සෙය්‍ය සදිස හීණයන්ට සෙය්‍යසමහීණ වෙමියනුයි. ලොභො, දෙසො මෝහ මාණ දූයි විචිකිච්ඡා ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යනු දස කෙලසයෝය.

දස ආඝාතවස්තුය. පාණඝාත අදින්නාදාන, කාමමිථ්‍යාචාර, මුසාවාද, පිසුණාවාච, පරුෂවචන ප්‍රලාපදෙඩීම, දැඩිලෝභය, ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටිය යන දශය අකුසලකර්මපථ යෝය, කාමරාග, පටිඝ, මානදිට්ඨි විචිකිච්ඡා, භවරාග අවිජ්ජා, සීලබ්බත පරාමාස, ඉස්සාමච්ඡරිය යන දශය සංයෝජනයෝය.— මිච්ඡත්ත දසයය, විපයර්‍යාසග්‍රාහ දොළසය අකුශල චිත්තෝත්පාද දොළසය යි මෙසේ එක්සිය සූතිසක් කෙලෂයෝ මාර්ගඥානයෙන් දුරුකට යුත්තාහු වෙති.

සමාපත්ති දෙකකි, පුථුජ්ජන නොවූ ආයර්‍යවූ උතුමන් සේවනය කරණ ඵල සමාපත්තියද සඤ්ඤාවේදයිත නිරෝධ සමාපත්තියදයන දෙකය. මෙයින් ඵල සමාපත්තිය නම් කුමක්ද?. මේ ශ්‍රාමන්‍ය ඵලය යිතතුළ නිර්වාණය පිහිටුවා ගැණීමෙන් ආයර්‍ය ඵලය නිරුද්ධ වීමෙන් අර්පණාව හෙවත් සමවැදීම වන්නේය. මෙය ඵල අනන්තයේදි සමවදිනා බැවින් ඵල සමාපත්තියයි කියනු ලැබේ යනු මීට ඵලසමවතයයි නම්වූයේ කෙසේද යන්නට පිළිතුරවේ. මේ ඵල සමාපත්තිය කුසල් හෝ අකුසල් හෝ ක්‍රියා සිතක් නොවන්නේය. ලෝකෝත්තර මාර්ග ඵලයන්ගේ විපාකමාත්‍රයම වන්නේය. ඒ නිසාද ඵලසමාපත්තිය නම් වේ. මේ ඵලසමාපත්තියට සමවදින්නේ කවුද? අනාගාමී හා රහතුන්වහන්සේලා සමවදිති. උන්වහන්සේලාගේ සමාධිය බලගතුව නිසැකව පවතින බැවිනි. අභිධර්ම ක්‍රමයෙ හැටියට සියලුම ආයර්‍යයන් වහන්සේලා ඒ ඒ ඵලයන්ට අයත් ඵල සමාපත්තීන්ට සමවදිනැයි කියනුලැබේ. නමුත් සෝතාපත්ති මාර්ගය උපදවනු සඳහා උපපාදය අභිභවනය කරයි. ගෝත්‍රභූ ඤාණය සෝතාපත්ති ඵලය උපදවනු පිණිස උපපාදය අභිභවනය කෙරෙණුයි—එසේමය.—සමහරු කියන පරිදි සොතාපන්න සකදාගාමීහු ඵල සමවත් නොවදිති—උසස් ආයර්‍යයෝ දෙදෙනාම සමවදිති ඊට කාරණයනම් සමාධිය සම්පූර්ණ කරගැණීමයි. අපුථුජ්ජනයෝ ලෞකික සමවත් අවදින්ට හැකි වෙති. එබැවින් සැම ආයර්‍යයෙකුටම ඵලසමවත් අවදින්ට හැකියාව තිබිය යුතුමය. එහෙත් සමාධිලාභීහුම සමවදිති. ආයර්‍යඋවත් සමාධිලාභී නොවේ නම් සමවත් ඇවදීමක් නොවේ. යම්සේ අව්සුළඟින් පිඩිතව පිපාසිත පුරුෂයෙකුට ගැඹුරු ළිඳක රැහැණක්නැතිව නගාගත නොහැකි වූ වතුරක් දක්නට ලැබේ නමුදු, පිපාසය නිවාගත නොහැකිවේමය. වතුර බාගැණීමට එකම බාධාව රැහැණක් නැති කමය. එසේම නිවන් රස නැමති ජලය පානය කරන්ට සමාධි නැමති රැහැණ අවශ්‍යමය. සමාධි නොලැබූ රහතුන්වහන්සේටද ඵලසමවත්

සමවැදීම නොවේමය. ආයර්‍යයන් වහන්සේලා ඵලසමවතට සමවදින්නේ කුමටද? සිතූ සිතූ විටක නිවන් සැප විඳිනු සඳහාය. දිට්ඨධම්ම සුඛවිහරණය සඳහාම බව වදාළ බුදුරජාණන්වහන්සේ ආනන්දය අනිමිත්තා චෙතො සමාධිය කායික සැප විහරණය වන්නේයයි වදාළ සේක.

මේ අනිමිත්තා චෙතොසමාධියට සමවදින්නේ කෙසේද? සියලුම නිමිති මෙනෙහි නොකිරීමෙන් අනිමිත්ත ධාතුනම් නිවණ පමණක් මෙනෙහි කිරීමෙන්ද සමවදින්නේය. කෙසේ මෙනෙහි කරයිද? අසංඛතවූ හෙවත් හේතුප්‍රත්‍ය සංයොගයකින් සකස් නොවූ අමතධාතුව සාන්තය ප්‍රණීතයයි සිතීමෙනි. මීට සමවදින්නේ කොයි ආකාරයෙන්ද? සමවතින් සිටින්නේ කෙසේද. සමවතින් නැගිටින්නේ කෙසේද ? සලකා ගත යුතුවේ.— ඵලසමාපත්තිය ලෞකිකද ලෝකෝත්තරද? මේ සමාපත්තිය ලෞකික නොවේ, ලෝකෝත්තරමය.

කොයි වේලාවේ කෙසේ අනාගාමීහු පලසමවතට සමවදීද? කෙසේ ගොත්‍රභූඥාණය ඵලසමාපත්තිය නූපදවයිද? අනාගාමී පුද්ගලයාගේ ගොත්‍රභූඥාණයට අනතුරුවම අරහත්මාර්‍ගය උපදීද? ගොත්‍රභූඥාණය විදර්‍ශනාඥාණයක් නොවන්නේ කෙසේද? ඒ වනාහී සමාපත්තියට නැඹුරුවූයේ හෝ බලගතුවූයේද නොවේ. ඒ නිසා නූපදවයි. සෝවාන් පුද්ගලතෙමේ පලසමවතට සමවදීමියි විදසුන් වඩා සකදගාමී වෙති. සකද ගාමීහු අනාගාමී වෙතැයි යමෙක් කියතොත් ඔවුන්ට මෙසේ කිය යුතුය. එසේ නම් අනාගාමීහු රහත් වන්නාහුය රහත්හු පසේ බුදු වෙති, පසේ බුදුවරු ලොව්තුරා බුදුන්වන්නාහු නොවෙද්‍ද, එය එසේ නොවෙතැයි කිය යුතුය. දෙයා කාරවූ ඵල විශෙෂයෝ දෙයාකාරය කින් රස අනුභව කිරීම වන්නාහ. සඤ්ඤාවෙදයිත නිරෝධ සමාපත්තිය මේ ඵලසමා පත්තියට ඉතා ආසන්න වෙයි. සඤ්ඤාවෙදයිත නිරොධ සමාපත්තිය යනු කුමක්ද?. සිත් හා සිතිවිලි ධර්‍මයන්ගේ නොපැවැත්මයි. ඊට සමවදින්නෝ කවරහුද? අනාගාමී රහත් ආයර්‍යයො නිරොධසමවතට සමවදිති. ඒ ආයර්‍යයන් විසින් සමාධිය හොඳින් පුහුණු කරගත් බැවිනි. නිරෝධ සමවතට සමවැදීමට සෝවාන් සකදගාමීහුද අරූපාවචර වාසීහුද නොහැකි වෙති. මේ සඤ්ඤා වෙදයිත නිරෝධ සමාපත්තියට කවරබලයකින් සමවදිද්ද? කුමන සංස්කාරයන් දුරුකිරීමෙන් එයට සම වදිද්‍ද? සමථ විදර්‍ශනා භාවනා බලයෙන්ම සමවදිති කායසඞ්ඛාර චිත්ත සඞ්ඛාරයන් සංසිඳවීමෙන්ම සමවදනාහ. නිරෝධ සමවතට පූර්‍වකෘත්‍ය (පළමුව කටයුතු දේ) මොනවාද? ශාසනෘන් වහන්සේ කැඳවීමෙන් මහසඞ්ඝයාගේ කැඳවීමෙන් හා ඉටා ගන්නා කාලපරිච්ඡෙදය අවසාන වීමෙන් සමවතින් නැගිටිමියි පළමුවෙන් අධිෂ්ඨාන කරගත යුතුය. සමවදින්නේ කුමටද? ඉහාතම සැප විහරණය සඳහාය. මෙය ආයර්‍යයන් වහන්සේලාගේ සියල්ලට පසුවන අකම්ප්‍ය සමාපත්තියයි. මෙය අභිඥ බලය පැතිර වීමකි—සාරිපුත්ත සඤ්ජීවාදී තෙර වරුන් මෙන් තම දෙහාරක්‍ෂාව සඳහාද සමවදිති. නිරොධසමවතින් නැගිටින්නේ කෙසේද? මම දැන් සමවතින් නැගිටිමි යන හිතක් නැත්තේය. පළමු සනිටුහන් කරගත් පරිදි කාලපරිච්ඡෙදය අවසාන වීමෙන් හෝ නින්දෙන් පිබිදීම මෙන් නැගී සිටීම වෙයි. සමවතින් නැගී කෙණෙහි කුමන සිතකින්ද අනාගාමී පුද්ගලයා අනාගාමී ඵල සිතින්ද රහතන්වහන්සේ අරහත්ත ඵලසිතින්ද යුක්ත වෙති. නිරොධයට සමවන් ආයර්‍යයා ස්පර්‍ශ කියක් විඳිද ? සුන්‍යතා අනිමිත්තා අප්පණිහිත තුන්ස්පර්‍ශ යො විඳිති. කුමණ සංස්කාරයෝ පළමුව ඇති වෙද්‍ද? නිරොධයෙන් මිදුන වහාම කායසංස්කාරයො පහළවෙති. අනතුරුව චිත්තසංස්කාර උපදිති. නිරෝධයට සමවන්නහුගේත් මළමිනියේත් වෙනස කුමක්ද, ශරීරය අමුනුනොවීම, හෘදය රූපය තුළම ආශ්වාශ ප්‍රශ්වාස පැවැත්ම, උණුසුම අඩු නොවීම සමවතින් සිටින්නකුගේ ලක්‍ෂණය. මේ සමවත සංඛත—(සකස් කළ) ද නැද්ද? නිරොධ සමාපත්තිය සංඛත හෝ අසංඛත යයි කිව නොහැක. මෙහි සඞ්ඛත අසංඛත ධර්‍මයෙක් නැත—උදාන ප්‍රයෝජනාදිය දක්වා.

විමුත්ති මාර්‍ගය නිම්යේය

උක්කුටික ආසනය

අර්ධ බද්ධපර්‍යඞ්කක ආසනය

බද්ධපර්‍යඞ්ක ආසනය

9—

විමුත්ති මග්ගො

උද්දානං

1. සිඞංකිලෙසමලවජ්ජිතධම්මදෙහං
නිච්චං අසච්චපරිවජ්ජිතසච්චවාදිං
ඡන්දාදිදෙසරහිතං සුගතං මුනින්දං
වන්දාමි බුද්ධමසමං වරධම්මරාජං.

2. සම්බුද්ධරාජඋදයාචලතොදිතං යං
සද්ධම්ම තෙජ සත රංසි සමුජ්ජලන්තං
වෙනෙය්‍ය ජන්තු පදුමානි පබොධයන්තං
වන්දාමි ධම්ම මිහිරං සිරසා මහග්ඝං.

3. නිච්චං අනිච්චමථ දුක්ඛ මනත්ත භාවං
භාවෙන්ති යෙහි නිරතා පි විමුත්තිමග්ගං
සන්තින්ද්‍රියාරිය ගුණෙහි සුපුඤ්ඤඛෙත්තං
වන්දාමි සඞ්ඝමනඝං සිරසා මහග්ඝං.

4. බුද්ධාදිකෙහි අරියෙහි ගතාති සෙට්ඨං
ආසෙවිතං මුනිගණෙහි සුඛත්ථිකෙහි
අන්තද්වයෙන රහිතං උජුකං සුමග්ගං
වක්ඛාමි යොගිජන කන්ත විමුත්තිමග්ගං.

5. පඤ්ච පීතික්කමො කච්ඡො—පඨමො සමථස්ස හි
දුතියො යුගලා තිනි—කාය චිත්තසුඛාදයො.

6. ආනාපාණ සති භූත—වණ්ණ කසිණාන්‍යතොපරං
චතුත්ථො පඤ්චමො කච්ඡො—ජට්ඨො අසුභ මුච්චතෙ

7. කායගතා සති සත්ත බුද්ධානුස්සති අට්ඨමො
අරූපා චචරො කච්ඡො—නවමොති පවුච්චති

බ්‍රහ්ම විහාරා චත්තාරො—දසමොති පවුච්චති
දස සඤ්ඤක්කමො කච්ඡො—එකාදසමො ති වුච්චති.

9. චතු මග්ග ඵලො කච්ඡො—වාදසො ති පවුච්චති
නිබ්බාණාමත කච්ඡො ති—තෙරසෙහි සුනිසිතං.

10. තත්‍ථ පඤ්චසු ඨිතීසු—යථාවුත්ත විධිම්පන
පවක්ඛාමි සමාසෙන—වන්දිත්වා රතනත්තයං.

11. මාතිකා පටිපත්තිච—ඡසද්දං හදයම්පිච
ධාතු සමූහො චතුනයං—පඤ්චනයං විදත්ථිම්පිච.

12. සමාධිඤ්ච පවක්ඛාමි—ධම්ම චිරට්ඨිතිකම්පිච
සිත්‍ථ දණ්ඩ පදීපොච—කාය වසීවනත මුච්චතෙ.

13. ඉච්චෙතෙ වාදසාකාර—විධිවුත්තා විසුං විසුං
තස්මා වසී වසී හුත්වා—භාවෙතබ්බං විසුං විසුං.

14. සංසාරෙ භය පස්සන්තා—නිබ්බාණ සුඛ මිච්ඡතා
භාවනා විධි මිච්ඡන්තා—කාතබ්බාච ඉමං විධිං.

15. ලෙන පබ්බත ගුහායංවා—පාසාද සර කුටීසුපි
රුක්ඛ චත්‍ථ කුටී චාති—නිලීනට්ඨාන මීදිසං.

16. සම්මජ්ජනී පදීපොච—කුණ්ඩිකා උදකම්පි ච
පාණීය මාලාවදූවෙ—චුප්ඵභාජනදසම්පිච.

17. ලිම්පෙත්වා චන්දනං තෙසු—පඨමෙ පඤ්චසු භාජනෙ
පුප්ඵානි චෙව පූජෙත්වා—දුතිය භාජන පඤ්චකෙ.

18. තථෙව ලාජා පූජෙත්වා ධූප පූජඤ්චකාරයෙ
යථාලද්ධං ගණ්හි තබ්බං—පඤ්ච සිත්‍ථක දණ්ඩකෙ.

19. ඉමිනා නයෙන කත්වාපි—පුබ්බ කරණෙපි නිට්ඨිතෙ
තථෙව පුබ්බ කිච්චම්පි—කා තබ්බං යොගිනා ඉධ.

20. සද්ධා සීල ගුණූපෙත—යෙන කෙනචි යොගිනා
සක්කච්චං පාරුපිත්වාන—වන්දිත්වා ඨිතකෙනථ.

ඔකාස, වන්දාමි භන්තෙ, සබ්බං අපරාධං ඛමථ මෙ භන්තෙ ති වුත්තෙ මයා කතං පුඤ්ඤං සාමිනා අනුමොදිතබ්බං සාමිනා කතං පුඤ්ඤං මය්හං දතබ්බන්ති වත්වා සාධු, සාධු අනුමොදාමීති.

21. එවමාදි වදෙ පච්ඡා—උක්කුටිකෙන නිසීදිය
ඔකාස සබ්බං අපරාධං—ඛමථ මෙ භන්තෙතිච.

22. තස්මා ආචරියෙ නාපි—ඛමාමි ඛමිතබ්බන්ති
වාචයෙ තථෙව—සිස්සෙනාපි සාධු සාධු ඛමාමීති.

23. පච්ඡාපි යීතකො යෙව—වන්දාමි භන්තෙති වා
සබ්බං අපරාධන්ති වා වත්වා—ඛමථ මෙ භන්තෙති වා.

24. මයා කතං පුඤ්ඤම්පි—සාමිනා අනුමොදිතබ්බන්ති
සාමිනා කතං පුඤ්ඤම්පි—මය්හංදාතබ්බන්ති වා.

25. මොදිත්වා පුන යොගිනා—නමොකාරං තයොවාරෙ
වාචෙත්වා නිට්ඨිතෙ පුන—බුද්ධං ජීවිත පරියන්තං
යාව නිබ්බාණම්පිච—ධම්මං ජීවිත පරියන්තං
යාව නිබ්බාණන්තිච—සඞ්ඝඤ්ජීවිත පරියන්තං
යාව නිබ්බාණන්තිච—සරණං ගච්ඡාමීත්‍යාදිකං.

26. ථිදිසං සරණං ගන්ත්වා—ඉතිපිසො භගවාදිකං
ගාථාය පරියොසානෙ—වන්දිත්වා වාරමෙකකං.

27. උක්කුටිකෙන නිසීදිත්වා—වාචෙතබ්බං පුනප්පුනං
දුතියම්පි බුද්ධං දුතියම්පි ධම්මං—දුතියම්පි සඞ්ඝන්තිච.

28. ජීවිත පරියන්තං යාව—නිබ්බාණන්තිච ථිදිසං
සරණං ගන්ත්වා ස්වාකඛාතො භගවතාදිකං.

29. ගාථාය පරියොසානෙ—වන්දිත්වා වාරමෙකකං
උක්කුටිකං නිසීදිත්වා—වාචෙතබ්බං යථා විධිං.

30. තතියම්පි බුද්ධං ජීව—පරියන්තං සරණන්තිච
යාව නිබ්බාණකංචාපි—ගච්ඡාමිති වදෙ පුන.

31. තතියම්පි ධම්මං සරණං—සඞ්ඝඤ්චාපි අනුත්තරං
තතියඤ්ජීවිත පරියන්තං—යාව නිබ්බාණකං ඉති.

32. බුද්ධං ධම්මඤ්ච සඞ්ඝං—සරණං ගච්ඡාමි තිච
ථිදිසං සරණං ගන්ත්වා—සුපටිපන්නොති ආදිකා.

33. ගාථාය පරියොසානෙ— යොගාවචර භික්ඛුනා
නිසීදිත්වාන තත්ථෙව—ඉමා ගාථා වදෙ බුද්ධො.

34. ඉච්චෙවං මච්චන්ත නමස්සනීයං—නමස්සමානො රතනත්තයං යං.
පුඤ්ඤාභිසන්දං විපුලං අලත්ථං—තස්සානුභාවෙන හතන්තරායො.

35. වන්දිත්වා එකවාරංහි—නිට්ඨා පෙත්වාන යොගිනා
කරණීය මෙත්ත සුත්තම්පි—වාචෙතබ්බාච සාධුකං

36. පඤ්චමාරෙ ජිතො නාථො—පත්තො සම්බොධි මුත්තමං
චතුසච්චං පකාසෙසි—මහා වීරං නමාමහං.

37. එතෙන සච්චවජ්ජෙන—සබ්බෙ මාරා පලායන්තු
ඉමිනා විධානොසානම්හි—ගණ්හිත්වා කුණ්ඩිකං සතො.

38. උදක පාතන කාලම්හි—ඉමාගාථා වදෙ සුධී
ඉමිනා පුඤ්ඤ කම්මෙන—උපජ්ඣායාගුණුත්තරා.

39. ආචරියූපකාරාච—මාතාපිතා පියා මමං
සූරියො චන්දිමා රාජා—ගුණවන්තා නරා පිච.

40. බ්‍රහ්මා මාරාච ඉන්දච—ලොකපාලාච දෙවතා
යමො මිත්තා මනුස්සාච, මජ්ඣත්තා වෙරිකාපිච.

41. සබ්බෙ සත්තා සුඛී හොන්තු—පුඤ්ඤානපකතෙ නමෙ
සුඛඤ්ච තිවිධං දෙන්තු—ඛිප්පංපාපෙථ වොමතං

42. ඉමිනා පුඤ්ඤකම්මෙන—ඉමිනා වුද්ධි සෙනච
ඛිප්පාහං සුලහෙචෙච—තණ්හුපාදාන ඡෙදනං.

43. යෙසන්තානෙ හීණාධම්මා—යාව නිබ්බාණතොපිමං
නස්සන්තු සබ්බදායෙච—යත්ථජාතො භවෙ භවෙ.

44. උජු චිත්තො සතිපඤ්ඤො—සල්ලෙඛො විරියවා මිනා
මාරා ලභන්තුනොකාසං—කාතුඤ්ච විරියෙසු මෙ

45. බුද්ධාදි පවරො නාථො—ධම්මොනාථො වරුත්තමො
නාථො පච්චෙක සම්බුද්ධො—සඞ්ඝො නාථොත්තරො
මමං තෙ සොත්තමානුභාවෙන—මාරොකාසංලභන්තු මා.

46. පඤ්ච සිත්ථක දණ්ඩානි—ජාලෙත්වා පූජිතෙ සති
නමොපාඨං තයොවාරං—වාචෙත්වා පුන යොගිනා

ඔකාස, අච්චයො නො මෙ භන්තෙ අච්චගමා, යථා බාලෙ යථාමූළ්හෙ යථා අකුසලෙ යො අහං අකරොමීතිචා එවං භන්තෙ අච්චයො නො භන්තෙ පති ගණ්හථ ආයතිං සංචරිස්සාමී.

ඔකාස අහං පටිපත්ති පූජාය. සබ්බඤ්ඤු ගොතමස්ස ඔවාදං පතිකරොමීති වාචයෙ. තයොවාරෙ වාචෙත්වා නිට්ඨිතෙ පුන—

47. ඔකාසාහං යාචාමි—උග්ගහනිමිත්තමපිච.
පටිභාග නිමිත්තඤ්ච—උපචාර විධි මෙවච.

48. අප්පණා සමාධි විධිඤ්චාපි—අනෙතා ගබ්භපඤ්ච පීතියො—
ඛුද්දකා පීතිති වාවෙත්වා—පුබ්බකිච්චෙච සු නිසීතෙ.

49. නවලොකුත්තර ධම්මෙමාති—වන්දිත්වා නිට්ඨී තෙ පුන
අසීති මහා සාවකෙච—නිබ්බාණ මභිපූරිතෙ.

50. ඛීණාසවා අප්පමෙය්‍යා—සමුද්දවාලුකාධිකා
පරම්පරාභතං ධම්මං—යාචෙ විත්ථාරතො අහං.

51. පඤ්චක්ඛන්ධෙසු චක්ඛු—කායද්වාරකෙ සුච
මනොද්වාරෙ සමංයෙව—උප්පජ්ජන්තූති භාවයෙ.

52. භාවෙතුමාරද්ධ ඛණෙ—නිසින්නො අපි තං ඛණෙ.
යාචාමහං බුද්ධ ගුණං—ධම්ම සඞ්ඝ ගුණානිච.

53. ආචරියගුණං සුසික්ඛිතං—කම්මට්ඨාණං පතිසරණන්තිච
ඉදනි ජීවිතං දෙමි—රතනානං තිණ්ණමපිච.

54. නිබ්බාණං සච්ඡි කරිස්සාමි—පච්චයො හොතු මෙ සද
නිබ්බාණ පච්චයො හොතු—පුබ්බකිච්චමහි නිට්ඨීතෙ.

55. පල්ලඞ්කෙන නිසීදිත්වා—තතො ආදිමහි වාචයෙ
පරිකම්මං පවක්ඛාමි—අරහං අරහ මෙවච

56. තීසු වාරෙසු වත්තබ්බං—යොගාවචර භික්ඛුනා
ඔලොකෙන්තොච නාසග්ගං—චක්ඛු විඤ්ඤාණතො තථා.

57. චිත්ත විඤ්ඤාණමස්සාස—පස්සාසෙසු ඨපෙබුධො
ඊදිසං පස්සතෙථෙන—පිණ්ඩු ධූමරාසි වසෙනවා.

58. වලාහකෙච සඤ්ජාතෙ—උග්ගහ නිමිත්තන්ති ජාතියා
පටිභාගංතත්ථ ථවිකාය—ගහිතාදස සන්නිභං.

59. පරිසුද්ධ සඞ්ඛ පත්තංච—නීරදන්තර මුග්ගතො
පුණ්ණචන්දෙව ජොතෙති—බලාකාමෙඝ සන්තිකා.

60. උග්ගහ නිමිත්තං ඵාලෙත්වා—පාතු භූතංච දිස්සතෙ.
තථා උග්ගහ මිනිත්තං තං—වඩ්ඪෙත්වා න පුනප්පුනං

61. කසිණ දෙසානි වජ්ජෙත්වා—පස්සන්තෙ නෙච යොගිනා
සහස්ස ගුණ පරිසුද්ධා—අප්පණා ඉධ ජායතෙ.

62. හවඞ්ග හෙදතො පච්ඡා—මනො ආවජ්ජගං යතො
බුද්ධිකායං අප්පණාපි—ඨපෙජාපමාති ජාණියා.

63. පරිකම්මං සූරියොව—උපචාරගිරිකණ්ණිකාමිව
ගණ්හිත්වානාසිකගෙගන—එකෙකංව පුනප්පුනං.

64. ඨපෙත්වාහදයෙ පච්ඡා—පුබ්බකිච්චානි සඞ්ඛිපෙ
තතො තමං හරිත්වාන—නාභිමහප්පණාතො ඨපෙ.

65. පරිකම්මූපචාරම්පි—අඞ්ගුලන්තරිකං ඨපෙ
පරිකම්මම්පි සබ්බත්ථ—අරහං අරහමෙවච.

